321 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 321 - இல - 06
Volume 321 - No - 06

2025 සැප්තැම්බර් 24 වන බදාදා
2025 செப்ரெம்பர் 24, புதன்கிழமை
Wednesday, 24th September, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 858]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 859-884]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ පළාත් සභා මැතිවරණය පැවැත්වීම පිළිබඳ රජයේ ස්ථාවරය [තීරුව 885]

සරල කළ එකතු කළ අගය මත බද්ද අහෝසි කිරීමෙන් අපනයන ක්ෂේත්‍රයට වන බලපෑම [තීරුව 888]

**නිල සංචිත වත්කම් ඉලක්ක සපුරා ගැනීමේ අභියෝගය:**

වැඩබලන මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 892]

**වරප්‍රසාද:**

වත්කම් සහ බැරකම් ප්‍රකාශයෙහි සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් දක්වා ඇති මූල්‍ය වත්කම් [තීරුව 899]

**දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 902 – 1035]

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**

යෝජනා සම්මතය [තීරුව 1036]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 1037-1044]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1044-1060]


# பிரதான உள்ளடக்கம்


**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 858]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 859-884]

**தனி அறிவித்தல் மூல வினா:**

நிறைவேற்றதிகார சனாதிபதி முறைமையை அகற்றுதல் மற்றும் மாகாண சபைத் தேர்தலை நடாத்தல் பற்றிய அரசின் நிலைப்பாடு [ப: 885]

எளிமைப்படுத்தப்பட்ட சேர்பெறுமதி வரி முறைமையை ஒழிப்பதனால் ஏற்றுமதித்துறையில் ஏற்படும் தாக்கம். [ப: 888]

**உத்தியோகபூர்வ சொத்தொதுக்க இலக்குகளை அடைவதில் எதிர்கொள்ளும் சவால்:**

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்திப் பதில் அமைச்சரினது கூற்று [ப: 892]

**சிறப்புரிமை:**

சொத்துக்கள் மற்றும் பொறுப்புக்களை வெளிப்படுத்துகையில் ஒருசில பாராளுமன்ற உறுப்பினர்களால் வெளிப்படுத்தப்பட்டுள்ள நிதிசார் சொத்துக்கள் [ப: 899]

**தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 902-1035]

**அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:**

தீர்மானம் [ப: 1036]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 1037-1044]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப:1044-1060]


# PRINCIPAL CONTENTS


SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 858]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 859-884]

QUESTION BY PRIVATE NOTICE:

Government Stance on Abolishing Executive Presidency and Holding Provincial Councils Election [Col. 885]

Impact of Abolition of Simplified Value Added Tax on Export Sector [Col. 888]

CHALLENGE OF MEETING OFFICIAL RESERVE ASSETS TARGET:

Statement by Acting Minister of Finance, Planning and Economic Development [Col. 892]

PRIVILEGE:

Financial Assets Declared by Some Members of Parliament in Declaration of Assets and Liabilities [Col. 899]

PENAL CODE (AMENDMENT) BILL:

Second Reading - Debate Adjourned [Cols. 902–1035]

ESSENTIAL PUBLIC SERVICES ACT:

Resolution [Col. 1036]

ADJOURNMENT QUESTIONS [Cols. 1037-1044]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols.1044-1060]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 සැප්තැම්බර් 24*වන බදාදා**
*2025 செப்ரெம்பர் 24, புதன்கிழமை*
*Wednesday, 24th September, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) றிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය, වැඩබලන අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு பதில் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media, Acting Minister of Justice and National Integration and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

Hon. Deputy Speaker, I present the Annual Report of the Sri Lanka Transport Board for the year 2023.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

Hon. Deputy Speaker, I present the Report of the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection on Penal Code (Amendment) Bill, which was referred to the Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැලිගම, වැලිපිටිය, රුප්පෙ ගෙදර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.කේ. සංජන් සසන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) උඩුගම්පොල, දොරණාගොඩ, අංක 72/ඒ දරන ස්ථානයෙහි පදිංචි අනුරසිරි අබේවීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගම්පහ, ඉදිගොල්ල, වැවලන්ද පාර, "සැනසුම", අංක 97/1 දරන ස්ථානයෙහි පදිංචි වී.පී. රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
Hon. Deputy Speaker, I present -

(1) a petition from Mr. G.G. Jayathissa of No. 49/5, Balanagala, Katugasthota; and

(2) a petition from Mr. G. Weerasekara of No. 54/4, Haaragama, Gurudeniya, Kandy.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Stepni Fernando. - *[Not in the Chamber.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No.1 - 17/2024 - (1), the Hon. Hesha Withanage Ankumbura Arachchi. - *[Not in the Chamber.]*

Question No. 2 - 118/2024 - (1), the Hon. Chaminda Wijesiri. - *[Not in the Chamber.]*

Question No. 3 - 220/2024 - (1), the Hon. Rohana Bandara. - *[Not in the Chamber.]*

Question No. 4 - 341/2024 - (1), the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. - *[Not in the Chamber.]*

Question No. 5 - 624/2025- (1), the Hon. Kins Nelson. - *[Not in the Chamber.]*

Question No.6 - 1113/2025 - (1), the Hon. Roshan Akmeemana. - *[Not in the Chamber.]*

Question No. 7 - 1119/2025 - (1), the Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No.8-1179/2025 - (1), the Hon. Sivagnanam Shritharan. - *[Not in the Chamber.]*

Question No. 9 - 1242/2025 - (1), the Hon. Thilina Samarakoon. - [Not in the Chamber.]

Question No. 10 - 1257/2025 - (1), the Hon. Dharmapriya Dissanayake. - [Not in the Chamber.]

Then, the second round.

### ශ්‍රී ලංකා තේ මණ්ඩලය: ආයෝජන
### இலங்கை தேயிலைச் சபை: முதலீடுகள்
### SRI LANKA TEA BOARD: INVESTMENTS

17/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දිගු කාලීන හා කෙටි කාලීන ආයෝජනවල ආයෝජනය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයෝජන සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) 2020ஆம் ஆண்டு முதல் இற்றைவரை இலங்கை தேயிலைச் சபை நீண்ட கால மற்றும் குறுங்கால முதலீடுகளில் முதலீடு செய்துள்ள பணத்தொகை வெவ்வேறாக யாது;

(ii) மேற்படி முதலீடுகளுக்கு முறையான அங்கீகாரம் பெறப்படவில்லை என்பதை அறிவாரா;

(iii) ஆமெனில், இது தொடர்பில் மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the amount of money invested by the Sri Lanka Tea Board in long-term and short-term investments separately, from the year 2020 up to now;

(ii) whether he is aware that proper approval has not been obtained for those investments; and

(iii) if so, the actions that will be taken in this regard?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

(a). ප්‍රවර්ධන සහ අළෙවිකරණ බදු ආයෝජනය

| වර්ෂය | කෙටි කාලීන ආයෝජන රුපියල් ශත | දිගු කාලීන ආයෝජන රුපියල් ශත | එකතුව රුපියල් ශත |
|---|---|---|---|
| 2020.12.31 | 6,956,839,407.93 | | 6,956,839,407.93 |
| 2021.12.31 | 8,138,139,498.00 | | 8,138,139,498.00 |
| 2022.12.31 | 9,145,424,351.00 | | 9,145,424,351.00 |
| 2023.12.31 | 8,261,200,000.00 | 850,000,000.00 | 9,111,200,000.00 |
| 2024.12.31 | 7,599,999,898.33 | 500,000,000.00 | 8,099,999,898.33 |
| 2024.07.31 | 7,600,000,000.00 | 500,000,000.00 | 8,100,000,000.00 |

(b). ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුදල් ආයෝජන

| වර්ෂය | කෙටි කාලීන ආයෝජන රුපියල් ශත | දිගු කාලීන ආයෝජන රුපියල් ශත | එකතුව රුපියල් ශත |
|---|---|---|---|
| 2020.12.31 | 454,409,000.00 | | 454,409,000.00 |
| 2021.12.31 | 406,500,000.00 | | 406,500,000.00 |
| 2022.12.31 | 536,983,997.00 | | 536,983,997.00 |
| 2023.12.31 | 847,898,926.98 | 100,000,000.00 | 947,898,926.98 |
| 2024.12.31 | 924,021,842.85 | 100,000,000.00 | 1,024,021,842.85 |
| 2024.07.31 | 893,163,605.77 | 100,000,000.00 | 993,163,605.77 |

(c). ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ඛනිජතෙල් නීතිගත සංස්ථාව අතර අවබෝධතා ගිවිසුම යටතේ වන ආයෝජන

| වර්ෂය | කෙටි කාලීන ආයෝජන රුපියල් ශත | දිගු කාලීන ආයෝජන රුපියල් ශත | එකතුව රුපියල් ශත |
|---|---|---|---|
| 2023.12.31 | 3,281,113,500.00 | - | 3,281,113,500.00 |
| 2025.07.31 | 1,476,865,500.00 | - | 1,476,865,500.00 |

(ii) සියලුම ආයෝජන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2018 අනුව සහ රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති පරිදි රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත.

2022 වර්ෂය දක්වා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කෙටි කාලීන ආයෝජන මණ්ඩලයේ බැංකු ගිණුම් පවත්වාගෙන යනු ලබන ලංකා බැංකු ශාඛාවල කෙටි කාලීනව ආයෝජනය කරන ලද අතර, 2022 වර්ෂයේ දී අභ්‍යන්තර විගණන නිර්දේශ අනුව වඩාත් තරගකාරී පොලී අනුපාතයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් රාජ්‍ය බැංකුවලින් මිල ගණන් කැඳවීම ආයෝජන කමිටු මඟින් සිදු කළ අතර, එම කමිටු නිර්දේශය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් පසු ආයෝජන කටයුතු සිදු කරන ලදී.

2024 වර්ෂයේ සිට ආයෝජන ක්‍රියාවලිය වඩාත් විධිමත් ලෙස ප්‍රසම්පාදන කමිටු අනුමැතියට ද ඉදිරිපත් කර ඇති අතර, ආයෝජන සඳහා මිල ගණන් කැඳවීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලැබේ. එම ආයෝජන කිරීමේ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කර ඇති අතර, සියලු ආයෝජන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතියෙන් පසු ආයෝජන කටයුතු සිදු කරනු ලැබේ. මාසික ආයෝජන විචලන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(iii) වර්තමානයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් සිදු කරන ආයෝජන කටයුතු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන සිදු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්: නිල නිවාස
## பாராளுமன்ற உறுப்பினர்கள்: உத்தியோகபூர்வ இல்லங்கள்
## MEMBERS OF PARLIAMENT: OFFICIAL RESIDENCES

118/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chaminda Wijesiri)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වන විට පවතින නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට නිල නිවාස ලබාගෙන ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව සහ නිල නිවාස ලබාගෙන නොමැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල නිවාස ලබාගෙන ඇති සහ නිල නිවාස ලබාගෙන නොමැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பாராளுமன்ற உறுப்பினர்களுக்காக இன்றளவில் காணப்படும் உத்தியோகபூர்வ இல்லங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) இன்றளவில் உத்தியோகபூர்வ இல்லங்களைப் பெற்றுள்ள பாராளுமன்ற உறுப்பினர்களின் எண்ணிக்கையும் உத்தியோகபூர்வ இல்லங் களைப் பெற்றுக்கொள்ளாத பாராளுமன்ற உறுப்பினர்களின் எண்ணிக்கையும் வெவ் வேறாக யாவை என்பதையும்;

(iii) உத்தியோகபூர்வ இல்லங்களைப் பெற்றுள்ள மற்றும் உத்தியோகபூர்வ இல்லங்களைப் பெற்றுக்கொள்ளாத பாராளுமன்ற உறுப்பினர் களின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(j) number of official residences available for Members of Parliament, as at present;

(ii) number of Members of Parliament who have obtained official residences and the number of those who have not, as at present, separately; and

(iii) names of the Members of Parliament who have obtained official residences and the names of those who have not, separately?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මාදිවෙල මන්ත්‍රී නිල නිවාස සංකීර්ණයේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වන විට පවතින නිල නිවාස සංඛ්‍යාව 111කි.

(ii)

- මේ වන විට -2025.09.01 දිනට- මාදිවෙල මන්ත්‍රී නිල නිවාස සංකීර්ණයේ නිවාස ලබාගෙන ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 111කි.

- මේ වන විට -2025.09.01 දිනට- මාදිවෙල මන්ත්‍රී නිල නිවාස සංකීර්ණයේ නිවාස ලබාගෙන නොමැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 112කි.

(iii)

**2025.09.01 දිනට මාදිවෙල මන්ත්‍රී නිල නිවාස සංකීර්ණයේ නිල නිවාස ලබා ගෙන ඇති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

| අංකය | පදිංචිකරුගේ නම |
|---|---|
| 1 | ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා, පා.ම., |
| 2 | ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම., |
| 3 | ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා, පා.ම., |
| 4 | ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා, පා.ම., |
| 5 | ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම., |
| 6 | ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම., |
| 7 | ගරු තුරෛරාසා රවිකරන් මහතා, පා.ම., |
| 8 | ගරු රෝහණ බංඩාර මහතා, පා.ම., |
| 9 | ගරු වසන්ත පියතිස්ස මහතා, පා.ම., |
| 10 | ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., |
| 11 | ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය, පා.ම., |
| 12 | ගරු දිලිප් වෙදආරච්චි මහතා, පා.ම., |
| 13 | ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම., |
| 14 | ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., |
| 15 | ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම., |
| 16 | ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා, පා.ම., |
| 17 | ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම., |
| 18 | ගරු නලින් හේවගේ මහතා, පා.ම., |
| 19 | ගරු කිංස් නෙල්සන් මහතා, පා.ම., |
| 20 | ගරු රොෂාන් අක්මීමන මහතා, පා.ම., |
| 21 | ගරු නීතිඥ සරත් කුමාර මහතා, පා.ම., |
| 22 | ගරු රියාස් ෆාරුක් මහතා, පා.ම., |
| 23 | ගරු තනුර දිසානායක මහතා, පා.ම., |
| 24 | ගරු සුනිල් බියන්විල මහතා, පා.ම., |
| 25 | ගරු ගමගෙදර දිසානායක මහතා, පා.ම., |
| 26 | ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම., |
| 27 | ගරු බී.ආරියවංශ මහතා, පා.ම., |
| 28 | ගරු දීප්ති වාසලගේ මහත්මිය, පා.ම., |
| 29 | ගරු තිලංක යූ. ගමගේ මහතා, පා.ම., |
| 30 | ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා, පා.ම., |
| 31 | ගරු කංචන වැලිපිටිය මහතා, පා.ම., |
| 32 | ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා, පා.ම., |
| 33 | ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය, පා.ම., |
| 34 | ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය, පා.ම., |
| 35 | ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම., |
| 36 | ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා, පා.ම., |
| 37 | ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය, පා.ම., |
| 38 | ගරු ආර්.ජී. විජේරත්න මහතා, පා.ම., |
| 39 | ගරු මුහම්මද් ෆයිසාල් මහතා, පා.ම., |
| 40 | ගරු චානක මාදුගොඩ මහතා, පා.ම., |
| 41 | ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා, පා.ම., |
| 42 | ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා, පා.ම., |
| 43 | ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා, පා.ම., |
| 44 | ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය, පා.ම., |

| | |
|---|---|
| 45 | ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා, පා.ම., |
| 46 | ගරු රිසාඩ් බදියුදීන් මහතා, පා.ම., |
| 47 | ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය, පා.ම., |
| 48 | ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා, පා.ම., |
| 49 | ගරු කිට්නන් සෙල්වරාජ් මහතා, පා.ම., |
| 50 | ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා, පා.ම., |
| 51 | ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම., |
| 52 | ගරු ලාල් ප්‍රේමනාත් මහතා, පා.ම., |
| 53 | ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා, පා.ම., |
| 54 | ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම., |
| 55 | ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., |
| 56 | ගරු අජිත් අගලකඩ මහතා, පා.ම., |
| 57 | ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා, පා.ම., |
| 58 | ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා, පා.ම., |
| 59 | ගරු ආර්.එම්. ජයවර්ධන මහතා, පා.ම., |
| 60 | ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා, පා.ම., |
| 61 | ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා, පා.ම., |
| 62 | ගරු සුසන්ත කුමාර නවරත්න මහතා, පා.ම., |
| 63 | ගරු සුදත් බලගල්ල මහතා, පා.ම., |
| 64 | ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා, පා.ම., |
| 65 | ගරු රත්න ගමගේ මහතා, පා.ම., |
| 66 | ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., |
| 67 | ගරු අරුන් හේමචන්ද්‍ර මහතා, පා.ම., |
| 68 | ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම., |
| 69 | ගරු නිමල් පලිහේන මහතා, පා.ම., |
| 70 | ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා, පා.ම., |
| 71 | ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම., |
| 72 | ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම., |
| 73 | ගරු සුජීව දිසානායක මහතා, පා.ම., |
| 74 | ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම., |
| 75 | ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා, පා.ම., |
| 76 | ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම., |
| 77 | ගරු අතුල වෙළඳගොඩ මහතා, පා.ම., |
| 78 | ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., |
| 79 | ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම., |
| 80 | ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා, පා.ම., |
| 81 | ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා, පා.ම., |
| 82 | ගරු පද්මසිරි බණ්ඩාර මහතා, පා.ම., |
| 83 | ගරු ටී. බී. සරත් මහතා, පා.ම., |
| 84 | ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම., |
| 85 | ගරු චන්දන තෙන්නකෝන් මහතා, පා.ම., |
| 86 | ගරු නාමල් කරුණාරත්න මහතා, පා.ම., |
| 87 | ගරු පලනි දිගම්බරම් මහතා, පා.ම., |
| 88 | ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., |
| 89 | ගරු ඊ.එම්. බස්නායක මහතා, පා.ම., |
| 90 | ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා, පා.ම., |
| 91 | ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා, පා.ම., |
| 92 | ගරු මනෝජ් රාජපක්ෂ මහතා, පා.ම., |
| 93 | ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., |
| 94 | ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම., |
| 95 | ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම., |
| 96 | ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම., |
| 97 | ගරු සුරංග රත්නායක මහතා, පා.ම., |
| 98 | ගරු නන්ද බණ්ඩාර මහතා, පා.ම., |
| 99 | ගරු අජිත් ගිහාන් මහතා, පා.ම., |
| 100 | ගරු කේ. ඉලංකුමාරන් මහතා, පා.ම., |
| 101 | ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා, පා.ම., |
| 102 | ගරු මංජුල සුගත් රත්නායක මහතා, පා.ම., |
| 103 | ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම., |
| 104 | ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා, පා.ම., |
| 105 | ගරු එම්.ජ්.සී.එස්. චතුරි ගංගානි මහත්මිය, පා.ම., |
| 106 | ගරු වරුණ ලියනගේ මහතා, පා.ම., |
| 107 | ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම., |
| 108 | ගරු උපුල් කිත්සිරි මහතා, පා.ම., |
| 109 | ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම., |
| 110 | ගරු කන්දසාමි ප්‍රභු මහතා, පා.ම., |
| 111 | ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා, පා.ම., |

**2025.09.01 දිනට මාදිවෙල මන්ත්‍රී නිල නිවාස සංකීර්ණයේ නිල නිවාස ලබා ගෙන නොමැති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

| අංකය | පදිංචිකරුගේ නම |
|---|---|
| 1 | ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා, පා.ම., |
| 2 | ගරු හේමාලි වීරසේකර මහත්මිය, පා.ම., |
| 3 | ගරු බිමල් රත්නායක මහතා, පා.ම., |
| 4 | ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා, පා.ම., |
| 5 | ගරු විජිත හේරත් මහතා, පා.ම., |
| 6 | ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා, පා.ම., |
| 7 | ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., |
| 8 | ගරු වසන්ත සමරසිංහ මහතා, පා.ම., |
| 9 | ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා, පා.ම., |
| 10 | ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා, පා.ම., |
| 11 | ගරු අනුර කරුණාතිලක මහතා, පා.ම., |
| 12 | ගරු සුනිල් කුමාර ගමගේ මහතා, පා.ම., |
| 13 | ගරු කුමාර ජයකොඩි මහතා, පා.ම., |
| 14 | ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා, පා.ම., |
| 15 | ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා, පා.ම., |
| 16 | ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා, පා.ම., |
| 17 | ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා, පා.ම., |
| 18 | ගරු ආනන්ද විජේපාල මහතා, පා.ම., |
| 19 | ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා, පා.ම., |
| 20 | ගරු සජිත් ප්‍රේමදාස මහතා, පා.ම., |
| 21 | ගරු චතුරංග අබේසිංහ මහතා, පා.ම., |
| 22 | ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා, පා.ම., |
| 23 | ගරු එරංග ගුණසේකර මහතා, පා.ම., |
| 24 | ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා, පා.ම., |
| 25 | ගරු ඇන්ටන් ජයකොඩි මහතා, පා.ම., |
| 26 | ගරු මහින්ද ජයසිංහ මහතා, පා.ම., |
| 27 | ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම., |
| 28 | ගරු සුගත් තිලකරත්න මහතා, පා.ම., |
| 29 | ගරු මුනීර් මුලාෆර් මහතා, පා.ම., |
| 30 | ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා, පා.ම., |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| | |
|---|---|
| 31 | ගරු නීතිඥ සුනිල් වටගල මහතා, පා.ම., |
| 32 | ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා, පා.ම., |
| 33 | ගරු එරංග වීරරත්න මහතා, පා.ම., |
| 34 | ගරු උපාලි සමරසිංහ මහතා, පා.ම., |
| 35 | ගරු පී. රුවන් සෙනරත් මහතා, පා.ම., |
| 36 | ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා, පා.ම., |
| 37 | ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම., |
| 38 | ගරු අසෝක සපුමල් රන්වල මහතා, පා.ම., |
| 39 | ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, පා.ම., |
| 40 | ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා, පා.ම., |
| 41 | ගරු රවී කරුණානායක මහතා, පා.ම., |
| 42 | ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා, පා.ම., |
| 43 | ගරු කබීර් හෂීම් මහතා, පා.ම., |
| 44 | ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., |
| 45 | ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම., |
| 46 | ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා, පා.ම., |
| 47 | ගරු ජීවන් තොන්ඩමන් මහතා, පා.ම., |
| 48 | ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම., |
| 49 | ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම., |
| 50 | ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., |
| 51 | ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම., |
| 52 | ගරු ඩී. වී. චානක මහතා, පා.ම., |
| 53 | ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා, පා.ම., |
| 54 | ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා, පා.ම., |
| 55 | ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා, පා.ම., |
| 56 | ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා, පා.ම., |
| 57 | ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම., |
| 58 | ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., |
| 59 | ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම., |
| 60 | ගරු නයන වාසලතිලක මහතා, පා.ම., |
| 61 | ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය, පා.ම., |
| 62 | ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා, පා.ම., |
| 63 | ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා, පා.ම., |
| 64 | ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය, පා.ම., |
| 65 | ගරු අර්කම් ඉල්යාස් මහතා, පා.ම., |
| 66 | ගරු ඔෂානි උමංගා මහත්මිය, පා.ම., |
| 67 | ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය, පා.ම., |
| 68 | ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා, පා.ම., |
| 69 | ගරු චමින්ද ලලිත් කුමාර මහතා, පා.ම., |
| 70 | ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., |
| 71 | ගරු ලසිත් භාෂණ ගමගේ මහතා, පා.ම., |
| 72 | ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා, පා.ම., |
| 73 | ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම., |
| 74 | ගරු අශෝක ගුණසේන මහතා, පා.ම., |
| 75 | ගරු ගයාත් ජනක මහතා, පා.ම., |
| 76 | ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම., |
| 77 | ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., |
| 78 | ගරු ටී.කේ. ජයසුන්දර මහතා, පා.ම., |
| 79 | ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා, පා.ම., |
| 80 | ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය, පා.ම., |
| 81 | ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා, පා.ම., |
| 82 | ගරු නන්දන පත්මකුමාර මහතා, පා.ම., |
| 83 | ගරු අරුණ පනාගොඩ මහතා, පා.ම., |
| 84 | ගරු නිශාන්ත පෙරේරා මහතා, පා.ම., |
| 85 | ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා, පා.ම., |
| 86 | ගරු අමිල ප්‍රසාද් මහතා, පා.ම., |
| 87 | ගරු විජේසිරි බස්නායක මහතා, පා.ම., |
| 88 | ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., |
| 89 | ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම., |
| 90 | ගරු රුවන් මාපලගම මහතා, පා.ම., |
| 91 | ගරු ධනුෂ්ක රංගනාත් මහතා, පා.ම., |
| 92 | ගරු සංජීව රණසිංහ මහතා, පා.ම., |
| 93 | ගරු රුවන් විජේවීර මහතා, පා.ම., |
| 94 | ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., |
| 95 | ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම., |
| 96 | ගරු ජගත් විතාන මහතා, පා.ම., |
| 97 | ගරු ෆස්මින් ෂරීෆ් මහතා, පා.ම., |
| 98 | ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම., |
| 99 | ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය, පා.ම., |
| 100 | ගරු දේවානන්ද සුරවීර මහතා, පා.ම., |
| 101 | ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම., |
| 102 | ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා, පා.ම., |
| 103 | ගරු අරවින්ද සෙනරත් මහතා, පා.ම., |
| 104 | ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම., |
| 105 | ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා, පා.ම., |
| 106 | ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම., |
| 107 | ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., |
| 108 | ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය, පා.ම., |
| 109 | ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා, පා.ම., |
| 110 | ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා, පා.ම., |
| 111 | ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා, පා.ම., |
| 112 | ගරු නිශාන්ත ජයවීර මහතා, පා.ම., |

(ආ) අදාළ නොවේ.

## බිත්තර වී අවශ්‍යතාව සහ තොග පවත්වාගෙන යාම: විස්තර

විතை நெல்லுக்கான தேவைப்பாடும் இருப்பைப் பேணுதலும்: விபரம்

REQUIREMENT AND MAINTENANCE OF SEED PADDY STOCKS: DETAILS

220/2024

**3.** `ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට රජය සතුව ඇති බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර වී අවශ්‍යතාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විවිධ කාලගුණික හා දේශගුණික විපර්යාස හේතුවෙන් බිත්තර වී අවශ්‍යතාව ඉහළ බැවින් රජය සතුව ප්‍රමාණවත් බිත්තර වී තොගයක් පවත්වා ගෙන යාම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது அரசாங்கத்தின் வசமுள்ள விதை நெல்லின் அளவு யாது என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டிலிருந்து இற்றைவரை, இலங்கையில் விதை நெல்லுக்கான தேவைப் பாடு ஒவ்வொரு வருடத்துக்கேற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iii) பல்வேறு வானிலை மற்றும் காலநிலை மாற்றங்களின் காரணமாக விதை நெல்லின் தேவை அதிகரித்திருப்பதால், அரசாங்கத்திடம் போதியளவு விதை நெல் இருப்பைத் தக்க வைத்துக்கொள்வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) quantity of seed paddy in possession of the Government at present;

(ii) quantity of seed paddy Sri Lanka needed in each of the years from 2020 to date, separately; and

(iii) measures taken by the Government to maintain an adequate stock of seed paddy as the demand for seed paddy has become high because of various weather and climate changes?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) වී බුසල් 147,932කි.

(ii)

| වර්ෂය | බිත්තර වී අවශ්‍යතාව (බුසල්) |
|---|---|
| 2020 | 6,042,270 |
| 2021 | 6,358,535 |
| 2022 | 6,287,575 |
| 2023 | 6,588,385 |
| 2024 | 6,439,945 |

(iii) 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වී පර්යේෂණායතනවල අභිජනන වී නිෂ්පාදනය කිරීම.

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බිත්තර වී ගොවිපළවල් තුළ අත්තිවාරම් බීජ, ලියාපදිංචි බීජ සහ සහතික බීජ නිෂ්පාදනය කිරීම.

3. පෞද්ගලික බීජ නිෂ්පාදකයින්, බීජ නිෂ්පාදන සමිති සහ පෞද්ගලික සමාගම් මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලියාපදිංචි බීජ යොදා ගෙන සහතික බීජ නිෂ්පාදනය කරනු ලබන අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් එම බීජ නිෂ්පාදන වැඩසටහන් නියාමනය කෙරේ.

4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ අංශය කොන්ත්‍රාත් ක්‍රමයට ගොවීන්ගේ කුඹුරුවල සහතික බීජ නිෂ්පාදනයක් කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 4 - 341/2024 - (1), the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam.

## මඩකලපුව දිස්ත්‍රික්කයේ කුඩා වැව්: ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව
## மட்டக்களப்பு மாவட்டத்திலுள்ள சிறு குளங்கள்: புனரமைப்பும் பராமரிப்பும்
## SMALL TANKS IN BATTICALOA DISTRICT: RESTORATION AND MAINTENANCE

341/2024

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කුඩා වැව් 478ක් පමණ තිබෙන බවත්;

(ii) එම වැව් අතරින්, වැව් 200කට වඩා අඩු සංඛ්‍යාවක් පමණක් නඩත්තු කරන අතර ඉතිරි වැව් නිසි පරිදි නඩත්තු නොකරන බවත්;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) එම වැව් ප්‍රතිසංස්කරණය කර නඩත්තු කරන්නේ නම්, ප්‍රදේශයේ ගොවීන් සවිබල ගැන්විය හැකි බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් නඩත්තු නොකරන වැව්, නිසි පරිදි නඩත්තු කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தில் கமத்தொழில் திணைக்களத்தின்கீழ் சுமார் 478 சிறு குளங்கள் காணப்படுகின்றன என்பதையும்;

(ii) மேற்படி குளங்களுள், 200இற்கும் குறைவான குளங்கள் மட்டுமே பராமரிக்கப்படுவதுடன், எஞ்சிய குளங்கள் உரிய முறையில் பராமரிக்கப் படுதில்லை என்பதையும்;

(iii) மேற்படி குளங்களைப் புனரமைத்துப் பராமரிப்ப தாயின், பிரதேசத்திலுள்ள விவசாயிகளை வலுப்படுத்த முடியும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ஆமெனில், பராமரிக்கப்படாத மேற்குறிப்பிட்ட குளங்களை உரிய முறையில் பராமரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he accept that -

(i) there are 478 small tanks under the Department of Agriculture within the Batticaloa District;

(ii) only less than 200 such tanks are maintained while others go without proper maintenance; and

(iii) the farmers in the area can be empowered, if those tanks are restored and maintained?

(b) If so, will he inform this House whether steps will be taken to properly maintain the above-mentioned tanks which are not properly maintained?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයෙහි සඳහන් ආකාරයට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ වැව් කිසිවක් නොමැති බව කාරුණිකව දන්වා සිටිනවා.

## නීති විරෝධී විදේශ සංක්‍රමණිකයන්: විස්තර
## சட்டவிரோத வெளிநாட்டுக் குடியேறிகள்: விபரம்
## ILLEGAL FOREIGN IMMIGRANTS: DETAILS

624/2025

5. **ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන නීති විරෝධී විදේශ සංක්‍රමණිකයන් රඳවා තබා ගැනීම සඳහා මධ්‍යස්ථානයක් මිරිහාන ප්‍රදේශයේ පිහිටුවා ඇති බව දන්නේද;

(ii) එම මධ්‍යස්ථානයේ මේ වනවිට රඳවා තබා සිටින විදේශ සංක්‍රමණිකයන් සංඛ්‍යාව එම එක් එක් පුද්ගලයාගේ රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීති විරෝධී විදේශ සංක්‍රමණිකයන් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වීම පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்குப் புலம்பெயரும் சட்டவிரோத வெளிநாட்டுக் குடியேறிகளைத் தடுத்து வைத்திருப்பதற்கான ஒரு நிலையம் மிரிஹான பிரதேசத்தில் அமைக்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) அந்தத் தடுப்பு நிலையத்தில் இன்றளவில் தடுத்து வைக்கப்பட்டிருக்கும் வெளிநாட்டுக் குடியேறி களின் எண்ணிக்கை, அத்தகைய ஒவ்வொரு வரினதும் நாட்டுக்கு அமைவாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) சட்டவிரோத வெளிநாட்டுக் குடியேறிகள் இலங்கைக்குப் புலம்பெயர்வதைக் கட்டுப்படுத்த மேற்கொள்ளப்படவிருக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that a detention centre has been established in the Mirihana area for the purpose of detaining illegal foreign immigrants who migrate to Sri Lanka;

(ii) the current number of foreign immigrants detained in that centre, separately by each individual's country; and

(iii) the measures that will be taken to control the illegal immigration of foreign nationals from coming into Sri Lanka?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

1988.07.19 දින රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් පළ කළ අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් රඳවා තැබීමේ ස්ථානයක් ලෙස නිවේදනය කර ඇත.

(ii) මේ වනවිට නොමැත. එහි නඩත්තු කටයුතු සිදු කරමින් පවතී.

(iii) ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රත්‍යන්ත පාලන අංශය හා විමර්ශන හා මෙහෙයුම් අංශය මඟින්, 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත, එහි සංශෝධනයන් හා රෙගුලාසි මඟින් පැනවූ විධිවිධානයන් මෙන්ම ජාත්‍යන්තර සම්මුතීන්වල විධිවිධානයන්ට අනුකූලව නීති විරෝධී සංක්‍රමණිකයන් ශ්‍රී ලංකාවට පැමිණීම මෙන්ම ශ්‍රී ලංකාවෙන් පිටතට සංක්‍රමණය වීම පාලනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග සිදු කරයි.

- නීති විරෝධී සංක්‍රමණ වැළැක්වීම සඳහා ආගමන විගමන ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය හා සම්බන්ධ අසාදු ලේඛනයක් පවත්වාගෙන යාම.
- Interpol ආයතනයේ දත්ත පද්ධතිය, ආගමන විගමන ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය හා ඒකාබද්ධ කිරීම.
- නීති විරෝධී සංක්‍රමණ පාලනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණුව ලැබූ බලයලත් නිලධාරින් පිරිසකගෙන් සමන්විත දේශ සීමා ආවේක්ෂණ ඒකකයක් පිහිටුවීම හා එම ඒකකයේ බලයලත් නිලධාරියෙකු 2024 වර්ෂයේ සිට බාලි ක්‍රියාවලියේ - Bali process- කලාපීය සහායක කාර්යාලය -RSO- පිහිටි තායිලන්තයේ ස්ථානගත කිරීම.
- විද්‍යුත් සංචරණ අනුමැතිය - ETA - මඟින් වීසා ලබා දීම සිදු කිරීමේදී තොරතුරු කල්තියා ලැබෙන බැවින් ඒවා කාලීන අධ්‍යයනය හා විශ්ලේෂණය කිරීම සඳහා අවදානම් තක්සේරු මධ්‍යස්ථාන පිහිටුවීම හා මෙම විද්‍යුත් සංචරණ අනුමැතිය - ETA - මඟින් වීසා ලබා දීම 2025.10.01 දින සිට සියලුම රටවලට අනිවාර්ය කිරීමට කටයුතු සූදානම් කිරීම තුළින් පූර්ව අවදානම් තක්සේරුව තවදුරටත් විධිමත් කිරීම.

(ආ) පැන නොනඟී.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 6 - 1113/2025 - (1), the Hon. Roshan Akmeemana.

**ගරු ගයාන් ජනක මහතා**
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තැපැල් කාර්යාල: ස්ථිර ගොඩනැඟිලි
## கிளிநொச்சி மாவட்ட தபாலகங்கள்: நிரந்தர கட்டிடங்கள்
## POST OFFICES IN KILINOCHCHI DISTRICT: PERMANENT BUILDINGS

1179/2025

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ -

(i) තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල ශ්‍රේණිගත කිරීම් අනුව ක්‍රියාත්මක වන්නේද;

(ii) තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව ශ්‍රේණි අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ස්ථිර ඉඩම් හා ගොඩනැඟිලි සහිත/රහිත තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) දිස්ත්‍රික්කයේ ස්ථිර ගොඩනැඟිලි නොමැති උප තැපැල් කාර්යාලවලට ස්ථිර ගොඩනැඟිලි ලබා දෙන කාල වකවානු කවරේද;

(v) කිලිනොච්චි, පරන්තන්, පච්චිලෙයිප්පල්ලි සහ පුනරින් තැපැල් කාර්යාලවලට නවීන පහසුකම් සහ පරිගණක පහසුකම් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) භාරතිපුරම්, පුන්නෙයිනීරාවී සහ පල්ලික්කුඩා ප්‍රදේශවල උප තැපැල් කාර්යාල පිහිටුවිය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, 2016.09.05 දිනැති මාගේ ලිපිය අනුව අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධතා නිලධාරි විසින් තැපැල්පතිට යොමු කළ 2016.09.09 දිනැති අංක PPS&MR / HR / 09-182 ලිපියට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) கிளிநொச்சி மாவட்டத்தில் -

(i) இயங்குகின்ற தபாலகங்கள் மற்றும் உப தபாலகங்கள் தரப்படுத்தலின் அடிப்படையில் இயங்குகின்றனவா என்பதையும்;

(ii) தபாலகங்கள் மற்றும் உப தபாலகங்களின் எண்ணிக்கை தரப்படுத்தலின் அடிப்படையில் வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) நிரந்தரக் காணி மற்றும் கட்டிட வசதிகளோடு / வசதிகளின்றி இயங்கும் தபாலகங்கள், உப தபாலகங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) மாவட்டத்தில் நிரந்தரக் கட்டிடங்களின்றி இயங்கும் உப தபாலகங்களுக்கு நிரந்தரக் கட்டிடங்கள் வழங்கப்படும் காலப்பகுதி யாது என்பதையும்;

(v) கிளிநொச்சி, பரந்தன், பச்சிலைப்பள்ளி மற்றும் பூநகரி ஆகிய தபாலகங்களில் நவீன வசதிகள் மற்றும் கணினி வசதிகள் காணப்படுகின்றனவா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பாரதிபுரம், புன்னைநீராவி மற்றும் பள்ளிக்குடா ஆகிய பிதேசங்களில் உப தபாலகங்கள் நிறுவப் பட வேண்டும் என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், 2016.09.05ஆம் திகதிய எனது கடிதத்தின் பிரகாரம் அமைச்சரின் பொது மக்கள் தொடர்பாடல் அலுவலரால் தபால்மா அதிபருக்கு அனுப்பப்பட்ட 2016.09.09ஆம் திகதிய PPS&MR/HR/09-182ஆம் இலக்கக் கடிதம் தொடர்பாக இதுவரையில் எதுவித நடவடிக்கை யும் மேற்கொள்ளப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he state, in respect of the Kilinochchi District,-

(i) whether post offices and sub-post offices are functioning according to the ranking;

(ii) the number of post offices and sub-post offices according to the ranking, separately;

(iii) the number of post offices and sub-post offices with/without permanent lands and buildings, separately;

(iv) timeframe for giving permanent buildings for sub-post offices which do not have permanent buildings; and

(v) whether post offices at Kilinochchi, Paranthan, Pachchilaippalli and Pooneryn have modern facilities and computers?

(b) Will he also state -

(i) whether he accepts that sub-post offices should be established in Bharathipuram, Punnaineeravi and Pallikkuda;

(ii) if so, the reasons for not taking any action about the letter No. PPS&MR/HR/09-182 dated 09.09.2016 sent by the Minister's Public Relations Officer to the Postmaster General according to my letter dated 05.09.2016?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ප්‍රධාන තැපැල් කාර්යාල - 01
I පෙළ - 03
II පෙළ - 01
උප තැපැල් කාර්යාල - 38

(iii)

| තැපැල් කාර්යාල | |
|---|---|
| ස්ථිර ඉඩම් හා ගොඩනැඟිලි සහිත | ස්ථිර ඉඩම් හා ගොඩනැඟිලි රහිත |
| කිලිනොච්චි | |
| පල්ලෙයි | |
| තලයඩි | |
| පරන්තන් | |
| පූනාකරි | |
| උප තැපැල් කාර්යාල | |
| ස්ථිර ඉඩම් හා ගොඩනැඟිලි සහිත | ස්ථිර ඉඩම් හා ගොඩනැඟිලි රහිත |
| අක්කරායන්කුලම් | අම්බල්නගර් |
| රාමනාදපුරම් | කල්මඩුනගර් |
| ස්කන්දපුරම් | කරඩිපොක්කු |
| වඩ්ඩකච්චි | කෝනාවිල් |
| වන්නේරිකුලම් | තිරුනගර් |
| උරුතිරපුරම් | තිරුවෙයියාරු |
| විනයාගපුරම් | එලුදුමඩ්ඩුවාල් |
| | ඉයක්කච්චි |
| | කිලාලි |
| | මුහමාලෙයි |
| | සෝරන්පත්තු |
| | තඩ්ඩුවාන්කොඩි |
| | අලියාවලයි |
| | වෙම්පියන්පට්ටු |
| | චුන්ඩිකුලම් |
| | මුල්ලියාන් |

| | |
|---|---|
| | කුඩතනෙයි |
| | නාගර් කෝවිල් |
| | කන්දවාලෙයි |
| | කුන්වුපරන්තන් |
| | මුරසුමෝඩෙ |
| | පුලියම්පොක්කනයි |
| | සිවනගර් |
| | දර්මපුරම් |
| | වෙඩ්ඩියාර්කුරිච්චි |
| | ඉරනයිතිව් |
| | කවුදාරිමුනෙයි |
| | පල්ලවරයාන්කඩ්ඩු |
| | පුනකරි - නල්ලූර් |
| | සිවපුරම් |
| | වීරවිල් |

(iv) උප තැපැල් කාර්යාලය සඳහා සුදුසු ගොඩනැඟිල්ලක් උප තැපැල් ස්ථානාධිපති විසින් සපයා ගත යුතු බැවින්, තැපැල් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මඟින් උප තැපැල් කාර්යාල සඳහා ගොඩනැඟිලි ඉදි කිරීම සාමාන්‍යයෙන් සිදු නොකෙරේ.

(v) කිලිනොච්චි, පරන්තන් හා පුනරින් යන තැපැල් කාර්යාල සඳහා නවීන පහසුකම් හා පරිගණක පහසුකම් සපයා ඇත.

පච්චිලෙයිප්පල්ලි නමින් තැපැල් හෝ උප තැපැල් කාර්යාලයක් නොමැත.

(ආ) (i) මෙම ප්‍රදේශවල පදිංචිකරුවන් හට තැපැල් පහසුකම් ලබා ගැනීමට කිලෝමීටර 2-3ක් අතර දුරක් තුළ දැනටමත් තැපැල් හෝ උප තැපැල් කාර්යාලයක් පිහිටා ඇති බැවින් ඒ හරහා ඔවුන්ට තැපැල් සේවා සපයා ගැනීමට හැකියාව පවතී.

(ii) මෙවැනි ලිපියක් තැපැල්පති වෙත ලද බවට හා ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව, දැනට පවත්නා ලේඛන අනුව තොරතුරු සොයා ගැනීමට නොමැත.

(ඇ) අදාළ නොවේ.

## මහ නැඟුම ආයතනය: වර්තමාන තත්ත්වය
### மக நெகும நிறுவனம்: தற்போதைய நிலை
### MAGA NEGUMA: CURRENT STATUS

1242/2025

**9. ගරු ගයාන් ජනක මහතා (ගරු තිළිණ සමරකෝන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு திலின சமரக்கோன் சார்பாக)
(The Hon. Gayan Janaka on behalf of the Hon. Thilina Samarakoon)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහ නැඟුම ආයතනය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ආයතනයේ ක්‍රියාත්මකව පවතින කාර්යාල සහ කර්මාන්ත අංගණ කවරේද;

(iii) ක්‍රියාත්මක නොවේ නම්, වසා දමා ඇති කාර්යාල සහ කර්මාන්ත අංගණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) අනුරාධපුර, කැකිරාව, ගනේවල්පොල ප්‍රදේශයේ මහ නැඟුම අංගණයක් පවතින බව දන්නේද;

(ii) එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එය වසා දැමීමට හේතු කවරේද;

(iv) එහි පවතින යන්ත්‍රෝපකරණ සහ වාහන වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඒවායේ වර්තමාන වටිනාකම කොපමණද;

(vi) ඒවා ශ්‍රී ලංකාවේ මාර්ග සංවර්ධනයට භාවිත කිරීමට වැඩ පිළිවෙළක් තිබේද;

(vii) එම මධ්‍යස්ථානය තවදුරටත් පවත්වාගෙන නොයන්නේ නම්, එය පවරා ගනු ලබන පදනම කවරේද;

(viii) එය පවරා ගනු ලබන ආයතනය කවරේද;

(ix) පවරා ගැනීම සඳහා ගත වන කාලය කොපමණද;

(x) පවරා ගනු ලබන කාල වකවානු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக நெகும நிறுவனம் தற்போது இயங்குகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த நிறுவனத்தில் செயற்பாட்டு நிலையிலுள்ள அலுவலகங்கள் மற்றும் கைத்தொழில் தளங்கள் யாவை என்பதையும்;

(iii) செயற்படாதிருப்பின், மூடப்பட்டுள்ள அலுவலகங்கள் மற்றும் கைத்தொழில் தளங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அநுராதபுரம், கெக்கிராவ, கனேவல்பொல பிரதேசத்தில் மக நெகும வேலைத் தளமொன்று உள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(ii) அதன் தற்போதைய நிலைமை யாது என்பதையும்;

(iii) அதனை மூடுவதற்கான காரணம் யாது என்பதையும்;

(iv) அங்கு காணப்படுகின்ற இயந்திர உபகரணங்கள் மற்றும் வாகனங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(v) அவற்றின் தற்போதைய பெறுமதி எவ்வளவு என்பதையும்;

(vi) அவற்றை இலங்கையிலுள்ள வீதிகளை அபிவிருத்தி செய்வதற்காகப் பயன்படுத்தும் வேலைத்திட்டமொன்று உள்ளதா என்பதையும்;

(vii) அந்த மத்திய நிலையத்தைத் தொடர்ந்தும் பயன்படுத்தாவிடின், அதனைக் கையகப் படுத்தும் அடிப்படை யாது என்பதையும்;

(viii) அதனைக் கையகப்படுத்தும் நிறுவனம் யாது என்பதையும்;

(ix) கையகப்படுத்த எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(x) எக்காலப் பகுதியில் கையகப்படுத்தப்படும் என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ගයාන් ජනක මහතා]

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he state -

(i) whether Maga Neguma is still functioning;

(ii) if so, its offices and industrial yards that are functioning; and

(iii) if defunct, the offices and industrial yards that have been closed down?

(b) Will he also state -

(i) whether he is aware of a Maga Neguma yard in Ganewalpola, Kekirawa in Anuradhapura;

(ii) its present state;

(iii) the reasons for its closure;

(iv) the machinery and vehicles available there, separately;

(v) their present value;

(vi) whether a programme is in place to use them for developing Sri Lanka's roads;

(vii) if the centre is no longer functioning, the basis of its acquisition;

(viii) the institution which will acquire it;

(ix) the time duration that will take for its acquisition; and

(x) the time period during which it will be acquired?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) නිෂ්පාදන හා ඉදිකිරීම් කටයුතු සිදු නොවන අතර ඇවර කිරීමට අදාළ කටයුතු සිදු වෙමින් පවතී.

| (a) මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පෞද්ගලික සමාගම | (b) මහ නැගුම ඉමල්ෂන් නිෂ්පාදන පෞද්ගලික සමාගම | (c) මහ නැගුම උපදේශන සහ කළමනාකරණ පෞද්ගලික සමාගම |
|---|---|---|
| · සියලු සේවකයින් විශ්‍රාම ගන්වා ඇත. · ඇවර කිරීමට පෙර සැපයුම්කරුවන් වෙනුවෙන් සිදු කළ යුතු ගෙවීම් ආදී කටයුතු පවත්වාගෙන යෑම සඳහා අවම සේවක සංඛ්‍යාවක් කාර්ය පැවරුම් යටතේ පවත්වා ගෙන යනු ලබයි. · කිසිදු නිෂ්පාදන හෝ ඉදිකිරීම් කටයුත්තක් සිදු කරනු නොලබයි. | · මාර්ග සංවර්ධන අධිකාරියට අයත් යන්ත්‍රසූත්‍ර හා භාණ්ඩ නැවත මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත. | · ඇවර කිරීමට අදාළ කටයුතු ආරම්භ කර ඇත. |

(ii)

| (a) මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පෞද්ගලික සමාගම | (b) මහ නැගුම ඉමල්ෂන් නිෂ්පාදන පෞද්ගලික සමාගම | (c) මග නැගුම උපදේශන සහ කළමනාකරණ පෞද්ගලික සමාගම |
|---|---|---|
| පැලියගොඩ ප්‍රධාන කාර්යාලය | මෙම සමාගම භාවිත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉමල්ෂන් යන්ත්‍රාගාරය නැවත ක්‍රියාත්මක කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තීරණය කර ඇති අතර අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව නැවත ක්‍රියාකරවීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අඟුලාන පිහිටි ප්‍රධාන කාර්යාලය සහ අටබාගේ පෙරමුසු යන්ත්‍රාගාරය |

(iii) (a) මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පෞද්ගලික සමාගම - ආරක්ෂාව සහ අදාළ වැඩබිම්හි වගකීම් කටයුතු වෙනුවෙන් අත්‍යවශ්‍ය සේවක ප්‍රමාණයක් රඳවා ඇත.

| | වැඩබිම් | පෞද්ගලික ආරක්ෂක අංශ | පවත්වාගෙන යන අවම සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| i | පැලියගොඩ | 05 | 01 |
| ii | ගනේවල්පොල | 06 | 02 |
| iii | කුණ්ඩසාලේ | 03 | 01 |
| iv | අම්බලන්ගොඩ | 04 | 01 |
| v | මයුරපුර | 01 | 01 |
| vi | රණමයුරපුර | 01 | 01 |
| vii | වීරවිල | 01 | 01 |

(b) මහ නැගුම ඉමල්ෂන් නිෂ්පාදන පෞද්ගලික සමාගම - මෙම සමාගම ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොමැති අතර ප්‍රධාන කාර්යාලය පැවති අඟුලානේ පිහිටි ගොඩනැගිල්ල පමණක් මේ වනවිට භාවිතයට නොගෙන වසා දමා ඇත.

(ආ) (i) ඔව්.

(ii) අක්‍රිය මට්ටමේ පවතී.

(iii) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0394/608/033 හා 2023.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මහ නැගුම සමාගම් ඇවර කිරීමට නියමිත බැවින්.

(iv) ගනේවල්පොල වැඩබිමෙහි ඇති යන්ත්‍රාගාර සංඛ්‍යාව 04කි.

| | | |
|---|---|---|
| 1. | පෙරමුසු යන්ත්‍රාගාරය | 01 |
| 2. | ක්‍රෂර් යන්ත්‍රාගාරය | 01 |
| 3. | VSI ක්‍රෂර් යන්ත්‍රාගාරය | 01 |
| 4. | කොන්ක්‍රීට් යන්ත්‍රාගාරය | 01 |

ගනේවල්පොල වැඩබිමෙහි නවතා ඇති වාහන සංඛ්‍යාව 33කි. ඒවා මෙසේයි.

| No. | Description | Registration Number |
|---|---|---|
| 1 | Motor Lorry 6 Wheel-Tipper | LJ-3845 |
| 2 | Motor Lorry 6 Wheel-Tipper | LH-6959 |
| 3 | Motor Lorry 6 Wheel-Tipper | LH-6943 |
| 4 | Motor Lorry 6 Wheel-Tipper | LH-6949 |
| 5 | Motor Lorry 6 Wheel-Tipper | LH-9528 |
| 6 | Motor Lorry 6 Wheel-Tipper | LO-5864 |
| 7 | Motor Lorry 6 Wheel-Tipper | LO-5865 |
| 8 | Motor Lorry 6 Wheel-Tipper | LO-5866 |
| 9 | Motor Lorry 6 Wheel-Tipper | LO-5868 |
| 10 | Motor Lorry 10 Wheel-Tipper | LJ-6543 |
| 11 | Motor Lorry 10 Wheel-Tipper | LI-5465 |
| 12 | Motor Lorry 10 Wheel-Tipper | LI-5464 |
| 13 | Motor Lorry 10 Wheel-Tipper | LI-1542 |
| 14 | Motor Cycle | WQ-3379 |
| 15 | Tractor | RB-0663 |
| 16 | Tractor | RB-8304 |
| 17 | Tractor | RB-9242 |
| 18 | Trailer Bowser | |
| 19 | Air Compressor | MAC 004 |
| 20 | Air Compressor | MAC 011 |
| 21 | Air Compressor | MAC 012 |
| 22 | Wheel Loader | MWL 002 |
| 23 | Wheel Loader | MWL 004 |
| 24 | Wheel Loader | MWL 005 |
| 25 | Excavator | MEX 101 |
| 26 | Excavator | MEX 104 |
| 27 | Excavator with Breaker | MEX 114 |
| 28 | Excavator | MEX 115 |
| 29 | Excavator | MEX 116 |
| 30 | Excavator with Breaker | MEX 117 |
| 31 | Excavator | MEX 118 |
| 32 | Generator (Ganewalpola) | MGEN-010 |
| 33 | BARGE | MFB-001 |

(v) 2024 වර්ෂයෙහි සැප්තැම්බර් මස මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ මහ නැඟුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නිලධාරීන් සමඟ සිදු කරන ලද තක්සේරුවට අනුව,

ගනේවල්පොල වැඩබිමෙහි ඇති යන්ත්‍රාගාරවල වටිනාකම - රුපියල් 91,000,000.00

ගනේවල්පොල වැඩබිමෙහි නවතා ඇති වාහනවල වටිනාකම - රුපියල් 72,710,000.00

(vi) ඔව්.

- එහෙත් ආයතනයට විරුද්ධව සේවා සපයන්නන් කිහිපදෙනෙකු පවරා ඇති නඩු කටයුතු හේතුවෙන් අධිකරණයේ අවසරයකින් තොරව මෙම උපකරණ භාවිතයට ගත නොහැක.

- අමප/25/0858/809/064 හා 2025.05.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම සමාගම ඇවර කිරීමට යටත්ව රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන වෙත බදු පදනම මත එම යන්ත්‍රෝපකරණ නිදහස් කිරීමට අනුමත කර ඇත. ඒ අනුව නීතිමය අවසරය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටී.

(vii) කොළඹ වාණිජ මහාධිකරණයේ පවතින CHC/32/23/CO දරන නඩුකරය මත එසේ පවරා දීමට දැනට නොහැක.

(viii) පවරා දෙනු ලබන්නේ නම් සමාගමේ තනි අයිතිකරු වන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දිය යුතුය.

(ix) කොළඹ වාණිජ මහාධිකරණයේ පවතින CHC/32/23/CO දරන නඩුවෙන් ලබා දෙන තීන්දු මත රඳා පවතී.

(x) කොළඹ වාණිජ මහාධිකරණයේ පවතින CHC/32/23/CO දරන නඩුවෙන් ලබා දෙන තීන්දුව මත රඳා පවතී.

(ඇ) අදාළ නොවේ.

## නිවසක් තුළ සිටින පවුල් ඒකක: හඳුනා ගැනීමේ ක්‍රමවේදය

### வீடொன்றிலுள்ள குடும்ப அலகுகள்: அடையாளங்காண்பதற்கான நடைமுறை

### FAMILY UNITS SHARING ONE SINGLE HOUSE: DISTINGUISHMENT PROCEDURE

1257/2025

**10. ගරු ගයාන් ජනක මහතා (ගරු ධර්මප්‍රිය දිසානායක මහතා වෙනුවට)**

(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க சார்பாக)

(The Hon. Gayan Janaka on behalf of the Hon. Dharmapriya Dissanayake)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එක් නිවසක් තුළ පවුල් ඒකක කිහිපයක් ජීවත් වන අවස්ථා තිබෙන බව දන්නේද;

(iii) එක් නිවසක් තුළ පවුල් ඒකක කිහිපයක් ජීවත් වනවිටදී, එම පවුල් සඳහා ඡන්ද නාම ලේඛන සකස් කිරීමේදී, එම පවුල් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට ග්‍රාම නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන විධිමත් ක්‍රමවේදය කවරේද;

(iv) එක් නිවසක් තුළ පවුල් ඒකක කිහිපයක් ජීවත් වනවිටදී, එම පවුල් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ප්‍රායෝගික සහ පරිපාලන ගැටලු පැන නගින බව දන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා විසඳුමක් ලබා දෙන්නේද;

(vi) එම විසඳුම කවරේද;

(vii) විසඳුමක් ලබා නොදෙන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள குடும்ப அலகுகளின் எண்ணிக்கை யாது;

(ii) ஒரு வீட்டுக்குள் பல குடும்ப அலகுகள் வாழும் சந்தர்ப்பங்கள் காணப்படுவதை அவர் அறிவாரா;

[ගරු ගයාන් ජනක මහතා]

(iii) ஒரு வீட்டுக்குள் பல குடும்ப அலகுகள் வாழும் சந்தர்ப்பங்களில், அக்குடும்பங்களுக்கான வாக்காளர் பெயர்ப்பட்டியலைத் தயாரிக் கையில், அக்குடும்பங்களை வெவ்வேறாக அடையாளம் காண்பதற்குக் கிராம உத்தியோகத் தர்களால் பின்பற்றப்படும் முறைசார்ந்த நடைமுறை யாது;

(iv) ஒரு வீட்டுக்குள் பல குடும்ப அலகுகள் வாழும் சந்தர்ப்பங்களில், அக்குடும்பங்களுக்கான செயற் பாடுகளை மேற்கொள்கையில் நடைமுறை ரீதி யான மற்றும் நிருவாக ரீதியான பிரச்சினைகள் எழுவதை அறிவாரா;

(v) ஆமெனில், அதற்கான தீர்வை வழங்குவாரா;

(vi) அத்தீர்வுகள் யாவை;

(vii) தீர்வு வழங்கப்படுவதில்லை எனில், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of family units living in Sri Lanka;

(ii) whether he is aware that there cases where a house is shared by several family units;

(iii) in the case of a house being shared by several family units, the formal procedure that is followed by Grama Niladharis to distinguish between the separate families when preparing the electoral register;

(iv) whether he is aware that practical and administrative problems arise when dealing with the families who share the same house;

(v) if so, whether a solution will be provided for that;

(vi) that solution; and

(vii) if a solution is not provided, the reasons for it?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දත්ත රැස් කිරීමේදී, "පවුල" යන සංකල්පය භාවිත නොකරන අතර, "නිවාස ඒකකය" හා "ගෘහ කාණ්ඩය" යන සංකල්ප භාවිත කරනු ලැබේ. ඒ අනුව, වර්ෂ 2024දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද ජන හා නිවාස සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ පුද්ගලයින් පදිංචි මුළු නිවාස ඒකක මිලියන 6ක් සහ ගෘහ කාණ්ඩ මිලියන 6.1ක් ඇති බවට වාර්තා වී ඇත.

(ii) ඔව්.

(iii) ගෘහ අංකය සමඟ වරහන් තුළ දිගු අංකයක්, එනම්; extension ලබා දී එම ගෘහ කාණ්ඩ වෙන්කර හඳුනා ගත හැකි පරිදි ලියාපදිංචි කිරීම සිදු වේ. නිදර්ශනයක් ලෙස ගෘහ අංකය 27 නම් සහ එම ගෘහයේ (නිවාස ඒකකයේ) ගෘහ කාණ්ඩ තුනක් ජීවත් වන්නේ නම් එම ගෘහ කාණ්ඩ තුළ 27 (1), 27(2), 27(3) ලෙස ලියාපදිංචි කිරීම 1980 අංක 44 දරන ඡන්ද ලියාපදිංචි කිරීමේ පනත ක්‍රියාත්මක වූ මුල් කාලයේ සිට ගෘහ ඒකක හඳුනා ගැනීම සඳහා අවස්ථාවෝචිතව වරිපනම් අංක ලැයිස්තුව හෝ ආහාර පාලක අංක ලැයිස්තුව පාදක කර ගන්නා ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් ග්‍රාම නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.

එසේම එම ලැයිස්තුවල සඳහන් වී නොමැති ගෘහයක් අලුතින් එකතු වනවිට එම ගෘහයට ඉහතින් සඳහන් ගෘහ අංකයට ප්‍රත්‍ය අංකයක් යොදා එනම්; නව ගෘහයට ඉහතින් වූ ගෘහයේ අංකය 27 නම් නව ගෘහයේ අංකය 27/1 ලෙස ලබා දීමට ග්‍රාම නිලධාරින්ට ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය යටතේ උපදෙස් ලබා දී ඇත.

ඡන්ද හිමි නාමලේඛනයට අදාළව යම් ඡන්ද හිමියෙකුගේ නමක් යම් ගෘහයක් යටතේ ලියාපදිංචි කිරීමට එම තැනැත්තාට අදාළ ගෘහයේ සාමාන්‍ය පදිංචියක් තිබිය යුතුය. ඒ අනුව යම් ඡන්ද හිමියෙකුට සාමාන්‍ය පදිංචි ලිපිනයන් එකකට වැඩි සංඛ්‍යාවක් ද තිබිය හැකි අතර, එබඳු අවස්ථාවක ඡන්ද හිමියා ඉල්ලා සිටින එක් ලිපිනයක පමණක් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට නෛතික ප්‍රතිපාදන පවතී. පනතේ මෙම විධිවිධානය යටතේ එක් ගෘහ කාණ්ඩයක් එක් ගෘහයක ලියාපදිංචි නොවී ස්වාමියා, භාර්යාව සහ දරුවන් ඔවුන්ගේ සාමාන්‍ය පදිංචිය සහිත වෙන් වෙන් ගෘහයන් යටතේ විසිරී ලියාපදිංචිවීම ද සිදු විය හැකිය.

පුද්ගලයෙකුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය එම තැනැත්තා සිය පවුලේ සාමාජිකයන් සමඟ වාසය කරන සහ සිය දෛනික සාමාන්‍ය කටයුතු ඉටු කරනු ලබන ස්ථානය ලෙස සලකා කටයුතු කිරීමටත්, බහු ලියාපදිංචිය වැළැක්වීම සඳහා හැකිතාක් දුරට එක් නිවාස ඒකකයක් එකම ලිපිනයක ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙසත්, ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය යටතේ ග්‍රාම නිලධාරින්ට වැඩිදුරටත් උපදෙස් දී ඇත.

(iv) ඔව්.

(v) ඔව්.

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම පනතේ ප්‍රතිපාදන අනුව, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම සිදු කර ඇත. ඒ අනුව, ඡන්ද හිමි නාමලේඛන සකස් කරනු ලබන්නේ ඡන්ද විමසීම පදනම් කරගෙනය. එම නිසා කිසියම් බාහිර පාර්ශ්වයක් ඡන්ද හිමි නාමලේඛන ලියාපදිංචි තොරතුරු ආශ්‍රයෙන් තීරණ ගන්නේ නම් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ නෛතික ප්‍රතිපාදන හා මැතිවරණ කොමිෂන් සභාව ලබා දී ඇති උපදෙස්, නිර්ණායක කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

(vii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Questions under Standing Order 27(2), the Hon. Sajith Premadasa, Leader of the Opposition.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ පළාත් සභා මැතිවරණය පැවැත්වීම පිළිබඳ රජයේ ස්ථාවරය
### நிறைவேற்றதிகார சனாதிபதி முறைமையை நீக்குதல் மற்றும் மாகாண சபைத் தேர்தலை நடாத்தல் பற்றிய அரசின் நிலைப்பாடு
### GOVERNMENT STANCE ON ABOLISHING EXECUTIVE PRESIDENCY AND HOLDING PROVINCIAL COUNCILS ELECTION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

"ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය" යනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. ඒක තමයි රටේ උත්තරීතර නීතිය. ජනතා පරමාධිපත්‍යය උපරිම ලෙස බලගැන්වීමට ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය අන්‍යෝන්‍ය අවබෝධයෙන් මෙන්ම ස්වාධීනව කටයුතු කළ යුතු වෙනවා. බහුතර බලයක් සහිත ආණ්ඩුවක් යටතේ මෙම ආයතන ව්‍යුහයන්හි ස්වාධීනත්වයට බාධා වීම සාමාන්‍ය තත්ත්වයක් වන අතර, එහි වෙනසක් මෙම ආණ්ඩුව යටතේ ද දැකිය නොහැකියි. ආණ්ඩුවේ ජනතා පරමාධිපත්‍යය සුරැකීමේ සද්භාවය පරීක්ෂා කිරීමේ නිර්ණායක වන්නේ ඒවායේ ක්‍රියාකාරිත්වය උපරිම වශයෙන් බලගැන්වීමට සිදු කරන පහසුකම්කරණය සහ හඳුන්වා දෙන ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණයන්ය. ඒ අනුව, ජාතික වශයෙන් වැදගත් වන පහත සඳහන් ප්‍රශ්න මම රජය වෙත යොමු කරනවා.

01. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 194හි සඳහන් පරිදි රජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීමට තවමත් අපේක්ෂා කරන්නේද?

    එසේ නම්, එම කටයුතු මේ වනවිට ආරම්භ කර තිබේද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට මෙම පාර්ලිමේන්තුව සම්බන්ධ කර ගන්නේ කවදා වනවිටද?

02. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ මතය කුමක්ද?

03. ආණ්ඩුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට කටයුතු කරන්නේ නම්, ඒ සඳහා වූ දින වකවානු මේ සභාවට ඉදිරිපත් කරන්නේද?

04. රජය පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන්නේ කවදා වනවිටද?

05. පළාත් සභා මැතිවරණය තවදුරටත් සීමා නිර්ණයකට හිරකොට ප්‍රමාද කිරීම රජයේ ස්ථාවරයද? නැතහොත් පැරණි - සමානුපාතික - ක්‍රමයට පැවැත්වීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය මෙම සභාවට පැහැදිලි කරන්නේද?

06. අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් බිඳී ගිය ජනතා විශ්වාසය නැවත ගොඩනැඟීමට අපේක්ෂා කරන බව වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වෙනවා. ඒ සඳහා ඔබ විසින් පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල පිහිටුවීමට යෝජනා කර තිබෙනවා. එය ඉටු කරන්නේ කවදාද? මේ අතර, මහජන අවධානය වැඩි වශයෙන් යොමුව ඇති නඩු කටයුතු හා සම්බන්ධ ඇතැම් විනිශ්චයකරුවන් ස්ථාන මාරු කිරීම, වැඩ තහනම් කිරීම හා උසස්වීම් ලබා දීම සම්බන්ධයෙන් මේ වනවිට සමාජ කතිකාවක් ආරම්භ වී තිබෙනවා. ඒ සම්බන්ධව ආණ්ඩුවේ ඇගයුම කෙබඳුද?

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමිය ඉදිරියේදී එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සම්ප්‍රදායක් හැටියට රජය පිළිතුරු ලබා දෙන්න කල් ඉල්ලුවාම අපි ඒකට අවස්ථාව ලබා දෙනවා. නමුත්, මේ වාගේ ඉතාම වැදගත් කරුණු ගණනාවක් - විශේෂයෙන්ම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, ඒ පිළිබඳව ජනතාවට දුන් ප්‍රතිඥා, බලාපොරොත්තු, ඒ ඇති වුණු සමාජ ගිවිසුම, ඒක ක්‍රියාත්මක වෙනවාද නැද්ද සහ පළාත් සභා මැතිවරණය පවත්වනවාද, නැද්ද- පිළිබඳව මම හිතන විධියට රජය ඇත්තවශයෙන්ම කරුණු ඉදිරිපත් කරන්නට සූදානම්ව සිටින්නට ඕනෑ. මම දන්නේ නැහැ, මොකක්ද මේකට කල් ඉල්ලන හේතුව කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කරුණු කාරණා ගැන නම් අපට හිතාගන්න පුළුවන් දත්ත ඒක රාශි කරන්න වෙනවා, තොරතුරු ගන්න වෙනවා යනාදී වශයෙන්. මම අහන්න කැමැතියි, ඇයි රජය මේවා පිළිබඳව උත්තරයක් ලබා නොදෙන්නේ කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිව්වා ගරු අගමැතිතුමිය ඇවිල්ලා පිළිතුරු ලබා දෙයි කියලා. ඒ වාගේම මතක තබාගන්න, අපේ ආණ්ඩුව පත් වෙලා තවම අවුරුද්දයි. ඔයගොල්ලන්ට අවුරුදු 3ක් යනකල් පළාත් සභා ඡන්දය තියාගන්න බැරි වුණා. ඒ වාගේම තමයි, මම අර මීට කලින් මතු කළා වාගේම ජාතික වැදගත්කමක් සහිත කරුණක් කියන එක විපක්ෂ නායකතුමාට තවම තේරෙන්නේ නැහැ. අපි මේ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. මේ ප්‍රශ්නය තුළ අධිකරණය ගැනත් අහනවා, විනිශ්චයකාරවරුන්ගේ ස්ථාන මාරු ගැනත් අහනවා, පළාත් සභා ක්‍රමය ගැනත් අහනවා, විධායක ජනාධිපති ක්‍රමය ගැනත් අහනවා. අනේ, කරුණාකර මෙතුමාට කියා දෙන්නකෝ මේ ස්ථාවර නියෝග 27(2)න් මොකක්ද අදහස් කරන්නේ කියන එක.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I think it is clear, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙලාවත් තිබෙනවා නේ. වැඩිපුර තව පැය එකහමාරක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I think the Hon. Minister was clear that the Hon. Prime Minister will answer that Question. Make it very short, please.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, පළාත් සභා මැතිවරණ පැවැත්වීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාත්මක කිරීම කියන මේ දේවල් ආණ්ඩුව ජනතාවට ඉදිරිපත් කරපු බලාපොරොත්තු. මේවා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම, මේ දේවල් ජාතික වශයෙන් වැදගත් නැහැයි කියලා කියන්නේ ඇයි? මේවා ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්න නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chief Government Whip responded with regard to that Question. Shall we move on to the second Question under Standing Order No. 27(2)?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම බොහොම පැහැදිලිව උත්තර දුන්නා, ගරු විපක්ෂ නායකතුමනි. විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් අපේ ස්ථාවරයක් තිබෙනවා. අපි ඒක කියන්නම්. *[බාධා කිරීමක්]* කලබල වෙන්න දෙයක් නැහැ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is the point you make?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අහන ප්‍රශ්නවලට සීමාවක් දාලා නැහැ, අර ප්‍රශ්නය අහන්න බැහැ; මේ ප්‍රශ්නය අහන්න බැහැ; අධිකරණවල විනිශ්චයකාරවරු මාරු කිරීම ගැන අහන්න බැහැ කියලා. අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ, කරුණාකර මේකට උත්තරයක් දෙන්න කියලායි. ඒකට අපට සීමා පනවන්න බැහැ, මේක අහන්න පුළුවන්; අරක අහන්න බැහැ කියලා. එහෙම එකක් නැහැ. ඒ නිසා අපි ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට කියන්නේ මේකයි. අපිව ඒ විධියට සීමා කරන්න හදන්න එපා. ඔබතුමන්ලා උත්තරය දෙන්න. උත්තරයෙන් පස්සේ අපි ඒ ගැන සෑහීමකට පත් වෙන්නේ නැත්නම් ඒ සම්බන්ධයෙන් අපි තීරණයක් ගන්නම්. මේ ස්ථාවර නියෝග යටතේ කිසිම ආකාරයක එවැනි සීමා කිරීමක් කරලා නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
උත්තර නැත්නම් නැහැයි කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The second Question under Standing Order No. 27(2), the Hon. Ravi Karunanayake.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාගේ මුහුණ දැක්කාම අහන්න යන ප්‍රශ්නයත් හිර වෙනවා. අපට වේලාව තිබෙන නිසා මම කාරුණිකව ඉල්ලනවා, මේ සම්බන්ධයෙන් සම්පූර්ණ කාලය ලබා දෙන්න කියලා.

## II

## සරල කළ එකතු කළ අගය මත බද්ද අහෝසි කිරීමෙන් අපනයන ක්ෂේත්‍රයට වන බලපෑම

எளிமைப்படுத்தப்பட்ட சேர்பெறுமதி வரியை ஒழிப்பதனால் ஏற்றுமதித் துறையில் ஏற்படும் தாக்கம்

IMPACT OF ABOLITION OF SIMPLIFIED VALUE ADDED TAX ON EXPORT SECTOR

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, I rise to draw the attention of this House under Standing Order No. 27(2) to the Simplified Value Added Tax - SVAT - system, the abrupt abolishment of which would be effective from 01$^{st}$ October, 2025, which has triggered and will trigger grave and widespread concerns across Sri Lanka's export community; අපනයන ක්ෂේත්‍රයට ලොකුවට බලපෑමක් ඇති කරයි.

On the 17$^{th}$ of September, 2025, during a widely-viewed national television programme, leading export industry representatives - Mr. Yohan Lawrence (JAAF and EASL), Mr. Shiham Marikar (National Chamber of Exporters), Mr. Jayantha Karunaratne (TEA and CTTA), Mr. Pushpika Janadheera (Sri Lanka Association of Manufacturers and Exporters of Rubber Products) and Mr. Sean Van Dort (Sri Lanka Shippers' Council) - spoke unanimously, warning of severe and negative consequences of this decision.

Sir, their testimony highlighted the following points:

- Cash flow paralysis: Under SVAT, exporters had immediate input VAT relief. With its removal, refunds are now delayed for a minimum of 105 to 180 days, effectively forcing exporters to extend an interest-free loan to the State. In particular, for SMEs borrowing at 11 to 20 per cent interest, such delays are devastating.
- Increased bureaucracy: A streamlined, digital system has been replaced with a cumbersome, paper-driven process, diverting scarce resources away from production and market expansion. That is, moving from a technical device into manual intervention.
- Loss of competitiveness: As you know, Sri Lanka is fighting a major competitive battle. Sri Lankan exporters are now disadvantaged compared to their rivals in Bangladesh, Vietnam, India, Indonesia, Laos and the Philippines, where refund systems are faster and more reliable.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ඩොනල්ඩ් ට්‍රම්ප් ඉන්දියාව හැර මේ රටවල් අටට තමයි සියයට 20 tax එක දීලා තිබෙන්නේ කියන එක.

- Erosion of trust: Abrupt and untested policy shifts damage Sri Lanka's investment climate, discouraging both local and foreign investment.
- Sectoral vulnerabilities:

  Regarding the apparel sector, Mr. Lawrence has mentioned that billions of dollars are tied up, crippling factory operations. He has also mentioned that the monthly exports amount to US Dollars 68 billion and roughly, the VAT component is about US Dollars 18 billion. So, that is, roughly, Rs. 2.5 billion off the bottom line.

  With regard to the tea industry, Mr. Karunaratne said that there would be cash delays cascading to smallholders and factories. Then, for rubber, Mr. Janadheera mentioned that high-value inputs would be blocked, undermining competitiveness. Mr. Marikar was of the view that many SMEs and diversified exporters are facing existential collapse while with regard to logistics and shipping, Mr. Van Dort pointed out that the entire ecosystem has been weakened, eroding Sri Lanka's role as a hub. Deemed exporters were not represented, but they are one of the biggest sectors in this SVAT refund mechanism.

Sir, while the Government justifies the decision on the grounds of curbing fraud and revenue leakage, industrial leaders stress that targeted audits, digital monitoring and strict penalties would have been sufficient. Instead, a blanket policy has "carpet-bombed" exporters, delivering no real revenue, but only a cash flow advantage to the Treasury at the expense of those who earn vital foreign exchange.

Sir, at a time when Sri Lanka must raise export earnings from US Dollars 16 to 17 billion in 2024 to US Dollars 36 billion by 2030, as pledged by President Anura Kumara Dissanayake, this policy risks becoming a self-inflicted wound on our most crucial economic sector.

Therefore, the Question I ask from the Hon. Minister of Finance is as follows:

1. Will the Hon. Minister state what immediate remedial measures are being implemented to prevent refund delays spanning minimum 105 days or more, which are creating a crippling cash flow crisis, particularly for small and medium enterprises borrowing at double-digit interest rates?

   Hon. Minister, as you know, even though, today, the fixed statutory rate is at 7.75 per cent, the lending rate is 15 to 20 per cent. That is the biggest problem.

   Given that the small and medium enterprises - SMEs - are essential for export diversification and growth, what special provisions are being made to protect them from insolvency due to a VAT refund delay, ensuring they could continue to operate and contribute to the 2030 goal set by the President?

2. Given that exporters are now effectively financing the Treasury interest-free, will the Ministry introduce an interim digital mechanism to guarantee timely refunds until a fully transparent VAT system is operational? That is, either through a direct VAT live operation or if not, try to see as to how you could bring in this temporary measure.

3. How does the Ministry reconcile the declared target of US Dollars 36 billion in exports by 2030 with a policy that industry leaders unanimously warn will discourage investments, delay operations and erode competitiveness? Will this lead to a case of defeating or discouraging President Anura Kumara Dissanayake's targets and objectives?

4. What safeguards or transitional support mechanisms would be established to protect small and medium enterprises and deemed exporters who supply larger exporters but cannot survive prolonged refund delays from collapse due to blocked working capital?

5. What is the projected financial benefit to the Treasury from abolishing SVAT, and how does the Ministry justify such short-term gains against the far greater foreign exchange losses and employment risks from weakened exports and company closures?

   Sir, when I was coming, three very big companies were discussing whether this SVAT would be taken off. For entrepôt trading, there is no SVAT. I am informed that there is a surreptitious attempt to bring entrepôt trading as well under SVAT. If that happens, shipping lines, airlines and every sector would be involved and there would be a complete collapse. Hon. Minister, you are practical and you are aware of this. Therefore, please ensure that there is a bifurcation between SVAT and entrepôt trading.

[ගරු රවි කරුණානායක මහතා]

6. Why has the Ministry reverted to a manual, bureaucratic refund process instead of introducing a real-time, online transaction-based VAT system that would both reduce fraud and preserve exporter liquidity?

7. Does the Government acknowledge that implementing IMF conditions without adapting them to Sri Lanka's ground realities risks a collapse of local production substituted by imports, forcing exporters into import-dependent survival models merely to meet cash flow and delivery timelines? If so, who will be held accountable for that catastrophe?

   Sir, මේකෙන් අර්ථකථනය වෙන්නේ මොකක්ද? අද මේ රටේ නිෂ්පාදනය කරලා අපනයනය කිරීම ගැටලුවක් වෙලා තිබෙනවා. මේ VAT ප්‍රශ්නය නිසා ආනයනය කිරීම් කරලා ඒවායෙන් කොටසක් උපයෝගි කර ගනීවි, අපනයනය කරන්න. ඒක ඉතා භයානකකාරී තත්ත්වයක් වෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ මේ දෙස ඉතාම ප්‍රායෝගිකව බලන්න කියලායි.

8. With barely a week remaining before SVAT is abolished, will the Hon. Minister explain what recourse or compensatory measures exist for exporters already struggling with domestic constraints and foreign market pressures? Does the Government accept that once a foreign buyer is lost, regaining that market is extremely difficult, if not impossible?

9. How many billions of rupees in VAT refunds are currently outstanding to exporters across all sectors and what is the specific, time-bound Action Plan targeted to clear that backlog?

   I am informed that there are more than Rs. 120 billion due as refunds spanning over the last 15 years. So, this is the problem that the exporters are facing.

10. Finally, as the new system creates a massive administrative burden for both exporters and the Inland Revenue Department, what digital system is being developed to automate and streamline the refund process and what is its definitive launch date? Will the Ministry establish a real-time monitoring and feedback mechanism to review the actual impact of abolishing SVAT and commit itself to revisiting or reversing the policy, should the adverse outcomes predicted by industry stakeholders come to pass?

Thank you, Sir.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (** වැඩබලන කම්කරු අමාත්‍ය සහ **මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்திப் பதில் அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Acting Minister of Finance, Planning and Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

Hon. Minister, I understand that some time is required to answer that. But, there is only one more week before its abolition. So, by the time you answer the Question, the SVAT would have already been abolished. අපි මේ කාරණා අහන්නේ, මේ රටේ අපනයන වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවක් තිබෙන නිසා. ඉතින්, පිළිතුර ලබා දීම සඳහා සුමාන දෙකක් ගන්නවා කියන්නේ, ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන ලබන 07වැනිදා වෙනකොට මේක අහෝසි වෙලා අවසන්. ඒ නිසා තමයි මෙහි පිළිතුරට ප්‍රමුඛත්වය ලැබිය යුත්තේ. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් අද හෝ හෙට හෝ පිළිතුර ලබා ගන්න ඔබතුමාට පුළුවන් නම් මා හිතන විධියට අපේ අපනයනකරුවන්ට ඒක ලොකු රුකුලක් වේවි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

Next, Ministerial Statement by the Hon. (Dr.) Anil Jayantha.

## නිල සංචිත වත්කම් ඉලක්ක සපුරා ගැනීමේ අභියෝගය: වැඩබලන මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## உத்தியோகபூர்வ சொத்தொதுக்க இலக்குகளை அடைவதில் எதிர்கொள்ளும் சவால்: நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்திப் பதில் அமைச்சரினது கூற்று

## CHALLENGE OF MEETING OFFICIAL RESERVE ASSETS TARGET: STATEMENT BY ACTING MINISTER OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (** වැඩබලන කම්කරු අමාත්‍ය සහ **මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்திப் பதில் அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Acting Minister of Finance, Planning and Economic Development)

Hon. Deputy Speaker, the Reply to the Question raised by the Hon. Ravi Karunanayake on 12th September, 2025 under Standing Order No. 27(2) is as follows:

US Dollars 7.2 billion of Gross Official Reserves by the end of December, 2025 is the IMF projection for Sri Lanka. Under the IMF-EFF Programme, achieving that Gross Official Reserves level is not considered a quantitative or a continuous performance criterion. The applicable target related to reserves build-up under the IMF-EFF Programme is the Net International Reserves -

NIR. Net International Reserves is the difference between the Gross Official Reserves and the reserve-related liabilities, subject to some adjustments as per the Technical Memorandum of Understanding. So, that is the net position, in a way. The NIR target achievement by end June and end December of each year is monitored at the corresponding reviews. Sri Lanka has already achieved the end December, 2024 NIR target comfortably through substantial net purchases of foreign exchange from the domestic foreign exchange market. Based on the current level of net purchases, Sri Lanka is in line to achieve the end June and end December, 2025 Net International Reserves targets.

Accordingly, the Answers to the specific questions raised are as follows:

1. US Dollars 7.2 billion is the projection of the IMF and is not a compulsion under the IMF -EFF Programme. By end August, 2025, the Central Bank had absorbed more than US Dollars 1.2 billion from the domestic forex market to build up Gross Official Reserves and the Central Bank will continue to monitor and implement necessary mechanisms to meet the requirements.
2. The yields of International Sovereign Bonds have declined in the recent past, thus indicating an improvement in investor perception and low-volatility. This currency with macro indicators signals reduction of uncertainties. The Government will explore options to select the best alternatives to continue to strengthen investor confidence leading to higher FDI and lower yields in the future.
3. As indicated earlier, the Central Bank is committed to build up reserves while considering many factors in tourism receipts, remittance from expatriates and purchasing forex, where necessary.
4. No. There is no such plan to restrict importation.
5. Change in policy interest rates is a monetary policy decision taken by the Monetary Policy Board of the Central Bank based on the available data and the outlook. Presently, the Central Bank maintains an accommodative monetary policy.
6. No. There is no such plan.
7. The Central Bank already published the Gross Official Reserves along with details on People's Bank of China Swap on a monthly basis. In addition, debt service payments are published in the Central Bank's Annual Economic Review.
8. As stated above, it is the IMF projection for Sri Lanka's Gross Official Reserves and it is not a quantitative or continuous performance criterion under the IMF-EEF Programme.
9. The Central Bank will continue to implement prudent measures in managing its affairs, considering many factors including evolving circumstances to ensure that its objectives are discharged, as intended.

Thank you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ravi Karunanayake?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, an honest Answer has been given by you, but, of course, written by the Central Bank. If I take the last answer you gave, I would like to say that the problem we are in is owing to the independent Central Bank; we would not have become a bankrupt State, if not for the Central Bank. So, steering on the answer given to question no. 06, may I ask you another question. As at 30th of September, 2024, the total Net Reserves asset of the country was US Dollars 6.4 billion. The last reported Net Reserves asset by 15th September, 2025 was US Dollars 6.86 billion. Then, you say, Hon. Minster, that there was intervention by the Central Bank with US Dollars 1.2 billion purchased. So, if that has been the case, US Dollars 1.2 billion plus US Dollars 6.4 billion should be US Dollars 7.6 billion. But, I am asking about the Net Reserves that are there. Intervention would have been there, but if there is an erosion of the rupee, then you have got to defend it. So, on that basis, just saying that there has been a US Dollars 1.2 billion absorption from market intervention does not mean anything when the Net Reserves are US Dollars 6.186 billion.

The Agreement on debt sustainability between the then Government and the IMF had been endorsed by this Government, too and I salute them for doing it without breaking the trend. The external borrowers will basically look at the Government's intervention and if they find that the reserves are not being built up, it will have an impact on the rupee. We are being tutored by the Central Bank thinking that we are absolute duds to listen only to what they say. Sir, I want to protect the Government as well because those guys ruined the past governments and will continue to do so in the future also.

So, all I want you to do is to ensure that we have more exports and that there would be interventions that build up the Net Reserves. According to an answer you gave last time, Hon. Minister, China's swap was not acceptable. This US Dollars 7.2 billion target is not a fictitious figure that we have stated, but it is a target that you all are pursuing under the IMF Agreement on debt sustainability.

So, Hon. Minister, I would basically like to see a more honest answer coming from you. I know that you have got to report what comes from the Central Bank. But - I have been speaking with you about it - let us ensure that the Government pursues a policy that is good for the

country and not what is good for the independent Central Bank, which buys cars they want and increases salaries as they want while the rest of the country does not get those benefits.

Thank you, Sir.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Sir, it is not a mere presentation of numbers or facts given by the Central Bank. Those facts are well connected to the Gross Reserves and the Net International Reserves, as I just explained in my Answer. Again, the maintenance of Gross Reserves is not a compulsion under the Programme. The compulsion is with respect to the NIR position. Accordingly, even the Central Bank's intervention in buying that US Dollars 1.2 billion was to manage the given position as of now because the Central Bank takes decisions by observing the movements of the other variables.

For example, if we take the export income, as of August, it had exceeded US Dollars 11 billion. In the mean time, the foreign exchange earnings, remittances and earnings from tourism have also been robust. - *[Interruption.]* Yes, that is true. But, of course, we need to allow the Central Bank to function and respect them because it operates with its own autonomy. The actions taken by the Central Bank in the past in maintaining the required levels as well as last year with regard to acquisition of foreign exchange have been all right. I just explained to you about the current position. We have more time to achieve the targets and during that time, they would use their tools appropriately.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, with Net Reserves being US Dollars 6.186 billion, the IMF fifth tranche amounting to US Dollars 330 million coming in and I am informed that there would also be an ADB funding of US Dollars 190 million, you will have roughly about US Dollars 6.7 billion. But, what about the balance of that US Dollars 7.2 billion target? You all should achieve that also. Otherwise, macro-linked bond holders would look at whether to move out or come in, and that would have an impact on the valuation of the rupee. That is the reason why I am pushing for this. Every 1 per cent depreciation of the rupee has an impact of Rs. 46 billion on Government's expenditure. That is the concern. One per cent interest rate has an impact of Rs.160 billion on the economy. So, Hon. Minister, we do not need to tell you these things because you have practical knowledge. Therefore, what I am saying is, together, we must ensure that the economy does not get stymied or get caught to the bureaucratic forces who are out there.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, let us not get into a debate on this.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am not debating, Sir. I am only trying to ensure that Sri Lanka - *[Interruption.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Member, thank you very much for the points made. Of course, the Central Bank would take into account all those points.

Then, with regard to the swap we have with the People's Bank of China, I would say that it is not a new thing; it has been there all this time. - *[Interruption.]* That is true, but the target is to build up the NIR, and the Central Bank will manage these things.

Another thing I want to emphasize is that with these allegations, criticisms or observations, still, we have been able to maintain a very stable foreign exchange rate without sliding to unnecessary volatility. And, from time to time, the Central Bank would, of course, take the required measures.

Thank you.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Dayasiri Jayasekara?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 (1) සහ (2) යටතේ මම ඔබතුමා වෙත වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේක පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ට බලපාන කාරණයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, I received that letter at 9.15 in the morning. I hardly had time to read it.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව මම එම වරප්‍රසාද ප්‍රශ්නය පෙරවරු 9.30ට පාර්ලිමේන්තු රැස්වීම් ආරම්භ කරන්න කලින් ලබා දුන්නා නම් ඇති. ඒකට වෙලාවක් දාලා නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It was a long letter.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
No, it is not a big letter; it is a very simple letter. But, it is regarding a big question.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
There are a lot of technicalities in that. So, I have passed it on to the SGP's Office. We will go through it and get back on another day.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 (1) සහ (2)හි මේ සම්බන්ධව බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වනවා:

> "29.(1) පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට ඍජුව ම සම්බන්ධ හදිසි යෝජනාවක් අන් සියලු යෝජනාවන් ද එදිනට නියමිත සියලු කටයුතු ද අභිබවා මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට ඍජුව ම සම්බන්ධ ප්‍රශ්නයක් මෑතක දී පැන නැඟ තිබෙන විට, ඡන්දය ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් මත වූ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පාර්ලිමේන්තුවේ කටයුතු කවර හෝ වේලාවක දී තාවකාලිකව නතර කරනු ලැබිය හැකි ය.
>
> (2) එවැනි වරප්‍රසාද පිළිබඳ කාරණයක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන කිසියම් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ කටයුතු තාවකාලිකව නතර කිරීම සඳහා පළමුව මූලාසනය වෙත දැනුම් දී ඒ සඳහා මූලාසනයේ අවසරය ගනු ලැබිය යුත්තේ ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කියලා ඔබතුමාගෙන් ලිඛිතව ඉල්ලා තිබෙනවා. මොකද, මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුම මන්ත්‍රීවරුන්ට මේක බලපාන නිසා. ස්ථාවර නියෝග 29 අනුව බොහොම පැහැදිලිව මන්ත්‍රීවරුන්ට මේක අදාළයි. ඔබතුමාත් දන්නවා, මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම තුළින් අපට ප්‍රශ්න ගණනාවක් මතුවෙලා තිබෙන බව. ඒකයි මම කිව්වේ, cryptocurrency 3,000ක් තබාගෙන ඉන්නවා කියලා. මේක බොහොම පැහැදිලිව 2017 දී ඉදිරිපත් කර තිබෙන අංක 12 පනතට සම්පූර්ණයෙන් විරුද්ධයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I received your letter, but I have not gone through it; I had no time to go through it. It was a detailed letter with a lot of technicalities.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Let me read this letter, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have actually handed it over to the SGP's Office.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, permit him to read it.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Yes, permit me to read this. This is a very small and a simple letter.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 29(1) සහ (2) අනුව මේක බොහොම පැහැදිලියි. මෙය මන්ත්‍රීවරුන් සියලුදෙනාට අදාළයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we will take it up tomorrow. We will study the document you handed over and certainly take it up tomorrow.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I will not be here tomorrow; I am not coming tomorrow.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I think you should better come.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා කරුණාකරලා ස්ථාවර නියෝග 29(1) සහ (2) බලන්න. ඔබතුමා ඒ ගැන බොහොම පැහැදිලි අවබෝධයක් තිබෙන කෙනෙක්. මට මේ ප්‍රශ්නය කියන්න දෙන්න. මේක

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඉදිරිපත් කරන්න විතරයි මම අවස්ථාව ඉල්ලන්නේ. තීන්දුව ඔබතුමා පසුව දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අද මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. එතැනින් පසුව තීන්දුව හෙට හෝ අනිද්දා හෝ ඕනෑම දවසක දෙන්න. It is up to you to decide. Let me just read this; I will only be reading this.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are not going into a debate on this. You can just read it.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Do not worry, Sir. I am not going into a debate.

## වරප්‍රසාද: වත්කම් සහ බැරකම් ප්‍රකාශයෙහි සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් දක්වා ඇති මූල්‍ය වත්කම්
## சிறப்புரிமை: சொத்துக்கள் மற்றும் பொறுப்புக்களை வெளிப்படுத்துகையில் ஒருசில பாராளுமன்ற உறுப்பினர்களால் வெளிப்படுத்தப்பட்டுள்ள நிதிசார் சொத்துக்கள்
## PRIVILEGE: FINANCIAL ASSETS DECLARED BY SOME MEMBERS OF PARLIAMENT IN DECLARATION OF ASSETS AND LIABILITIES

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත ප්‍රකාරව සකස් කොට 2018 මාර්තු මස 07වෙනි දින සම්මත කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ vi වන කොටසේ 14-21 දක්වා වන මන්ත්‍රීවරයන්ගේ මූල්‍යමය බැඳීම් පිළිබඳ ලේඛනය සහ එම බැඳියාවන් අනාවරණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම යන වගන්ති යටතේ සිදු කර ඇති වරප්‍රසාද පනතේ උපලේඛනයේ "ආ" කොටසේ වගන්ති 1 යටතේ සිදුකර ඇති වරප්‍රසාද කඩකිරීම සම්බන්ධයෙනි.

උක්ත චර්යා ධර්ම අනුව වර්තමාන පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් මේ වන විට ඔවුන්ගේ වෙබ් අඩවියේ පළ කර තිබේ. ඒ අනුව වෙළඳ හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍ය වසන්ත සමරසිංහ මැතිතුමා සතුව ක්‍රිප්ටෝ මුදල් 3,000ක් තිබෙන බව සඳහන් කර ඇති අතර, ගරු කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මැතිතුමා සතුව බයිනැන්ස් ගිණුමේ USDT 1,850ක් පවතින බව සඳහන් කර තිබේ.

According to an Order issued under the Foreign Exchange Act, No. 12 of 2017, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your heading itself is quite enough for the moment until we take it up tomorrow.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට මේක කියවන්න ඉඩ දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. I have already started, Sir. මම ඉක්මනින් අවසන් කරනවා.

According to an Order issued under the Foreign Exchange Act, No. 12 of 2017, the use of debit and credit cards for cryptocurrency transactions is also prohibited. The Central Bank points out that cryptocurrencies do not contribute to the country's economy and can also cause a loss of foreign exchange by adversely affecting the national financial system. මෙම නියෝග 2017 අංක 12 දරන පනත යටතේ මහ බැංකු අධිපතිවරයා විසින් නිකුත් කර තිබෙන්නේ. ඒ අනුව, මෙවැනි කාරණා මහ බැංකු අධිපතිවරයා විසින් මුදල් විශුද්ධිකරණය යටතේ වරදක් බව සඳහන් කර ඇත. මෙම මුදල් credit cards හෝ debit cards මඟින් හෝ උණ්ඩියල් ක්‍රමයට හෝ හවාලා ක්‍රමයට ලබා ගත්තේ ද යන්න පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් මෙම ගරු සභාවට කරුණු ඉදිරිපත් කළ යුතුය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ vi කොටස යටතේ මන්ත්‍රීවරයන්ගේ මූල්‍යමය බැඳියාවන් පිළිබඳ ලේඛනය සහ එම බැඳියාවන් අනාවරණය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම යන කොටස යටතේ 14වන වගන්තියේ සිට 21වන වගන්තිය දක්වා වන වගන්තීන් සලකා බැලීමේදී මන්ත්‍රීවරයන් විසින් ඔවුන්ගේ මූල්‍ය බැඳියාවන් පිළිබඳව ලේඛනයක් මහ ලේකම්වරයා විසින් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන ආකෘතියකින් සහ ආකාරයකින් යුක්තව පවත්වා ගෙන යා යුතුය. එසේම 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන මෙම ලේඛනයේ අඩංගු යම් තොරතුරක් ප්‍රසිද්ධියට පත් කිරීම සම්බන්ධව අදාළ වේ.

එසේම එහි 22 වන වගන්තිය අනුව මෙම විධිවිධානවලට අදාළ මන්ත්‍රීවරයාගේ කලත්‍රයා සහ පවුලේ සාමාජිකයන්ටද අදාළ වන්නේය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2018 පනත අනුව තවමත් මේ පිළිබඳව එක වැඩ පිළිවෙළක් හදලා නැහැ. ලංකාවේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කිරීම තුළ මේ සම්බන්ධයෙන් විශාල මහජන මතයක් සමාජය තුළ ගොඩනැඟී ඇත. විශේෂයෙන්ම මේ තුළින් සමස්ත මහජන මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කළ යුතුවා වනවා සේම වත්මන් රජයට බලය ලබා දීමට මූලික හේතුවක් බවට පත් වුණු දේශපාලනඥයන් විසින් රාජ්‍ය දේපළ අයුතු ලෙස භාවිත කිරීම සහ අයුතු ධනවත්වීම යන කරුණු මත ගෙන ගිය මහජන ව්‍යාපාරයේ අපේක්ෂාවන් දැඩි සේ කඩා බිඳ දමා ඇත. එබැවින් ආණ්ඩුවේ කිසිවකුට ජනතාවගේ එකී බලාපොරොත්තුව කිසිදු ආකාරයකින් කඩ කිරීමට කිසිදු අයිතිවාසිකමක් නැත. තමන්ට ලැබෙන වැටුප් නොගෙන ස්වේච්ඡාවෙන් ජනතාවට සේවය කරන බවටත්, ජනතාවගේ බදු මුදල් වංචා නොකරන බවටත්, අයුතු ලෙස ධනය ඒක රාශි නොකරන බවටත් වත්මන් රජයේ සෑම

මන්ත්‍රීවරයෙකුම සෑම විටම ප්‍රකාශ කළ ආකාරයට ඔවුන්ගේ අවංකභාවය ඔප්පු කිරීමේ වාරය ඔවුන්ට පැමිණ ඇති බව සඳහන් කරමි.

එබැවින් උක්ත චර්යා ධර්ම පද්ධතිය සහ පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත උල්ලංඝනය වන සේ මෙම අයවලුන් ක්‍රියාත්මක කර තිබේ නම් ඒ පිළිබඳව වහාම සොයා බැලීමක් කර මේ උත්තරීතර පාර්ලිමේන්තුවට හෙළිදරව් කර වරදක් කර තිබේ නම්, දැනටත් ක්‍රියාත්මක වන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව යටතේ හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නීතිමය ක්‍රියාවලිය යටතේ එවැනි පුද්ගලයන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළ යුතුව ඇත.

ඒ අනුව වසන්ත සමරසිංහ අමාත්‍යවරයා විසින් ලබාගෙන තිබෙන ක්‍රිප්ටෝ මුදල් 3,000ක් සහ ගරු කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මැතිතුමා සතුව බයිනැන්ස් ගිණුමේ USDT 1,850ක් ලබා ගත්තේ කෙසේද යන්න පිළිබඳව මෙම පාර්ලිමේන්තුවට හෙළිදරව් කළ යුතුව තිබෙන අතර ඉහතින් දක්වන ලද ආචාර ධර්ම යටතේ මෙම පාර්ලිමේන්තුවට කරුණු පැහැදිලි කරන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

Thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, whether there has been a breach of Privilege, we will announce subsequently.

Now, let us move on to the Business of the Day.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I have already started the Business of the Day. What is your point of Order, Hon. Rasamanickam? Is it on this same issue?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Let me say what I have to say, Hon. Deputy Speaker. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඉතා වැදගත් මේ කාරණය පිළිබඳව ජාතික ජන බලවේග ආණ්ඩුව වහාම ප්‍රකාශයක් කරන්න ඕනෑ. මොකද මේගොල්ලන්ට කෙහෙල් කැන්, හාල් දීපු අය අද අපෙන් අහනවා. ඒගොල්ලන්ගෙන් අහලා තිබෙනවා, ඒගොල්ලන්ට පාන් ද කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We will start the Business of the Day.

Item No. 1 in the Order Paper - the Second Reading of the Penal Code (Amendment) Bill - to be moved by the Hon. (Mrs.) Saroja Savithri Paulraj. You have 15 minutes.

## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## PENAL CODE (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 10.17]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන්,"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින අපි දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරනවා. ඇත්තටම ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පැන නැඟී තිබෙනවා. දරුවන් සම්බන්ධව වන සියලු ආකාරයේ හිංසන පිටු දැකීම සඳහා කටයුතු කිරීමේදී, ශාරීරික දණ්ඩනය අහෝසි කිරීම සඳහා වන කටයුතු වෙනුවෙන් තමයි අපි මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ 27 (13) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජික වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ ශුභ සිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කළ යුත්තේ ය."

ඒ වාගේම, ගෝලීය වශයෙනුත් අපි විවිධ නීති හා ප්‍රතිපත්ති එක්ක එකඟ වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාව 1990 වර්ෂයේදී ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අත්සන් කරලා, එහි පාර්ශ්ව රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ අනුව 1992දී ශ්‍රී ලංකා රජය විසින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියක් හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම අපි මේ කථා කරමින් සිටින මාතෘකාවත් එක්ක බැලුවොත්, දරුවන් කොයි විධියටද, කුමන ස්ථානවලදී ද ප්‍රචණ්ඩත්වයට ලක් වන්නේ කියන එක පිළිබඳව සොයා බැලිය යුතුයි. අද දින මේ දණ්ඩ නීති සංග්‍රහයේ 308 කියන වගන්තිය සංශෝධනය කිරීමට යනකොට, පසුගිය වසර ගණනාවක් තිස්සේ ඒ 308වන වගන්තිය යටතේ ලැබුණු පැමිණිලි අපට හඳුනා ගත හැකි වුණා. ඒ අනුව ළමයින්ට සිදු වුණු කෲරත්වය - cruelty - පිළිබඳව වන අපරාධ වාර්තාවීම් ගත්තොත්, 2010 වර්ෂයේදී 905ක්, 2011දී 1,156ක්, 2012දී 1,516ක්, 2013දී 2,030ක්, 2014දී 2,160ක්, 2015දී 2,317ක්, 2016දී 2,180ක්, 2017දී 2,144ක්, 2018දී 413ක් ආදී වශයෙන් ඇවිල්ලා 2020 වර්ෂය වනවිට එය 2,237ක් වෙලා තිබෙනවා.

ඒ වාගේම 2021දී 2,471ක්, 2022දී 2,096ක්, 2023දී 2,238ක්, 2024දී 1,950ක් හා 2025 වර්ෂයේ මේ වෙනකොට -ඒ කියන්නේ

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

ජූලි මාසයේ 31වැනි දා වනවිට පමණක්- 1,126ක් වශයෙන් දරුවන් කෲරත්වයට පත් කිරීමේ අපරාධ සම්බන්ධයෙන් වාර්තා වෙලා තිබෙනවා. මේ පිළිබඳව කථා කිරීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කාරණය තමයි, දරුවන් කෲරත්වයට පත් වන ආකාර මොනවාද කියන එක. වාර්තා වන සිදුවීම් අනුව නිවසේදී, පාසලේදී, පරිවාස නිවාසවලදී, රැඳවුම් භාරයේදී විතරක් නොවෙයි, ළමා නිවාසවලදී, මහ මඟදී, බස් නැවතුම්පොළවලදී හා මිතුරු කල්ලිවලදී පවා දරුවන් හිංසනයට හා කෲරත්වයට පත් වන බව අපි දැක තිබෙනවා.

ඒ අතරතුර මම විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කාරණාවක් තිබෙනවා. පසුගිය කාල පරාසය තුළ අපි දැක්කා, දරුවන් විවිධාකාරයෙන් දණ්ඩනයට හා කෲරත්වයට පත් වෙනවා. තාත්තා කෙනෙක් දරුවාට බත් කවද්දී එක බත් කටක් ගණනේ ඒ දරුවාගේ මුහුණට අනින වීඩියෝවක් පසුගිය කාලයේ මාධ්‍යවල සංසරණය වුණා. ඒ වාගේම අපි දැකපු තව දෙයක් තමයි, අම්මලා විදේශ රටවල රැකියාවලට ගියාම ඒ අයගේ දරුවන් ඉන්නේ තමන්ගේ පියා හෝ ඥාතියෙක් එක්ක. ඒ ළමයි ආරම්භක අවස්ථාවේදී රැකවරණයට පත්වෙලා හිටියාට පසු කාලීනව ඔවුන් විටින් විට කෲරත්වයට හා හිංසනයට මුහුණ දෙන අවස්ථා අපි දැකලා තිබෙනවා. විශේෂයෙන්ම මැද පෙරදිග රටවල ගෘහ සේවයට යන අම්මලා සිය දරුවන් විකල්ප රැකවරණ භාරයකට - ආච්චිට, සීයාට, මාමාට, නැන්දාට, පවුලේ වෙන හිතවතෙකුට හෝ ඥාතියෙකුට - භාර දීලා ගියාට ඒ දරුවන් නිතරම කායික හිංසනයන්ට, මානසික හිංසනයන්ට වාගේම නොසලකා හැරීම්වලට භාජන වෙනවා. ඒ විධියට ගත්තාම නම් වශයෙන් සඳහන් නොකළාට පසුගිය කාල පරාසය තුළ ඕනෑ තරම් එවැනි සිදුවීම් වාර්තා වෙලා තිබෙනවා. මම කලින් කිව්ව විධියට පාසල තුළදීත් දරුවන් කෲරත්වයට හා හිංසනයට ලක්වෙන අවස්ථා දිනෙන් දින අපට වාර්තා වෙනවා. අපි ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අත්සන් කරපු එහි පාර්ශ්වකාර රටක්. අපි 1990 ජනවාරි මාසයේ 26වැනි දා ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අත්සන් කරලා, 1991 ජූලි මාසයේ 12වැනි දා ඒක අපරානුමත කරලා තිබෙන රටක්. එම සම්මුතියේ Article 19 යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "States Parties shall take all appropriate legislative, administrative, social and educational measures to protect the child from all forms of physical or mental violence, injury or abuse, neglect or negligent treatment, maltreatment or exploitation, including sexual abuse, while in the care of parent(s), legal guardian(s) or any other person who has the care of the child."

එතකොට, මේ උක්ත ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුව යම්කිසි දරුවෙක් ඒ රැකවරණ භාරයේදී හිංසනයට ලක් වෙනවා නම් ඒක වරදක් බව මෙන්න මේ අද අපි ගෙනෙන සංශෝධනවලින් ප්‍රකාශයට පත් කරන්න අපට පුළුවන්කම තිබෙනවා. අපි ගෙනෙන මේ පනත් කෙටුම්පතෙන් බලාපොරොත්තු වෙන්නේ දරුවන්ව සියලු ආකාරයෙන් මේ හිංසනයන්ගෙන් මුදා ගැනීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 නොවැම්බර් මාසයේ බොගෝටාවල පැවති දරුවන්ට එරෙහිව ශාරීරික දඬුවම් අවසන් කිරීමේ ගෝලීය අමාත්‍ය මණ්ඩල සමුළුවේදී ලංකාව අත්සන් කරපු ප්‍රධාන වගකීම්වලින් එකක් හැටියට දරුවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ ශාරීරික දඬුවම් අවසන් කිරීමට අවශ්‍ය නීතිමය සහ ව්‍යවස්ථාපිත ක්‍රියාමාර්ගයන් ගැනීමට පූර්ණ එකඟත්වය ප්‍රකාශ කිරීම සඳහන් කරන්න පුළුවන්. අපි එසේ ප්‍රකාශ කරපු රාජ්‍යයක්. ඒ කියන්නේ, ළමයා නිවැරදි කිරීමේ අරමුණින් හෝ කායික, මානසික, වාචික, ලිංගික හිංසනයක්, අපරාධයක් කරන්න බැහැ කියන එක අද අපි ගෙනෙන සංශෝධන තුළට ඇතුළත් වෙනවා. ඒකෙදි අපි ප්‍රධාන වශයෙන්ම කියනවා, දරුවෙකුගේ පූර්ණ අයිතිය සම්පූර්ණයෙන්ම අයත් වෙන්නේ ඒ දරුවා ජීවත් වන ප්‍රදේශයේ දිසා විනිසුරුට බව. ඒක නිසා මව්පියන් හැටියට අපටවත්, ගුරුවරුන්ටවත්, ඥාතීන්ටවත් - ඒ කිසිවෙකුටවත් - තවත් පුද්ගලයෙකු හැටියට, තවත් ජීවියෙකු හැටියට දරුවෙකුට හිංසා පමුණුවන්න, කෲරත්වයට ලක් කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා අපි මේ ගෙනෙන සංශෝධන හරහා ලැබෙන ආවරණය තුළින් අප බලාපොරොත්තු වෙනවා, දරුවන්ට වඩාත් හොඳ හෙට දවසක් නිර්මාණය කරන්නට.

ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම, පාසල් ක්ෂේත්‍රය තුළ ශාරීරික දණ්ඩනය සඳහා වන ඉඩකඩ ඇහිරීම සඳහා 2016.04.29වැනි දින 12/2016 දරන අමාත්‍යාංශ චක්‍රලේඛය නිකුත් කර තිබෙනවා. ඒ චක්‍රලේඛය අනුව තමයි පාසල් තුළ ශාරීරික දණ්ඩනය කියන එක වරදක් බවට පත් කරන්නේ. 12/2016 දරන චක්‍රලේඛය, පාසලේ විනය ආරක්ෂා කිරීම කියන කාරණය සම්බන්ධයෙන් නිකුත් කරපු චක්‍රලේඛයක්. විනය කියන එක ගත්තොත්, ඇත්තටම අපි සියලුදෙනාට එක එක විධියට විනය කියන එක අර්ථ දක්වන්න පුළුවන්. මේ විනය කියන එක තුළ දරුවන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ කුමක්ද? හැම දරුවෙකුටම ආදර්ශය තුළින් ගොඩනැඟුණු සමාජයක් අපි ලබා දෙන්න ඕනෑ. ඒ ආදර්ශය හා වගකීම වර්තමාන වැඩිහිටි පාර්ශ්වය හැටියට අපි භාර ගන්න ඕනෑ. සංස්ථාවක්, පාසලක්, ආගමික ආයතනයක්, රැකවරණ භාරයක්, පරිවාසයක්, ළමා නිවාසයක් කියන මේ ඕනෑම තැනකදී තමා භාරයට පත් වන දරුවා මේ රටේ පුරවැසියෙක්. එහෙම නැත්නම් ඒ දරුවා අයිති වෙන්නේ තනි පුද්ගලයෙකුට හෝ අම්මා, තාත්තා කියන දෙපළට විතරක් නොවෙයි. දරුවාගේ පූර්ණ අයිතිය රජය සතුයි. දරුවන් අයිති රටට.

දරුවාගේ භාරකාරයා වෙන්නේ දරුවා පදිංචි ප්‍රදේශයේ ඉන්න දිසා විනිසුරුවරයා. අන්න ඒ නෛතික රාමුව ඔස්සේ ළමයින් කෲරත්වයට පත් කිරීමට හෝ වධ හිංසා කිරීමට කිසිවෙකුට අයිතියක් නැහැ. ඒ නිසාම මම මේ වෙලාවේ කියන්න ඕනෑ, මෙන්න මේ පාසල් විනය සම්බන්ධව නිකුත් කර තිබෙන චක්‍රලේඛයේ සඳහන් ඉතාම වැදගත් කරුණු කිහිපයක් අපි සැලකිල්ලට ගත් බව. මේ අනුව පාසලක විනය පවත්වාගෙන යාමේදී බලපාන කරුණු සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව විසින් විවිධ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එහිදී පසුගිය කාලය තුළ ශාරීරික දඬුවම කියන එක ඇතුළේ ඔවුන් -ඒ කියන්නේ වෛද්‍යවරුන්, මනෝ විද්‍යාඥයන්, මානව ක්‍රියාකාරිකයන් වැනි කණ්ඩායම්- තවදුරටත් ශාරීරික දඬුවම් කියන එක පැහැදිලි කර ඇත්තේ ළමයින්ට කායික වශයෙන් පීඩනයක් වන ආකාරයට ලබා දෙනු ලබන දඬුවම් ලෙසයි. මෙහිදී කායික වශයෙන් පීඩනයක් ලබා දෙන දඬුවම් විතරක් නොවෙයි, ඇත්තටම මානසිකව වන පීඩාව හා ලිංගික අපයෝජනය නොසලකා හැරීම කියන ඒවාත් මේවාට ඇතුළත් වෙනවා. නමුත් ඒවා මනින්නේ කොහොමද කියන කාරණාව ඕනෑම සමාජයක තිබෙන අර්බුදයක්.

ඔවුන් තවදුරටත් පෙන්වා දෙනවා, එය සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා අනාගතයේදී සමාජ විරෝධී චර්යාවන්ට යොමු වීමට පවතින ඉඩ කඩ වැඩි වීම මෙන්ම පසුකාලීනව ඔවුන් තුළ දැඩි මානසික ආතති තත්ත්වයන්ද වර්ධනය විය හැකි බව. මෙන්න මේ ශාරීරික දඬුවම් නිසා එසේ වෙනවා කියා මේ චක්‍රලේඛයේ සඳහන් වෙලා තිබෙනවා. මේ අදාළ චක්‍රලේඛයේම ලියා තිබෙනවා, මෙවන් පහරදීම් මඟින් ලැබෙන යහපත් ප්‍රතිඵලයන්ට වඩා අයහපත් ප්‍රතිඵල වැඩි බව අනාවරණය වීමෙන් පසුව, බොහෝ සංවර්ධිත රටවල් මෙන්ම ශ්‍රී

ලංකාව ද වර්තමානය වන විට ශාරීරික දණ්ඩනය අත්හිටුවීමට පියවර ගෙන තිබේ කියලා. එමෙන්ම මෙවන් දණ්ඩන මඟින් ශිෂ්‍ය චර්යාවන් පන්ති කාමරය තුළදී සංවර්ධනය වූ බවට පවතින සාක්ෂි අවම නිසා -ඇත්තටම දඬුවමින් හැදිච්ච ළමයෙක් නැහැ කියන එක. දඬුවම් දීලා, ඒ දඬුවම්වලින් ළමයෙක් පන්ති කාමරය තුළ හොඳ දරුවෙක් බවට පත් කර ගන්නවාට වඩා, මේ දඬුවම් ක්‍රම ඇතුළේ පාසලෙන් පළා ගිය, පාසල අතහැර ගිය දරුවන් තමයි වැඩිම ප්‍රමාණයක් වාර්තා වෙන්නේ.- ශාරීරික දණ්ඩනය ප්‍රයෝජනයක් නොමැති ක්‍රියාවලියක් බව පෙනී යනවා කියලා මෙහි සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම මෙහි කියනවා, ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණයන්ගෙන් අනාවරණය වී ඇත්තේද චර්යාව හැඩ ගැස්වීම සම්බන්ධයෙන් ළමුනට ලබාදෙන ලද දඬුවම මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැති බවත්, වෙනත් අයහපත් ප්‍රතිඵල එමඟින් නිර්මාණය වන බවත්. එසේ නිර්මාණය විය හැකි අයහපත් ප්‍රතිඵල මොනවාද? අන්න ඒක තමයි තිබෙන භයානකම තත්ත්වය. මේ දඬුවම්වලින් ළමයින්ට සිද්ධ වන දේ ගැන සඳහන් කර තිබෙනවා.

ඒ අනුව, ශාරීරික දඬුවම් තුළින් ප්‍රචණ්ඩත්වය, පහරදීම, හොරකම වැනි සමාජ විරෝධී ක්‍රියාවන් සිසුන් තුළ මතු වීම, ළමා අපහරණයට ඇති අවදානම වැඩි වීම, සිසුන් තුළ ආක්‍රමණශීලී හා කලහකාරී චර්යා රටා මතු වීම, ශිෂ්‍යයා, ගුරුවරයා හා විදුහල්පතිවරයා අතර පවත්නා සම්බන්ධතාව ක්‍රමයෙන් දුරස්ථ වීම, නිෂේධනාත්මක සමාජ හා මානසික කැලඹීම් ළමයාට ඇති වීම, ළමයා විසින් සංකල්ප ගොඩනඟා ගැනීමේදී අහිතකර ආකාරයෙන් බලපෑම් ඇතිවීම, පසුකාලීනව මෙවන් සිසුන් තුළ පරාජිත මානසිකත්වයක් වර්ධනය වීමෙන් සමාජ විරෝධී ආකල්ප ඇත්තෙකු බවට දැයට නිර්මාණය වීමට වැඩි ඉඩකඩක් මතුවීම, පොදු දේපළ විනාශ කරන තැනැත්තෙකු බවට පත්වීම සහ ශිෂ්‍යයන්ගේ පහළ අධ්‍යාපන සාධන ඇතිවීම වැනි දේ සිදු වෙන්න පුළුවන්. ගුටි කාපු ළමයින් හොඳම තැනකට ආවා කියන වාර්තාවලට වඩා, ගුටි කාලා පාසල් හැරගිය ළමයින්ගේ ප්‍රවණතාව තමයි වැඩි. ඒ නිසා ශිෂ්‍ය සාධනය අත්පත් කර ගන්න දඬුවම් ක්‍රමය කියන එක උචිත නැහැ කියලා අපි මේ වෙලාවේ යෝජනා කරනවා. ඒ වාගේම මේ ලක්ෂණවලින් අනාගත සමාජය ශිෂ්ටසම්පන්න සමාජයක් ලෙස ගොඩ නඟන්න ඕනෑ කියලා අපි හිතනවා නම්, මේ දඬුවම් ක්‍රම ලබා දීම, විශේෂයෙන්ම දරුවන්ට කායිකව දඬුවම් කිරීම තුළින් අපි අත්පත් කර ගන්න බලාපොරොත්තු වන අරමුණු ඉෂ්ට වෙන්නේ නැහැ කියන එකත් කියන්න ඕනෑ. ඒ නිසා, දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ඇතුළේ ශාරීරික දණ්ඩනය පැමිණවීම කියන කොටසට අදාළ 308ආ. වගන්තියට අපි තව අලුතින් එකතු කළ සංශෝධනය තමයි 308ආ. (1) (අ) ලෙස සඳහන් වන්නේ. එහි සඳහන්ව තිබෙනවා, "දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රමයක් වශයෙන් හෝ සද්භාවයෙන් කරන අවස්ථාවක හැර කෙතරම් අඩු වුවද යම් ප්‍රමාණයක වේදනාවක් හෝ අපහසුතාවක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික බලය භාවිත කරනු ලබන යම් ක්‍රියාවක් සිදු කරන; හෝ..." යනුවෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධනයත් එක්ක අපි වෙනස් කරන්න බලාපොරොත්තු වන වගන්ති තුළින්; ඇත්තටම දණ්ඩ නීති සංග්‍රහයේ 13වැනි අධිකාරයේ තිබෙන කායික දණ්ඩනය සඳහා අපි ගෙනෙන සංශෝධනවලදී අපි බලාපොරොත්තු වන ප්‍රධානම දේ තමයි, තවදුරටත් මේ සමාජය ඇතුළේ ඕනෑම තැනකදී දරුවෙකුට සිදුවන කායික, මානසික අපහරණය, -විශේෂයෙන්ම කායික දණ්ඩනය- ළමයාගේ අවස්ථා අහිමි කිරීම, ඒ වාගේම මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වැනි කාරණා වළක්වා ගත යුතුයි කියන එක. ඒ වාගේම, 1946දී පිහිටුවන ලද UNICEF එකේ ප්‍රඥප්තියට අනුව, ළමා රක්ෂණ ප්‍රතිපත්ති හා නීති සම්පාදනයට ඔවුන් අපට සහාය දක්වනවා. ළමා ශ්‍රමය, ළමා විවාහ සහ ජාවාරම් ඇතුළු සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය, අපයෝජනය, නොසලකා හැරීම් සහ සූරාකෑම්වලින් දරුවන් ආරක්ෂා කිරීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය මේ හරහා ආවරණය වෙනවා.

අධ්‍යාපන ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, සෞඛ්‍ය ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, සමාජ සුබසාධන ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කියන මේ හැම එකක් තුළින්ම අපි බලාපොරොත්තු වෙන්නේ දරුවන්ට වඩාත් හොඳ, යහපත් රටක් ලබා දීම. ඒ නිසාම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ, 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත තුළත් අපට ආවරණයක් තිබෙනවා. ලංකාවේ හිංසනයට හා දඬුවමට ලක් වන දරුවන්, ඒ කායික හිංසනය වෙනුවෙන් පැමිණිලි කිරීම සඳහා 1929 අංකය, එහෙම නැත්නම් ඍජු පැමිණිලි ඒකකය තිබෙනවා. ඒ ආදී සියල්ල හරහා දැනුම් දෙමින් ඒ ළමයින්ට සිදුවන කෲරත්වය පිටුදැකීමේ හැකියාව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ දරුවන් වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීම, එහෙම නැත්නම් මේ විමර්ශන යන්ත්‍රණය ඇතුළේ යුක්තිය ලබා දීම සඳහා ආයතන ගොඩක් තිබුණත් මේ ආයතන සියල්ලක්ම තනි තනිව තමයි ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ. පාසල, සෞඛ්‍ය ආයතන, අධිකරණය, පොලිසිය සහ නීතිය පසිඳලන අනෙකුත් ආයතන සියල්ලම හුදෙකලා වෙලා, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ඇතුළු මේ සියලු ආයතන එකට වැඩ කරන්නේ නැතිව වෙන් වෙන්ව වැඩ කරන තත්ත්වයක් තමයි තිබුණේ. එ් නිසා අපි මේ වන විට -පසුගිය මැයි මාසයේ ඉඳලා- ලංකාව තුළ බහු ආංශික ප්‍රවේශයක්, බහු ආංශික යන්ත්‍රණයක් සකස් කරලා තිබෙනවා. දරුවන්ට එරෙහිව සිදු වන සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් වළක්වා ගැනීමට අදාළ වන ක්‍රියාමාර්ග ගැනීම සඳහා මේ සියලු ආයතන එකට වැඩ කළ යුතු නිසා එකට වැඩ කරන පසුබිමක් අපි සකස් කරලා තිබෙනවා. මේ බහු ආංශික යන්ත්‍රණය තුළ විශේෂයෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධීක්ෂණය යටතේ මෙන්න මේ ආයතනවලදී -පාසල් පද්ධතිය තුළ, නිවාස තුළ, ඕනෑම රැකවරණ මධ්‍යස්ථානයකදී, ළමා සුබසාධන මධ්‍යස්ථානයකදී- දරුවෙක් හිංසනයට ලක් වෙනවා නම් අන්න ඒ දරුවන්ව දණ්ඩනයෙන් මුදා ගැනීම, එහෙම නැත්නම් ළමයාට සිදු වන අගතියෙන් මුදා ගැනීම සඳහා වන ආවරණය අද මේ ගෙන එන සංශෝධන පනත් කෙටුම්පතෙන් ලැබෙනවා.

ඕනෑම සමාජයක් නීතියෙන් විතරක් හදන්න බැහැ.. නීතිවලින් විතරක් අපට මේ හිංසනය, දණ්ඩනය, ප්‍රචණ්ඩත්වය හෝ අපරාධය කියන එක නතර කරන්න බැහැ. මෑත කාලීන ප්‍රවණතා අනුව ගත්තාම අපි දැක්කා, බිඳ වැටුණු පවුල් සංස්ථාව ඇතුළේ, විශේෂයෙන්ම මව්වරුන් විදෙස්ගත වීම ඇතුළේ, ආදරණීය පවුල අහිමි වීම ඇතුළේ අනාරක්ෂිතභාවයට හා දරිද්‍රතාවට පත් වන දරුවන්ගේ, එහෙම නැත්නම් ඒ දරිද්‍රතාවට පත් වන පවුල්වල තත්ත්වය මත තමයි හිංසනවලට හා අපරාධවලට වැඩියෙන්ම දරුවන් ගොදුරු වෙලා තිබෙන්නේ කියන එක. ඒ නිසා අපට සමාජ වගකීමක් තිබෙනවා. එක, මේ සමාජය නීතිමය ආවරණය ලබන්න නම්, අපි ශිෂ්ට සම්පන්න දියුණු රටවල නීති පද්ධතීන් අත්පත් කර ගන්න නම්, අන්න එ් නීති පද්ධති ක්‍රියාත්මක වන දියුණු රටවල තිබෙන තත්ත්වයට සංස්කෘතික දියුණුව අපි අත්පත් කර ගන්න ඕනෑ. අධ්‍යාපනයේ දියුණුවත්, ජීවන තත්ත්වයේ දියුණුවත්, ආර්ථිකයේ දියුණුවත්, සිතුම් පැතුම්වල දියුණුවත් අපි අත්පත් කර ගන්න ඕනෑ. අන්න ඒ සිතුම් පැතුම්වල දියුණුව අපට අත්පත් කර ගන්න පුළුවන් වෙන්නේ පුද්ගලයා අනෙකාට ගරු කරන සමාජයක් ඇතුළේ. වැඩිහිටියා ශිෂ්‍යයන්ට ගරු කරන,

[ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය]

වැඩිහිටියා බාලයාට ගරු කරන, බාලයන් වැඩිහිටියන්ට ගරු කරන, අන්‍යෝන්‍යාව එකිනෙකාට ගරු කරන, කාන්තාවන්, පිරිමින් හැම කෙනාම එකිනෙකාට ආදරයෙන් සලකන, ගරුත්වයෙන් කටයුතු කරන, අන්තර් පුද්ගල ගරුත්වය ඇති සමාජයක් නිර්මාණය කිරීම කියන එක දීර්ඝ කාලීන පුහුණුවක ප්‍රතිඵලයක් හැටියටත් ලැබෙන දෙයක්. ඒ හැර නීතිමය රාමුව තුළ වළක්වන්න පුළුවන් වෙන්නේ, දණ්ඩනයට භය කරලා හදන්න පුළුවන් වෙන්නේ එක්තරා සීමිත කාලයක් තුළ විතරයි. ඒ නිසා දඬුවමට බිය වීම කියන කාරණාව, එකක්. තමා විසින්ම තමාව ස්වයං විනයට ලක් කර ගැනීම කියන එක තව එකක්.

මට මේ වෙලාවේ මතක් වෙනවා, පොඩි කාලයේ අහලා තිබෙන කවියක්.

"වේවැල් කෝටු නාරං සියඹලා අතු
කිතුල් පොල් ඉරටු වැල් කහඹිලිය අතු
මේ වැනි ඉපල් මගේ දැතට නොපෑ යුතු
පමා නොවී යම් අකුරට මෙයින් මතු"

මේ කවිය අහපු පොඩි කාලයේත් මගේ ඔළුවේ තිබුණු දෙයක් තමයි දරුවා ආසාවෙන් පාසලට යනවා නොවෙයි, ශිෂ්‍යයෙක් ආසාවෙන් පාසලට යනවා නොවෙයි, ගුටි කන්න වෙනවාට භයේ පාසලට යනවා කියන එක. ඉතින්, අපි බලාපොරොත්තු වෙන්නේ එහෙම අධ්‍යාපන ක්‍රමයක් නොවෙයි. පාසල කියන එක ප්‍රසන්න පරිසරයක් විය යුතුයි. නිවස කියන එක දරුවාට ප්‍රසන්න පරිසරයක් විය යුතුයි. දඬුවමට බියේ හැඩ ගැහෙන, දඬුවමට බියේ වෙවුලන දරුවන් වෙනුවට වැරැදි නොකරන දරුවන්, එහෙම නැත්නම් තමාට තමාව පාලනය කරගත හැකි ස්වයං විනයකින් යුතු සමාජයක් අපට ඕනෑ.

විශේෂයෙන්ම අපි දරුවා ලෙස සලකන්නේ වයස අවුරුදු 18ට අඩු අය. වයස අවුරුදු 18ට අඩු ළමයින්ව කා෴රත්වයට පත් කිරීම, වෙළඳාමට යොදවා ගැනීම, සාපරාධී ක්‍රියාවල යොදවා ගැනීම, ළමා මෙහෙකාර සේවය, ළමා විවාහ, ශ්‍රමය සූරා කෑම ආදී සියල්ලටම යොදවා ගැනීම සිදු කරනු ලබන්නේ වැඩිහිටි සමාජය විසින්.

ඒක නිසා හඬක් නැති දරුවෙකු; තමන්ට තමන් වෙනුවෙන් පෙනී ඉන්න බැරි වයස අවරුදු 18ට අඩු දරුවෙකු මේ ප්‍රචණ්ඩකාරී ප්‍රවණතාවන්ට යොදාගන්නේ වැඩිහිටියෙකු වන නිසා අපි හිතනවා, වැඩිහිටියාගේ පෞරුෂයේ පවතින ඌන සංවර්ධිත ලක්ෂණ තමයි තමන් වෙනුවෙන් තමන්ට පෙනී ඉන්න හැකියාවක් නැති දරුවන් මත මුදා හරින්නේ කියලා. ඒක නිසා ප්‍රචණ්ඩත්වය මුදා හැරීම කියන එක ගුරුවරයාගෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, දෙමව්පියන්ගෙන් තමන්ගේ දරුවාට, වෛද්‍යවරයාගෙන් රෝගියාට, ආරක්ෂක අංශයෙන් ආරක්ෂාව බලාපොරොත්තුවෙන් එන කෙනාට, සේව්‍යයාගෙන් සේවකයාට ආදි වශයෙන් කොයි කෙනෙකුගෙන් සිද්ධ වුණත්, ඒක වරදක්. ඒක නිසා අපි හැම විටම බලාපොරොත්තු වෙනවා, අපේ ඊළඟ පරපුර හැටියට තමන් වෙනුවෙන් පෙනී ඉන්න හැකියාවක් නැති, තමන් වෙනුවෙන් සටන් කරන්න හඬක් නැති, තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් තමන්ට ක්‍රියාමාර්ග ගන්නට බැරි, වයස අවුරුදු 18ට අඩු දරුවන් වෙනුවෙන් ප්‍රචණ්ඩත්වය මුදා හැරීම කියන එක අද ගෙනෙන මෙන්න මේ සංශෝධන පනත් කෙටුම්පත ඇතුළේ තිබෙන දඬුවමින් යම්තාක් දුරකට ආවරණය වේවි කියලා. ඇත්තටම ආකල්පමය පරිවර්තනය සමාජය තුළ ඇති වනතුරු, ස්වයං විනය වැඩිහිටියන් තුළ ඇති වනතුරු එම ක්‍රියාව යම්තාක් දුරකට මීස සියයට 100ක් මේකෙන් ආවරණය කරන්න බැරි බව අපි කියනවා. ඒ වාගේම තමයි, අප කිසිම කෙනෙකුට තමන් හදිසි ආවේගයට පත්වීම මත දරුවා මත ප්‍රචණ්ඩත්වය මුදා හැරීමට අයිතියක් නැහැ. අම්මා තාත්තා වෙන්න පුළුවන්; තමන් කොයි තරම් කෝප ගැන්වෙන අවස්ථාවක වුණත්, තමන් කොයි තරම් ආතතියට ලක් වන අවස්ථාවක වුණත් ඒ ආතතිය, පීඩනය, කෝපය මුදා හරින්න දරුවෙකුව පාවිච්චි කරන්න කිසිවෙකුට අයිතියක් නැහැ. එසේ චේතනාන්විතව දරුවෙකු මත ඒ ආවේගය මුදා හැරීම කියන එක බරපතළ වරදක්. ඒක නිසා එය දණ්ඩනය ලැබිය හැකි වරදක් බවට පත්වීම අද ගෙනෙන මෙම සංශෝධනය හරහා සිද්ධ වෙනවා.

මෙහිදී අප බලාපොරොත්තු වන ප්‍රධාන ප්‍රවණතා දෙකක් තිබෙනවා. එකක් තමයි, නීතිමය ආවරණය ඇතුළේ ළමයා සුරක්ෂිත කිරීම. දෙවැනි කාරණාව තමයි, මෙන්න මේ කියන දියුණු මානවීය ලක්ෂණවලින් යුතු සමාජයක් නිර්මාණය කිරීම ඇතුළේ ළමයාගේ නිදහස් සංවර්ධනයට මඟ පෑදීම. මේ දෙකම වෙනුවෙන් ගන්න අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත යුතුව තිබෙනවා. මෙන්න මේ දියුණු මානවීය ලක්ෂණවලින් යුතු සමාජයක් නිර්මාණය කිරීම තමයි අප ප්‍රධාන වශයෙන් ඉලක්ක කරන්නේ. ඒ කරා යන ගමනේදී මූලික පියවරක් හැටියට මේ නීතිමය ආවරණය කියන එක අපට අවශ්‍ය වෙනවා. 1998 වර්ෂයට පෙර 'ළමයා' යන්න නිර්වචනය වුණු ආකාරයට, අවුරුදු 12ට අඩු කෙනෙක් තමයි ළමයා ලෙස සැලකුවේ. ඒක නිසා එවකට දරුවන් ළමා මෙහෙකාර සේවයේ යෙදවීම, ශ්‍රමය සූරාකෑම, සිඟමනේ යෙදවීම, අන්තරායකර රැකියා සඳහා යොදා ගැනීම, ආපදාකර රැකියාවලට යොදා ගැනීම, විවාහ කර ගැනීම ආදි සියල්ල සිද්ධ වෙලා තිබුණා. හැබැයි මේ වනකොට 'ළමයා' යන්නට අදාළව පැවැති ඒ වයස් කාණ්ඩය අවුරුදු 18 දක්වා ඉහළ නංවා තිබෙනවා. වයස අවුරුදු 18ට අඩු සියලුදෙනාම ළමයින් ලෙස සලකන සමාජයක තමයි අපි දැන් ඉන්නේ. ඒ උසස් මානවීය ලක්ෂණවලින් යුතු සමාජ විකාශයේ දියුණුවත් එක්ක රටක් හැටියට අපි මේ තත්ත්වයට පත් වෙන්න ඕනෑ. ඒ නිසා වයස අවුරුදු 18ට අඩු හැම පුද්ගලයෙක්ම ළමයෙකු ලෙස සලකන, අන්න ඒ දරුවාට කායික, මානසික, වාචික හා ලිංගික වශයෙන් කිසිදු හිංසනයක් සිදු නොවන තත්ත්වයකට අපි මේ රට දියුණු කරනවා.

ඒ වාගේම තමයි අපි බලාපොරොත්තු වෙනවා, දරුවා මත ප්‍රචණ්ඩත්වය මුදා හැරීම වැළැක්වීමට. අවුරුදු 20කට වැඩි දීර්ඝ කාලයක් පාසල් සේවයේ හිටපු ගුරුවරියක හැටියට මම කියන්නේ දරුවාට දඬුවම් කිරීම ඇතුළේ දරුවාගේ ආධ්‍යාත්මය බිඳ වැටීම සිදු වන බවයි. ශාරීරික තුවාල පිටට පෙනෙන්න පුළුවන්. හැබැයි, හදවත කඩා වැටීම කියන එක පිටට පෙනෙන්නේ නැහැ. හැම අම්මා කෙනෙකුටම, හැම තාත්තා කෙනෙකුටම, හැම ගුරුවරයෙකුටම මේ සම්බන්ධයෙන් ලොකු වගකීමක් තිබෙනවා. බාහිරින් පෙනෙන තුවාල සිදු කිරීමට අදාළව දඬුවම් කරන්න අපට පුළුවන්. බාහිරින් පෙනෙන තුවාල සිදු කරපු අයට ලංකා දණ්ඩ නීති සංග්‍රහය ප්‍රකාරව දඬුවම හා දඩය කියන ඒවා නියම කරන්න පුළුවන්. හැබැයි ආධ්‍යාත්මික කඩා වැටීම්, හදවතේ කඩා වැටීම්, පරාජය සහ තමන් අපේක්ෂා භංගත්වයට පත්වීම කියන එක මනින්න මිම්මක් නැහැ. ඒ වාගේම තමයි අපට ඕනෑ උදාර පෞරුෂයකින් යුතු අනාගත පරපුරක් නම්, අපි දරුවන්ට ඒ ස්වාධීනත්වය දෙන්න ඕනෑ. දරුවාගේ රැකවරණය යටතේ අපි දරුවාගේ අවස්ථාව ලබා දෙන්න ඕනෑ. දරුවන්ගේ අවස්ථාව අහිමි කිරීම ද මේ පාසල් පද්ධතිය තුළ සහ සෙසු අවස්ථාවලදී අපි ප්‍රධාන වශයෙන් දකිනවා. එනම්, දරුවාට හිමි වරප්‍රසාද අහිමි කිරීම. වර්තමාන සමාජය තුළ සිදු වන පරිසර විනාශය නිසා; අනාගත දූ දරුවන්ට හුස්ම ගන්න තිබෙන වාතය, ගස් කොළන් ටික, ගංගා සහ ජලාශ ටික, පිරිසිදු පානීය ජලය ටික අද විනාශ කරලා දැමීම නිසා අනාගත දරුවන්ගේ උරුමය නැති වෙනවා. ඒක ප්‍රධානම අහිමි කිරීමක්.

ඒ වාගේම, අපි අද ප්‍රධාන වශයෙන් කථා කරන දෙයක් තමයි මත්ද්‍රව්‍ය භාවිතය.

වර්තමානය වන කොට මත්ද්‍රව්‍ය අපේ සමාජය වෙළාගෙන තිබෙනවා. අම්මලා හැටියට අපි අහනවා, දිනෙන් දින හසු වන මේ මහා මත්ද්‍රව්‍ය කන්දරාවෙහි දීර්ඝ කාලීන පාරිභෝගිකයන් බවට අපේ දරු පරපුර, අපේ දරු පැටවුන් පත් වෙලා අපේ ළමා පරපුර විනාශයට පත් වෙනවා නම් අපේ දරුවන්ට අප උරුම කරන්න බලාපොරොත්තු වන ඒ අනාගත ලෝකය කොහොමද ගොඩ නඟන්නේ කියලා. මෙන්න මේ කියන මත්ද්‍රව්‍ය ප්‍රශ්නය විසඳීමට අපට ප්‍රධාන වශයෙන්ම වැදගත් වනවා, මේ මෑතක සිට ක්‍රියාත්මක කරගෙන යනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාවලිය. විශේෂයෙන්ම පාසල් පද්ධතිය ඇතුළේ මත්ද්‍රව්‍ය ප්‍රවණතාව වැඩි වීම නිසා ලිංගික අපචාර වැඩි වීම, ධාරණය හා මතකය නැති වීම, පාසල් හැර යෑම් වැඩි වීම වාගේම ළමා ගර්භිණීභාවය -ළමයින් අතර ගර්භිණීභාවය - වැඩි වීම කියන ගැටලු ඇති වී තිබෙනවා. එම නිසා මේ සිද්ධි සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට අප හැමෝටම ලොකු වගකීමක් තිබෙනවා, පක්ෂ, පාට දේශපාලනයෙන් තොරව. විශේෂයෙන් හැම අම්මා කෙනෙකුටම, හැම තාත්තා කෙනෙකුටම ලොකු වගකීමක් තිබෙනවා, මේ මත්ද්‍රව්‍ය රකුසාගෙන් දරුවන් බේරාගන්න. මේ රටට මත්ද්‍රව්‍ය ගෙනැල්ලා අපේ දරු පරපුර විනාශ කරන මේ සමාජ ප්‍රවාහය අතුගා දැමීමේ වගකීම තනි තනිවත්, සමාජයක් හැටියටත් අපි භාර ගන්න ඕනෑ. ඒක දේශපාලන ඉලක්කයක් නොවෙයි, සමාජ ඉලක්කයක්. දියුණු මානවීය සමාජයක් කරා යන ගමනේදී අපට තිබෙන ප්‍රධාන ඉලක්කවලින් එකක් තමයි දරුවන්ට සුරක්ෂිත හෙටක් ලබා දෙන එක. ඒක දේශපාලන අරමුණකට එහා ගිය ජාතික අරමුණක්; ජාතික වගකීමක්. ඒ ජාතික වගකීම පැහැර හරින්නට හෝ ඉන් බැහැර වෙන්නට කිසිම කෙනෙකුට පුළුවන්කමක් නැහැ. අන්න ඒ නිසා තමයි, ළමයින්ට සිදු කරන කායික දණ්ඩනය වැළැක්වීම වෙනුවෙන් අප ගෙනැවිත් තිබෙන මේ සංශෝධන පනත් කෙටුම්පත ඉතා වැදගත් කියලා අප කියන්නේ.

කිසිදු දරුවෙක් හදවතින් තුවාල නොවිය යුතුයි. ඒ වාගේම, කායිකවත් තුවාල නොවිය යුතුයි. එසේ හදවතින් සහ කායිකව තුවාල නොවූ දරුවන් තමයි අපට ඕනෑ. ඒ නිසා ශරීරයෙන් තුවාල නොවුණු දරුවන් වාගේම, හදවතින් තුවාල නොවුණු දරුවන් තනා ගැනීම වෙනුවෙන් අපි ලොකු වැඩ කොටසක් කරන්න ඕනෑ. අන්න ඒ වෙනුවෙන් අපට ගන්න පුළුවන් සියලු ක්‍රියාමාර්ග අපි ගන්නවා. මේ කටයුත්ත වෙනුවෙන් මැදිහත් වුණු රාජ්‍ය පාර්ශ්ව, ස්වේච්ඡා සංවිධාන, විවිධ ආයතන, ළමා ක්‍රියාකාරීන් වාගේම විවිධ සිදුවීම්වලට මුහුණු දුන්නු දෙමාපියන් ඇතුළු හැම කෙනෙක්ම මෙම පනත් කෙටුම්පත සම්මත වන තෙක් දෑස් දල්වා බලාගෙන ඉන්නවා; දෑස් අයා බලාගෙන ඉන්නවා. ඒ නිසා මෙය විශාල පිරිසකගේ බලාපොරොත්තු සඵල වීමක්. ඉතිහාසයේ අපට පෙර මේ වෙනුවෙන් ගොඩක් හඬ නගපු, කාර්යවලි කරපු හැම කෙනාටම ස්තුතිවන්ත වෙන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මොකද, සමාජයක ඉදිරිය සඳහා අතීතයේ පටන් මේ උදාර මෙහෙවර වෙනුවෙන් සටන් කළ ඒ හැම කෙනාටම ගෞරවය ලැබෙන ගෞරවනීය අවස්ථාවක්, මේක.

කායික දණ්ඩනය වැළැක්වීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයට අප අද මේ ගෙනෙන සංශෝධන ඉදිරි සමාජයට නිදහසේ ජීවත් වෙන්න ඉඩ ලබා දෙන්නක් වනවා. අපේ ආදරණීය ජනතාවගෙන්, විශේෂයෙන්ම අම්මා, තාත්තාගෙන් මා ඉල්ලීමක් කරනවා. ඔබට තිබෙන මාහැඟි සම්පත ඔබේ දරුවා. අපි කන මිරිකලා, ටොක්කක් ඇනලා, දරුවා දණ ගස්වන කොට ඒ දරුවාගේ ආත්මාභිමානය බිඳ වැටිලා ඉවරයි. ඒ බිඳ වැටෙන ආත්මාභිමානය නැවත කවදාවත් ගොඩනඟන්න බැහැ. සටන්කාමී දරුවෙක්, අගතියට එරෙහි වන දරුවෙක්, වරදට විරුද්ධව කථා කරන්න පුළුවන් පෞරුෂයක් තිබෙන දරුවෙක් එතැනින් එහාට කවදාවත් නිර්මාණය වෙන්නේ නැහැ. ඒ නිසා පාසල් පද්ධතියේදී අපි බලාපොරොත්තු වෙනවා දරුවන්ට ඒ හඬ නගා කථා කිරීමේ අයිතිය ලබා දෙන්න, ඔවුන්ගේ හැකියාවට අදාළ තැන, ඔවුන්ගේ කුසලතාවන්ට අදාළ තැන සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන වටපිටාව සකස් කරන්න. අපි ඒ හැම දෙයක්ම සුරක්ෂිත වන අධ්‍යාපන ක්‍රමයක් මේ රට තුළ නිර්මාණය කරනවා; ඒ වෙනුවෙන් වන වැඩ පිළිවෙළ ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනවා.

ආකල්ප සංවර්ධනයත් ඒ වාගේම තමයි. ලංකාවේ අප අදහන හැම ආගමක් තුළම සඳහන්ව තිබෙනවා, අපි කොහොමද බාල වයස්කරුවන්ට සලකන්න ඕනෑ, ගෞරව කරන්න ඕනෑ කියන කාරණා. ඒ වාගේම තමයි අපි අන්තර් පුද්ගල ගරුත්වය හදා ගන්න ඕනෑ කොහොමද කියන එකත් ඒ හැම ආගමික සංස්ථාවකින්ම -හැම ආගමකින්ම- ප්‍රකාශයට පත් වෙනවා. අපේ රට ඉතිහාසයේ ඉඳන්ම මානව ධර්ම අතින් හොඳ, වටිනා වටාපිටාවක් තිබුණු, ආගන්තුක සත්කාරයට ගරු කරපු, පුද්ගල ගරුත්වය ලබා දීපු රටක්. අපේ රට ඒ පිළිබඳව හොඳ ඉතිහාසයක් තිබුණු රටක්. හැබැයි, වර්තමානය වනකොට අනෙකාට මොන අගතිය සිද්ධ වුණත් අනෙකා ආරක්ෂා කරන්න ඉදිරිපත් නොවන සමාජයක් ඇති වෙලා තිබෙන්නේ මෙන්න මේ අපරාධ රැල්ල, එහෙම නැත්නම් මෙන්න මේ හිංසනය සාධාරණීකරණය කළ වටපිටාව තුළයි. ඒක නිසා අපි දරුවන්ගේ මනස තුවාල නොකර හදමු; කායික දණ්ඩනය වළක්වමු. කායික හිංසනයෙන් තොර සමාජයක් ඇතුළේ විතරයි අපට ඉහළ සාධනීය සමාජ තත්ත්වයක් අත්පත් කර ගන්න පුළුවන් වන්නේ. ඒක නිසා තමයි අප මේ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. මීට ඉහත පාසල් තුළ තිබුණු විනය පටිපාටි, ඒ සඳහා නිකුත් කර තිබෙන චක්‍රලේඛ ආදි සියල්ල කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. අපි දණ්ඩ නීති සංග්‍රහයට නව සංශෝධන කීපයක්ම ඉදිරිපත් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වගන්තියට ඉක්බිතිවම 308ආ කියන නව වගන්තිය ඇතුළත් කර තිබෙනවා.

පනතේ 308ආ (1) වගන්තියට අනුව, "වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂාව දරා සිටිමින් දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රමයක් වශයෙන්, කොතරම් අඩු වුවද යම් ප්‍රමාණයක වේදනාවක් අපහසුතාවක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික බලය භාවිත කරනු ලබන යම් ක්‍රියාවක් සිදු කරන; හෝ

කෙතරම් අඩු වුව ද යම් ප්‍රමාණයක අවමානයක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික නොවන යම් ක්‍රියාවක් සිදු කරන කවර හෝ තැනැත්තකු ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදු කරන්නේය" කියන එක මේ පනතේ තිබෙනවා. ඒ වරදට අනුව දඬුවම් සංශෝධනයත් සිද්ධ වෙනවා.

අපි ලෝකය ගත්තොත්, අපි අද ඉදිරිපත් කරන සංශෝධන මීට ඉහත වෙනත් රටවලින් පිළිගෙන තිබෙනවා.

ඒ වාගේම ප්‍රධාන ප්‍රඥප්තියේ 316 වගන්තිය මේ විධියට සංශෝධනය වෙනවා.

"316අ. 326 වන වගන්තිය මඟින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවේ දී හැර, වයස අවුරුද් අහඅටකට වඩා අඩු තැනැත්තෙකුට ස්වේච්ඡාවෙන් බරපතළ තුවාල සිදුකරන කවර හෝ තැනැත්තෙකුට අවුරුදු දහයක කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි බරපතළ වැඩ සහිත හෝ රහිත දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් දඬුවම් නියම කරනු ලබන්නේය."

අන්න ඒ කාරණා තමයි ඇතුළත් වෙන්නේ.

මීට අමතරව මම මේ වෙලාවේ තවත් කාරණයක් කියන්න කැමතියි. විශේෂයෙන් පාසල් පද්ධතිය තුළ ළමයෙක් පාසලට අනුචිත, අශෝභන, අයෝග්‍ය යැයි සැලකෙන විධියේ කොණ්ඩා

[ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය]

මෝස්තරයකින් සැරසිලා ආවාම, ඒ දරුවාට එතැනින් එහාට සමාජයට මුහුණ දෙන්න බැරි විධියේ දඬුවම් ලබා දෙනවා. ඒ වාගේම පාවහන්වලට ගල්වන ආලේපන -සපත්තු පොලිෂ්- හිසේ ආලේප කළ අවස්ථා ගැන වාර්තා ලැබිලා තිබෙනවා. ගැහැනු දරුවන්ගේ ගවුමේ වාටිය ලිහනවා. මෙවැනි දඬුවම් කායික දඬුවම් ගණයට නොවැටුණත්, දරුවාගේ ආත්මාභිමානය, ආත්ම විශ්වාසය පලුදු වෙන අවස්ථා වෙනවා. ඒ නිසා දණ්ඩනය කියන එකට නව්‍යකරණයක් අවශ්‍යයි. මීට වඩා වෙනස්, විකල්ප දණ්ඩන ක්‍රම අවශ්‍යයි. ඒක නිසා තමයි අපි කියන්නේ, දරුවන්ගේ බාහිරින් තිබෙන තුවාල දකින්න අවස්ථාව තිබුණාට, බාහිරින් තිබෙන තුවාල අපට පෙණුනාට, ඒවාට දණ්ඩන ලබා දුන්නාට, දරුවන්ට සිදුවන ප්‍රතික්ෂේප කිරීම් හා ආත්මාභිමානයට, ආත්ම ගෞරවයට සිදුවන හානි කියන එකට දණ්ඩනයක් නැහැ කියලා. ඒ නිසා අපි වර්තමානයේ කරන්න බලාපොරොත්තු වෙන දේවල් තිබෙනවා.

ඉන් එකක් තමයි, ආර්ථික අපහසුතා තිබෙන දරුවන් ඒ පවුල් පිටින් ආර්ථිකව සවිබලගන්වන්න ඕනෑ. එතකොට ඒක අනිවාර්යයෙන් ආවරණය වෙනවා. ආර්ථික අපහසුතා තිබෙන දරුවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම ඇතුළේ දරුවාට පාසල් යෑමේදී නිල ඇඳුමේ තිබෙන අඩු පාඩු, පාසල් පොත් පත්වල තිබෙන අඩු පාඩු, පාවහන්වල තිබෙන ගැටලු ආදි සියල්ලක්ම රජයේ පාර්ශ්වයෙන් පූර්ණය කරනකොට දරුවා අධ්‍යාපනය ලබන අවස්ථාවලදී සමානාත්මතාව කියන එක ඇති වෙනවා. හැම දරුවෙකුටම සමාන පහසුකම් ලැබෙනවා. ඒ නිසා පහසුකම්වල අඩුපාඩුව මත නැවත වරක් ළමයා අපහසුතාවට හෝ හිංසනයට පත් නොවන්න රජයක් හැටියට අපි හැම තිස්සේම වගබලා ගන්නවා.

ඒ වාගේම තමයි අපි මේ ළමයින්ට ඇති කරන විකල්ප අධ්‍යාපන අවස්ථා. අධ්‍යාපනයේ තිබෙන බරත් අපි මේකෙන් ආවරණය කරන්න ඕනෑ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ ළමයාගේ සාධනීය වෙනස්කම් සඳහා වන මඟපෙන්වීම අපි කරමින් යනවා. ශාරීරික දඬුවම් තහනම් කර තිබෙන රටවල යොවුන් ප්‍රචණ්ඩත්වය පහව ගොස් ඇති බවට සාක්ෂි තිබෙනවා. ශ්‍රී ලංකාව මේ සම්මුතියට අත්සන් කිරීමෙන් වසර ගණනාවකට පසු එකී සම්මුතියට එළඹුණු දකුණු සුඩානය, දකුණු අප්‍රිකාව වැනි රටවල් පවා මේ වනවිට ශාරීරික දඬුවම් තහනම් කරලා තිබෙනවා. මේවායින් ඒ රටවල් සාධනීය ලක්ෂණ අත්පත් කරගෙන තිබෙනවා. ලෝකයේ ළමයින්ගෙන් සියයට 15ක් පමණ සියලු ශාරීරික දඬුවම්වලින් නීතියෙන් සම්පූර්ණයෙන්ම ආරක්ෂා වෙලා තිබෙනවා. රටවල් 115ක් තවම නීති සකස් කරලා නැහැ. රටවල් 62ක පාසල්වල ශාරීරික දඬුවම් සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා. රටවල් 15ක් අපරාධ සඳහා දඬුවම් ඇතුළුව ශාරීරික දඬුවම් සම්පූර්ණයෙන්ම තහනම් කරලා නැහැ. ඇත්තටම ගත්තොත්, රටවල් 62ක් කායික දණ්ඩනය කියන එක සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, මේ වේගයෙන් දියුණු වෙන ලෝකය ඇතුළේ අපේ දරුවන්ට මනසින් නිදහස්, හිංසනයෙන් තොර පරිසරයක් ඇති කරගන්න. එළඹෙන ඔක්තෝබර් 01වැනි දාට යෙදෙන ලෝක ළමා දිනයට සමගාමීව අපි "ළමා දින ජාතික සතියක්" ප්‍රකාශයට පත් කර තිබෙනවා. අන්න ඒ ළමා සතිය වෙනුවෙන් අපට අද ගන්න ලැබිච්ච මේ පියවර ඉතාම සාධනීය පියවරක්. මේ සාධනීය පියවර හරහා අනාගත දරුවන්ට සුරක්ෂිත හෙට දවසක් ලබා දෙන බවට අපි සහතික කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ajith P. Perera. You have a time allocation of 18 minutes.

[පූ.භා. 10.52]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2005 අංක 23 දරන ශාරීරික දණ්ඩන ඉවත් කිරීමේ පනත මඟින් - අදට අවුරුදු 20කට කලින් - ශාරීරික දණ්ඩනය අපේ රටේ නීතියෙන් ඉවත් කරලා තිබෙනවා. ඒක අලුත් දෙයක් නොවෙයි. දැන් මේ අලුත් නීතියෙන් කරන්න යන්නේ, ඒ ශාරීරික දණ්ඩනය ඉවත් කිරීම කියන ස්ථාවරය ඉතාම දැඩි, බරපතළ තැනකට අරගෙන යෑමයි. ගරු ඇමතිතුමිය දීර්ඝ කථාවක් කළා. ඇත්ත වශයෙන්ම එතුමිය කියපු හැම දෙයකටම මම එකඟයි. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩි ප්‍රශ්නයකට තිබෙන්නේ මේ පනතේ තිබෙන ඉතා බරපතළ, සංවේදී, ගැටලුසහගත, ප්‍රායෝගික කාරණා, නීතිමය කාරණා, සදාචාරාත්මක කාරණා, ගුරුවරුන්ට බලපාන කාරණා, දෙමව්පියන්ට බලපාන කාරණා සහ දරුවන්ට බලපාන කාරණා. මේ සංශෝධන පනත් කෙටුම්පතේ 308ආ. (ආ) හි මෙසේ සඳහන් වෙනවා:

> "කෙතරම් අඩු වුව ද යම් ප්‍රමාණයක අවමානයක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික නොවන යම් ක්‍රියාවක් සිදුකරන, කවර හෝ තැනැත්තකු ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකරන්නේ ය."

ඒකට වසර ගණනාවක් සිරගත කරනවා. මොකටද? "කොතරම් අඩු වුවද" යන්නට ඉංග්‍රීසියෙන් කියන්නේ, "however light." මම ඒක ඉංග්‍රීසියෙන් සම්පූර්ණයෙන් කියවන්නම්. The Bill states, I quote:

> "(*b*) non-physical act with knowledge that it is likely to cause humiliation however light,"

"කොතරම් අඩු වුවත්".

ගරු ඇමතිතුමියනි, ඔබතුමියත් ගුරුවරියක්. මම නීතිඥයෙක්, කථිකාචාර්යවරයෙක්, දරුවන් තුන්දෙනෙකුගේ තාත්තා කෙනෙක්, ගුරුවරියකගේ ස්වාමිපුරුෂයෙක්. ඒ නිසා මටත් සැලකිය යුතු අත්දැකීමක් තිබෙනවා මේ විෂය ගැන. ඔබතුමිය උදාහරණයක් කිව්වා, ගැහැනු ළමයෙක් කොටට ඇඳගෙන පාසලට ආවොත්, ඇඳුමේ වාටිය දික් කළාමත් ප්‍රශ්නයක් තිබෙනවා, පාට පාටින් cutex ගාගෙන පාසලට ආවොත්, නොගැළපෙන සපත්තු දමාගෙන ආවොත්, ඒ පිළිබඳව පාසලේ ශිෂ්‍ය නායකයන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන්, විනය පාලකයන් කටයුතු කරනවා කියලා. ඒක මෙච්චර කල් කළා. ඒ වැඩේ කෙරෙන්නත් ඕනෑ.

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය දැනගෙන හෝ නොදැන මේ ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේ 308ආ. (ආ) හි සඳහන් පරිදි "කෙතරම් අඩු වුව ද යම් ප්‍රමාණයක අවමානයක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික නොවන යම් ක්‍රියාවක් සිදුකරන," කියන අර්ථ නිරූපණය ඕනෑවට වඩා පුළුල් වැඩියි. මේ අර්ථ නිරූපණය තුළ ළමයෙකුට පන්තියේ "ලකුණු ප්‍රමාණය අඩුයි, මහන්සි වෙන්න ඕනෑ" කියලා කිව්වත්, ඒකත් අවමානයක් කියලා කෙනෙකුට කියන්න පුළුවන්. ඔබතුමිය ගත් උදාහරණය, "ගවුම කොට වැඩියි, දික් කරගන්න" කියන එකත් මේ අර්ථයට

වැටෙනවා. සංශෝධනයක් කළොත් මේකෙන් එළියට එන්න පුළුවන්, ගරු ඇමතිතුමියනි. ඒ සංශෝධනය තමයි "අවමානය" කියන වචනයට අර්ථ නිරූපණයක් දෙන එක. අවමානය - humiliation - කියන කාරණය මත සිර දඬුවමකට ලක් කරන්නේ කාවද? අපරාධ නඩුව පවරන්නේ කාටද? පොලීසිය අත්අඩංගුවට ගන්නේ කාවද? වැඩ තහනම් වෙන්නේ කාගෙද? ගුරුවරයාගේ. එහෙම නැත්නම් අම්මා තාත්තා, එහෙමත් නැත්නම් පාසලේ ශිෂ්‍ය නායකයින්. විනය පිළිබඳව වගකීම් දරන අය. අද හවසට මෙම පනත් කෙටුම්පත යම් හෙයකින් සම්මත වුණොත්,- ඔබතුමියගේ ආණ්ඩුවේ 159දෙනෙක් ඉන්නවා. ඒ නිසා ඕනෑ නම් මේක සම්මත කර ගන්න පුළුවන්. හැබැයි, විනය පාලනය පිළිබඳව පාසලේ සහ නිවසේ තිබිය යුතු තත්ත්වය අපේ සංස්කෘතියේ තිබිය යුතු වැදගත් කාරණාවක්. අපි කිසි විටෙක කියන්නේ නැහැ, ශාරීරික දඬුවම් අවශ්‍යයි කියලා. අපි ශාරීරික දඬුවම්වලට විරුද්ධයි. ශාරීරික දඬුවම් සම්පූර්ණයෙන් අහෝසි කළ යුතුයි. හැබැයි, මේ පනත් කෙටුම්පතේ ශාරීරික දඬුවම් නොවන වෙනත් කොටසකුත් තිබෙනවා, ගරු ඇමතිතුමියනි. ඒකයි ප්‍රශ්නය. මේකේ තිබෙනවා,"කෙතරම් අඩු වුව ද යම් ප්‍රමාණයක අවමානයක්..." කියලා. අවමානයක් වෙන්න ඕනෑත් නැහැ, "යම් ප්‍රමාණයක අවමානයක් ඇති වීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික නොවන යම් ක්‍රියාවක්..." යනුවෙන් තමයි තිබෙන්නේ. වරදවා හිතන්න එපා, අපි ශාරීරික දඬුවම්වලට විරුද්ධයි. වැරදිලාවත් වෙනත් අර්ථයක් ගන්න එපා. ශාරීරික නොවන යම් ක්‍රියාවක් සිදුකරන යැයි කියනු ලබන දෙයක් ගැනයි මේ කියන්නේ.

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය නැවත කියවලා බලන්න. ඔය පනත් කෙටුම්පතේ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ වෙන තැනක හෝ "අවමානය" - "humiliation" - කියන එකට කිසිම අර්ථ නිරූපණයක් දීලා නැහැ. මහේස්ත්‍රාත්වරයෙකුට මේ වගකීම දෙන්නේ කොහොමද? එක් එක් මහේස්ත්‍රාත්වරයාට එක් එක් අර්ථ නිරූපණ තිබෙන්න පුළුවන්. කෙනෙකුට අවමානයක් වෙන්න පුළුවන් දෙයක් තවත් කෙනෙකුට අවමානයක් නොවෙන්න පුළුවන්. සුළු තුවාලයක් යනු කුමක්ද, බරපතළ තුවාලයක් යනු කුමක්ද කියලා දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ නිරූපණය කරලා තිබෙනවා. හැබැයි, "අවමානය" කියන එක අර්ථ නිරූපණය කරලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍යවරයකු හැටියට ඔබතුමා දන්නවා තුවාල වර්ගීකරණය කරන්න පුළුවන් පැහැදිලි අර්ථ නිරූපණයක් තිබෙන බව. හැබැයි, අවමානය පිළිබඳ අපරාධ වරදක්, - අපි කොහොමත් criminal defamation අයින් කරලා තිබෙන්නේ. අපි වැඩිහිටියන් සම්බන්ධව තිබුණු සාපරාධී අපහාසය - criminal defamation - කියන වරද අයින් කළා. අපි ඒක දැක්කේ සංස්කෘතියේ දියුණුවක් හැටියට.

දැන් මෙතැන තව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ, වයස අවුරුදු 18 ළමයාගේ අර්ථ නිරූපණය. ඒක හරි. අවුරුදු 18ක් වෙන්න ඕනෑ. හැබැයි, අද අවුරුදු 16න් පස්සේ කැමැත්තෙන් ලිංගික ක්‍රියාවල යෙදෙන්න පුළුවන්, කැමැත්තෙන් සංසර්ගයේ යෙදෙන්න පුළුවන්, කැමැත්තෙන් බයිස්කෝප් බලන්න යන්න පුළුවන්, කැමැත්තෙන් beach එකට යන්න පුළුවන් කියලා ඔබතුමිය දන්නවා. වයස අවුරුදු 16-18 අතර අයට කැමැති දෙයක් කරන්න පුළුවන්. ඔබතුමිය ඒ නීතිය වෙනස් කරන්නේ නැහැ. ඒක නේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. වයස අවුරුදු 16ට වැඩි ගැහැනු ළමයෙකු හෝ පිරිමි ළමයෙකු විරුද්ධ පාර්ශ්වයේ කෙනෙකු එක්ක හෝ සම පාර්ශ්වයේ කෙනෙකු එක්ක ලිංගික ක්‍රියාවක් කරලා දෙමව්පියන්ට අහු වෙනවා, ගුරුවරුන්ට අහු වෙනවා. එවැනි වෙලාවක ස්වභාවිකවම මතු වෙන්න පුළුවන් ප්‍රතිචාරයක් තිබෙනවා. එක්කෝ, කනෙන් අල්ලන්න පුළුවන්, තදින් බණින්න පුළුවන්. එතකොට ඒ දරුවා කල්පනා කරන්න පුළුවන්, "මාව humiliate කළා; මට යම් විධියකින් අවමානයක් කළා" කියලා. "අවුරුදු 16ට වැඩි මට sex කරන්න පුළුවන්. අවුරුදු 16ට වැඩි මට නීත්‍යානුකූලව sex කරන්න පුළුවන්කම තිබියදීත් අපේ අම්මා මට බැන්නා, අපේ අම්මා මට අපහාස කළා" කියලා අම්මාව පොලීසියට අරගෙන යන්න පුළුවන්. එක call එකයි ඕනෑ කරන්නේ. ළමයින්ට සන්නිවේදනයේ දක්ෂතා තිබෙනවා. බොහොම පහසුවෙන් සන්නිවේදනය කරන්න පුළුවන්.

ගරු අගමැතිතුමියනි,ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමනි, මම බොහොම වගකීමෙන් කියා සිටිනවා, මෙතැන ප්‍රශ්නයක් තිබෙන බව. මොකක්ද තිබෙන ප්‍රශ්නය? මෙතැන ශාරීරික නොවන ක්‍රියාවන් සම්බන්ධව අර්ථ නිරූපණයක් නැහැ. අවමානය අර්ථ නිරූපණය කරලා නැහැ. මේක මෙලෙස ක්‍රියාත්මක වුණොත් ගුරුවරුන්ට, දෙමව්පියන්ට, ශිෂ්‍ය නායකයන් ඇතුළු දරුවන්ගේ භාරය දරන අයට අනවශ්‍ය ප්‍රශ්නයක් එනවා. ගහන්න බැහැ; ගහන්නම බැහැ. වරද සුළු වුණත්, බරපතළ වුණත් ගහන්නම බැහැ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ වෙන තැනක. මේ අර්ථ නිරූපණය පුළුල් වැඩියි, අනවශ්‍යයි. මේ අර්ථ නිරූපණය තුළින් ඉතා බරපතළ ගැටලු ඇති වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ මේ ගැනත් මම කියන්න ඕනෑ. කල් තියා දැනුම් දීලා, කාරක සභා අවස්ථාවේ සංශෝධනයක් මම ඉදිරිපත් කර තිබෙනවා. එය පාර්ලිමේන්තුවේ බෙදා හැර තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමියටත් ඒක ලැබිලා ඇති. නමුත්, ඒ ගැන ගරු ඇමතිතුමිය කරුණු කිව්වේ නැහැ. ඒ සම්බන්ධයෙන් මම කනගාටු වෙනවා. මම දන්නේ නැහැ, ඒ ඇයි කියලා. කෙසේ වුවත්, මම ඒ සංශෝධනය ඉදිරිපත් කර තිබෙනවා. මම සංශෝධනය ඉදිරිපත් කර තිබෙනවා, එතැනට "සද්භාවය" කියන වචන එකතු කරලා. සද්භාවය - *bona fide*. සද්භාවය කියන වචනය එකතු කරන්නේ මොකද? යම් හෙයකින් ගුරුවරයෙකු, දෙමව්පියන්, ශිෂ්‍ය නායකයෙකු සද්භාවයෙන් ක්‍රියා කරලා මෙවැනි අභාග්‍ය සම්පන්න තත්ත්වයකට පත් වුණොත්, එවැනි වෙලාවක ආරක්ෂාව සඳහා පරීක්ෂණ කරන පොලීසියට, නඩු අසන අධිකරණයට සලකා බලන්න පුළුවන් අවස්ථාවක් දෙන්න. එහෙම නැතිව සම්පූර්ණයෙන්ම ආවරණය කරන විධියේ වගන්තියක් ඇතුළත් කිරීම තුළ ප්‍රායෝගික නොවන, අනවශ්‍ය පීඩනයක් ගෙන දෙන, ඔබතුමිය සහ මේ රට අපේක්ෂා කරන ශාරීරික දණ්ඩනවලින් ළමයින් මුදා ගැනීමේ ශ්‍රේෂ්ඨ, වැදගත් වූ පරමාර්ථය වෙනුවට පීඩාකාරී තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. මොකද, ළමයින්ටත් නිදහස පිළිබඳ හැඟීම් තිබෙනවා. වයස අවුරුදු 16ට වැඩි ළමයින්ට ලිංගික ක්‍රියාවල යෙදෙන්න පුළුවන් කියලා අපේ රටේ නීතිය පිළිගන්නවා නම්, ඒ වාගේම අද ළමයින්ට බොහොම නිදහස්ව හැසිරෙන්න පුළුවන් සමාජයක් බොහෝ දුරට ඇති වෙලා තිබෙනවා නම්, එවැනි තත්ත්වයක් තුළ මේ වාගේ අවිනිශ්චිත අර්ථ නිරූපණයක් නැති තත්ත්වයක් තුළ ඉතාම බැරෑරුම් තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන සාකච්ඡා කරද්දී අපේ ගරු මන්ත්‍රීතුමෙකු එක්තරා උදාහරණයක් පිළිබඳව සඳහන් කළා. ඒ මන්ත්‍රීතුමා මෙහෙම කිව්වා. තමන්ගේ දියණිය වැඩිවියට පත්වීම නිමිත්තෙන් ගත් උත්සවයේ ආදායම් තාත්තා හෙළිදරව් කරනවා. ඒ නිසා දියණියට පාසලට යන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. දියණිය අවමානයකට පත් වෙලා. මෙවැනි තත්ත්වයක් තුළ, ඒ කියන්නේ තාත්තා දියණියගේ මල්වර වීමේ උත්සවයේ ආදායම් හෙළිදරව් කිරීම දරුවාට මානසික පීඩනයක් වෙලා, දරුවා පාසල් යන්නේ නැහැ කියලා තීරණය කරනවා. එතකොට මේ පනත් කෙටුම්පත සම්මත වුණොත්, එහෙම කරපු තාත්තාත් සිර දඬුවම් ලබන තැනැත්තෙකු බවට පත් වෙනවා. අපරාධ වගකීම - criminal liability. තාත්තා කරපු වැඩේ වැරදියි. ඒ ගැන සැකයක් නැහැ. හැබැයි, එවැනි ඉතා බරපතළ තත්ත්වයක ඉඳලා ඇමතිතුමිය කිව්වා වාගේ ගවුමේ වාටිය දික් කරගන්න, cutex

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගාන්න එපා, lipstick ගාන්න එපා, අපි අනුමත කරපු වර්ගයේ සපත්තු දමාගෙන එන්න, සෙරෙප්පු දමන්න එපා, සෙරෙප්පු නැතිව එන්න එපා යනාදී වශයෙන් කියන දෙයක් හෝ එක එක විෂයට ලකුණු අඩුයි, ඔබගේ අවධානය මදි, පන්තියේ නිදාගන්නවා කියන කාරණා පවා ගුරුවරයාට හිරේ යන්න හේතුවක් වනවා නම් ඒක නුසුදුසුයි. ශාරීරික දඬුවම් කරන්න බැහැ, ඒක පිළිගන්නවා. ගහන්න බැහැ, ඒක පිළිගන්නවා. තුවාල කරන්න බැහැ, ඒක පිළිගන්නවා. හැබැයි, මේ අර්ථ නිරූපණය ඕනෑවට වඩා වැඩියි; හොඳටම වැඩියි. ඒ නිසා රජය මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. ඒ නිසා මේ පිළිබඳව ගැඹුරින් කල්පනා කරන්න. මේ පනත් කෙටුම්පතේ පරමාර්ථය විශිෂ්ට වුණාට, ඒ ගැන ගැටලුවක් තිබෙනවා. ඒ නිසා ඉතුරු වගන්ති ගැන අපි ගැඹුරින් කල්පනා කරන්න ඕනෑ.

බරපතළ අවස්ථාවල, - ආබාධිත දරුවන්, ඒ වාගේම රැඳවුම් භාරයේ ඉන්න දරුවන් සම්බන්ධයෙන් කරන වැරදිවලට උපරිම දඬුවම් දෙන්න ඕනෑ. ඒ ගැන සැකයක් නැහැ. ඒ සම්බන්ධයෙන් වන වගන්ති හොඳයි. හැබැයි, මෙතැන ගැටලුව තිබෙන්නේ වරද අර්ථ නිරූපණය කිරීම වුවමනාවට වඩා වැඩි වීම. ඒ පුළුල් අර්ථ නිරූපණය තුළ බරපතළ අසාධාරණ තත්ත්වය නැති වෙන්න පුළුවන්. මේකේ තිබෙන බරපතළකම මෙහෙමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙවැනි චෝදනාවක් එල්ල වුණාම පොලිසියට මේ පැමිණිල්ල භාර ගන්න වෙනවා. පොලිසියට පරීක්ෂණයක් කරන්නම වෙනවා. පොතේ හැටියට, වරදක් කර තිබෙනවා නම් හුදු අවමානයක් වීම කියන මානසික මට්ටම තුළ පවා පොලීසියට අර ගුරුවරයාව, අම්මාව, තාත්තාව, ශිෂ්‍ය නායකයාව අත්අඩංගුවට ගන්න වෙනවාමයි.

අත්අඩංගුවට අරගෙන නිකම් ඉන්නත් බැහැ, "B" වාර්තාවක් සහිතව මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන්න ඕනෑ. මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරුවාම, නීතිය ක්‍රියාත්මක වීමෙන් ගුරුවරයෙක් නම් වැඩ තහනම් වෙනවා. ඒ අම්මා, තාත්තා රජයේ රැකියා කරනවා නම් ආයතන සංග්‍රහය ක්‍රියාත්මක වෙලා ඔවුන්ගේ වැඩ තහනම් වෙනවා. ඒ නිසා ඔවුන්ගේ ජීවිත විනාශ වෙනවා. නඩුව අහලා අවසානයේ මේ පනතේ අර්ථ නිරූපණය කුමක්ද, ව්‍යවස්ථාදායකයේ අර්ථ නිරූපණය කුමක්ද කියලා උසාවියට තීරණය කරන්න වෙන්නේ නැහැ. ගුරුවරයෙකුගේ වැඩ තහනම් වෙලා අවුරුදු දෙකක් ගෙදර හිටියොත් ඇති වෙන තත්ත්වය මොකක්ද? අපේ රටේ උසාවි නඩු අහලා දවසෙන් දෙකෙන් ඉවර කරන්නේ නැහැ නේ. අපේ රටේ මහෙස්ත්‍රාත් අධිකරණයක් නඩුවක් විභාග කරලා ඉවර කරන්න අවුරුදු පහක්වත් ගන්නවා. එවැනි වාතාවරණයක් තුළ ගුරුවරයෙකුට අවුරුදු පහක් රක්ෂාව නැතිව -වැඩ තහනම් වෙලා- බරපතළ චෝදනාවක් හිස මත තියාගෙන ගෙදර ඉන්න වුණොත්, එතැනයි ගැටලුව තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව බැරෑරුම්ව කල්පනා කරන්න ඕනෑ, මේක සෙල්ලමක් නොවෙයි. ශාරීරික දඬුවම් දැනටමත් -අවුරුදු 21කට කලින්- තහනම් කරලා තිබෙනවා. ඒ තහනමේ ස්වභාවය, දඬුවම වැඩි කිරීම වැනි දේවල් කරන්න අවශ්‍ය නම් ඒක් කමක් නැහැ. හැබැයි මේ පනත් කෙටුම්පතේ 4වන වගන්තියෙන් 308ආ (ආ) ලෙස ගෙනෙන සංශෝධනයෙන් පුංචිම දේකටත්, ශාරීරික දඬුවමක් නොවන දේකටත්, අවමානය කියන කාරණය ඇතුළත් කරලා තිබෙනවා. ඒකේ කියන්නේ, "යම් ප්‍රමාණයක අවමානයක්" කියලා. ඒ කියන්නේ අවමානය අර්ථ නිරූපණය කරලාත් නැහැ. ගරු ඇමතිතුමියනි, ඒකයි ගැටලුව. අවමානය අර්ථ නිරූපණය කරලා නැහැ. ඒ නිසා මේක බැරෑරුම් ප්‍රශ්නයක්, ගැඹුරු ප්‍රශ්නයක්. ඒ කාරණය කෙරෙහි රජය වශයෙන් ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

වරදවා අවබෝධ කර ගැනීම වළක්වන්න පොදුවේ මම නැවත මෙය කියනවා. ශාරීරික දඬුවම් වැළැක්වීම සඳහා වැඩිදුරටත් වඩාත් දියුණු නීති ගෙන ඒම සම්බන්ධව මා ඇතුළු සමගි ජන බලවේගය පක්ෂයි. ඒ සඳහා අවශ්‍ය වන අපගේ සහයෝගය ලබා දෙනවා. ඊයේ දින මේ පිළිබඳව පැවති ආංශික අධීක්ෂණ කාරක සභාවට අපේ මන්ත්‍රීවරුන් ගිහිල්ලා, විශේෂයෙන් අපේ නීතිඥවරුන් ගිහිල්ලා කරුණු කියා සිටියා. අද මේ පනත් කෙටුම්පත විවාදයට ගන්න එක රජයේ තීරණයක්. නමුත් මේ කාරණය පිළිබඳව නැවත නැවත සිතා බලන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මම ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව, සංශෝධනය පිළිගන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම තව වැදගත් කරුණු කිහිපයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. දැන් විශාල අවධානයක් යොමු වෙලා තිබෙනවා, අධිකරණ කටයුතු කෙරෙහි. අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විශේෂ ආරක්ෂාවක් ලබා දීලා තිබෙනවා. විනිශ්චයකාරවරුන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම පිළිබඳ විශාල බලයක් එයට තිබෙනවා. නමුත් අද සමාජය තුළ විනිශ්චයකාරවරුන් පත් කිරීම, මාරු කිරීම සහ උසස් කිරීම පිළිබඳව සැලකිය යුතු අවධානයකට ලක් වෙන, යම් ආකාරයක මතභේදකාරී, ඒ වාගේම විනිශ්චයකාරවරුන් තුළ යම් ආකාරයක අවිනිශ්චිතභාවයන් ගොඩනැඟෙන තත්ත්වයන් මතු වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සේවා කොමිසමට ඇති බලය අපි පිළිගන්නවා. නමුත් විශේෂයෙන් කියන්න අවශ්‍යයි, විනිශ්චයකාරවරුන් මාරු කිරීම සහ උසස් කිරීමේ ක්‍රියාදාමය පාරදෘශ්‍ය විය යුතු බව. මේ රජය බලයට පත් වෙනකොටත් රජයේ මූලික ප්‍රතිපත්තියක් වුණේ පාරදෘශ්‍යභාවය ආරක්ෂා කිරීම. අපිත් ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. ඒ නිසා අධිකරණ සේවා කොමිෂන් සභාවත් විනිශ්චයකාරවරුන් මාරු කිරීමේදී සහ උසස් කිරීමේදී පාරදෘශ්‍යභාවය රැකෙන ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළ යුතුයි. අධිකරණ සේවා කොමිෂන් සභාව විනිශ්චයකාරවරුන්ට මාරු වීම් සහ උසස්වීම් ලබා දීමේදී අනුගමනය කරන වැඩ පිළිවෙළ කුමක්ද කියලා වෘත්තියේ යෙදෙන සියලුම විනිශ්චයකාරවරුන්ට කල් තියා දැනගැනීමට අවකාශය තිබෙන්න ඕනෑ. ඔවුන්ගේ දක්ෂතා, අවශ්‍යතා හැකියා කියන ඒ සියල්ල සමඟ ඔවුන්ට අවබෝධයක් තිබෙන්න ඕනෑ, මේ ලැබුණු උසස්වීම හරිද වැරැදිද, තමන් ස්ථානගත වෙලා ඉන්නේ කොතැනද, තමන්ට ලකුණු කොච්චර ලැබුණාද, ඒ සඳහා වූ ක්‍රියාදාමය මොකක්ද කියලා. ඒ පිළිබඳව පාරදෘශ්‍යභාවයක් තිබෙන්න ඕනෑ. රටේ හැම තැනකම පාරදෘශ්‍යභාවය පරීක්ෂා කරන මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය තුළ විනිශ්චයකාරවරුන්ගේ පත් කිරීම්, මාරු කිරීම් සහ උසස් කිරීම් පිළිබඳව පාරදෘශ්‍යභාවය අත්‍යවශ්‍ය කරුණක් බව ඉතා වගකීමෙන් කියන්නේ මම මේ ක්ෂේත්‍රය පිළිබඳව බරපතළ වගකීමක් හිතේ තියාගෙනයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දිනවල යුක්තිය පසිඳලීම පිළිබඳව වැදගත් වන ප්‍රවෘත්තියක් පළ වුණා. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගමගෙදර දිසානායක මහතා ප්‍රකාශයක් කරලා තිබුණා, මධ්‍යම සංස්කෘතික අරමුදලේ රුපියල් මිලියන 8,000ක වංචාවක් සිදුවෙලා තිබෙනවා, එය රජය විසින් පත් කරපු කොමිෂන් සභාවක් මඟින් සොයාගෙන තිබෙනවා කියලා. මධ්‍යම සංස්කෘතික අරමුදලේ වංචාවක් සිදුවෙලා තිබෙනවාය කියන චෝදනාව පසුගිය රජයත්, මේ රජයත්, මේ පාර්ලිමේන්තුව තුළත්, එළියේදිත් දිගින් දිගටම මතු කරන්නේ ඇයිද කියලා ඔබතුමාත් හොඳින් දන්නවා. ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමාගේ ඒ ප්‍රකාශය "දිනමිණ" පුවත් පතේ headline එකේමයි තිබෙන්නේ.

එය අපේ අවධානයට ලක් වෙනවා. ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා කියන කාරක සභාව, 2025 ජූලි මාසයේ 15වැනි දා අංක අමප/25/1154/802/018 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව තමයි පත් කරලා තිබෙන්නේ. "මධ්‍යම සංස්කෘතික අරමුදල සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කිරීම" යනුවෙන් එහි සඳහන් කර තිබෙනවා. 2025.07.01 දින සන්දේශය, පරාසය වන්නේ, 2007 වර්ෂයේ සිට 2020 දක්වා කාල සීමාවේදී ආගමික ස්ථානවල විවිධ කටයුතු සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් මූල්‍යාධාර ලබා දීමේදී සිදු වී ඇති බවට වාර්තා වී තිබෙන විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් සොයා බැලීම. මේ කමිටුවේ සාමාජිකයන් තමයි, හිටපු මහාධිකරණ විනිසුරු ප්‍රදීප් ජයතිලක, සිවිල් ඉංජිනේරු සරත් රාමනායක, විශ්‍රාමික සහකාර විගණකාධිපති කේ.ඒ. චන්ද්‍රපාල කියන අය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කමිටුව මාස දෙකක් ඇතුළත වාර්තාව ඉදිරිපත් කරන්න ඕනෑ කියලා කියනවා. ඇත්තවශයෙන්ම මෙහෙම වාර්තාවක් තිබෙනවා නම් මේ සභාව දැනගත යුතුයි. ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමාට මම අභියෝග කරනවා, මෙම කැබිනට් පත්‍රිකාව ප්‍රකාරව මේ කමිටුව මාස දෙකක් ඇතුළත එවැනි වාර්තාවක් සකස් කරලා තිබෙනවා නම් අපි සියලුදෙනාගේම දැනගැනීම පිණිස ඒක ඉදිරිපත් කරන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නොවෙයි නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය අනුව දඬුවම් ලැබිය යුතු වරදක් තමයි ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා කරන්නේ.

ඒ විතරක් නොවෙයි. මේ ප්‍රශ්නය පිළිබඳවම මීට කලින් හිටපු මහාධිකරණ විනිසුරු වසන්ත ජිනදාස මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් කටයුතු කළා. එම කමිටුවේ සාමාජිකයන් වන හිටපු මහාධිකරණ විනිසුරු වසන්ත ජිනදාස මැතිතුමා -දැන් ආණ්ඩුකාරතුමා- පරිපාලන සේවයේ විශ්‍රාමික එච්.පී. ගුණපාල මැතිතුමා, ඒ වාගේම පරිපාලන සේවයේ විශ්‍රාමික එම්.බී. වීරකෝන් මැතිතුමා විසින් පරීක්ෂණයක් කළා. එම පරීක්ෂණ වාර්තාව මා සතුව තිබෙනවා. ඇත්තවශයෙන්ම දේශපාලනික වශයෙන් මඩ ගැසීමක් විධියට යම් කෙනෙක්ව යම් චෝදනාවකට ලක් කරලා, දිගින් දිගටම මඩේ දානවා, මඩේ දානවා, මඩේ දානවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි මතක තියාගන්න, වැරදි නොකරපු මිනිහෙක්ව ඒ විධියට කොච්චර මඩේ දැම්මත් පීඩාවට ලක් කරන්න බැහැ, හානියට පත් කරන්න බැහැ කියලා. මෙම වාර්තාව තුළ යම් පුද්ගලයෙකු විශේෂිතව නම් කරලා ඔහුට විරුද්ධව එවැනි කිසිම වංචනික චෝදනාවක් ඇත්තේ නැහැ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට කලින් ගාමිණී සරත් එදිරිසිංහ, ගෝඨාභය ජයරත්න, ඒ වාගේම නීතිඥ හරිගුප්තා රෝහණධීර යන සාමාජිකයන් තුන්දෙනාගෙන් යුත් කමිටුවකුත් පත් කළා. ඒ කමිටුවත් කිසිම ආකාරයකට පුද්ගලයෙක් ඉලක්ක කර ගත් චෝදනාවක් හෝ නිශ්චිත වංචාවක් සොයාගෙන නැහැ.

ඊළඟට, මේ කාරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් යොමු කළා. එම කොමිෂන් සභාවේ 2022.11.11 දින දරන නියෝගයෙන් කියනවා, "බීසී/1528/2014 දරන ගොනුව සම්බන්ධයෙන් අල්ලස් පනත යටතේ කටයුතු කිරීමට ප්‍රමාණවත් කරුණු අනාවරණය නොවුණු බැවින්, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නොකිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉවරයක් වෙන්න එපායැ. සද්භාවයෙන් දේශපාලනය කරන මිනිස්සු උපරිම විශ්වාසයේ හැටියට තමන්ගේ රාජකාරි කටයුතු කරනවා. මේ රටේ සංස්කෘතික අයිතිවාසිකම් දිනාගන්න කටයුතු කරන අය වෙනුවෙන් ඒක කරන්න ඕනෑ. ඇත්තවශයෙන්ම මේ විධියට චෝදනාවට ලක් කරන්නට හදන අපේ ගරු මන්ත්‍රීතුමා මේ මධ්‍යම සංස්කෘතික අරමුදල පිළිබඳ වගකීම දැරුවේ මාස 11යි. කිසිම වරදක් නොකරපු පුද්ගලයෙකුට එරෙහිව මේ විධියට කමිටු පිට කමිටු දැම්මත් අද වෙනකල් වරදක් සොයා ගන්න පුළුවන් වෙලා නැහැ. ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ පාර්ලිමේන්තුවේ ඉන්නවා නම්, එතුමාට මේ සම්බන්ධව උත්තර දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අර ඉන්නේ, අර ඉන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඉන්නවාද?

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පත්තරයට කිව්වා නේ, වාර්තාව තිබෙනවා කියලා. ඒ කියන්නේ ප්‍රදීප් ජයතිලක, සරත් රාමනායක සහ කේ.ඒ. චන්ද්‍රපාල කියන අයගෙන් සැදුම්ලත් කමිටුව මාස දෙකක් ඇතුළත වාර්තා ඉදිරිපත් කරන්න ඕනෑ. ජූලි මාසයේ 15වැනි දා ඉඳලා බැලුවාම අද වෙනකොට මාස දෙකක් ගත වෙලා ගොඩක් කල්. නියෝජ්‍ය ඇමතිතුමනි, මම තමුන්නාන්සේට අභියෝග කරනවා. එම වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න, වගකිව යුතු නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට. එහෙම නැත්නම් සමාව ගන්න, "දිනමිණ" පත්තරයේ headline එකට ගහන්න ඒ සාවද්‍ය ප්‍රකාශය කළ එකට. මේක හැම දාම කරන්න දෙන්න පුළුවන් දෙයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙතුමාට මතක් කරන්න කැමැතියි, -තවම දැකලා නැත්නම්, කියවා නැත්නම්,- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කියවන්න කියලා. ඔබතුමා පදනමක් නොමැතිව ප්‍රකාශයක් කර තිබෙනවා නම්, එම චර්යා ධර්ම සංග්‍රහයට අනුව ඔබතුමා වරදක් කර තිබෙනවා. ඔබතුමාට දැන් වුණත් අවස්ථාව දෙන්නම්, මට වැඩිපුර වෙලාව තිබෙන නිසා. ඔබතුමා ළඟ එම වාර්තාව තිබෙනවාද? ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සභාවේ ඉන්නවා නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා ළඟ ඔය කියන ප්‍රදීප් ජයතිලක හිටපු මහාධිකරණ විනිශ්චයකාරතුමාගේ වාර්තාව තිබෙනවාද? *[බාධා කිරීමක්]* වාර්තාව තිබෙනවාද? *[බාධා කිරීමක්]* වාර්තාව තිබෙනවාද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
උත්තර දෙන්නකෝ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
වාර්තාව තිබෙනවාද? *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඉඩ දෙනවා නම්, කියන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

වාර්තාව තිබෙනවාද? *[බාධා කිරීම්]* වාර්තාව තිබෙනවාද? *[බාධා කිරීම්]* වාර්තාවක් නැත්නම් ලජ්ජයි, නියෝජ්‍ය ඇමතිතුමා. කරුණාකරලා සමාව අරගෙන මේ ප්‍රශ්නය ඉවර කරගන්න. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. එම වගකීම ඉෂ්ට කරන්නේ නැත්නම් අපි ඒ ගැන කනගාටු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විවාදයට ගනු ලබන ප්‍රධාන විෂය ගැන මම කථා කරන්නම්. කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමියනි, ඔබතුමියගේ චේතනාව පැහැදිලියි. ගුරුවරියක් හැටියට ඔබතුමියට බොහොම ප්‍රායෝගික අවබෝධයක් තිබෙනවා. හැබැයි, මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත ඕනෑවට වඩා දැඩි වැඩියි, අර්ථ නිරූපණය පුළුල්. මේ නිසා ඔබතුමිය නියෝජනය කරන ගුරු වෘත්තියේ නියැළෙන්නන් වාගේම මේ රටේ ලක්ෂ ගණනක් වන දෙමව්පියෝත්, පාසල්වල ශිෂ්‍ය නායකයෝත් ලොකු අමාරුවක වැටෙනවා. ඒ නිසා මම ඔබතුමියට කියන්න කැමැතියි, නීති කෙටුම්පත් සම්පාදක වාගේම නීතිපතිතුමා මුණ ගැහිලා නැවත මේ පිළිබඳව සාකච්ඡා කරන්න කියලා. ඒ වාගේම දහම් පාසල්,- *[බාධා කිරීමක්]* ඔව්, දහම් පාසල් වෙන්නත් පුළුවන්. පල්ලිය, පන්සල කියන හැම තැනටම මේ කාරණය අදාළයි. පන්සලේ හාමුදුරුවන්ටත් මේක අදාළයි, දහම් පාසල් තිබෙන නිසා. පල්ලියේ පියතුමාටත් මේක අදාළයි. ඒ කියන්නේ, මින් අනතුරුව කිසිම ආකාරයක අවවාදයක් දෙන්න බැරිව යනවා. මම නැවත කියනවා, ශාරීරික දණ්ඩනයට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි කියන එක. හැබැයි, මෙතැන තිබෙන මේ දෙවැනි උපාංගය, ඒ කියන්නේ ශාරීරික නොවන අනෙකුත් දණ්ඩනයන් පිළිබඳව දක්වා තිබෙන මේ අර්ථ නිරූපණයේ පුළුල් වැඩිකම නිසා ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

මට කථා කරන්න මේ වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම විශ්වාස කරනවා, රජය මේ පනත් කෙටුම්පත පිළිබඳව අවබෝධයෙන් යුතුව කටයුතු කරයි කියලා. අපේ රටේ දෙමව්පියන් ඇතුළු අප සියලුදෙනාම පක්ෂ, පාට භේදයක් නැතුව ගුරුවරුන් ගැන එක්ව කල්පනා කරන්න ඕනෑ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Bimal Rathnayake.

[පූ.භා. 11.17]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේදී විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත පිළිබඳව කරුණු කිහිපයක් කියන්න මා බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා අසා ඇති ලෝක විනාශ න්‍යාය ගැන. ඒ කියන්නේ, "මේක වෙලා, මේක වෙලා" කියමින් මුළු ලෝකයම එකම දෙයකට ගෙනෙනවා. අපි පොඩි උදාහරණයක් ගනිමු. ළමයෙකුට දඬුවමක් දෙනවා. දඬුවම දුන්නාට පසුව ඒ ගුරුවරයා වැඩ තහනමට ලක් වෙනවා. ඊට පසුව ඔහුගේ පවුල අනාථ වෙනවා. ඉන්පසුව ඒ පවුලේ දරුවා -පුතා- "කෙහෙල්බද්දර පද්මේ" කෙනෙක් වෙනවා. ඊට පසුව ඔහු කුඩු ගෙනෙනවා, අයිස් ගෙනෙනවා. මුළු ලෝකයේ සියල්ල වෙන්නේ ඒ තුළ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් ඉස්කෝලේ ගිහින් තිබෙනවා. ඒ නිසා මෙතැන බිල්ලෝ මවන්න අවශ්‍යතාවක් නැහැ. අපි හැම දෙයක් ගැනම තුලිතව බැලිය යුතුයි. නීතිය කියන්නේ හැම වෙලාවේම උසාවියක්, පොලීසියක් ඇතුළේ වෙන දෙයක් නොවෙයි. ඒක සමාජයක් ඇතුළත ක්‍රියාත්මක වෙන්නේ. ඒ සම්බන්ධයෙන් ගොඩක් දේවල් ලියා තිබෙනවා. මෑත භාගයේ ෆූකෝල්ට් වාගේ අය discipline සහ punishments සම්බන්ධව ගොඩක් දේවල් ලියා තිබෙනවා; තව ගොඩක් අය ඒ සම්බන්ධයෙන් ලියා තිබෙනවා. ජෝන් ලොක්ගේ සිට ලියා තිබෙනවා. බුදුන් වහන්සේත් ඒ ගැන දේශනා කරලා තිබෙනවා. ඒ නිසා මේ හැම දෙයක්ම යම්කිසි සමාජයක් ඇතුළේ සිද්ධ වෙන්නේ. එම නිසා බිල්ලෝ මවලා, මෙහෙම වෙලා, මෙහෙම වෙලා, මෙහෙම වෙලා කියන්න එපා. දැන් එහෙම නේ කිව්වේ.

අධිකරණ පද්ධතිය කියන්නේ අපේ රටේ අලුතින් පටන් ගත් එකක් නොවෙයි. අපේ රටේ අධිකරණ පද්ධතිය අවුරුදු සිය ගණනක් පරණයි. ඒ නිසා අපේ රටේ සිටින විනිශ්චයකාරවරුන් මේ පිළිබඳව අදාළ කරන තීන්දු දෙයි කියා මා හිතනවා. ඒ නිසා අමුතු බිල්ලෝ මැවීම අවශ්‍ය නැහැ. මෙතැන තිබෙන වැදගත්ම නමුත් අත් හරින කොටස මොකක්ද? අපි දැක තිබෙනවා, පන්තියේ සිටින ළමයින්ට සමහර ගුරුවරුන් කථා කරන විදිය. සමහර විට එය එම ගුරුවරයාගේ ඇත්ත හැඟීම වෙන්න පුළුවන්. සමහර ගුරුවරු සමහර ළමයින්ට "මෝඩයා" කියනවා. ඒ වාගේම අපි දැක තිබෙනවා, සමහර ගුරුවරු -ඔක්කෝම නොවෙයි. ගුරුවරුන්ගේ තිබෙන හොඳකම් අස්සේ එවැනි දේ කියන අයත් ඉන්නවා. ගුරුවරුත් මනුස්සයෝ නේ - "ඔයාට නම් කවදාවත් ගණන් බැහැ." කියනවා. සමහර ගුරුවරු කියනවා, තව තව දේවල්. නරකම දේවල් නොවෙයි. සමහර විට ළමයා හදා ගැනීමේ වුවමනාවෙන් තමයි එහෙම දේවල් කියනවා ඇත්තේ. නමුත් අපි ලෝකයේ අලුතින් එන සාකච්ඡා, සංවාද එක්ක ඉස්සරහට යන්නේ නැත්නම් අපට ඉන්න වෙන්නේ වැඩවසම් යුගයේ තමයි. මම හිතනවා, දරුවෙකුට වේවැලෙන් ගහනවාට වඩා "ඔයාට ගණන් බැහැ" කියන එක ඒ දරුවාට බලපානවාය කියලා. මම දැකලා තිබෙනවා, මගේ පන්තියේ දරුවන්ට එහෙම කියනවා. ඒ වාගේම පන්තියේ අන්තිම පේළිය කියලා වර්ගයක් තිබෙනවා. පන්තියේ ඉස්සරහ පේළියේ නැත්නම් පළමුවැනියා වෙන්න බැහැ වාගේ වෙන පැත්තකුත් තිබෙනවා. කවියකුත් තිබෙනවා, බයිසිකලය හදන චන්දරේ ගැන. Cane punishment, physical punishment විතරක් නොවෙයි, හැම දාම emotional damage එකකට ලක් වෙච්ච චන්දරේලා ගැන ලියපු ප්‍රසිද්ධ කවියක් තිබෙනවා.

අපි බස් එකේ එනකොටත් නොයෙක් ප්‍රශ්න නිසා ශාරීරිකව හිංසාවට, පීඩාවට, අපචාරයට ලක් වෙනවා නේ. විශේෂයෙන් ගැහැනු ළමයි. පිරිමි අයත් එහෙමයි. කොන්දොස්තර මහත්තයාගේ බලපෑමට ලක් වෙනවා; ඔහුගේ අසාධාරණකම්වලට ලක් වෙනවා. නමුත් මේකෙන් වෙන්නා වූ emotional damage එක වැඩියි. ඒ නිසා දරුවා මානසිකව හැමදාම පෙළෙනවා. සමහර ළමයි ඉන්නවා, ඔවුන්ට ඒ ලේබල් එක වැදුණාට පස්සේ කිසි දෙයකට try කරන්නේ නැති. අපේ පන්තිවල හිටපු ඒ වාගේ ඕනෑ තරම් ළමයි මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. පන්තියේ පළමුවැනියා වෙච්ච, section first වෙච්ච, ශිෂ්‍යත්ව විභාගය පාස් වෙච්ච අයට ඔය අත්දැකීම් නැති වෙන්න පුළුවන්. කවුරු හරි කියනවා නම් ගුරුවරයෙක් අවවාදයක් දීමයි, ගුරුවරයෙක් අපහාසයක් කිරීමයි තෝරා ගන්න බැහැ කියලා, ඒක ලොකු ගැටලුවක්. ඒක නේ මේ කියන්න හදන්නේ.

මම හිතන්නේ නැහැ, එහෙම රටක් බවට අපි පත් විය යුතුයි කියලා. සමාජයක් කියන්නේ තර්කානුකූලයි. දෙමව්පියෝ තර්කානුකූලයි. දෙමව්පියෝ ඒ ගැන දන්නවා. ඒ ගැන ලොකු තර්කයක් තිබෙනවා නේ. මේක මීට කලිනුත් අපි කරන්න ගියා. ඒ අනුව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි මේක දැම්මාම මේ ගැන විශාල සාකච්ඡාවක් ඇති වුණා. මම හිතන විධියට, මීට අවුරුදු හතරකට, පහකට කලින් හිතවත්ම අයත් දාලා තිබෙනවා, "හොද්දක් හැදි ගෑවේ නැති වුණාම රස නැහැ" කියලා. හොද්දකුයි, ළමයෙකුයි වෙනස් නේ. හොද්දට අදාළ කරන theories ඔක්කෝම ළමයාට අදාළ නැහැ. යාන්ත්‍රික භෞතික චලිතයට අදාළ කරන නියමයන් ජීව විද්‍යාවට, සමාජයට අදාළ නැහැ. ඒක ඒ විධියටම ගන්න බැහැ. මම අහගෙන හිටියා සමහරු කියනවා, "අපට ගහපු නිසා තමයි අපි හැදුණේ" කියලා. එහෙම හැදිච්ච අය ඇති. අවුරුදු 500ක්, 1,000ක්, 2,000ක් තිස්සේ මේක වර්ධනය වෙලා අද දරුවන්ගේ හැඟීම්වලට වන බලපෑම ගැන කථා කරනවා. අපි කාටත් එහෙමයි. අතින්, පයින් පහර දෙනවාට වඩා අපට වුණත් ගොඩාක් hurt වෙන්නේ මොකටද? එතුමාගේ කථාවේ දෙවන කොටසේ තිබුණේ ඒක නේ. අවංකවම කටයුතු කරපු මන්ත්‍රීවරයෙකුට hurt කළා කියලා නේ කියන්නේ. අතින් පයින් ගහලා නැහැ. එතුමාගේ කථාව ප්‍රතිවිරුද්ධයි එතුමාගේ මූලික තර්කයට.

අපේ ගරු නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉතාම අහිංසකව නොකිව යුතු දෙයක් කියලා තිබුණා. එතුමාට කියන්න තිබුණේ එතුමාගේ දේපළ සම්බන්ධව කාට හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ගැන උසාවියෙන් අහන්න කියායි. එතුමා කරපු දේ තමයි ඕනෑවට වඩා තොරතුරු කියපු එක. ඒක අවශ්‍ය දෙයක් නොවෙයි. නමුත්, දැන් මොකක්ද කළේ? දැන් කියනවා, ඒ තාත්තා හිරේ දාන්න ඕනෑ කියලා. ඇත්තටම හිරේ දාන්න ඕනෑ කවුද? හිරේ දාන්න ඕනෑ ඒ දරුවාට ඒ අපහාසය කරන පුද්ගලයන්; ඒක මෙතැන වර්ණනා කරන පුද්ගලයන්. ඒ තාත්තා නොවෙයි හිරේ දාන්න ඕනෑ. තාත්තා අවංකකම වැඩිකමට වෙච්ච දේ කියන්නේ, මේ පල් හොරු රැලක් ඉස්සරහා. එතැනත් පෙනෙනවා, ඒ emotional damage එක ගැන හැඟීමක් නැහැ කියන එක. මම කියන්නේ, ඒ දරුවාගේ උදාහරණයම ඇති, ඇමතිතුමියට මේ පනත ගෙනෙන එකට තර්කයක් ගෙනෙන්න. වෙන මුකුත් ඕනෑ නැහැ. තාත්තලාගේ දේශපාලනය, අම්මලාගේ දේශපාලනය පොඩි ළමයින්ට ආදේශ කරන, ඒක හුවා දක්වන, ඒක hail කරන, ඒක මෙතැනත් ඇවිල්ලා justify කරන, ඒ තාත්තාත් court එකට ගෙනියන්න ඕනෑ කියන අය ඉන්නවා. වෙලාවට ගුරුවරයෙක් නොවුණේ. ඉස්කෝලවල උගන්වන ගුරුවරයා ළමයින්ගේ පේළි මාරු කරන්නේ ඇයි? කොන්වීම පිළිබඳ හැඟීම නිසා. අපි කාගේත් ජීවිත තුළ ඒක තිබෙනවා. අපේ හැඩරුව, හඬ, ශරීරය ගැන අපි හැම කෙනාටම එක එක විධියේ හැඟීම් තිබෙනවා නේ. මගේ නම තමයි නරකම නම කියලා අපි හිතනවා. අපේ අම්මායි, තාත්තායි දමපු නම තරම් නරක නමක් නැහැ කියලා හිතපු කාලයක් තිබෙනවා. ඕනෑම කෙනෙකුගෙන් ඒ ගැන අහලා බලන්නකෝ. ඒක තමයි හොඳම නැති නම. එක්කෝ උස මදි, නැත්නම් කෙට්ටු වැඩියි, සුදු වැඩියි, නැත්නම් සුදු මදියි කියලා නොයෙක් හැඟීම් තිබෙනවා. ඒ වාගේම කොණ්ඩය සම්බන්ධවත් ප්‍රශ්න තිබෙනවා. ඒ විධියට අවුරුදු 18, 20 වෙනකල් එක එක ප්‍රශ්න තිබෙනවා. එතකොට, ඒවා සම්බන්ධ කරගෙන විවිධ emotional damages කරනවා; ගුරුවරුනුත් කරනවා; දෙමව්පියනුත් කරනවා; නැන්දලා මාමලාත් කරනවා; යහළුවෝත් කරනවා; ඉස්කෝලවල senior අයියලාත් කරනවා. එහෙම කරනවා. එහෙම කළා කියලා අපි නඩු දම දමා ඉන්නද? එහෙම නම් වෙනම උසාවි 500ක් විතර හදලා, නීතිඥයෝ එක්ක කටයුතු කරන්න ඕනෑ. එහෙම එකක් නැහැ. මේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ, ලංකාවේ සංස්කෘතිය ඇතුළේ. ලංකාවේ අම්මලා තාත්තලා දන්නවා, ගුරුවරු දන්නවා, දරුවෙකුට අපහාස කරන්නත්, අපහාස නොකර කියන්නත්. ඒ නිසා මේ ලෝක විනාශ තියරියට ගෙනිහිල්ලා, "මෙහෙම වෙලා, මෙහෙම වෙලා..." කිව්වාට එහෙම වෙන්නේ නැහැ.

ඒ වාගේම මම කියන්න කැමැතියි, 1773 වාගේ ඈත කාලයක - අපි මේ ගැන ඇත්තටම පක්ෂයේ අධ්‍යාපන සඟරාවකුත් කළා, "විමර්ශන" කියලා. ඒකේත් අපි මේ ගැන ලිව්වා, අවුරුදු ගණනකට කලින් - අවුරුදු 200කට කලින් තමයි Polandවල මේ corporal punishment නතර කරලා තිබෙන්නේ. අපි සෝවියට් දේශය -සාර් අධිරාජ්‍යය- ගත්තොත්, ඉතාම වැඩවසම් රටක්, ඉතාම පසුගාමී රටක්; විප්ලවය වෙනකොට. 1917 ඔක්තෝබර්වල විප්ලවය කළා; නොවැම්බර්වල තමයි corporal punishment නතර කළේ. චීනය ගත්තොත්, ඉතාම පසුගාමී රටක්, 1949දී. ඒගොල්ලන් 1986දී සම්පූර්ණයෙන් තහනම් කරනවා. ඊළඟට ඉන්දියාව. අපට වඩා ගොඩක් පසුගාමී අතිසංකීර්ණ රටක්. 1985දී තමයි ඉන්දියාව මෙය තහනම් කරන්නේ. 1985දී තහනම් කරලා, ඒගොල්ලන් ඒකේ තවත් ගොඩක් වර්ධනයන් දක්වා ඇවිල්ලා තිබෙනවා. අපට කියන්න තිබෙන්නේ ඒකයි. මේ තත්ත්වය දැනුත් සෑහෙන ප්‍රමාණයකට අඩු වෙලා තිබෙන්නේ. දැන් ගුරුවරු අතිවිශාල ප්‍රමාණයක් එහෙම කරන්නේ නැහැ. ඒ වාගේම වැඩියෙන්ම ගුටි කාපු අය මෙතැන හැසිරෙන විධියෙන් පෙනෙනවා, ඒගොල්ලන් කොච්චර ගුටි කාලා තිබෙනවාද කියලා. ඇත්තටම ඉතිහාසය බැලුවොත් තේරුම් ගන්න පුළුවන්, ඒගොල්ලන්ට ගුරුවරු කොච්චර ගහලාද කියලා. මානසික රෝගීන් නොවන, මෙතැන ඉන්න අය මම කියන්නේ.

දැන් බලන්න, "තාරේ සමීන් පාර්" වාගේ චිත්‍රපටයක් බැලුවොත් පෙනෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවන්ගේ හැඟීම් - emotions - ගැන, මානසිකත්වය ගැන අපි කොච්චර හිතන්න ඕනෑද කියලා. ඒ චිත්‍රපටය හදලාත් දැන් අවුරුදු 10කට වැඩියි. අඩු ගණනේ ඒක බලන්න එපා යැ. ඒකයි මම කියන්නේ, ලෝකයේ හැම රටක්ම යම් කිසි අධ්‍යයනයන්, සාකච්ඡාවන් ඇතුළේ, තමන්ගේ සංස්කෘතිය ඇතුළේ මේවා වෙනස් කරගෙන යනවා. දැන් තරුණ දෙමව්පියන් හුඟක් අය මම හිතන විධියට තමන්ගේ දරුවන්ට ගහන්නේ නැහැ; අපහාස කරන්නේ නැහැ. "තාරේ සමීන් පාර්" චිත්‍රපටය බැලුවාට පස්සේ මමත්, මගේ නෝනාත් ඇත්තටම පුදුම කම්පනයකට ලක් වුණා. මොකද, සමහර වෙලාවට අපි දරුවෝ දිහා එහෙම සැරෙන් බලපු අවස්ථා තිබෙනවා. කොච්චර නරක දෙයක් කළාද කියලා මම නම් ඇත්තටම ඉගෙන ගත්තේ ඒකෙන්, පොත් කොච්චර කියවලා තිබුණත්. ඒ නිසා ලෝකයෙන් එන අලුත් දැනුම ගන්න බැරි නම්, හැම වෙලාවේම බිල්ලෝ මව මවා, end of history තියරිය කිය කියා ඉන්නවා නම්, රටකට ඉස්සරහට යන්න බැහැ.

අනෙක් කාරණය මේකයි. මේ පනත අපි අද සම්මත කරන්නේ නැහැ. අද මේ පනත ගැන විවාද කරනවා අපි. ඊට පස්සේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ සමස්ත කාරණය එක්ක තියලා තමයි මේක සම්මත කරන්නේ. අද කරන්නේ සංවාදය. අපි හිතපු දේ හරි. අපේ අරමුණ වුණේ මේකයි. හුඟක් අය කිව්වා, මේ ගැන වාද කරන්න ඕනෑ නැහැ, නිකම් යමු, වෙන දේකට අවස්ථාව දෙන්න කියලා. ඒ කියන්නේ මේගොල්ලන්ට ඕනෑ නැහැ, ඒ වාගේ සාකච්ඡා. නමුත් පක්ෂ නායක රැස්වීමේදී අපි කිව්වා, "හරි කලාතුරකින් මේ වාගේ දේවල් කථා කෙරෙන්නේ, අපි මේකට සංවාදයක් හදන්න ඕනෑ" කියලා. අන්න ඒ සංවාදය හදපු එක පැත්තෙන් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, දරුවන් කියන්නේ අපේ විනෝදයට ඇති වෙච්ච අය නොවෙයි. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒගොල්ලන් ගැන අපි ඒ විධියට කල්පනා කරන්න ඕනෑ. 2050දී ලංකාවේ ඒගොල්ලන් ඉන්නේ. අද අවුරුදු 6, 7 දරුවන් තමයි 2050 වෙනකොට මේ රට -ලංකාව- කරන්නේ. ඉතින්, තවම අපි ඒගොල්ලන් හදන්නේ 1800 ගණන්වලට අනුව නම්, ඒක ගැළපෙන්නේ නැහැ.

[ගරු බිමල් රත්නායක මහතා]

ඒ වාගේම අපි දන්නවා, හැම ගෙදරකම ඒ ගෙදරට ගැළපෙන සංස්කෘතියක් තිබෙන බව. ඒ ගෙවල් ඇතුළේ ඒ දේවල් බේරා ගන්නා ක්‍රම හැදිලා තිබෙනවා. ඒ නිසා දරුවන්ට ආදරය, සෙනෙහස තිබෙනවා නම්, අම්මලා තාත්තලා, අත්තම්මලා සීයලා, අයියලා අක්කලා ඒගොල්ලන්ට උගන්වන්නේ කොහොමද, බලපෑම් කරන්නේ කොහොමද කියන එක ගැන ඒගොල්ලන්ට හැඟීමක් තිබෙනවා. ඒ හැඟීම සාමාන්‍යයෙන් ගෙදර ඉන්න චූටි සතෙකුටත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ආදරේට ගෙදර හදන බලු පැටියා වුණත් දන්නවා, ආදරෙන් හදන කෙනා එයාට මොනවා හරි තරවටුවක් කළොත්, එයාට මොනවා හරි බලපෑමක් කළොත්, එයාට හිංසනයක් නොවෙයි ඒ කරන්නේ කියලා. ඉතින් දරුවෙක් කොහොමත් සතෙකුට වඩා බුද්ධිමත්. ඒ නිසා මට කියන්න තිබෙන්නේ ඒකයි, මේ පනත සම්බන්ධව. ලෝකයේ රටවල් රාශියක් මේ ගමන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම අපි අතිවිශාල වශයෙන් දකිනවා, මේ psychological damage එක තමයි අද ප්‍රබල වෙලා තිබෙන්නේ කියන එක.

ඒ වාගේම තමයි cyber bullying. කේරළයේ ඇති තරම් චිත්‍රපට කරලා තිබෙනවා, සමහර පුද්ගලයන් විසින් පාසල් දරුවන් blackmail කරන්නේ කොහොමද කියලා, ඒගොල්ලන්ගේ තිබෙන චූටි චූටි අඩුපාඩුකම් සම්බන්ධව. ඉතාම කුඩා දේවල්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි දන්නවා, පොඩි කාලේ අපි දන්නේ නැතිකමට, කුතුහලයට කරන මෝඩ වැඩ, චූටි වැරදි තිබෙනවා. ඒවා කවුරුහරි කෙනෙක් හොයා ගන්නවා. හොයාගෙන ඒක blackmail කරනවා. ඒකට කාඩ් ගහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, campusවල ragging තිබෙනවා. අපි දන්නවා, ඒවා නිසා කොයිතරම් නම් බලපෑමක් නරක පැත්තට වෙනවාද කියලා. අපි කියන්න කැමැතියි, මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ, අපි නූතන, නවීන සමාජයකටයි යන්න යන්නේ. ඛලීල් ජිබ්රාන් කිව්වා වාගේ දරුවෝ අපට අයිති නැහැ. ඒගොල්ලෝ අපි තුළින් ඇවිල්ලා ඉස්සරහට යනවා. ඒගොල්ලන්ට මීට වඩා නිදහස් ලෝකයක් අවශ්‍යයි. ඒගොල්ලන් අවුරුදු 16න් ලිංගික කටයුතුවල නිරත වෙන ඒවා, ඒගොල්ලන් beach යන ඒවා,- ඉතින් beach ගියාම මොකද වෙන්නේ? ඒගොල්ලන් සෙල්ලම් කළාම මොකද වෙන්නේ? මම නම් ගරු අගමැතිතුමියට එක දවසකුත් කිව්වා, A/L පාස් වුණාට පස්සේ පුළුවන් නම්, රුපියල් 5,000ක් දෙන්න, හැම A/L ශිෂ්‍යයෙකුටම ඔහු පාස් ද, ෆේල්ද නොසලකා, චිත්‍රපටයක්, නාට්‍යයක් බලන්න යන්න. ඉස්සරහට digital system එක ආවාට පස්සේ අපට පුළුවන් මේ 5,000 වෙන් කරන්න cultural activitiesවලට විතරක්. ජර්මනියේ එහෙම දෙනවා. දරුවා වැඩිහිටියෙක් කරනවා, පිළිවෙළකට. නාට්‍යයක් බලන්න, චිත්‍රපටයක් බලන්න, සිංදුවක් අහන්න, beach එකට යන්න, football matches බලන්න යන්න, cricket matches බලන්න යන්න ඕනෑ. ඉතින් සල්ලි ගොඩක් නැති අය ඉන්නවා. නමුත් දරුවන් එහෙම කටයුතු කරන්න ඕනෑ. ඒගොල්ලන්ට නිදහස දෙන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, දරුවෙක් අපට තනියම හදන්න බැහැ කියන කාරණය. දෙමව්පියන් කොපමණ කැප වුණත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, දෙමව්පියන්ට දරුවෙක් තනියම හදන්න බැහැ කියලා. ඔය මිනිස්සු බණිනවා නේ, අපෝ! මේගොල්ලන්ගේ අම්මලා තාත්තලා මෙහෙමයි, ඒ වාගේ තමයි දරුවෝ කියලා. නමුත් දැන් එහෙම වෙන්නේ නැහැ. ඒ අවුරුදු 100කට කලින්. ඒ කාලයේ දරුවෝ හැදුණේ ගමක් ඇතුළේ; වත්තක් ඇතුළේ. නමුත් අද දරුවාගේ ආකල්පවලින් පවුලෙන් control වෙන්නේ සියයට 10යි, නැත්නම් 12යි. සම්පූර්ණයෙන්ම social mediaවලින්, ඉස්කෝලෙන් තමයි මේක වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ දවස්වල කියවනවා, "කැමෙලියා" කියන පොත. ඒක අපේ ගරු රාධක්‍රිෂ්ණන් මැතිතුමාට සමීප පොතක්. ගරු රාධක්‍රිෂ්ණන් මැතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ පොත කියවන්න කියලා. එහි තිබෙන්නේ ලංකාවේ තේ වගාව ගැන. තේ වගාව ආරම්භ වුණු කාලේ රාමේෂ්වරම්වලින් ගෙනැල්ලා වද දුන්නු අභිංසකයන් ගැන. ඒක ඉතා වැදගත්. මුල්ඔය වතුයායේ අරගළය ගැන තිබෙනවා. ඒ පොතේ එන චරිතය ගත්තොත්, ඔහු ඉතාම පීඩිත ආකාරයෙන් බිහි වෙච්ච වතු හිමියෙක්. ඔහුත් අනාථයෙක්. තාත්තා කවුද දන්නේ නැති, අම්මා කවුද දන්නේ නැති කෙනෙක්. ඔහුට හැබැයි, කුමන හරි හේතුවකට දේපළක් හම්බ වෙනවා. ඔහු කුඩා කල අපචාරයට ලක් වෙනවා. ඔහු මොකද කරන්නේ? ඔහු වැඩිහිටියෙක් වුණාට පස්සේ සේවකයන්ට සලකන්නෙත් ඒ අත්දැකීම මත. එයාගේ ලිංගික කටයුතු පවා තිබෙන්නේ වද දීම ඇතුළේ. ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කියවන්න. මම පොතක් දෙන්නම්, ගරු රාධක්‍රිෂ්ණන් මැතිතුමාට. ඔබතුමාට සිංහල කියවන්න පුළුවන් නේ. මම හිතන විදියට, ඔබතුමාට සිංහල කියවන්න පුළුවන්. අපි ඔබතුමාට පොතක් දෙන්නම්. ඒ පොතේ පෙන්වනවා, ඒ තිරිසන් ක්‍රමවලට ලක් වුණාට පස්සේ ඒක කොහොමද ගලාගෙන යන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව වැඩි වේලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ කාරණාව කියලා කථාව අවසන් කරනවා.

ඊළඟට, ලජ්ජා කිරීම වුණත් හිංසනයක්. ඔය cyber bullyingවලින් එන ලොකුම දේ තමයි, ලොකු පිරිසක් අතරට ඒක යන එක. අනෙක දැන් ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, right to forget කියන එක නැහැ. ඉතිහාසයේ වැරැද්දක් වුණා නම්, ඒ හැමදෙයක්ම save වෙලා social mediaවල serversවල තිබෙනවා; hard disksවල තිබෙනවා. ඒවා අරන්, අරන් දානවා. ඒ නිසා තමයි අපට ඕනෑකම තිබෙන්නේ මේ වාගේ ටිකක් නූතන විදියට - ඇත්තටම නූතනත් නොවෙයි. සෝවියට් දේශයේ 1917දී; චීනයේ 1986දී; ඉන්දියාවේ 1985දී; එහෙමත් තිබේද්දී, මම කනගාටු වෙනවා, ඇත්තටම මේ වාගේ ප්‍රකාශ කිරීම ගැනත්.

ඒ වාගේම අපේ නියෝජ්‍ය ඇමතිවරයාගේ දියණිය අපහාසයට ලක් කරන ඒ එක් කණ්ඩායම, ඒ තිරිසන් මතය මෙතැන සනාථ කරන්න කටයුතු කිරීම ගැන අපි කනගාටු වෙනවා. ඒ දරුවාගේ තාත්තා තමයි වැරදිකරු කියලා කිව්වත් ඇත්තටම තාත්තා කරපු වැරැද්දක් නැහැ. තාත්තා අභිංසකයෙක් වාගේ වෙච්ච දේ කිව්වා. එතුමාට බොහොම පැහැදිලිව උත්තරයක් දෙන්න කිව්වා, උසාවියෙන් බලා ගන්න කියලා. අපියි ඒ වත්කම් බැරකම් ප්‍රකාශ පුරවලා දීලා තිබෙන්නේ. එහෙම නැතුව කවුරුවත් investigations කරලා හොයලා නොවෙයි. නමුත් ඒ දරුවාට ඒක පාවිච්චි කරලා අපහාස කරනවා නම්, ඒ නිසාම තමයි ගරු සරෝජා පෝල්රාජ් ඇමතිතුමියනි මේ වාගේ නීතියක් අවශ්‍ය වන්නේ. ඒ නිසා බොහොම ස්තුතියි, අපි ඔබතුමියට සුබ පතනවා, ඒ අපරාධ සම්බන්ධ නීති පනතත් එක්ක මේක හරියට සම්මත කර ගන්න ඔබතුමියට පුළුවන් වෙයි.

පාර්ලිමේන්තුවේ ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමන්ලා දැන් පිහිටුවා තිබෙනවා කලා සංස්කෘතික සංසදයක්. මම ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, සියලු මන්ත්‍රීවරුන්ට "තාරේ සමීන් පර්" චිත්‍රපටය පෙන්වන්න කියලා සහ ගොඩක්ම upset තිබෙන කට්ටියට එහි CD එක ගණනේ දෙන්න කියලා.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே-

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Sathiyalingam, hold on please. His name was mentioned. Hon. Deputy Minister, what is your point of Order?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා විසින් සඳහන් කරනු ලැබුවා, මේ පනත් කෙටුම්පතේ "සද්භාවය" නමැති වචනය ඇතුළත් විය යුතුයි කියලා. මෙය, ගරු අධිකරණ ඇමතිතුමාත් මේ ගරු සභාවේ නොමැති අවස්ථාවක් වන නිසා මම විනාඩියක කාලයක් ගන්නවා, ඒ ගැන පැහැදිලි කරන්න.

එහෙම වචනයක් දැමීම අවශ්‍ය වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, දණ්ඩ නීති සංග්‍රහයේ 74 වන වගන්තියේ පැහැදිලිව සඳහන්ව තිබෙනවා, සද්භාවයෙන් කරන දෙයක් වරදක් වන්නේ නැහැ කියලා. සද්භාවයෙන් ගහන්න බැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දණ්ඩ නීති සංග්‍රහයේ 74 වන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "පීඩාවක් කිරීමේ සාපරාධී අදහසක් නොමැතිව, පුද්ගලයන්හට හෝ දේපළවලට විය හැකි වෙනත් පීඩා වැළැක්වීමේ හෝ මගහැර වීමේ කාර්යය සඳහා සද්භාවයෙන් යම් ක්‍රියාවක් කරන ලද නම්, එය කරනු ලැබුයේ ඉන් පීඩාවක් විය හැකි බව දත් පමණකින් වූ විට ඒ ක්‍රියාව වරදක් බවට පත් නො වේ."

ඒක පැහැදිලිවම සඳහන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය."

මූලික නීතියේ එසේ සඳහන්ව තිබෙනවා. ඒ නිසා එන එන පනත් කෙටුම්පතේ සද්භාවය ද, *mala fide* ද, *bona fide* ද කියලා සඳහන් කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒක මේ අනෙක් පනත්වලත් අන්තර්ගතව තිබෙන කාරණාවක්. මා හිතන විධියට, එතුමා යළි ඒ වගන්තිය කෙරෙහි අවධානය යොමු කළොත්, එහි ඒකට උත්තරය තිබෙන බව පැහැදිලි වේවි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Pathmanathan Sathiyalingam.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று-

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Just a few seconds, Hon. (Dr.) Pathmanathan Sathiyalingam. Yes, Hon. Gamagedara Dissanayake, you were referred to.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා විසින් මගේ නම සඳහන් කරමින් මේ ගරු සභාවට ඉතාම වැරදි සහගත ඒත්තු ගැන්වීමක් කරන්න උත්සාහ ගනු ලැබුවා. මම එය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා ඔබතුමාගේ අවසරය පරිදි මගේ පැත්තෙන් කරුණු පැහැදිලි කිරීමක් කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ මේ තිබෙන්නේ මධ්‍යම සංස්කෘතික අරමුදල පනත. මේ පනතේ හරි පැහැදිලිව සඳහන්ව තිබෙනවා, ඒ අරමුදල සතුව තිබෙන මුදල් කොහොමද පාවිච්චි කළ යුත්තේ කියලා. ඒ අරමුදලේ තිබෙන මුදල් පාවිච්චිය 2016-2019 අතර කාලයේදී අනිසි විධියට සිද්ධ වුණා. මණ්ඩලයේ කිසිදු අනුමැතියකින් තොරව රුපියල් මිලියන 8,000කට වැඩි මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වරින් වර සාකච්ඡා ඇති වුණා, එතුමා කිව්වා වාගේම. ඒ සාකච්ඡා අනුව වඩා නීත්‍යනුකූලව සහ නිවැරදිව වැරදිකරුවන් හඳුනාගැනීමේ අවශ්‍යතාව තිබුණු නිසා අප විසින් පත් කරනු ලැබුවා, විශ්‍රාමික මහාධිකරණ විනිසුරු ප්‍රදීප් ජයතිලක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිපුද්ගල කමිටුවක්. අප ඒ කමිටුව පත් කළේ 07වැනි මාසයේ 07වැනි දා. මාස 2ක් ඇතුළත වාර්තාව ලබා දෙයි කියන පදනමින් තමයි ඒ පත් කිරීම කළේ. නමුත්, යම් යම් තාක්ෂණික කාරණා නිසා අපට ඒ කමිටුව රැස් කරන්න සිද්ධ වුණේ 07වැනි මාසයේ 30වැනි දා. එතැන් සිට බලාත්මක වන පරිදි එම කාලය තව දවස් කිහිපයකින් අවසාන වීමට නියමිතව තිබෙනවා. මා දන්නා පරිදි මේ වන විට ඒ වාර්තාව සකස් කරලා, අවසාන අදියරේ තිබෙන්නේ. නමුත්, ඒ වාර්තාවෙන් නිශ්චිත ලෙස ඒත්තු ගන්වන කරුණුවලට අමතර වශයෙන්, ඒ මණ්ඩලය නියෝජනය කරන නියෝජිතයෙකු හැටියට අපට කරුණු අනාවරණය වෙනවා, 2016 -2019 අතර කාලයේදී මෙහි වගකීම දරපු, දැන් වෙනත් වගකීම් දරන අය කොහොමද ඒ අරමුදලේ මුදල් පාවිච්චි කර තිබෙන්නේ

[ගරු ගමගෙදර දිසානායක මහතා]

කියලා. මේ වැරැදි සහගත මැදිහත්වීම පිළිබඳව ඔවුන්ට විවේචන එනකොට, තමන් වැරැදිකරුවන් වෙනවා කියන කාරණය තහවුරු වෙනකොට බය වෙලා විවිධ මත හදනවා. ගරු මන්ත්‍රීතුමනි, ඉතාම නිවැරැදිවයි මාධ්‍ය වෙත අප මේ ප්‍රකාශය කළේ. ආචාර ධර්ම සම්බන්ධ ප්‍රශ්නයක් මෙතැන නැහැ. හරියට කරුණු ඒත්තු ගන්වන්න පුළුවන්කම තිබෙනවා, මේ වාර්තාව එළි දැක්වූවාට පසුව. අපට දැනට අනාවරණය වන තොරතුරු අනුව ඒ පනතේ මූලික කොන්දේසියම කඩලායි තිබෙන්නේ. ඒ කොන්දේසිය කඩලායි තිබෙන්නේ. එම නිසා වාර්තාව ආවාට පස්සේ ඉතිරි කාරණා ටික සාකච්ඡා කරමු.

බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, give me a few seconds.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, we need not go into a debate on this. He stood up because you mentioned his name.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, give me just a few seconds.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා "දිනමිණ" පත්තරේට සැප්තැම්බර් මාසයේ 22වැනි දා කිව්වේ, "... ඒ පිළිබඳ සොයා බැලීමට වත්මන් රජය බලයට පත් වූ පසු පත් කරන ලද වංචා දූෂණ විමර්ශන කමිටුව මඟින් අනාවරණය කරගෙන තිබේ..." කියලායි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ කියන්නේ, ඔබතුමා කමිටු වාර්තාව දැකලා තිබෙනවා. ඒකයි මම අභියෝග කළේ කමිටු වාර්තාව දෙන්න කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ කියන්නේ ප්‍රදීප් ජයතිලක මැතිතුමා කල් තියා ඔබතුමාට පෙන්නුවා ද, ඒ කමිටු වාර්තා කෙටුම්පත? ඔබතුමා කොහොමද දන්නේ ඒ වාර්තාව එළිදක්වන්න කලින් ඒ පිළිබඳ කාරණා? ඔබතුමාම කිව්වා, "වාර්තාවක් නැහැ; තවම හදනවා" කියලා. එහෙම නම් කොහොමද, ඔබතුමා මෙහෙම කියන්නේ? එළිදක්වා නැති කමිටු වාර්තාවේ කෙටුම්පත ප්‍රදීප් ජයතිලක හිටපු විනිශ්චයකාරතුමා ඔබතුමාට දුන්නාද? කොහොමද ඔබතුමා කියන්නේ, "දන්නේ නැහැ" කියලා. ඕක සම්පූර්ණයෙන් වැරැදියි නේ. එක්කෝ, ඔබතුමන්ලාගේ කාර්ය පටිපාටිය වැරැදියි. එහෙම නැත්නම්, නිසැකවම,- *[බාධා කිරීමක්]* දැන් ඔබතුමා කියනවා නේ,- *[බාධා කිරීමක්]*

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔය වාර්තාවේ අවසාන ඡේදයේ මොකක්ද තිබෙන්නේ කියලා කියවන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
වාර්තාවේ නොවෙයි, "දිනමිණ" පත්තරේ. මේක තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ පත්තරය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි අපහාසය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You need not go into a debate on this, Hon. Members.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේක තමයි අපහාසය, පදනමක් නැතිව කරන අපහාසය. වාර්තාව ඉදිරිපත් කරලා අවසානයි, අපේ ආණ්ඩුව තමයි කළේ කියලා-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, please do not go into a debate on this.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හැබැයි, මම අභියෝග කරන කොට දැන් කියනවා, "එහෙම එකක් නැහැ." කියලා. ලජ්ජයි නේද? ලජ්ජයි නේද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will now call upon the next speaker, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have eight minutes and your time starts now.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நிமிடத்திலிருந்து என்னுடைய நேரத்தைக் கணக்கிடுங்கள்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, your time starts now.

[மு.ப. 11.41]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Okay, thank you so much.

தண்டனைச் சட்டக்கோவை திருத்தச் சட்டமூலம் இன்றைக்கு இங்கு கொண்டுவரப்பட்டு இருக்கின்றது. இந்தச் சட்டமூலம் மிகவும் முக்கியமானது. இதைக் கொண்டு வந்தமைக்காக அரசுக்கு என்னுடைய வரவேற்பையும் பாராட்டையும் தெரிவித்துக் கொள்கிறேன். இந்தச் சட்டமூலத்தினூடாகப் பிள்ளைகள் தொடர்பில் சரீர மற்றும் உடல் ரீதியிலல்லாத தவறுக்கான தண்டனை சம்பந்தமாகப் புதிதாக உள்வாங்கப்பட்டுள்ள விடயங்கள் எங்களுடைய நாட்டைப் பொறுத்தவரை மிகவும் முக்கியமானவை. இந்தத் தண்டனைச் சட்டக்கோவைச் சட்டத்துக்குத் திருத்தங்கள் கொண்டுவருவதன் நோக்கம், தண்டனைகளை நேரடியாகச் சமூகத்தில் பிரயோகிப்பதற்கானதல்ல. ஓர் ஆரோக்கியமான சமுதாயத்தை முன்னோக்கிக் கொண்டுசெல்வதற்கான வழிகாட்டுதல்களை வழங்குவதற்காகவே இவ்வாறான சட்டங்கள் கொண்டுவரப்படுகின்றது. எங்களுடைய சமூகத்தை ஆரோக்கியமானதாக முன்கொண்டு செல்வதற்

கான முழுப் பொறுப்பும் இந்தப் பாராளுமன்றத்துக்கு இருக்கின்றது. அந்த வகையிலே, இந்தச் சட்டமூலத்தில் குறிப்பிடப்பட்ட விடயங்கள் நிச்சயமாக எங்களுடைய சமூகத்தை நல்வழிப்படுத்துகின்ற, அதனை ஓர் ஆரோக்கிய மான சமூகமாகக் கட்டியெழுப்புகின்ற தேவைக்காகப் பயன்படுத்தப்படலாமென்பதுதான் என்னுடைய நிலைப் பாடாக இருக்கின்றது. இருந்தாலும், இந்தச் சட்டமூலம் இங்கு கலந்துரையாடப்படுகின்றபோது, நான் ஒரு சில விடயங் களைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

உதாரணமாக, இங்கு 308ஆ.(1) (ஆ) பகுதியிலே குறிப்பிடப்பட்ட "இழிவுபடுத்துதலை விளைவிக்கும் சாத்தியம்" என்பதற்கான பொருள்கோடல் என்னவென்பது இதில் உள்வாங்கப்பட வேண்டும். அதாவது, இதனைச் சட்டமாகக் கொண்டுவரும்போது இதில் குறிப்பிடப்பட்ட சில சொற்களுக் கான பொருள்கோடல்கள் உள்வாங்கப்பட வேண்டுமென்ற கோரிக்கையை நான் முன்வைக்கிறேன். அதேபோல, இந்தச் சட்டமூலத்தின் தமிழ்மொழிப் பிரதிக்கும் ஆங்கிலமொழிப் பிரதிக்கும் இடையில் சில வித்தியாசங்கள் - figures வித்தியாசம் - இருக்கின்றன. அதை இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகிறேன். உதாரணமாக, இந்தச் சட்டமூலத்தில் 314அ இல், "இரண்டாண்டுகள் வரை நீடிக்கக்கூடியதான காலப்பகுதியொன்றுக்குக்கான இருவகையிலொருவகை மறியற்றண்டனையினால் அல்லது ஐந்து இலட்சம் ரூபாய் வரை நீடிக்கக்கூடிய குற்றப் பணத்தினால்" எனச் சொல்லப்பட்டிருக்கிறது. ஆனால், ஆங்கில மொழிப் பிரதியில், 314A. states, "five thousand rupees" எனச் சொல்லப்பட்டு இருக்கின்றது. அதாவது, தமிழ் மொழியிலே ஐந்து இலட்சம் எனச் சொல்லப்பட்டு இருப்பது ஆங்கிலத்தில் "five thousand rupees" என்று இருக்கின்றது. நான் அதை உங்களுடைய கவனத்துக்குக் கொண்டு வருகிறேன். இந்தச் சட்டத் திருத்தமானது, எங்களுடைய சமூகத்தை முன்னோக்கிக்கொண்டு செல்வதற்குத் தேவையான தெனக் கூறிக்கொண்டு, எங்களுடைய பிரதேசத்திலே இருக்கின்ற ஒரு சில முக்கியமான பிரச்சினைகள் சம்பந்தமாக இந்தச் சந்தர்ப்பத்தில் பேசலாமென நினைக்கின்றேன்.

இந்த வருடப் பாதீட்டிலே எங்களுடைய பிரதேசங்களிலே இருக்கின்ற பாதைகளைத் திருத்துவதற்கு, குறிப்பாக உள்ளூராட்சி மன்றங்களின் பாதைகளைத் திருத்துவதற்கு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. பாரிய பொருளாதார நெருக்கடிக்குள் இருந்த இந்த அரசாங்கம் இப்போது அதிலிருந்து விடுபட்டு, மூச்சுவிடுகின்ற அளவுக்கு வந்து எங்களுடைய மக்களுடைய அடிப்படைத் தேவைகளை நிறைவேற்றுவதற்குச் சில நிதி ஒதுக்கீடுகளைச் செய்திருக் கின்றது. அதற்கு என்னுடைய நன்றியையும் பாராட்டுக் களையும் இந்த அராசங்கத்துக்குத் தெரிவித்துக் கொள்கின்றேன். இருந்தாலும், உள்ளூராட்சி மன்றங்களின் கட்டுப்பாட்டுக்குக் கீழே சட்ட ரீதியாக இருக்கின்ற வீதிகளுக் குரிய நிதியானது குறித்த உள்ளூராட்சி மன்றங்களுக்கு ஒதுக்கப்படாமல், அரசாங்க அதிபர்களூடாக ஒதுக்கப்பட்டு இருக்கின்றது. ஒதுக்கப்பட்ட அந்த நிதிக்கான வீதித் தெரிவுகள் சம்பந்தப்பட்ட உள்ளூராட்சி மன்றங்களுக்குத் தெரியாமல் மேற்கொள்ளப்படுகின்றது.

இப்போது மக்கள் பிரதிநிதிகளால் கையாளப்படுகின்ற உள்ளூராட்சி மன்றங்கள்தான் இந்த நாட்டிலே இயங்குகின்றது என்பது உங்களுக்குத் தெரியும். அப்படி மக்கள் பிரதிநிதிகளால் தெரிவுசெய்யப்பட்டு இயங்குகின்ற அந்த உள்ளூராட்சி மன்றங்களுடைய எந்தவொரு கருத்தையும் பெற்றுக் கொள்ளாமல், அந்த உள்ளூராட்சி மன்றங்களின் கீழ் வருகின்ற வீதிகளைப் புனரமைப்பதற்கான பட்டியல் வேறு எங்கேயோ தயாரிக்கப்பட்டு, அந்த உள்ளூராட்சி மன்றங்களுக்கு அனுப்பப்பட்டிருக்கின்றது. அவ்வாறு அனுப்பப்பட்ட பட்டியல் களை ஆராய்ந்து பார்க்கும்போது, முக்கியமான சில வீதிகள் உள்வாங்கப்படாத ஒரு நிலைமையைக் காண முடிகின்றது. உதாரணமாக, செட்டிக்குளம் பிரதேச சபையைப் பொறுத்தவரையிலே, ஒரு வட்டாரத்தில் 18 வீதிகளைப் புனரமைப்பதற்காக நிதி ஒதுக்கப்பட்டிருக்கின்ற அதேவேளை, வேறு சில மிகவும் பாதிப்படைந்த வீதிகளைக் கொண்ட வட்டாரங்களில் எந்தவொரு வீதிப் புனரமைப்புக்கும் நிதி ஒதுக்கப்படாத சூழ்நிலை காணப்படுகின்றது. ஆகவே, உள்ளூராட்சி மன்ற வீதிகளின் புனரமைப்பில் அந்த உள்ளூராட்சி மன்றங்கள் ஒரு contractor மாதிரிச் செயற்படாமல் சுயமாகச் செயற்படுகின்ற நிலை இருக்க வேண்டும். அதாவது, அந்த உள்ளூராட்சி மன்றங்களின் கீழாகப் புனரமைக்கப்பட வேண்டிய வீதிகளை யாரோ தெரிவுசெய்து, அரசாங்க அதிபருக்குப் பணம் அனுப்பப்பட்டு அதைப் புனரமைக்கின்ற contractors ஆகத்தான் இப்போது இந்த உள்ளூராட்சி மன்றங்கள் இருக்கின்றன. இது ஒரு பாரதூரமான விஷயம்! ஆகவே, இந்த நிதி ஒதுக்கீட்டுடன் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் இதில் கூடிய கரிசனை எடுத்து இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கான ஒரு வழிமுறையைக் கையாள வேண்டும்.

உள்ளூராட்சி மன்றங்களின் மக்கள் பிரதிநிதிகள் இப்போது ஒவ்வொரு வட்டாரமாகச் சென்று மக்களோடு கலந்துரையாடி அவர்களுடைய தேவைகளை அறிந்து priority list ஒன்றைத் தயாரித்து வைத்திருக்கிறார்கள். அப்படியான சூழ்நிலையில், உள்ளூராட்சி மன்றங்களோடு சம்பந்தம் இல்லாதவர்கள் புனரமைப்புக்கான வீதிகளைத் தெரிவு செய்வதனூடாக, வீதிப் புனரமைப்புக்கான நிதி ஒதுக்கீடு உண்மையில் அதிக தேவையிருக்கின்ற மக்களுக்குப் போய்ச் சென்றடைவதைத் தடுக்கின்ற செயற்பாட்டைச் செய்ய வேண்டாம் என்பதைச் சம்பந்தப்பட்ட அமைச்சரிடம் என்னுடைய விநயமான கோரிக்கையாக நான் முன்வைக்கின்றேன். ஆகவே, இப்போது தயாரித்து அனுப்பப்பட்ட அந்த உள்ளூராட்சி மன்ற வீதிகளின் பட்டியல் தொடர்பில் அரசாங்க அதிபரும் உள்ளூராட்சி மன்ற நிருவாகிகளும் கலந்துரையாடி ஓர் இணக்கமான தீர்வுக்கு வந்து, அரசாங்கத்தால் ஒதுக்கப்பட்ட அந்த நிதி மக்களுக்குப் பிரயோசனமானதாக மாறுவதற்குரிய ஏற்பாட்டைச் செய்ய வேண்டுமென்று நான் மிகவும் தாழ்மையாகக் கேட்டுக் கொள்கிறேன்.

வவுனியா நகர சபையானது மாநகர சபையாகத் தரமுயர்த்தப்பட்டு, அதன் பெயர்ப் பலகை மாற்றப் பட்டிருக்கிறது. ஆனால், மாநகர சபைக்குரிய அடிப் படையான வசதிகள், ஆளணிகள் அங்கு இல்லை. ஆகவே, இந்த அரசாங்கம் எதிர்காலத்தில் - 2026ஆம் ஆண்டிலாவது - அந்த மாநகர சபைக்குரிய ஆளணியை நிரப்புவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அத்துடன், வவுனியா மாவட்டத்திலே இருக்கின்ற உள்ளூராட்சி மன்றங்களில் ஒரேயொரு உள்ளூராட்சி மன்றம்தான் தீயணைப்புப் படையைக் கொண்டதாக இருக்கின்றது. வவுனியா மாவட்டம் முழுவதற்கும் இந்தத் தீயணைப்புப் படைதான் சேவையை வழங்குகின்றது. தீயணைப்புப் படை என்ற அடிப்படையில் அதற்கு ஒரு வாகனமும் ஒரு ambulanceதான் வழங்கப்பட்டிருகிறது; தனியான ஒரு பிரிவு அங்கு உருவாக்கப்படவில்லை. அதற்குரிய முக்கியமான காரணம் ஆளணி மற்றும் நிதி

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

வசதியின்மையாகும். ஆகவே, வரவிருக்கின்ற பாதீட்டின் நிதி ஒதுக்கீடுகளின் மூலமாகவேனும் வவுனியா மாவட்டத் திற்குப் பொறுப்பாக இருக்கின்ற மாநகர சபையினுடைய தீயணைப்புப் படைப் பிரிவுக்குத் தேவையான வசதிகளை வழங்கவேண்டும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Pathmanathan Sathiyalingam, your time is up now.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அத்துடன் இந்த உள்ளூராட்சி மன்றங்களுக்கான ஆளணி அமைப்பில் திருத்தங்களைச் செய்து, அந்த மன்றங்கள் தங்களுடைய கடமையை, மக்களுக்கான சேவையைத் திறம்படச் செய்வதற்கான வசதிகளைச் செய்து கொடுக்க ஆவன செய்ய வேண்டும் என்று கேட்டுக்கொண்டு, மீண்டும் ஒரு தடவை வீதிகளைப் புனரமைப்பதற்கான நடவடிக்கைகள் தொடர்பாக உடனடியாக அரசாங்க அதிபரும் சம்பந்தப்பட்ட உள்ளூராட்சி நிறுவனங்களும் கலந்துரையாடி, அரசாங்கத்தால் ஒதுக்கப்பட்ட அந்நிதி சரியாக மக்களுக்குச் சென்றடையக் கூடியதாக நடவடிக்கை எடுக்க வேண்டுமென்று சம்பந்தப்பட்ட துறைசார் அமைச்சரைக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Arun Hemachandra. You have 12 minutes.

[පූ.භා. 11.50]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (වැඩබලන විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா- வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா பதில் அமைச்சர்)
(The Hon. Arun Hemachandra- Acting Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතනවා අද වැදගත් දිනයක් කියලා. ඒකට හේතුව, ලංකා ඉතිහාසයේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් ගැන තමයි අද අපි සාකච්ඡා කරන්නේ. අද අපි පනතකට වැදගත් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. එය සුවිශේෂී දෙයක්.

මම ඉස්කෝලේ යන කාලයේ ඇත්තටම මට යම්කිසි බලාපොරොත්තුවක්, අපේක්ෂාවක් තිබුණා, මේ වාගේ සංශෝධනයක් ගෙනැල්ලා ළමයින්ට යම්කිසි ආකාරයේ සුරක්ෂිතභාවයක් ඇති කරන්නට ඕනෑ කියලා. හේතුව, මම පෞද්ගලිකවත් අවස්ථා කිහිපයකදීම මේ වාගේ ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම මම ඕනෑ තරම් දැකලා තිබෙනවා, මේ වාගේ ප්‍රශ්න ගැටලුවලට මුහුණ දෙන ළමයින්. ඉස්කෝලේ යන කාලයේ අපට බලාපොරොත්තුවක් තිබුණා, මෙවැනි පනත් සංශෝධනයක් කවදා හරි අපේ රටේ සිද්ධ වෙයි ද කියලා. මම ඉතාම සතුටු වෙනවා, දැන් අපේ ආණ්ඩු කාලය තුළ, විශේෂයෙන්ම අපි මේ පාර්ලිමේන්තුවේ ඉන්න කාලය තුළ ඒ සඳහා මැදිහත් වෙන්න අපට අවස්ථාවක් ලැබීම පිළිබඳව. ඒ වාගේම, යම්කිසි ආකාරයකින් මේ සංශෝධනයට පක්ෂපාතීව කරුණු දක්වන්නත් මට අවස්ථාවක් ලැබිලා තිබෙනවා.

විශේෂයෙන්ම මීට කලින් කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු මේ සම්බන්ධ කාරණා කිහිපයක් සඳහන් කළා. එකක් තමයි, මේ නිසා කවුරු හරි කෙනෙක් වින්දිතයකු විධියට පත් කරන්න පුළුවන් කියන එක; ගුරුවරු වෙන්න පුළුවන්, දෙමව්පියන් වෙන්න පුළුවන් යම්කිසි ආකාරයකින් එයාලා victimize වෙන්න පුළුවන් කියන කාරණාව සඳහන් කළා. නමුත්, මම මේ කාරණය කියන්න ඕනෑ. විශේෂයෙන්ම මේ වාගේ ප්‍රශ්නයක් උසාවියේදී ඔප්පු කරන ඒ කරුණු කාරණාත් එක්ක තමයි ඒක වෙන්නේ. මේ කාරණයට අදාළව ඕනෑ තරම් නීති තිබෙනවා. මේ කාරණයට අදාළව ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා. මේ කාරණයට අදාළව ඕනෑ තරම් judgments තිබෙනවා. මම හිතනවා, අපි දැන් ඉදිරිපත් කරන මේ සංශෝධනය ගත්තොත්, ඒක ඉතාම ප්‍රමාණවත් කියලා. ඒ වාගේම, ලංකාවේ සිසුන් දිගු කාලයක් තිස්සේ මුහුණ දෙන හිංසනයට අදාළව ගත්තොත්, සැලකිය යුතු ආකාරයකට ඒ ප්‍රශ්න, ගැටලුවලට මේ මඟින් තිතක් තියන්න පුළුවන් කියලා ලොකු විශ්වාසයක්, බලාපොරොත්තුවක් අපට තිබෙනවා.

මෙතැනදී මම පනතට අදාළව technical කරුණු කියන්න යන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අපට අදාළ කෙටුම්පත තිබෙනවා. ඒ පිළිබඳ විවිධ සාකච්ඡා දැන් සිද්ධ වෙයි. නමුත්, මම මෙතැනදී සමහර කාරණා සඳහන් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ලංකාවේ සිදු වුණු මේ වාගේ ප්‍රශ්න, ගැටලුවලට අදාළව මීට කලින් උසාවියේ මූලික අයිතිවාසිකම් නඩු කිහිපයක් පවරලා, ඒ සඳහා ලබා දුන් තීන්දු කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, "Bandara Case" කියලා නඩුවක් තිබෙනවා. එතැනදී අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමට අදාළව විශේෂයෙන්ම, "... caning a student was held to violate the fundamental rights ..." කියන කාරණයත් එතැනදී සඳහන් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, අවස්ථා කීපයකදීම මේ කරුණු කාරණා තැන් තැන්වල මතු වෙනවා. මේවාට අදාළව අවුරුද්දට 1,000කට අධික පැමිණිලි ප්‍රමාණයක් ලැබෙනවා. මෙච්චර කාලයක් තිබුණු නීති රාමුව ගත්තොත්, ඒ නීති රාමුව ප්‍රමාණවත් මදිකමක් තිබුණා. ඒ නිසා තමයි අද අපි මේ සංශෝධන ගෙනෙන්න උත්සාහ කරන්නේ. හැම දාම මෙවැනි කරුණු කාරණා සාකච්ඡාවට ලක් වෙනකොට, මේක ඉතාම සංවේදී කාරණාවක් - sensitive topic එකක් - විධියට තමයි පසුගිය කාල වකවානු තුළ දැකලා තිබෙන්නේ. සමාජය තිබෙන තැනට වඩා ඉස්සරහට, මීට වඩා හොඳ තැනකට අරගෙන යන්න උත්සාහ කරන දේශපාලන ව්‍යාපාරයක් විධියට, ඒ සඳහා ජන වරමක් ලැබිච්ච ආණ්ඩුවක් විධියට අපි බලාපොරොත්තු වෙනවා, අපේ කාලය තුළ මෙවැනි ප්‍රගතිශීලී සංශෝධන අනිවාර්යයෙන්ම ගෙනෙන්නට. ඉතින්, ඒකට අදාළ කරන ප්‍රවේශයක් තමයි අපි මෙතැනදී දකින්නේ.

අපි කියනවා, යටත් විජිත මානසිකත්වය - colonial mentality - කියලා. ඒ යටත් විජිත මානසිකත්වය හරහා තමයි මේ සංස්කෘතිය අපේ පද්ධතිය තුළට ඇතුළු වෙන්නේ. ඇත්තටම caning කියන දඬුවම් කරන මේ සංස්කෘතිය ගත්තොත්, ඒක ඇතුළු වෙන්නේ ඒ පදනමින්. නමුත් ඒ යටත් විජිතකරුවෝ, එහෙම නැත්නම් දශක ගණනාවකට කලින් අපව යටත් විජිත කරපු ඒ රටවල් ගත්තොත්, ඒ රටවල් පවා දැන් සැලකිය යුතු ආකාරයෙන් ඒ නීතිරීති ඒ රටවල් තුළත් සංශෝධන කරලා තිබෙනවා. නමුත් අපි අසමත් වෙලා තිබෙනවා, ඒ රටවල් තුළ

ඇති කරපු ඒ සංශෝධන අපේ රට තුළ ඇති කරන්නට. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මෙම සංශෝධන හරහා අපව යටත් විජිත කරපු රටවලට පවා ඇති කර ගැනීමේ හැකියාවක් තිබුණු ඒ සංශෝධන අපේ රට තුළට ගෙනෙන්න.

මම ඒ ගැන කරුණු කාරණා කීපයක් කියන්න කැමැතියි. මහා බ්‍රිතාන්‍යයේ ඒ කාලයේ තිබුණු Campbell and Cosans v. the United Kingdom කියන නඩුවක, "Court ruled that even the fear and threat of corporal punishment causing distress and humiliation violates dignity" කියලා තිබෙනවා. ඒ වාගේම 1998 වසරේ A v. the United Kingdom කියන නඩුවට අදාළ Judgment එකක් තිබෙනවා. එහි, "Court found punishment unlawful because it caused humiliation, not just injury" කියලා තිබෙනවා. Tyrer v. the United Kingdom කියලා තවත් නඩුවක් තිබෙනවා. ඒක 1978 එකක්. එහි, "Emphasized that the institutionalized humiliation of a boy being punished by state authority" කියලා තිබෙනවා.

ඇත්තට අපේ රට ගත්තොත්, විවිධ ප්‍රශ්න ගැටලුවලට මුහුණ දීපු රටක්. අපි දන්නවා, ශාරීරිකව විතරක් නොවෙයි මානසිකව ගත්තත් මෙවැනි ප්‍රශ්න ගැටලුවලට සිසුන් මුහුණ දීපු අවස්ථා මේ රටේ තිබෙන බව. කෙනෙකුගේ ජාතිකත්වය මත වෙන්න පුළුවන්, කුල මත වෙන්න පුළුවන්, දෙමාපියන් කරන රස්සාව මත වෙන්න පුළුවන්, ලිංගිකත්වය මත වෙන්න පුළුවන්, හමේ පාට මත වෙන්න පුළුවන්, ආගම මත වෙන්න පුළුවන්, ඒ වාගේ විවිධ කරුණු කාරණා හරහා හිංසනයට පත් වෙන සමාජයක් මේ රටේ ඉන්නවා. මහජන දිනවලට අප හොයා ගෙන එන දෙමව්පියන් එක එක ප්‍රශ්න ගැටලු අරගෙනයි එන්නේ.

මමත් පසුගිය කාලය තුළ මුහුණ දීපු ප්‍රශ්නයක් තිබෙනවා. පෙර පාසල් ළමයෙකුගේ දෙමාපියන් සහ ඒ පෙර පාසල් ගුරුවරිය අතර යම්කිසි ප්‍රශ්න වගයක් තිබිලා තිබෙනවා. ඒ පෙර පාසලට යන එ් පුංචි දරුවා ඒ ප්‍රශ්න නිසා හැමදාම ගැටලුවලට මුහුණ දීපු අවස්ථා තිබෙනවා. විශේෂයෙන් අඩු ලකුණු තමයි දරුවාට ලබා දීලා තිබෙන්නේ. මේ වාගේ දේවල් විසඳීමට විවිධ කමිටු පත් කරලා තිබුණත්, විවිධ ආකාරයෙන් මැදිහත් වෙලා තිබුණත් රටේ නීතිය ඇත්තටම ප්‍රමාණවත් නැහැ, ඒ ගුරුවරියට විරුද්ධව action එකක් ගන්න. මේක සමස්ත ගුරුවරුන්ට හෝ ගුරුවරියන්ට පොදු එකක් හෝ සමස්ත දෙමාපියන්ට පොදු එකක් නොවෙයි. මෙවැනි හුදෙකලා සිදුවීම් රට තුළ මතු වෙන අවස්ථා තිබෙනවා. නමුත්, එවැනි තත්ත්වයක් තිබෙද්දීත් රටේ මෙච්චර කාලයක් තිබුණු නීතිරීති ඇත්තටම ප්‍රමාණවත් නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා අපට දැන් හොඳ ප්‍රවේශයක් ලැබී තිබෙනවා, මෙවාට මැදිහත් වෙන්න.

ඒ වාගේම තමයි මා සහෝදර මන්ත්‍රීවරයා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරන රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමාත් - මන්ත්‍රී සහෝදරයාත්- මේ වාගේ ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දුන්නා. එතුමා උගන්වපු ඉස්කෝලයේ ශිෂ්‍යයන් මේ වාගේම යම්කිසි ආකාරයකට හිංසනයට ලක් වෙච්ච තත්ත්වයක් තිබුණා. ඒක දෙන්නෙක් සම්බන්ධ ප්‍රශ්නයක්. ඒ සිසුන්ට විරුද්ධව action අරගෙන තිබුණා. ඇත්තටම මම නම් හිතන විධියට ඉතාම වේගයෙන් ඉස්සරහට යන රටක, ලෝකයක අපි එවැනි දඬුවම් දෙන්න ඕනෑ නැහැ. නමුත් ඒ දඬුවමට විරුද්ධව මෙතුමා කථා කළා කියලා මෙතුමාට විරුද්ධව විනය පරීක්ෂණයක් ක්‍රියාත්මක කළා. ඇත්තටම ඒ දඬුවම දීපු අදාළ පාර්ශ්වයන්ට විරුද්ධව විනය පරීක්ෂණ තියනවා වෙනුවට, ඒ දඬුවමට විරුද්ධව කථා කරපු ගුරුවරයාට විරුද්ධව විනය පරීක්ෂණ තියපු යුගයකුත් තිබුණා.

අපිට ලොකු mandate එකක් තිබෙනවා. අපි ප්‍රගතිශීලී දේශපාලනයක් ගැන කථා කරනවා. අපි ලෝකයේ අනෙකුත් දේවල් එක්ක සංසන්දනය කරලා, ලෝකයේ හොඳ දේවල් අත්පත් කරගෙන, ඒ හොඳ අත්දැකීම් අරගෙන අපේ නීති රීති පද්ධතියත් සංශෝධනය කරන්න උත්සාහ කරන මේ අවස්ථාවේදී විශේෂයෙන් මෙවැනි සංශෝධන ඉතාම වැදගත් කියලා අපි හිතනවා.

ඒ වාගේම, නීති පැත්තෙන් විතරක් මේක counter කරන්න බැහැ කියලා මම හිතනවා. විශේෂයෙන්, මේකට අදාළව research පැත්තෙනුත් අපි තොරතුරු ගන්න ඕනෑ. මේකට අදාළ researches කීපයක් තිබෙනවා. Gershoff & Grogan-Kaylor කියන පුද්ගලයෝ දෙදෙනාම 2016දී research එකක් කරලා තිබෙනවා; ඒක "Journal of Family Psychology" කියන නමින් තමයි තිබෙන්නේ. "Corporal punishment increases aggression, depression and humiliation" කියලා එහි සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, Kousta *et al.* කියන කිහිපදෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් කරලා තිබෙන research එකකුත් තිබෙනවා; ඒ තමයි, "Nature Human Behaviour" කියන එක. "Humiliation and psychological punishment harm mental health and learning and parent-child bonds" කියලා එහි සඳහන් වෙනවා. ඒ වාගේ විවිධ දේවල් තිබෙනවා. ඉතාම යහපත්, හොඳ සමාජයක් නිර්මාණය කරනකොට ඒකට අදාළව මෙවන් ප්‍රගතිශීලී සංශෝධනත් අවශ්‍යයි.

ඒ වාගේම තව එක කාරණාවක් ගැන මම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙවන් ප්‍රගතිශීලී නීති රීති ගෙනෙන්න හදනකොට, සංශෝධන කරන්න හදනකොට මොකක්ද සිද්ධ වෙන්නේ? පසුගිය කාලයේ තිබුණු දේශපාලන සංස්කෘතියේම තවත් අදියරක් විධියට තමයි අපි මේක දකින්නේ. මේ රට තුළම සිසුන්ට හානි කරන, ළමයින්ට හානි කරන, තරුණ ප්‍රජාවට හානි කරන විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධව ගත්තාම, ආණ්ඩුවක් විධියට අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරගෙන යන වැඩ පිළිවෙළ සම්බන්ධවත් අනිවාර්යයෙන් අපි මෙතැනදී සඳහන් කළ යුතුයි. එක අතකට අපි මෙවැනි ප්‍රගතිශීලී නීති රීති ගෙනෙන අතරතුර පසුගිය කාලවකවානු තුළ ඒ තිබුණු දේශපාලන සංස්කෘතියේම කොටසක් විධියට තමයි මේ රට තුළම විෂ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන එවන් සංස්කෘතියක් තිබිලා තිබෙන්නේ කියලා අපි දකිනවා. අද මේකට විරුද්ධව කටයුතු කරන පොලීසිය, අනෙකුත් ආරක්ෂක අංශ ඇතුළු සියලුදෙනාට අපේ ස්තුතිය පුද කරනවා.

අපේ අනාගත පරම්පරාවට මේ රට භාර දෙනකොට අපි ඔවුන්ට ඉතාම සුරක්ෂිත රටක් භාර දිය යුතුයි. නමුත් දූෂණවලට, වංචාවලට, නාස්තියට විරුද්ධව, ඒ වාගේම විෂ මත්ද්‍රව්‍යවලට විරුද්ධව මේ ආණ්ඩුව කටයුතු කරනකොට මෙතැන සිටින විපක්ෂය නියෝජනය කරන සමහර අය අවාසනාවන්ත විධියට, කනගාටුදායක විධියට godfathersලා හොයාගෙන යනවා. එතුමන්ලාට godfathersලා අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ නිසායි. එක්තරා කාලයක එතුමන්ලාව ඒ දූෂණ, වංචාවලින් බේරපු godfathersලා හිටියා. ඒ godfathersලා කාලීනව වෙනස් වුණා. ඒ godfathersලා ගත්තොත්, ඔවුන්ගේ නම් වෙනස් වුණා; පාට වෙනස් වුණා. නමුත් කල්ලි කණ්ඩායම් එක විධියට තමයි හැම දාම තිබුණේ. මේ වාගේ සංශෝධන හරහා මේ ආණ්ඩුව ඉතාම වේගයෙන් ඉස්සරහට යනවා. ඒ වාගේම විමර්ශන, නඩු කටයුතු ඇතුළු සියලු දේම ඉතාම වේගයෙන් අපි ඉස්සරහට අරගෙන යනවා. අපේ දරුවන්ට මේ රට භාර දෙනකොට මීට වඩා සුරක්ෂිත, මීට වඩා හොඳින් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක්, වටපිටාවක් නිර්මාණය කිරීමේ වගකීම අපිට තිබෙනවා. ඒ සඳහා සියලුදෙනාටම ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මෙම සංශෝධනයට සහයෝගය දක්වන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Hiniduma Sunil Senevi. You have 13 minutes.

[අ.භා. 12.01]

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර කථා කරපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පෙන්වා දුන් පරිදි ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් අමාත්‍යවරිය අද දවසේ ගෙනාපු මේ සංශෝධන යෝජනාව ඉතාම වැදගත් බවට කිසිදු සැකයක් නැහැ. මේක ඉතාම විශේෂ අඩවියක් පිළිබඳ වැදගත්ම පනත් කෙටුම්පතක්. මොකද, මෙය පවතින නීතියට ප්‍රගතිශීලී ප්‍රවේශයකින් ගෙන එන සංශෝධනයක්. මෙවැනි සංශෝධන ගෙන එන්න ඕනෑ වෙන්නේම මෙබඳු ප්‍රගතිශීලී ප්‍රවේශයකින්ම තමයි. මේක දරුවන්; ළමුන් සම්බන්ධ කථාවක්. ඒ වාගේම තමයි මේක ළමයින්ගේ දිවිය, දරුවන්ගේ ඉරණම සම්බන්ධ කථාවක්.

මෙය, ළමයා වැඩිහිටියෙකු බවට පත් වුණාට පසුව කෙබඳු පුරවැසියෙක්, කෙබඳු ජීවියෙක් වෙන්න නියමිතව තිබෙනවාද කියන එකට සියයට සියයක්ම අදාළ කථාවක්. මොකද, ඒ වැඩිහිටියාගේ පරිසමාප්ත ජීවිතයේ ස්වරූපය, ඒ නිර්ණායක අනිවාර්යයෙන්ම ළමා කාලයේදී මුහුණ දෙන ශාරීරික දඬුවම සහ අමාත්‍යතුමිය ඉතා පැහැදිලිව ස්ථානගත කළ පරිදි හදවතේ ඇති වන තුවාල පිළිබඳ ප්‍රතිවිපාක මත තීන්දු වනවා. ඒ නිසා මේ සංශෝධන ඉතාම සද්භාවයෙන්, ප්‍රගතිශීලීව, දැන් තිබෙන නීතිය වඩා ඉදිරියට ගෙන යන්න, පුරවැසියන්ට ගැළපෙන ලෝකයක් හදා ගන්න ගෙනා යෝජනා වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවන් සම්බන්ධ බොහොම ලස්සන අලංකරණ අපි අහලා තිබෙනවා. අපි එයට ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ, rhetorics කියලා. "දරුවා මිනිසාගේ පියා" කියලා අපි කියනවා. "ලෝකය අයත් වන්නේ, අනාගතය අයත් වන්නේ දරුවන්ට" කියලා අපි නිතර කියන්න පුරුදු වෙලා තිබෙනවා. ඒත්, ලංකාවේ වැඩිහිටියෝ හැටියට ඒ කථාව කියන්න අපට සුදුසුකම් තිබෙනවාද? ලාංකික දරුවන්ට අවංක ලෙස ආදරය කළ පිරිසක්ද මේ වැඩිහිටි පරම්පරාව? නිරෝගී, සමාජ සංස්කෘතික සහ ආර්ථික ජීවිතයක් අපි ඔවුන්ට හදලා දුන්නාද? අපි එහෙම එකක් ඔවුන්ට තිළිණ කරලා තිබෙනවාද? අද උදේ ඉඳලා මේ සභාවේ ගැලරිය පාසල් දරුවන්ගෙන් පිරිලා තිබුණා. අපි කළ කථාබහට, අපේ ප්‍රවේශයට ඔවුන් සවන් දෙන්න ඇති. අද අපි විවාදයට ගන්න මේ කාරණය අඩුම තරමින් ඉදිරියේදී අපේ දරුවන්ගේ ලෝකයට, ළමා ලෝකයට නිශ්චිත පරිසමාප්ත ජීවිතයක් උරුම කරලා දෙන්න අනිවාර්යයෙන්ම බලපානවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අවධානය යොමු වන්නේ නීතිමය කරුණු පැත්තට නොවෙයි. ඒ පැත්තෙන් සාකච්ඡා කරන්න නීතිවේදීන් වන අමාත්‍යවරු, මන්ත්‍රීවරු ප්‍රමාණවත් තරම් මෙතැන සිටිනවා. මම කැමැතියි, මගේ මේ විනාඩි දෙක තුනක කාලය තුළ දඬුවම් සංස්කෘතිය ගැන අවධානය යොමු කරන්න. ඒ වාගේම දඬුවමට පිටුපස තිබෙන දර්ශනය ගැන සහ එහි මනෝ සායනික ස්වරූපය ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන සාකච්ඡාවක් දියත් වන කාලයක්. මම කැමැතියි, ඒ කාරණය එක්කත් මෙය සම්බන්ධ කර ගන්න. දැන් මේ කායික, ශාරීරික දඬුවම් සහ මානසික පීඩාවට ඉලක්ක වන දඬුවම් ප්‍රවර්ග ළමා ලෝකයේ ක්ෂේත්‍ර හතරකින්, පියවර හතරකින් පෙනෙන්නට තිබෙනවා. එකක්, දෙමවුපියන් හෝ පවුලේ වැඩිහිටියන් ගෙන එන දඬුවම්. දෙවැනි එක ගුරුවරුන් දෙන දඬුවම්. තුන්වන එක නේවාසිකාගාර, රැඳවුම් නිවාස හා ළමා නිවාස ආදී තැන්වල සිටින පාලක පාලිකාවන්ගෙන් එල්ල වන්න පුළුවන් දඬුවම්. ඊළඟට, තව කාරණයක් තිබෙනවා. ඒ තමයි ශිෂ්‍ය නායකයින් සම්බන්ධව කියැවුණාට, ඒ ගැන අද දවසේ මේ වනතුරු අපේ අවධානය වැඩිපුර ඉලක්ක වුණේ නැහැ. අපි සියලුදෙනා දන්නවා, ශිෂ්‍ය නායකයින්ට විනය සම්බන්ධයෙන් නිශ්චිත කාර්යභාරයක් පැවරෙන බව. සමහර වෙලාවට ඔවුන්ට වඩා බාල නංගිලා මල්ලිලාගේ විනය සම්බන්ධයෙන් සොයා බැලීම කියන තැනින් ඉදිරියට ගිහිල්ලා දඬුවම් දීම දක්වා ඔවුන්ට පාසල්වල යම්කිසි වගකීම් කොටසක් පැවරෙනවා. ඒක ගැටලුවක්. සමහර වෙලාවට විශ්වවිද්‍යාලවලත් එසේ තිබෙනවා. සමහර තවත් තැන්වලත් එසේ තිබෙනවා. පුංචි දරුවන්ගේ නිදහස සීමා කරන්න වෙන්න පුළුවන්, ඔවුන්ව පාලනය කරන්න වෙන්න පුළුවන්, තවත් දරුවෙකුට - මදක් වැඩිහිටි තවත් දරුවෙකුට- පැවරෙන ව්‍යුහයන් අපට දකින්නට තිබෙනවා. ඒ නිසා මේ කාරණා හතරම වැදගත්.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමිය සහ එම කණ්ඩායම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කුලුනු පහකින් කරගෙන යනවා. ඒකෙන් ඉතා වැදගත් එකක් තමයි මානව සම්පත දියුණු කරන එක. අද දවසේ සංවාදයට බඳුන් වන මානව සම්පත් දෙකක් අපට හඳුනා ගන්න පුළුවන්. ඒ තමයි ගුරු සහ සිසු. දඬුවම් සංස්කෘතිය, එහි පිටුපස තිබෙන දර්ශනය වඩා දියුණු ප්‍රවේශයකින් සංවර්ධනය කර ගන්න ඒ දෙගොල්ලෝම අපට ඕනෑ වෙනවා. අපේ ගුරු භවතුන් දඬුවම පිළිබඳ අලුතින් හිතන්න පුහුණු කර ගන්න වනවා. ඒ වාගේම මම අර කලින් කිව්වා වාගේ, ඒකට කොටස්කරුවෙකු හැටියට සම්බන්ධ වන දරුවන් යොදා ගන්නේ කොයි ප්‍රමාණයෙන්ද, එහි මාත්‍රාව මොකක්ද කියන එක ගැනත් අලුතින් හිතන්න වනවා.

මම කැමතියි, ගරු අමාත්‍යතුමිය උදේ නිතර අවධාරණය කළ හදවතේ තුවාල ගැන යමක් කථා කරන්න. ඒ වාගේම ගරු සභානායකතුමා චිත්‍රපට කිහිපයක් ගැන, කලා නිර්මාණ කිහිපයක් ගැන සිහිපත් කළා. මොකද, කලා සංස්කෘතික ක්ෂේත්‍රය මේ කියන අධිසංවේදී කලාපය අනුභූති හැටියට, නිර්මාණ හැටියට ඕනෑ තරම් අරගෙන තිබෙනවා. 1941දී හැදුණු චිත්‍රපටයක් තමයි, "Citizen Kane" කියන්නේ. Orson Welles තමයි මේ චිත්‍රපටය අධ්‍යක්ෂණය කළේ. "Citizen Kane" නම් චිත්‍රපටයේ ඉන්නවා, පසු කාලයේ ඇමෙරිකාවේ ජනාධිපතිවරණයට පවා ඉදිරිපත් වුණු චාල්ස් ෆොස්ටර් කේන් කියන මහා ධනවතා. ඔහු මිය යන මොහොතේ ඔහුගේ කටින් "Rosebud" කියන වචනය කියවෙනවා. "Rosebud" කියන්නේ "රෝස කැකුළ" කියන එක. මේක සෙවීම තමයි මුළු චිත්‍රපටය තුළම සිදුවන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවාද, "Rosebud" කියන්නේ මොකක්ද කියලා? ඒ මහා ධනවතා දරුවෙක්ව සිටි කාලයේ ඔහුව ගෙදරින් ඉවත් කරලා නගරයේ පාසලකට ගෙනයන්න හදනවා. ඔහුගේ අකැමැත්තෙන් තමයි ඒ ගමන ගෙනයන්න හදන්නේ. ඒ ගෙනයන දවසේත් ඔහු තුරුළු කරගෙන හිටපු, ඔහු වඩාත්ම ආදරය කළ සෙල්ලම් බඩුව තමයි, කුඩා හිම ඔරුව. ඒ හිම ඔරුවේ නම තමයි "Rosebud". ඔහුගේ තාත්තා ඉතාම කුරිරු විධියට මේ හිම ඔරුව දරුවාගෙන් උදුරලා විසිකරලා දාලා තමයි ඔහුව නගරයට පිටත් කරන රථයට නංවන්නේ. තමන්ගේ ළමා කාලයේ දැඩි ලෙස ආදරය කරපු මේ ආදරණීය වස්තුව ඔහුගෙන් උදුරා දැමීම පිළිබඳව ඉදිරි අවුරුදු හැට හැත්තෑව ඇතුළත ඔහුගේ ජීවිතයේ යම් කරුණක් මතු වෙන්නේ නැහැ. ඔහු මහා ධන කුවේරයෙක් දක්වා ගමනක් යනවා. ඔහු

ජනාධිපතිවරණයටත් ඉදිරිපත් වෙනවා. හැබැයි, මිය යන මොහොතේ ඔහුගේ හංස ගීතය - swan song - හැටියට, අන්තිම සිතිවිල්ල හැටියට ඔහුට කල්පනා වුණේ ඔහුට අහිමි වුණු ළමා ජීවිතය. මෙතෙක් කල් වැඩිහිටියෙක් හැටියට ඔහු කෙසේ ජීවත් වුණත්, ඔහුට අහිමි වුණු ඒ හිම ඔරුව පිළිබඳ මතකය තමයි ඔහුගේ මුළු ජීවිත කාලය පුරාම විඳවලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේක අන්තිම මොහොතේ මතක් වෙන්නේ. මේක එළියට පෙනෙන තුවාලයක් නොවෙයි. අපේ ගරු මන්ත්‍රීවරුන් පෙන්වා දුන් හැටියට සද්භාවය හෝ පුළුල් වැඩිකම වැනි තර්කන ඇතුළේ සාකච්ඡා කළාට මේ කියන කොටස කෙසේවත් එළියට පෙනෙන එකක් නොවෙයි. මෙබඳු දේවල් අප්‍රකටව තව කොච්චර තිබෙන්න පුළුවන්ද කියන එක මගේ අවධානයට බඳුන් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක ඒ දරුවාගේ ජීවිතයේ හිඩැසක් ඇති කරනවා, කම්පනයක් ඇති කරනවා. වඩා නිවැරදිව කිව්වොත්, ඔබතුමාගේ වෘත්තීය ජීවිතයේ තිබෙන භාෂාවෙන් කිව්වොත්, මේක ක්ෂතියක් - trauma එකක් - බවට පත් වෙනවා; traumatic experience එකක් බවට පත් වෙනවා. හදවතේ තුවාල ක්ෂතියක් බවට පත් වුණාට පස්සේ අපි නීතියෙන් මැන්නේ නැති වුණාට, හිරේ විලංගුවේ නොවැටුණාට මුළු ජීවිතයක් අඩාළ කරන, විනාශ කරන තැනකට මේක තල්ලු වෙනවා. මේ පිළිබඳව නිර්මාණ, නිදර්ශන මට ඕනෑ තරම් ඉදිරිපත් කරන්න පුළුවන්.

මේ අන්තිම විනාඩි දෙකේ තව එක උදාහරණයක් මම ඔබට කියන්න කැමතියි. 1948 වර්ෂයේදී ඉතාලියේ Vittorio De Sica අධ්‍යක්ෂණය කළ "Bicycle Thieves" කියලා නව රැල්ලේ තව චිත්‍රපටයක් තිබෙනවා. ඒකේ ඉන්නවා, පුංචි දරුවෙක්. ඒ වාගේම ඒ දරුවාගේ තාත්තා ඉන්නවා. ඒ තාත්තාට අයිති බයිසිකලය නැති වෙනවා. ඒක හොරු ගන්නවා. මේ කථාවේ එක තැනකදී මේ පුංචි දරුවා ඉදිරියේ නගර වැසියන් විසින් මේ තාත්තාට දඬුවම් කරනවා; අපහාස කරනවා; නිග්‍රහ කරනවා. ඒ දඬුවම ලැබෙන්නේ තාත්තාට. නමුත් මට අවධාරණය කරන්න ඕනෑවෙන්නේ මේවායේ වක්‍ර ප්‍රතිවිපාක දරුවන්ට දඬුවම් හැටියටම ලැබෙන හැටි. ඒවා පාසලේ වේවැලකින්, අතුල් පහරකින්, කම්මුල් පහරකින් කෙරෙන දේවල් නොවෙයි. ඒ නිසා මේ පනත පිටුපස තිබෙන ඇත්ත චුවමනාව, විෂය භාර අමාත්‍යතුමියගේ ඇත්ත චුවමනාව තමයි අපි වටහාගන්න ඕනෑ. ඒ දරුවාගේ මුළු ජීවිතයටම බලපානවා, තමන්ගේ පියා තමා ඉදිරියේ නිග්‍රහයට බඳුන් වීම. මෙබඳු කාරණා ඕනෑ තරම් මට මතක් කරන්නට පුළුවන්.

"The Silence of the Lambs" කියලා තවත් ලෝක ප්‍රකට චිත්‍රපටයක් 1991දී හැදුණා. මේකේ තිබෙන්නේත් childhood violence ගැන. පස්සේ කාලයක මිනීමරුවන් බවට පරිවර්තනය වෙන්න පුළුවන් විධියේ වැරදි, එහෙම නැත්නම් දඬුවම් දීම්, කම්පන සහ ක්ෂති පුංචි කාලයේ දරුවන්ගේ ජීවිතවලට එන්නත් වුණොත්, ඒකෙන් ප්‍රචණ්ඩත්වයෙන් පිරුණු සමාජයකට පාර කැපෙනවා. අපේ රටේ අද අපි අත්විඳින මත් ද්‍රව්‍ය ව්‍යසනය වෙන්න පුළුවන්, ආයුධ අරගත් පාතාලය වෙන්න පුළුවන්, මේ තැන්වලට මිනිස්සු තල්ලු කරගෙන යාමට මේ දඬුවම් සංස්කෘතිය මොන තරම් ඉවහල් වෙන්න පුළුවන්ද කියන එක මතු කර පෙන්වීම තමයි මගේ චුවමනාව වන්නේ.

නීතියෙන් කරන්න පුළුවන් අර්ථ කථනවල සීමාවක් තිබෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු, විසඳුමක් හැටියට ගෙනාපු, මේ විවෘතභාවය සීමා කරන්න හඳුන්වා දුන් "සද්භාවය" කියන වචනය පවා නැවත වතාවක් අර්ථ කථනය කෙරෙන්නේ ගරු මහෙස්ත්‍රාත්තුමෙක්, විනිශ්චයකාරතුමෙක් අතින් උසාවියේදීයි. ඒ සද්භාවයේ සීමාව කොතැනද තිබෙන්නේ? මේවා භාෂාව පිළිබඳ ප්‍රශ්න හැටියටත්, භාෂාව පිළිබඳ සීමා හැටියටත් සටහන් කරගන්න ඕනෑ.

ඊයේ අපේ ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා අවධාරණය කළා, ඊයේ දිනයේ තිබුණු විශේෂත්වය ගැන. ඊයේ දිනය, ජාත්‍යන්තර සංඥා භාෂා දිනය. පසුගිය දවස්වල අපට අහන්න ලැබුණා, කායික ආබාධ සහිත දරුවන් දඬුවමට සහ අපයෝජනයට පත් වෙච්ච අවස්ථා. අද මේ කථා කරන පනතට අදාළ දේවල් මේ වාගේ තැන්වල කොයිතරම් සැඟවිලා තිබෙන්න පුළුවන්ද? අඳ, ගොළු, බිහිරි වාගේ ආබාධ සහිත, අඩුපාඩු සහිත දරුවන් මේ සමාජයේ ඉන්නවා. ඒ, ඔවුන්ගේ වරදක් නොවෙයි. ඒවා උපදිනකොටම උරුම වෙන්නත් පුළුවන්. ඒ වාගේ ආබාධ සහිත දරුවන් දඬුවමකට ලක්වන අවස්ථාවක් ගැන කල්පනා කර බැලුවොත්, ඒක කොතරම් ව්‍යසනයක් වෙන්න පුළුවන්ද? ඒ ලබන දඬුවමට ප්‍රතිචාර දක්වන්න බැරි වෙන්න හේතුව, ඔහු ගොළු වීම නම්, ඒක ස්වාභාවික හේතුවක් නම්, ඒක කොතරම් ඛේදජනකද? ඔහුගේ ප්‍රතිචාරය එළියට කෑ ගහලා කියාගන්න බැරිවීමෙන් ඇතිවන පීඩනය සායනික අර්ථයෙන් - clinical meaning එකෙන් - ගත්තොත්, පසු කාලයකදී සමාජයට අවැඩදායක පුරවැසියෙක් බිහිවන තරමට එය දුරදිග යන්න පුළුවන්. මේ කායික දඬුවම් පාර්ශ්වය අප සියලුදෙනා ප්‍රතික්ෂේප කරන බවට කිසිදු විවාදයක් නැහැ. නමුත් අපට නොපෙනෙන, හදවතේ ඇතිවන තුවාලවලින් වැගිරෙන රුධිරය සමහර වෙලාවට සමාජයක් හැටියට වන්දි ගෙවන තැනකට තල්ලු වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක ශිෂ්ටත්වය මනින්න පුළුවන් පරාමිතීන් රැසක් තිබෙන්න පුළුවන්. ඒ අතරින් වැදගත්ම පරාමිතීන් දෙකක් තමයි, කාන්තාවකට ඒ රට සලකන විධිය සහ ළමුන්ට ඒ රට සලකන විධිය. ඔබ ඕනෑ තරම් දැකලා ඇති, "අතිශයින්ම වැඩිහිටියන්ට පමණයි" කියලා චිත්‍රපට තිබෙනවා. නමුත් කොතැනකවත් නැහැ, "අතිශයින්ම ළමයින්ට පමණයි" කියන චිත්‍රපට. එහෙම නැහැ. ඒවායේ සීමා තිබෙනවා. නමුත් අපේ දරුවන්ගේ ලෝකය කොයිතරම් දුරට ආරක්ෂා කරන්න රටක් හැටියට අපි නීතියෙනුත්, ඇත්ත චුවමනාවෙනුත්, අවංකභාවයෙනුත් කැප වෙනවාද කියන එක හෙට දවසේ ශ්‍රී ලංකාව පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක් කරා මෙහෙයවන ගමනට ඉතාම වැදගත්. ඒ නිසා මගේ මේ කරුණු ටික මේ පනත සම්බන්ධ තර්ක පෝෂණය කිරීමට එකතු කරමින්, කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda. You have seven minutes.

[අ.භා. 12.16]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද දවසේ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ලක් වනවා. අපි සතුටු වෙනවා, මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව. අද දියුණු සමාජයක්, දියුණු ලෝකයක් පවතින්නේ. අද අපේ රටේ මතය බවට පත් වෙමින් තිබෙන්නේ, මේ සමාජය තහවුරු කරමින් තිබෙන්නේ, දරුවන්ට දඬුවම් දීම උචිත නැහැ කියන කාරණය. මේ පිළිබඳව කථා කරනකොට අතීත කථා වස්තුවක් මට මතක් වුණා. පන්සියපනස් ජාතක පොතේ තිබෙන "තිලමුට්ඨි ජාතකය" කියන කථාවේදී තල හොරා කෑ කුමාරයාගේ කථාව පිළිබඳව මේ සභාවේ ඉන්න වැඩි පිරිසක් දන්නවා ඇති කියලා මම විශ්වාස කරනවා. දරුවන්ට වධ හිංසා පැමිණ වීම, මානසික හිරිහැර කිරීම, කෲරත්වයට පත් කිරීම, තුවාල කිරීම මහජන නියෝජිතයෙකු විධියට වාගේම පියෙකු විධියට මම දැඩිව හෙළා දකිනවා; මගේ විරෝධය ප්‍රකාශ කරනවා. හැබැයි, අපි නීති, පනත් ගෙනෙනවා වාගේම, අලුතෙන් නීති එකතු කරනවා වාගේම ඒ තුළින් මේ සමාජ ව්‍යුහය තුළ ඇතිවන හිඩැස පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑය කියන කාරණය මම මේ මොහොතේ සිහිපත් කරනවා.

ගරු චානක මාදුගොඩ මහතා

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරද, දඬුවම කියන්නේ එකම කාසියේ දෙපැත්ත. වරදක් කළොත් දඬුවමක් දිය යුතුයි. හැබැයි, අද වනකොට පාසලේදී වාගේම නිවසේදී දරුවෙක් වරදක් කළ විට ඔවුන්ව යම්කිසි ශික්ෂණයකට ලක් කරන්න ගුරුවරුන්ට මෙන්ම දෙමව්පියන්ට දෙපාරක් හිතන්න වෙලා තිබෙනවා. මොකද, උසාවිය මඟින් වරදකරුවන් බවට පත් වෙච්ච ගුරුවරු, විදුහල්පතිවරු අද වනකොට හිර ගෙවල් තුළ ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ පිළිබඳව අපි සියුම්ව කථා කරන්න ඕනෑ. වරදකට දඬුවම් දීම මේ දියුණු සමාජය ප්‍රතික්ෂේප කරනවා අපි දකිනවා. අද වනකොට පාසල් පද්ධතිය පවත්වාගෙන යෑමේදී දරුවෙකු යම් ශික්ෂණයකට පත් කරන්න ගුරුවරු මැළිකමක් දක්වනවා. සමහර වෙලාවට වරදක් දුටුවත් එය නොදැක්කා වාගේ ඉන්න ගුරුවරු පෙලඹෙමින් සිටිනවා. මොකද, ඒ ශික්ෂණය සම්බන්ධයෙන් ඇති නීතිරීති පිළිබඳව සමාජය තුළ තිබෙන කතිකාව නිසායි. වරදකට යම් දඬුවමක් නොදීම පිළිබඳව සමාජය තුළ කතිකාවක් ඇති වෙලා තිබෙන මේ මොහොතේදී පාසල් පද්ධතිය තුළ විනය පවත්වාගෙන යෑමේදීත්, ශිෂ්‍ය නායකයින්ට පැවරුණු වගකීම ඉටු කිරීමේදීත් විදුහල්පතිවරුන්, ගුරුවරුන් ඇතුළු සමස්ත ප්‍රජාවම අද වනකොට යම් මානසික ගැටලුවකට මුහුණ දෙමින් සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවන් යම්කිසි ශික්ෂණයකට ලක් කිරීම සඳහා ඔවුන් සමඟ ගැටෙන වෘත්තීන්ට යම් ඉඩක් තිබෙනවා නම් හොඳයි කියන මතය, මගේ මතයක් විධියට මම මේ මොහොතේදී ප්‍රකාශ කරනවා. ඒකට යම්කිසි ඉඩක් නොතිබුණොත් අපට මේ කටයුතු කරගෙන යන්න බැහැ.

ඒ වාගේම මම මේ මොහොතේදී මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අපි පසුගිය දවසක දැක්කා, ජාතික ජන බලවේගයට සම්බන්ධ උපකාරක පන්ති පවත්වාගෙන යන ගුරුවරු අතින් සිද්ධ වුණු සිදුවීම්. මෑතකදී සිදු වුණු එවැනි උදාහරණ කීපයක් පිළිබඳව මම මතක් කරන්නම්. අපි දැක්කා, තමන්ගේ උපකාරක පන්තියේ සිටින පිරිමි දරුවෙකු ඉදිරියට ගෙනැල්ලා, ඒ දරුවාට ගැහැනු දරුවෙකු ලවා වේවැල් මිටියකින් තරවටු කරනවා. ඒ වාගේම අපි දැක්කා, ජාතික ජන බලවේගයට සම්බන්ධ උපකාරක පන්ති ගුරුවරයෙකු නිසා මානසික පීඩනයට ලක් වෙච්ච දරුවෙකු සිය දිවි නසා ගන්නවා. ඒවා මේ සමාජයේ සිදු නොවිය යුතු දේවල්. ඒකට ජාතික ජන බලවේගයද, පොහොට්ටුව පක්ෂයද, අනෙක් පක්ෂද කියන කාරණය අදාළ වෙන්නේ නැහැ. නමුත්, මම මෑතකදී සිද්ධ වුණු එවැනි සිදුවීම් කිහිපයක් පිළිබඳවයි ඒ සිහිපත් කළේ. වරදෙහි ස්වභාවය, වරදෙහි තිබෙන ගැඹුර පිළිබඳව කථා කිරීම විවාදාත්මක කරුණක් කියන එකත් මම මේ මොහොතේදී සිහිපත් කරන්න ඕනෑ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Sir, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, please wait until the Hon. Member has finished. He will finish up his speech in two minutes.

Hon. Chanaka Madugoda,you have two more minutes.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව කථා කරනකොට මට මතක් වෙනවා, සුනිල් පෙරේරා මැතිතුමා කියපු සින්දුවක කොටසක්.

"තාත්තා මට ඇනපු ටොක්ක දවාලෙ තරු පෙනුණා
ඒ ඇරපු සත්තම්වලට කන් දෙක මගේ පිරුණා
එදා මට පෙනුණෙ ඔබව හතුරෙක් වාගෙයි තාත්තෙ
අද මට පෙනෙන්නේ ඔබ දෙවියෙක් වාගෙයි තාත්තෙ..."

ඒක තමයි දඬුවම තුළින් ගොඩනැඟුණු අපේ ජීවිතය තුළ තිබුණේ. ඒ නිසා මේක ඉතා සියුම්ව කථා කරන්න ඕනෑ කාරණයක් බව සිහිපත් කරමින්, මේ මොහොතේ පවතින ගැටලු කිහිපයක් පිළිබඳව කෙටියෙන් මෙම සභාව දැනුවත් කරන්නත් මම මේ අවස්ථාවේ බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ආණ්ඩුව පැවති කාලයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ තිබුණු කුරුඳු වගාව සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කළා. ගාල්ල කියන්නේ, කුරුඳු වගාව ප්‍රචලිතම දිස්ත්‍රික්කයක්. හොඳම කුරුඳු තිබෙන්නේ දකුණේ, ගාල්ලේ. නමුත්, අද වනකොට කුරුඳු වගාවේ යෙදෙන පුද්ගලයන් දැඩි අපහසුතාවකට පත් වෙලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, අද වනකොට කුරුඳු වගාව සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කියලා වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කරලා තිබෙනවා. නමුත් ඒ දෙපාර්තමේන්තුවට අද ප්‍රාදේශීය සැලැස්මක් තිබෙන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ වාගේම ප්‍රාදේශීය වශයෙන් වගකියන නිලධාරීන් මේ වනවිට ඒ දෙපාර්තමේන්තුවේ නැහැ. නිලධාරීන් විශාල ප්‍රමාණයක් අඩු වීම නිසා ඒ කටයුතු කරගෙන යෑමේදී ඔවුන් අපහසුතාවකට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම ඉහළ සිට පහළ දක්වා වූ සංවිධාන ධුරාවලියක් මේ දෙපාර්තමේන්තුව තුළ අද වනකොට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා ගමේ හැදෙන කුරුඳු ටිකට වගකියන රාජ්‍ය යාන්ත්‍රණයක් මේ නිලධාරීන් තුළින් ක්‍රියාත්මක වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලෝකයේ හොඳම කුරුඳු වගා කරන ගාල්ලේ කුරුඳු වගාකරුවන්ට අද වනකොට යන එන මං නැති වෙමින් තිබෙනවා. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ තිබෙන අඩුපාඩුකම් හඳුනාගෙන එය ශක්තිමත් කිරීමට කටයුතු කරන්න කියන කාරණයත් ඉතා ගෞරවයෙන් මම මේ සභාව හමුවේ සිහිපත් කරනවා.

ඒ වාගේම පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් මේ වනවිට මුහුණ දෙමින් සිටින ගැටලුවකුත් මම ඉදිරිපත් කරන්න කැමැතියි. පාසල්වල ගුරු මහත්ම මහත්මීන් සමඟ එකතු වෙමින් එම ක්‍රීඩා පුහුණුකරුවන් පාසල්වල ක්‍රීඩාව ඉහළට ඔසවන්න, ශක්තිමත් කරන්න සුවිශේෂී කාර්යභාරයක් මේ වනවිට සිදු කරමින් පවතිනවා. නමුත්, ඔවුන් මේ වනකොට විශාල ගැටලු රාශියකට මුහුණ දෙමින් ඉන්නවා. දැනට ඔවුන්ගේ සේවා කාලය වසර 5ක් පමණ ගෙවී තිබුණත් පත්වීම තවම ස්ථිර කරලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ නිසා ඔවුන්ගේ වෘත්තීය සුරක්ෂාව පිළිබඳව ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ වාගේම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දරුවන්ගේ ක්‍රීඩා කුසලතා සංවර්ධනය සඳහා ක්‍රීඩා ඉගැන්වීම්වලට යොමු කර තිබුණත්, මේ පිරිස තවමත් අනධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙසයි හඳුන්වන්නේ. ඔවුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පවත්වනු ලබන විභාග කොටස් තුනෙන් දෙකක්ම ඔවුන්ගේ විෂයට අනුකූල නොවන ක්ෂේත්‍රවලින් තමයි සකස් කර තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. ඔවුන්ට, ඔවුන්ගේ රැකියාවෙන් ඉහළට යන්න ක්‍රමවේදයකුත් නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම ක්‍රීඩා ඇමතිතුමාගෙන් වාගේම අධ්‍යාපන ඇමතිතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳවත් ඔබ ආණ්ඩුවේ අවධානය යොමු කරලා, පාසල් ක්‍රීඩා පුහුණුකරුවන්ගේ ගැටලුව නිරාකරණය කරන්න කියලා.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, what is your point of Order?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ කථාව තුළ විශේෂයෙන් මතු කරන්න හැදුවා, 'ජාතික ජන බලවේගයේ', 'ජාතික ජන බලවේගයේ' කියන එක. එක අවස්ථාවකදී කිව්වා,- *[බාධා කිරීමක්]* මම ඔබතුමාගේ කථාවට උත්තරයක් මේ දෙන්නේ. එක අවස්ථාවකදී කිව්වා, "ජාතික ජන බලවේගයේ වියුෂන් ගුරුවරයෙක්" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක විවෘතව කථා කරන්න ඕනෑ. යම්කිසි සිද්ධියක් වුණාට පස්සේ ශ්‍රී ලංකා පොලීසිය මැදිහත් වෙලා "බී" වාර්තාවක් ඉදිරිපත් කරලා ගරු අධිකරණයට යොමු කර තිබෙනවා. මෙතුමා කියපු ඔය සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වුණා; පොලීසිය විමර්ශනයක් කළා. මේ සම්බන්ධයෙන් අලුත්කඩේ අංක 6 මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුකරයක් පැවැත්වෙනවා. ඊට අමතරව, මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාට උපදෙස් ලබා ගැනීමට යවලා තිබෙනවා. මම අද මේ වාර්තාව පොලීසියෙන් අරගෙන ආවා. මේ වාර්තාවේ අවසන් ඡේදයේ තිබෙනවා,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please sit down? We will listen to the Hon. Watagala.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හැම එකකටම ඇවිල්ලා හොස්ස දමනවා. කොහෙන්ද මෙතුමාව පත් කරගෙන තිබෙන්නේ?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, would you please make it short?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Member කෙනෙකුගේ ප්‍රශ්නයකට උත්තරයක් දෙනකොට.... නැඟිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, I will have to expunge that word from Hansard.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
I withdraw that word, Hon. Deputy Speaker.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He withdrew that word.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
I withdrew that word.

මෙන්න අවසන් පරීක්ෂණ වාර්තාවේ අවසන් ඡේදය. "1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 308 වන වගන්තිය හා සාක්ෂි ආඥාපනතේ 33 වන වගන්තිය ප්‍රකාරව ශිවානන්දරාජා යන අයට හෝ වෙනත් වග කිව යුතු පාර්ශ්වයන්ට එරෙහිව ක්‍රියා කිරීමට හැකියාව ඇත්ද යන්න පිළිබඳ උපදෙස් පතා උද්ධෘත දින අංක යටතේ නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඊට අදාළව අංක දරන යොමු අංකය යටතේ නීතිපති උපදෙස් ලබාගෙන ඇති අතර, තවමත් නීති උපදෙස් ලැබී නැත."

ගරු අධිකරණයේ මේ නඩු කටයුත්ත තිබෙනවා. මෙතැනට ඇවිල්ලා කියනවා, "ජාතික ජන බලවේගයේ වියුෂන් මාස්ටර්" කියලා. මේක හරි වැරදි පූර්වාදර්ශයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we are not going to make this a debate. The Hon. Deputy Minister stood up because you had mentioned his party's name. -*[Interruption.]*

Hon. (Dr.) Ramanathan Archchuna, what do you want to say?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. මම දන්නේ නැහැ, ඔබතුමා ගැන. දැන් ඉන්න කථානායකතුමා කෙරෙහි විශ්වාසයක් නැති නිසා අපි එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවා. මෙතුමා විනාඩි දෙකහමාරක් විතර දැන් කථා කළා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා

මට පැහැදිලි කරලා කියන්න, ඒ point of Order එකට කොයි විධියට ද අවස්ථාව දුන්නේ කියලා. අපට එක නීතියක්, ආණ්ඩු පක්ෂයට එක නීතියක් වෙන්න බැහැ. ඉස්සරහට ඔබතුමා තමයි කථානායක හැටියට පත් වෙන්න යන්නේ. අපි දැන් ඔබතුමාව තමයි කථානායකතුමා හැටියට පත් කරන්න යන්නේ. එතකොට point of Order එක,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, he is the subject Minister and on whatever topic -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

He is not the subject Minister; he is the Deputy Minister.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Since the subject Minister is not here, he had a responsibility because his party's name was mentioned and -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කියන්න, Standing Ordersවල කොහේ හරි තිබෙනවාද, party එක mention කළාම කථා කරන්න පුළුවන් කියලා?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

He also has 14 minutes allotted today.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක සම්පූර්ණයෙන්ම වැරදියි නේ. වැරැද්ද පිළිගන්න. වැරැද්ද පිළිගෙන ඒ වාගේ අවස්ථාවක් අපටත් දෙන්න. එතකොට ප්‍රශ්නය ඉවර වෙනවා.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We will move on to the next speaker. - [Interruption.] Hon. Chanaka Madugoda, would you please take your seat? - *[Interruption.]*

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා- *[බාධා කිරීමක්]* මටත් උත්තරයක් දෙන්න අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chanaka Madugoda, Hon. Members, we are not going for a debate. Thank you.
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Prof.) Sena Nanayakkara. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප ජීවත් වන මේ පරිසරය තුළ අවධානය අඩුවෙන්ම යොමු වන, ඒ වාගේම බොහෝ දුරට සලකා නොබැලෙන ගැඹුරු කාරණයක් සම්බන්ධයෙන් තමයි ඉතාම සාර්ථක විවාදයක් ඇතුළේ අද අප මේ සාකච්ඡා කරන්නේ.

අද අප ජීවත් වෙන්නේ, 21වැනි සියවසේ වඩාත් දියුණුවට පත් වුණු ලෝකයක. අපේ අත් දැකීම අනුව, 21වන සියවස කියන්නේ ලෝකය මෙතෙක් ගමන් කළ ගමන් මාර්ගයේ දියුණුම අවස්ථාවයි. මේ කාලය විශේෂයෙන්ම විද්‍යාව, තාක්ෂණය, අධ්‍යාපනය වාගේම සන්නිවේදනය ආදි සකලවිධ පාර්ශ්වයන්ගෙන් දියුණුවේ හිනි පෙත්තට නැඟපු කාලයක් විධියට තමයි, ලෝකයේ සතර දිග්භාගයෙන් අපට ලැබෙන අත්දැකීම්වලින්, අප අහන, දකින, අත්විඳින සියලු සිදුවීම්වලින් හිතාගන්න පුළුවන් වෙන්නේ. මේ සියල්ල අතරතුර තමයි මේ වාගේ කාරණාවක් පිළිබඳව ඉතාම සංවේදී මට්ටමින් අවධානය යොමු කරන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම ලෝකයේ විද්‍යාව, තාක්ෂණය දියුණු වෙන්න, දියුණු වෙන්න සමහර දේවල් සරල බවට පත් වෙලා තිබෙනවා. එසේ සරල බවට පත්වීම නිසාම සමහර කාරණා අතිශය සංකීර්ණ, ගැඹුරු, විසඳාලිය නොහැකි, උභතෝකෝටික ප්‍රශ්න බවට පත් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නයත් ඒ වාගේ උභතෝකෝටිකයක් බවට පත් කරන්නට මේ වනකොට සමහරු අර අදිමින් සිටින බවක් තමයි අද උදෑසන ඉඳලා මේ විවාදාපන්න මාතෘකාව පිළිබඳව සාකච්ඡා කරපු කරුණු අනුව මට නම් හිතෙන්නේ. මේ කාරණය වඩාත් සාධාරණ, සමාජශීලී, සමාජ හිතකාමී, මේ ලෝකයට යහපත සඳන මාතෘකාවක් වන නිසා එක් පාර්ශ්වයක් පිළිබඳව නොහිතා මේ කාරණාවේ ගුණාත්මක පක්ෂය පිළිබඳව විතරක් ගැඹුරින් විග්‍රහ කරන්න අපට සිද්ධ වෙනවා.

අද අපි සංවාදයට භාජන කරන්නේ, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය සඳහා වූ පනත් කෙටුම්පතක් පිළිබඳවයි. මෙහිදී මම ඉතාම කනගාටුවෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. විපක්ෂයේ එක්තරා මන්ත්‍රීතුමෙක් මේ සම්බන්ධයෙන් කථා කරද්දී මතක් කළා, "මේ පනත සම්මත වුණේ මීට අවුරුදු 21කට පෙර.

ඒක නිසා මේක අමුතු දෙයක් නොවෙයි" කියලා. මම ඒ වචන ටික ඒ විදියටම උදෘත කරලා කිව්වේ, "මේක අමුතු දෙයක් නොවෙයි" කියලා එතුමා කියපු නිසායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අමුතු දෙයක් නොවෙයි තමයි. හැබැයි, ඒ අමුතු දෙයක් නොවන කාරණයේ සමාජ ප්‍රතිඵලය ඉතාම භයානක, ඉතාම ත්‍රාසජනක, ඉතාම ශෝචනීය තත්ත්වයක් බව අපි මේ වනකොටත් දකිනවා. අපි උදාහරණයක් ගනිමු. පෙරේදා දවස ඇතුළත තංගල්ල ප්‍රදේශයෙන් සොයාගත් කිලෝ 700කට ආසන්න මත් ද්‍රව්‍ය ප්‍රමාණය ගැනත් එක්තරා ආකාරයකට මේ කියන "අමුතු දෙයක් නොවෙයි" කියලා හැඟීමක් ලෝකය තුළ ඇති කරන්න තමයි සමහර පිරිස් ඒ උත්සාහ කරන්නේ.

නමුත්, මෙම කාරණය අද මේ සමාජයට ඉතාම වැදගත් කාරණාවක්. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව ශ්‍රී ලංකාව පිළිබඳව විමර්ශනය කිරීමේදී හෙළිදරව් කරපු කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි, ශාරීරික දඬුවම් ඇතුළු අපචාරවලට, එහෙම නැත්නම් අපයෝජනවලට ගොදුරු වන ළමුන් ගණන ක්‍රමක්‍රමයෙන්, ඉතාම ශීඝ්‍රයෙන් ඉහළ නැඟීම. දෙවැනි කාරණය තමයි, අප දන්නා විදියට සාමාන්‍ය පොදු සමාජය තුළ පමණක් නොවෙයි, විකල්ප රැකවරණ මධ්‍යස්ථාන ඇතුළේත්, ළමා නිවාස, ළමා පාසල්, එහෙම නැත්නම් එවැනි පොදු ළමා රැකවරණ මධ්‍යස්ථානවලදීත් පැහැදිලිවම ඒ ශාරීරික දණ්ඩනය සහ හිංසාව නීත්‍යානුකූලභාවයට පත් වෙලා තිබෙන එක. ඇත්තටම එය ඉතාම ශෝචනීයයි. මෙන්න මේ කාරණය තමයි අතිශය සංවේදී කාරණයක් වන්නේ. ජාතික ජන බලවේගය රජය විදියට අපි, දරුවා කෙරෙහි මීට වඩා ගැඹුරු සහ සංවේදී ආකල්පයක් මේ රජය තුළ සහ ජනතාව තුළ තිබෙන්න ඕනෑ කියලා රටක් විදියට හිතලායි, දියුණු සමාජයක් විදියට හිතලායි මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ.

මම පුංචි උදාහරණයක් කියන්නම්. මීට අවුරුදු ගණනාවකට - දශක දෙකතුනකට - කලින් ජර්මනියේ Düsseldorf අධිකරණයේදී ලෝක නෛතික ඉතිහාසය ඇතුළේ සුවිශේෂ සිදුවීමක් වුණා. විලියම් ෆ්‍රීච් කියන පුද්ගලයා තමන්ගේ සත්මහල් ප්‍රාසාදයේ ඉහළ මාලයේ ඉඳලා ස්වයංක්‍රිය ආයුධයකින් තත්පර 9ක් ඇතුළත තමන්ගේ බිරිය, තමන්ගේ ගෙදර මෙහෙකරුවන්, තමන්ගේ දරුවන් 3දෙනා, ඒ අවට සිටි පිරිස ඇතුළු 9දෙනෙකු ඝාතනය කළා. මේ සිද්ධිය Düsseldorf අධිකරණයට ගියාම එම චූදිතයා විනිශ්චයකාරවරයා ඉදිරියේ කළ පාපොච්චාරණයේදී පැහැදිලි වුණේ එම පුද්ගලයා කුඩා කාලයේ ලැබූ දරුණු වධ හිංසා ගැනයි. මේක සාමාන්‍ය සරල සිදුවීමක් විදියට කෙනෙකුට හිතෙන්න පුළුවන්. හැබැයි, මහා විශාල සමාජ ඛේදවාචකයකට, විපත්තියකට, ව්‍යසනයකට දොර කවුළු විවර කරන ප්‍රවේශයක් විදියට තමයි මේ කියන ළමා හිංසනය හා අනිසි දණ්ඩනය කියන කාරණය අපි දකින්නේ. ඒ නිසා ළමා හිංසනය හා අනිසි දණ්ඩනය පිටු දැකීමේ ඉතා පවිත්‍ර පරමාර්ථයකින් තමයි අද අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ.

අපේ කාන්තා සහ ළමා කටයුතු ගරු අමාත්‍යතුමියගේ කථාවේදී කිව්වා, එක්තරා කවියක්. මට මතක විදියට ඒක වදන් කවි පොතේ එන කවියක්. ඒ කවිය මෙසේයි:

"වේවැල් කෝටු නාරං සියඹලා අතු
කිතුල් පොල් ඉරටු වැල් කසඹිලිය අතු
මෙහැම ඉපල් මගෙ දැතට නොපෑ යුතු
පමා නොවී එම් අකුරට මෙයින් මතු"

චිරන්තන සාහිත්‍යය තුළ එන මේ කවියෙහි සඳහන් පරිදි දරුවාගේ සිතෙහි ගොඩනැංවුණු මනෝභාවය ගැන හිතන්න. දරුවාගේ කිසිදු වැරැද්දක් නැතුව පාසලට පැමිණීම -තක්සලාවට යන එක- ප්‍රමාද වීම හේතුකොටගෙන ගුරුවරයන්ගෙන් දඬුවම් ලැබීම හේතුවෙන් ඇත්ත වශයෙන්ම දරුවාගේ මනස තුළ මතු වන මනෝභාවය මොන තරම් විකෘතිද? එම හැඟීම නිසා දරුවාගේ අපේක්ෂා ශූන්‍ය වන, අපේක්ෂා භංගත්වයට පත් වන ස්වභාවය ඉතාම ඛේදනීයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලාංකීය සමාජයේ අතීතය තුළ ඒ වාගේ දේවල් සාහිත්‍යය තුළට කාන්දු වෙන්නේත් ඔය තත්ත්වය නිසාම තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම දරු පරපුර කියන්නේ රටක අනාගතයයි. ශේක්ෂ්පියර් දරුවා හැඳින්වූයේ "මිනිසාගේ පියා" ලෙසයි. සමාජයට එතරම්ම පුරෝගාමී මෙහෙවරක් කරන, සමාජය ගොඩනංවන පිරිස තමයි දරුවන් කියන්නේ. බුද්ධ දේශිතය තුළ දරුවන් ගැන සඳහන් වන්නේ "පුත්තා වත්ථු මනුස්සානං" කියලායි. මෙහි "පුත්තා" කිව්වේ පොදුවේ දරුවෝ සියලුදෙනා; දරුවන් සහ දැරියන් සියලුදෙනා. ඒ අය සමාජයට වස්තුවක්. සමාජය ගොඩනගන එක, සමාජයට ආදරය කරන එක, සමාජය පිළිබඳව සංවේදීව, ගැඹුරින් හිතන එක ඇත්ත වශයෙන්ම දියුණු සමාජයක ලක්ෂණයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු සංස්කෘතික ඇමතිතුමා කිව්වා වාගේ ඇත්ත වශයෙන්ම ඕනෑම දියුණු සමාජයක දරුවාට සහ කාන්තාවට කොයි තරම් ප්‍රමාණයකින් සලකනවාද කියන කාරණය ඉතා ගැඹුරින් විශ්ලේෂණයට ලක් කරනවා. මේ වන විටත් දරුවාට සහ කාන්තාවට නොසලකන සමාජයක් වෙත්නම්, ඒ සමාජය නොදියුණු, ගල් යුගයේ තිබෙන ප්‍රාථමික සමාජයක් බවට පත් වෙනවා. ඒක තමයි පැහැදිලි සත්‍යය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් හොඳින්ම දන්නා පරිදි ලෙනින් සහෝදරයා පවා කියා තිබෙන්නේ, "හොඳම දේ දරුවන්ට" - the best thing is for children - කියන කාරණයයි. අපි දරුවන්ට හොඳම දේ දෙනකොට වඩා හොඳින්, දරුවා පිළිබඳව සංවේදීව හිතන්න සිද්ධ වෙනවා. ඒක නිසා තමයි ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව මීට මාස 12කට පෙර ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් එම කාරණය සඳහන් කළේ. ඒ ගැන ඔබතුමාට මතක ඇති. එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පවා දරුවා පිළිබඳව ඉතා බරපතළ විදියට, ගැඹුරින් හිතා කරුණු සඳහන් කර තිබෙනවා. එහි පැහැදිලිව සඳහන් වෙනවා, සිරකරුවන් සමඟ දරුවන් ප්‍රවාහනය නොකළ යුතු බව. ඒ තත්ත්වය අපි ප්‍රතිපත්තියක් විදියට ඇති කරපු දෙයක්. ඒ වාගේමයි, ඔටිසම් දරුවන් පිළිබඳව විශේෂයෙන්ම හිතා අප සඳහන් කර තිබෙන කාරණය. ඒ වාගේම දරු ජාවාරම, එහෙම නැත්නම් දරුවන් කුලී සේවාවල යෙදවීම, දරුවන් වෙළෙඳාම ආදි සියලු දේවල් අකැප කටයුතු විදියට තමයි ජාතික ජන බලවේගය රජය ඇත්ත වශයෙන්ම නම් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙහිදී ඉතාම ඛේදනීය කාරණයක් කියන්න ඕනෑ. පසුගිය සතියේ අනුරාධපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වුණා. මෙය, ඒ කමිටුවේදී හෙළිදරව් වෙච්ච ඉතා බරපතළ, ශෝචනීය කාරණයක්. ඒ තමයි අනුරාධපුරය ප්‍රදේශයේ පිහිටි ආබාධිත දරුවන් රැඳී සිටින එක්තරා පාසලක දරුවන් යම් ආකාරයක ලිංගික අතවරයකට ලක් වීම කියන කාරණය. මේ කියන දණ්ඩනය සහ හිංසනය කියන කාරණයේදී අපි පැහැදිලිවම සලකා බැලිය යුතු දේවල් තිබෙනවා. මා ඒ පිළිබඳව මගේ අවධානය වැඩි වශයෙන් යොමු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඕනෑම කෙනෙකු දරුවන් පිළිබඳව සංවේදීව දයාවෙන් හිතනවා නම් මේ කාරණය විවාදයක් වෙන්න විදියක් නැහැ. A Good teacher can change any student කියන එක පෙන්වන්න films තිබෙනවා. ඒ වාගේමයි "Two plus two equals five" කියන චිත්‍රපටය. මේ චිත්‍රපට රූපාවලිවලින් පැහැදිලිව පේනවා මේ වෙනකොට

[ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා]

ලෝකයේ ප්‍රකටම මතය විධියට පත් වෙලා තිබෙන්නේ ඇත්ත වශයෙන්ම දරුවාට කරන හිංසනය, දරුවාට කරන පීඩනය වළක්වාලිය යුතුයි කියන කාරණය බව. ඒ නිසා අපේ ජාතික ජන බලවේග රජය අද දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 308වන වගන්තිය සංශෝධනය කිරීම ඉතාම නිවැරදි ප්‍රගතිගාමී තීරණයක් විධියට තමයි අපි දකින්නේ. "වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂකත්වය දරා සිටිමින්, දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රමයක් වශයෙන්, කොතරම් අඩු වුවද..." කියන මේ වචන පනත තුළ පාවිච්චි කළේ නිකම් නොවෙයි, ඇත්ත වශයෙන්ම දරුවා පැහැදිලිවම මීට වැඩිය සමාජයේ අවධානයට ලක් විය යුතුයි කියන කාරණය නිසා. අද මේ පනතට ගේන සංශෝධනය පැහැදිලිවම මේ රටේ දරු පරම්පරාවේ අනාගතය සම්බන්ධයෙන් ගත්තාම වඩාත් ප්‍රගතිගාමී අවස්ථාවක් විධියට අපි සලකන බව අවධාරණය කරමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Mujibur Rahuman. You have 15 minutes.

[අ.භා. 1.11]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අධිකරණයත් එක්ක සම්බන්ධ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතට ළමයින් සම්බන්ධ සංශෝධනයක් ඉදිරිපත් කරන අවස්ථාවේ විවාදයට සහභාගී වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි සියලුදෙනාම දන්නවා මේ පනතට මූලික හිංසනය, එහෙම නැත්නම් කෲර හිංසනය කියන කාරණා ඇතුළත් වෙන්නේ 1995දී බව. ඒකේ දිගුවක් ලෙස තමයි වර්තමාන ආණ්ඩුවත් මේ යම් යම් සංශෝධන කරන්නේ. විශේෂයෙන් සභානායකතුමාගේ කථාවේදී කිව්වා අද මේ කෙටුම්පත ගැන ඡන්දයකට යන්නේ නැහැ, විවාදයක් විතරයි කරන්නේ කියලා. එහෙම නම් ආණ්ඩුව එක පැත්තකින් පිළිගෙන තිබෙනවා මේ සංශෝධනය හරහා යම්කිසි ගැටලුවක් මතු වෙන්න පුළුවන් කියලා. ඒ හින්දා මේක වඩා නිරවුල් කරගෙන සම්මත කර ගම්මු කියන යෝජනාව ආණ්ඩුව පැත්තෙන්ම ඇවිල්ලා තිබෙනවා. අපි හිතනවා ආණ්ඩුව එහෙම තැනකට පැමිණීම ඉතාම හොඳයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ළමයින් සම්බන්ධ මේ විවාදය මම මුලින්ම පටන් ගන්නේ ළමයෙක් සම්බන්ධ කාරණයකින්. විශේෂයෙන්ම හම්දී ෆස්ලීන් කියන අවුරුදු එකහමාරක දෙකක දරුවෙක් පරීක්ෂණයකින් පසුව 2021 පෙබරවාරි මාසයේ කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලට ඇතුළත් කරනවා, දරුවාගේ වකුගඩු දෙකෙන් එක වකුගඩුවක -වම් පැත්තේ- ප්‍රශ්නයක් තිබෙනවා කියලා තහවුරු කරගෙන. ඒකට ශල්‍යකර්මයක් කළා 2022 දෙසැම්බර් මාසයේ 24වෙනි දින. 2023 ජූලි 27වෙනි දා ඒ දරුවා මිය යනවා. මිය ගියාට පස්සේ ඒ පරීක්ෂණ වාර්තාවල සඳහන් වෙන්නේ ඒ ළමයාගේ වකුගඩු දෙකම අයින් කළා කියලා. ඒ වකුගඩු අයින් කරපු ශල්‍යකර්මය කළ වෛද්‍යවරයා සහ ඔහුගේ සහායකයා මේ වෙනකොට ලංකාවේ නැහැ. ඔවුන් මේ ළමයා මියැදුනාට පසුව මාසයක් ඇතුළත රටින් පිටමං වෙලා ගියා. මේ පිළිබඳව දෙමාපියන්ට තිබුණු සැකය හින්දා, ඔවුන් මේ පිළිබඳ පරීක්ෂණයක් ඉල්ලා තිබෙනවා. 2025 මාර්තු 11වෙනි දා මහේස්ත්‍රාත් විසින් ඒ පරීක්ෂණයක් කරලා තීන්දුවක් ලබා දීලා තිබෙනවා. එතුමාගේ තීන්දුව අනුව පැහැදිලිව කියනවා අපරාධයක් සිදු වෙලා ඇත්නම්, ඒ වාගේම නොසැලකිලිමත්භාවයක් ඇත්නම් එයට සම්බන්ධ වෙලා හිටපු අය වහාම අත්අඩංගුවට අරගෙන නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. මේ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ කරලා දැන් මාසය 6කට කලින් ඒ වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට යවලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව තවම මේ සම්බන්ධ අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කරලා නැහැ. මේ නඩුව ඉස්සරහට ගෙන යන්න අවශ්‍ය මූලික දේවල් තවම කරලා නැහැ.

විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ මේ දරුවාගේ වාර්තාවල පැහැදිලිවම සඳහන් වෙනවා ඒ දරුවාට වකුගඩු දෙකක් තිබුණා කියලා. සාක්ෂි විමසීමේදී ඒකට සම්බන්ධ වෛද්‍යවරු පවා ඇවිල්ලා කියලා තිබුණා, වකුගඩු දෙකක් තිබුණා කියලා. ශල්‍යකර්මය කළාට පස්සේ පරීක්ෂණ කරද්දී අහුවෙනවා, වකුගඩු දෙකම ඉවත් කරලා කියලා. මේ ගැන හිටපු සෞඛ්‍ය ඇමතිවරු දෙදෙනෙකුගෙන් අපි ප්‍රශ්න කළා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තවම වාර්තාවක් දීලා නැහැ. දැන් මේ සිද්ධියට අවුරුදු දෙකහමාරකට ආසන්න කාලයක් වෙනවා. මේ ආණ්ඩුව ආපු අලුත නලින්ද ජයතිස්ස ඇමතිතුමාගෙනුත් මම ඇහුවා, "කෝ, ඒ දරුවා සම්බන්ධ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරීක්ෂණ වාර්තාව?" කියලා. නමුත් තවම එළියට දැම්මේ නැහැ. දැන් අපි නීතියේ ආධිපත්‍යය ගැන කථා කරනවා. ජනාධිපතිතුමා උදේ ඉඳන් හවස් වෙනකල් කට ඇරියොත් නීතියේ ආධිපත්‍යය ගැන කියනවා. කෝ, ඒ දරුවාට නීතියේ ආධිපත්‍යය? අලුත් ආණ්ඩුවක් ඇවිල්ලාත් ඒ දරුවා වෙනුවෙන් තවම නීතියේ සාධාරණත්වය ඉෂ්ට කරන්න අපොහොසත් වෙලා තිබෙනවා. පරණ ආණ්ඩුවට යම් යම් පීඩන වුණා. දේශපාලනඥයන්ට උදවු කරනවා. දේශපාලනඥයන් නීතිපති දෙපාර්තමේන්තුව අල්ලා ගෙන ඉන්නවා කියලා නේ ඒ අයට චෝදනා තිබෙන්නේ. මේ ආණ්ඩුව ඇවිල්ලාත් දැන් අවුරුද්දක් වෙනවා නේ. ඒ ළමයාගේ වාර්තාව CID එකෙන් නීතිපති දෙපාර්තමේන්තුවට යවලා මාස හයක් වෙනවා නේ. නමුත් තවම නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ නේ. ඒ වෛද්‍යවරයා රටත් දාලා ගිහිල්ලා ඉවරයි. අවුරුදු දෙකහමාරක දරුවෙකුට මේ වෙච්ච අසාධාරණය බලන්න. පැහැදිලිවම ඔහුට වකුගඩු දෙකක් තිබුණා කියලා වාර්තාවල සඳහන් වෙනවා. ශල්‍යකර්මයේදී වකුගඩු දෙකම ඉවත් කරලා තිබෙනවා. වම් පැත්තේ වකුගඩුව දුර්වලයි කියලා තමයි ඒ ළමයාට ශල්‍යකර්මය කළේ. නමුත් අවසානයේදී වම, දකුණ දෙකම ඉවත් කරලා ඒ ළමයාගේ ජීවිතය නැති වෙනවා. නමුත් සාධාරණත්වය නැහැ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවත් ඒක ඉෂ්ට කරලා නැහැ. නලින්ද ජයතිස්ස ඇමතිතුමාගෙන් මම කලින් ඇහුවාම එතුමා කිව්වා, ඒ වාර්තාව දෙන්නම් කියලා. නමුත් ඒ වාර්තාව තවම නැහැ. මම සෞඛ්‍ය ඇමතිවරු තුන්දෙනෙක්ගෙන් මේක ඇහුවා. මම කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාගෙන් ඇහුවා. රමේෂ් පතිරණ ඇමතිතුමාගෙන් ඇහුවා. දැන් අපේ වර්තමාන ඇමතිතුමා තමයි මම ඒ කාරණය අහපු තුන්වැනියා. එතුමාත් මට උත්තර විධියට කිව්වේ, තවම ඒ වාර්තාව ලැහැස්ති නැහැ කියලා. අපි කනගාටු වෙනවා, ඒ දරුවාට වෙච්ච දේ පිළිබඳව තවම නීතිය ක්‍රියාත්මක කරන්න බැරි වීම ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නීතියේ ආධිපත්‍යය ගැන කථා කරනවා. අපි සියලුදෙනාම දන්නවා, විශේෂයෙන්ම

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) ව්‍යවස්ථාවෙන් ජනතාවගේ පරමාධිපත්‍ය බලය පාර්ලිමේන්තුවට ලබා දීලා තිබෙන බව. පාර්ලිමේන්තුව තමයි ජනතාවගේ ඒ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරන්නේ. පාර්ලිමේන්තුව විසින් තමයි ජනතාවගේ බලය ක්‍රියාත්මක කරන්න අධිකරණයට බලය පවරලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවෙන් දෙන බලය තමයි අධිකරණය අද ක්‍රියාත්මක කරන්නේ. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව කියනවා. ඒ වාගේම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අපේ රටේ ජනතාවගේ නිදහස වෙනුවෙන් ක්‍රියාත්මක වෙන ප්‍රධාන කුලුනු තුන තමයි, විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය. අපි දන්නවා ජනතාවගේ ආරක්ෂාව, භාෂණයේ නිදහස, ලිවීමේ නිදහස ඒ සියලු දේවල් මේ තිබෙන කුලුනු තුන මත රඳා පවතින්නේ කියලා. ඒක අපි සියලුදෙනාම විශ්වාස කරනවා.

නමුත් මේ ආණ්ඩුව ආවාට පස්සේ පසුගිය කාලය තුළ ලබා දීලා තිබෙනවා, මහාධිකරණ විනිශ්චයකාරවරුන්ට උසස්වීම්. ඒ මහෙස්ත්‍රාත් අධිකරණවල හිටපු විනිශ්චයකරුවන්ට. එහෙම ලබා දීමේදී මෙච්චර කල් අපේ රටේ ක්‍රියා පටිපාටියක් තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ක්‍රියා පටිපාටිය තමයි ජ්‍යෙෂ්ඨත්වය මත promotions ලබා දීම. ජ්‍යෙෂ්ඨත්වය මත ඔවුන්ට උසස්වීම් ලබා දීමේ ක්‍රමයක් තිබුණා. නමුත් මේ ආණ්ඩුව ආවාට පස්සේ ජ්‍යෙෂ්ඨත්වය මත උසස්වීම් ලබා දීමේ ඒ ක්‍රමය අයින් කරලා තිබෙනවා. ඒක අයින් කරලා ආණ්ඩුව මේ වනවිට ගිහිල්ලා තිබෙනවා merit system එකට. ඒ කියන්නේ සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීලා ලකුණු ලබාගෙන ඒ උසස්වීම් ලබා දීමේ ක්‍රමයක් පසුගිය කාලයේ ආණ්ඩුව හඳුන්වා දුන්නා. ඒ අනුව තමයි අපේ රටේ මහාධිකරණවලට විනිශ්චයකරුවන් 17දෙනෙකුට පත්වීම් ලබා දුන්නේ. ඒ 17දෙනෙකුගෙන් එක් කෙනෙක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ආපු කෙනෙක්. අනෙක් 16දෙනාම අධිකරණ ක්ෂේත්‍රයේ ඉන්න අය. මේ පත්වීම් ලබා දීමේදී අධිකරණ සේවා කොමිෂන් සභාව තමයි ප්‍රධාන වශයෙන් ක්‍රියා කරන්නේ. ඒ සම්මුඛ පරීක්ෂණ පවත්වන කොට අනිවාර්යයෙන්ම අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනාම ඉන්න ඕනෑ. නමුත් සාමාජිකයන් දෙදෙනෙක් විතරයි, ඒ සම්මුඛ පරීක්ෂණය කළේ. ඇයි, අනෙක් සාමාජිකයා පත් නොකර ඒ සම්මුඛ පරීක්ෂණය කළේ කියන ප්‍රශ්නය අද අපි ඉදිරියේ තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනෙක් ඉන්නවා. තුන්දෙනාගෙන් දෙදෙනායි ඒ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වුණේ. අනෙක් සාමාජිකයා පත් කර තිබුණේ නැහැ. ඒ සාමාජිකයා පත් කළේ, ඒ සම්මුඛ පරීක්ෂණය ඉවර වුණාට පස්සේ.

නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ළඟ තිබෙනවා, ජ්‍යෙෂ්ඨත්වය අනුව ඒ විනිශ්චයකාරවරුන්ගේ නාම ලේඛනය. ඒක 252දෙනෙකුගේ නාම ලේඛනයක්. මම ඒ නාම ලේඛනය ඇමුණුම 01 වශයෙන් **සභාගත*** කරනවා.

එම නාම ලේඛනයේ ඇතුළත් 252දෙනාගෙන් මුලිකව සිටින 35දෙනා අතරින් තමයි අර 16දෙනා තෝරාගෙන තිබෙන්නේ. ඒ කියන්නේ 252දෙනාගෙන් අර මුලින් සිටින 35දෙනා අතරින් 16දෙනෙක් තමයි තෝරාගෙන තිබෙන්නේ, මේ ලකුණු ක්‍රමය අනුව. ඒ 35දෙනාගේ නාම ලේඛනයත් මගේ ළඟ තිබෙනවා. එම නාම ලේඛනයත් මම සභාගත කරන්නම්. කලින් ජ්‍යෙෂ්ඨත්වය මත උසස්වීම් ලබා දුන්නත්, දැන් මේ ලේඛනයේ පළමු වැනියාට ඉන්න කෙනාට promotion හම්බ වෙලා නැහැ. ඊළඟට, 3වැනියාට ඉන්න කෙනාටත් promotion හම්බ වෙලා නැහැ. 4වැනියාට ඉන්න කෙනාට promotion හම්බ වෙලා තිබෙනවා. 8වැනියාට ඉන්න කෙනාට promotion හම්බ වෙලා තිබෙනවා. 11වැනියාට ඉන්න කෙනාට promotion හම්බ වෙලා තිබෙනවා. 12වැනියාට ඉන්න කෙනාට promotion හම්බ වෙලා තිබෙනවා. 13වැනියාට ඉන්න කෙනාටත් promotion හම්බ වෙලා නැහැ. 15වැනියාට ඉන්න කෙනාටත් promotion හම්බ වෙලා නැහැ. 16වැනියාට ඉන්න කෙනාට promotion ලැබිලා තිබෙනවා. ඊළඟට, 17-20 දක්වා ඉන්න අයට promotions දීලා තිබෙනවා. ඊළඟට, 21වැනියාට සහ 22වැනියාට ඉන්න අයට promotions ලැබිලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 25වැනියාට promotion ලැබිලා තිබෙනවා; 28වැනියාට ඉන්න කෙනාට promotion ලැබිලා තිබෙනවා. ඊළඟට, 29වැනියාට ඉන්න කෙනාට promotion හම්බ වෙලා නැහැ. 30-35 වෙනකල් ඉන්න අයට promotions දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලේඛනයේ උඩින් ඉන්න සියලුදෙනාම ජ්‍යෙෂ්ඨත්වය මත අවුරුදු 15ක්-20ක් විනිශ්චයකාර තනතුරේ සේවය කරපු උදවිය; අත්දැකීම් තිබෙන උදවිය. එතකොට ඒ අයට ප්‍රමුඛත්වය නොදී, ඒ අයට උසස්වීම් ලබා නොදී, මේ ලැයිස්තුවේ ඉන්න 33වැනියාට දීලා තිබෙනවා. කවුද ඒ 33වැනියා? ඒ 33වැනියා තමයි පසුගිය දා හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා අත් අඩංගුවට ගන්න නියෝග කළ විනිශ්චයකාරතුමිය. එතුමියටත් promotion හම්බ වෙලා තිබෙනවා. එතුමිය ඉන්නේ 33වැනියාට. නමුත් ඊට උඩින් ඉන්න විශාල පිරිසක් මග හැරලා තිබෙනවා. එහෙම කොහොමද වෙන්නේ? ඒ 35දෙනාගේ නාම ලේඛනය මම ඇමුණුම 02 වශයෙන් **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාන මාරුවලදීත් ඒකම තමයි කරලා තිබෙන්නේ. ජ්‍යෙෂ්ඨත්වය අනුව නොවෙයි ස්ථාන මාරු දීලා තිබෙන්නේ. ඒ කියන්නේ 70 ගණන්වලට ඉන්න උදවිය කොළඹ මහෙස්ත්‍රාත් හැටියට ඇවිල්ලා තිබෙනවා. එහෙම වුණේ නැහැ මීට කලින්. ස්ථාන මාරු ලබා දෙනකොට, කොළඹ අධිකරණවලට ස්ථාන මාරු ලබා දෙනකොට, ජ්‍යෙෂ්ඨත්වය මත තමයි ලබා දුන්නේ. මගේ ළඟ මේ තිබෙන්නේ, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය ඉදිරිපත් කරලා තිබෙන ස්ථාන මාරුවලට අදාළ නම් ලැයිස්තුව. මේ ලැයිස්තුවේ තිබෙනවා, නම් 106ක්. මේ 106දෙනා අතර ඉන්නවා, ජ්‍යෙෂ්ඨත්වය මත පදනම් වුණු waiting list එකේත් 70 ගණන්, 60 ගණන්වල ඉන්න උදවිය. ඒ අය ජ්‍යෙෂ්ඨත්වයෙන් ඊට ඉහළින් ඉන්න සියලුදෙනාට උඩින් ඇවිල්ලා පත්වෙලා තිබෙනවා.

ඉතින් මම මේ විග්‍රහ කරන්නේ මේකයි. මේ ලකුණු දෙන ක්‍රමය ගැන, එහි විනිවිදභාවය ගැන ප්‍රශ්නයක් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොහොමද ඒ ලකුණු ලබා දුන්නේ? කොහොමද ඒ අය තෝරා ගත්තේ? එතුමන්ලාට මේ ගැන කථා කරන්න විධියක් නැහැ. අසාධාරණයක් වුණාම විනිශ්චයකාරවරුන්ට ගිහිල්ලා ඒ ගැන කථා කරන්න තැනක් නැහැ. අඩුම ගණනේ එතුමන්ලාට අභියාචනයක් ඉදිරිපත් කරන්නත් බැහැ. ඒ නිසා විනිශ්චයකාරවරුන්ට promotions ලබා දීමේදී, ස්ථාන මාරු ලබා දීමේදී සිදු වන අසාධාරණකම් ගැන සොයා බලන්න මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා මම යෝජනා කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චෝදනාවක් නැත්නම්, ඒ ගොල්ලන්ගේ පඩි කපලාත් නැත්නම්, ඒ ගොල්ලන්ට charge sheet එකකුත් නැත්නම්, ඒ ගොල්ලන්ගෙන් explanation call කරලාත් නැත්නම්, මම සභාගත කළ මේ ලැයිස්තුවේ ඉන්න අයට promotions ලබා නොදුන්නේ ඇයි? කිසිම charge sheet එකක් නැත්නම්, ඒ ගොල්ලන්ගේ පඩි කපලාත් නැත්නම්, ඒ ගොල්ලන්ගෙන් explanation call කරලාත් නැත්නම්, ඒ ගොල්ලන් විනය විරෝධී ක්‍රියාවක් කරලාත් නැත්නම්, ඒ ගොල්ලන්ට ඒ promotions ලබා නොදී, මේ merit system එක උඩ promotions දුන්නේ කොහොමද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් අපට මතු වෙන ප්‍රශ්නය තමයි මෙතෙක් කල් ස්වාධීනව වැඩ කරගෙන ආපු අධිකරණයට බලපෑම් කිරීමේ අදහසින් මේක කළාද කියලා. තමන්ට අවශ්‍ය විනිශ්චයකාරවරුන්, තමන්ට අවශ්‍ය තැන්වලට place කරන්න මේ merit system එක ගෙනාවාද කියන සැකය අද අධිකරණ ක්ෂේත්‍රය තුළ තිබෙනවා. එහෙම නම්, මේ merit system එක ගෙනැල්ලා තිබෙන්නේ, තමන්ට අවශ්‍ය විනිශ්චයකාරවරුන් තමන්ට අවශ්‍ය තැන්වලට දමා ගන්නයි. මොකද, මෙච්චරකල් තිබ්බ ඒ ක්‍රමය ඉවත් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාවට අවසාන වශයෙන් තිබෙන්නේ අධිකරණය ගැන විශ්වාසය පමණයි. මොකද, ආණ්ඩු එනවා යනවා. ඒ ආණ්ඩුවලින් ජනතාව බලාපොරොත්තු වෙන දේවල් ඉෂ්ට වෙන්නේ නැත්නම්, නීතියේ රැකවරණය ලැබෙන්නේ නැත්නම්, අන්තිමට ජනතාව යන්නේ අධිකරණයට. ඒ නිසා අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය බිඳ දමන්න එපා කියන එක අපි ආණ්ඩුවට මතක් කරලා දෙනවා. එහෙම කිරීම තුළ නැවත වතාවක් මේ රට තුළ අරාජික තත්ත්වයක් ඇති වෙන්න පුළුවන් කියන අනතුර අප ඉදිරියේ තිබෙනවා කියන එකත් අපි ආණ්ඩුවට මතක් කරලා දෙන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න, මම කථාව අවසාන කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී/29984 යටතේ නඩුවක් තිබෙනවා, පර්චස් 32 ක ඉඩමක තට්ටු දෙකක ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන්. අංක 10, නගර සභා පටුමඟ, දෙහිවල තමයි එහි ලිපිනය. මේක National Workers' Congress එකට අයිති ගොඩනැගිල්ලක් බලෙන් අල්ලා ගැනීම සම්බන්ධව නඩුවක්. 2024 සැප්තැම්බර් මාසයේ 06වෙනි දා වහාම ඒ සැකකරුවන් අත් අඩංගුවට ගන්න කියලා ගල්කිස්ස මහේස්ත්‍රාත්තුමිය නියෝග කරනවා. ඒ නියෝගය කළේ 2024 සැප්තැම්බර් 06 වෙනි දා. නමුත් අත් අඩංගුවට ගන්නේ නැහැ. ඊළඟට, නැවත වතාවක් 2024 නොවැම්බර් මාසයේ 22වෙනි දා වහාම අත් අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්න කියලා මහේස්ත්‍රාත්තුමිය පොලීසියට නියෝග දෙනවා. මොකද වෙන්නේ? අත් අඩංගුවට ගන්නේ නැහැ. ඇයි ඒ? මේ ආණ්ඩුවේ ඇමතිවරයෙක් නිසා එයා අත් අඩංගුවට ගන්නේ නැහැ. නමුත් ජනාධිපතිතුමා නීතියේ ආධිපත්‍ය ගැන කථා කරනවා. ඊළඟට, ඒ මහේස්ත්‍රාත්තුමිය මාරු කරනවා. මාරු කරලා වෙන මහේස්ත්‍රාත් කෙනෙක් ගේනවා. එතුමා නඩුව විභාග කරගෙන යනකොට එතුමාත් මාරු කරලා දැන් තව අලුත් එක්කෙනෙක් පත් කරලා තිබෙනවා.

මොකක්ද, මේ හදන්න යන නීතියේ ආධිපත්‍ය? මේකද, කථා කරපු විනිවිදභාවය? මේකද, කථා කරපු පාරදෘශ්‍යභාවය? මේකද, ජනතාවට දීපු පොරොන්දුව? අද පොලීසිය ඇවිල්ලා නීතිපතිගෙන් උපදෙස් ඉල්ලනවා, මේ ඇමතිතුමා අත් අඩංගුවට ගන්න ද, එපාද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහේස්ත්‍රාත්තුමිය නියෝග දීලා තිබෙනවා නම් අත් අඩංගුවට ගන්න ඕනෑ. ඒක නීතිපතිගෙන් අහන්න ඕනෑ නැහැ. රනිල් වික්‍රමසිංහ අත් අඩංගුවට ගන්නකොට නීතිපතිගෙන් ගිහිල්ලා ඇහුවේ නැහැ, අත් අඩංගුවට ගන්නද, එපාද කියලා. ඒ නීතිය ආණ්ඩුවේ ඉන්න ඇමතිවරයෙකුට ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ ඔහු මේ ආණ්ඩුවේ ඇමති කෙනෙක් නිසාද කියන ප්‍රශ්නය තමයි අපට දැන් තිබෙන්නේ. ජනාධිපතිතුමා උදේ ඉඳන් සවස් වෙනතුරු නීතියේ ආධිපත්‍ය ගැන බෙරිහන් දෙනවා. නීතියේ ආධිපත්‍ය ඇති කරන්න ඕනෑ කියනවා. නමුත් ඒ හැම එකක්ම අපට තමයි. විරුද්ධ පක්ෂයේ ඉන්න අපට තමයි නීතියේ ආධිපත්‍යය. ආණ්ඩුව නියෝජනය කරන මැති ඇමතිවරුන්ට නීතියේ ආධිපත්‍යයක් නැහැ. ඒ ගොල්ලන්ට නීතියේ ආධිපත්‍ය නැහැ. ඒ ගොල්ලන්ට අවශ්‍ය විධියට නීතිය නැවෙනවා. ඒ ගොල්ලන්ට අවශ්‍ය විධියට නීතිය නවා ගන්නවා. නවාගෙන අපට කියනවා, නීතියේ ආධිපත්‍ය හදනවා කියලා. නමුත් අද අපට පෙනෙන්න තිබෙනවා, අධිකරණයට බලපෑම් කිරීම, විනිශ්චයකරුවන් තමන්ට අවශ්‍ය විධියට තමන්ට ඕනෑ ඕනෑ තැනට පත් කරන්න කටයුතු කිරීම තුළ නැවත වතාවක් පසුගිය කාලයේ වාගේම අධිකරණයට අත පෙවීම සිද්ධ වන බව. ඒ හරහා අධිකරණයේ ස්වාධීනත්වය නැතිවීම නිසා රට තුළ අරාජික තත්ත්වයක් ඇති වෙන බව කියමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Rajapaksha. You have ten minutes.

[අ.භා. 1.29]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ දරු පරපුර හිංසනයෙන්, දණ්ඩනයෙන්, අපචාරයෙන් මුදා ගැනීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයට ගෙනෙන මේ සංශෝධනය මම දකින්නේ අශිෂ්ටත්වයේ ඉඳලා ශිෂ්ටත්වය කරා ගමන් කරන මේ සමාජයේ සාධනීය ලක්ෂණයක් විධියටයි. අපි විශ්වාස කරනවා, මේ බොහෝදෙනා පරිණාමවාදය ගැන දන්නවා කියලා. ඩෙස්මන්ඩ් මොරිස් කියන සමාජ විද්‍යාඥයා - මනෝ විද්‍යාඥයා - කියනවා, සෑම මනුෂ්‍යයකු තුළම තිරිසනෙකුත් ඉන්නවා කියලා. අපි ළඟ තිබෙන තිරිසන් ගති ලක්ෂණ, සත්ව ගති ලක්ෂණ අපි අයින් කරගෙන තිබෙන්නේ දීර්ඝ කාලයක් තිස්සේ අපි ගොඩනඟා ගත් නීති රීති, සම්ප්‍රදායයන්, ඇවතුම් පැවතුම්, සිරිත් විරිත් හරහා ගොඩනඟා ගත් ශිෂ්ටත්වය නිසා.

එවැනි ශික්ෂණයක්, එවැනි ශිෂ්ටත්වයක් නොතිබුණා නම් මේ මානව සමාජය මීට වඩා කෲර, මීට වඩා සත්ව හැසිරීම් වැඩි වන තැනක් වෙන්න පුළුවන්. මම එහෙම කිව්වේ, මේ ශික්ෂණය නොලබපු බොහෝ තැන්වල දවසින් දවස ඒ සත්ව චර්යා මතුවන නිසායි. අද වුණත් එහෙමයි. අපේ රටේ දරු පරපුරට එරෙහිව එවැනි චර්යා මතුවන එක වැළැක්වීම සඳහා තමයි අපේ රජය දණ්ඩ නීති සංග්‍රහයේ මේ වගන්ති වෙනස් කරලා ඒ දරු පරපුරේ ආරක්ෂාව තහවුරු කරන්න අවශ්‍ය කටයුතු කරන්නේ. සත්ව ලෝකයේ ඉන්න සතුන් අතර Homo sapiens sapiens කියන මනුෂ්‍යයාට විතරයි සමාජයක් තිබෙන්නේ. අනෙකුත් සියලු සතුන් පරිසරයට පැටව් බිහි කරනවා. මනුෂ්‍යයන් විතරක් සමාජයට දරුවෝ බිහි කර හදා වඩා ගන්නවා. දරුවෝ හදා වඩා

ගන්නකොට ඒ දරුවන්ට භීතිය, ත්‍රාසය, දණ්ඩනය එකතු කරලා ඒ දරුවන්ගේ චර්යා සුබදායී පැත්තට වෙනස් කරන්න බැරි බව අපි දැඩි සේ විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි දන්නවා, දඬුවම් කිරීම චර්යා වෙනස් කිරීම සඳහා යොදා ගන්නවා නම්, ඒ සතුන්ට කියලා. දැනටත් මේ ක්‍රමය ලෝකයේ පාවිච්චි කරන්නේ සතුන් සඳහා විතරයි. සතුන් හීලෑ කරන්න, සතුන් මෙල්ල කරන්න දඬුවම පාවිච්චි කළත්, ශිෂ්ට සම්පන්න වෙමින් පවතින මානව සමාජය තුළ දරුවන් හික්මවීම - ශික්ෂණය - සඳහා දැන් දඬුවම පාවිච්චි නොවන තරමට සමාජය ශිෂ්ටසම්පන්න වෙලා තිබෙන්නේ. අන්න ඒ නිසා දරුවන් හික්මවීම -ශික්ෂණය- සඳහා ආදරය, කරුණාව, පිළිගැනීම, ඇගැයීම වැනි සාධනීය උපකරණ, සාධනීය ක්‍රම පාවිච්චි කරන එක දියුණු මානව ශිෂ්ටාචාරයක ලක්ෂණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මානව හැසිරීම කියන්නේ ආරයේ හා පරිසරයේ සංකලනයක්. එහෙමයි මානව විද්‍යාවේ මානව හැසිරීම අර්ථ කථනය කරන්නේ. නමුත්, මානව හැසිරීමේදී ආරය කියන සාධකය බලපාන්නේ සියයට 5කටත් වඩා අඩුවෙන්. ඉතිරි සියයට 95ම ඒ දරුවන්ට පරිසරයෙන් එකතු වන සාධක. ඒ නිසා ඕනෑම දරුවෙක් හොඳ මට්ටමට ගෙන එන්න ඕනෑ නම්, ඔහුගේ නිවස වෙන්න පුළුවන්, පාසල වෙන්න පුළුවන්, ජීවත් වන සමාජය වෙන්න පුළුවන්, අන්න ඒ සමාජ වටපිටාවේ -නිවසේ සමාජය, පාසල් සමාජය හෝ එහෙම නැත්නම් පොදු සමාජය තුළ තිබෙන ඒ වටපිටාවේ- තිබෙන යහපත් බව, ක්‍රමවත් බව නිසා ඒ දරුවාගේ හැසිරීම අපට වෙනස් කරන්න පුළුවන්. ඒක තමයි අද ලෝකයේ සෑම තැනකම දියුණු ශිෂ්ටාචාර තුළ මිනිසුන් හික්මවීම - ශික්ෂණය- සඳහා යොදා ගන්නා ක්‍රමය බවට පත් වෙලා තිබෙන්නේ.

අද මේ සභාව තුළ වැඩිපුර කථා කළේ පාසලේ සිටින දරුවන් හිංසනයට ලක් වීම, කායික හා මානසික පීඩාවට පත් වීම වැනි කරුණු පිළිබඳවයි. අපි දන්නවා, දරුවෙකුගේ කාලය ගත්තොත් දවසේ පැය 24න් සාමාන්‍යයෙන් පැය 6ක්, 7ක් ඒ දරුවා හෝ දැරිය පාසලේ ඉන්න බව. දවසේ කාලයෙන් හතරෙන් පංගු තුනක්, නැත්නම් තුනෙන් පංගු දෙකක් දරුවන් ඉන්නේ නිවසේ හෝ වෙනත් පරිසරවල. ඒ නිසා මේ පනතින් අපි ආරක්ෂා කරන්න බලන්නේ පාසලේදී ඇතිවන තත්ත්ව විතරක් නොවෙයි. දරුවා ජීවත් වන නිවසේදීත්, දරුවා ජීවත් වන සමාජ පරිසරය තුළිනුත් ඒ දරුවන්ට ඇති වන පීඩාව ඉවත් කිරීම සඳහා සාධනීය පියවරක් දණ්ඩ නීති සංග්‍රහයේ මේ වෙනස් කරන වගන්ති තුළින් ඇති කරලා තිබෙනවා.

පාසල් විනය ගැන කථා කරපු නිසා මමත් ඒ ගැන යමක් කියන්න ඕනෑ. මොකද, පාසල සම්බන්ධයෙන් දිගු කාලීන අත්දැකීම් තිබෙන මටත් ඒ ගැන වචනයක් කථා නොකර බැහැ. පාසලේ විනය පවත්වා ගැනීම වෙනුවෙන් අවසාන වශයෙන් නිකුත් කර තිබෙන්නේ 2016 අංක 12 දරන චක්‍රලේඛය බව අපි දන්නවා. ඒ චක්‍රලේඛය තුළ පාසල් විනය ගැන කථා කරන්නේ, දරුවන්ට ස්වයං විනය ඇති කර ගැනීම සඳහා සුදුසු පරිසරයක් පාසල තුළ ගොඩ නඟමින්, දරුවා හොඳ හික්මීමක් ඇති දරුවෙකු බවට පත් කරන්න අවශ්‍ය කටයුතු පාසල තුළ ක්‍රියාත්මක විය යුතුයි කියලායි. ඒ විධියට තමයි පාසල තුළ දරුවා ගොඩනඟා ගත යුත්තේ. ඒ නිසා පාසලට එන ළමයාගේ ශාරීරික වර්ධනය, බුද්ධි වර්ධනය, චිත්ත වේග වර්ධනය, පෞරුෂ වර්ධනය ඇතුළු සමස්ත වර්ධනය වෙනුවෙන් උචිත ක්‍රියාමාර්ග රාශියක් අපට පාසල තුළදීම ගන්න පුළුවන්. දරුවන්ට දඬුවම් කරනවා වෙනුවට, හිංසනයට ලක් කරනවා වෙනුවට දරුවාගේ වර්ධනය වෙනුවෙන් පාසල තුළදී වුණත් අපට නොයෙක් දේවල් කරන්න පුළුවන්. සිසුන්ට හොඳ පෞරුෂයක් ගොඩනඟා ගැනීමට අවශ්‍ය වන පරිදි හොඳ විස්තෘත, පෘථුල, විෂය සමගාමී ක්‍රියාකාරකම් සමූහයක් පාසල තුළ දියත් කිරීමෙන් වාගේම, මානව හිතකාමී, සමාජ හිතකාමී වන පාසල් පිළිවෙත්, පන්ති කාමර පිළිවෙත් ආදිය තුළින් මේ දරුවා ඉතාම ගුණවත්, යහපත්, හික්මුණු කෙනෙකු බවට පත් කරලා, යහපත් පෞරුෂයක් ඇති හොඳ පුරවැසියෙකු විධියට දඬුවම් කිරීමෙන් තොරව සමාජගත කිරීම සඳහා පාසලට ඇති තරම් අවස්ථා - අවකාශ - තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, your time is up. Would you please wind up?

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

මම කලිනුත් කියා සිටියා, අපේ දරුවන් හිංසනයට ලක් වෙන්නේ පාසල තුළදී පමණක් නොවෙයි, පාසලෙන් පිටතදීත් හිංසනයට ලක් වෙනවා කියලා. මම ලබපු සමීප අත්දැකීමක් කියන්නම්. පසුගිය මාසයේ මම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවකට සහභාගි වුණා. ඒ ප්‍රදේශයේ මේ වර්ෂය තුළ අපචාර කටයුතු 53ක් සිද්ධ වෙලා තිබුණා. ඉන් අපචාර 13ක් සිද්ධ වෙලා තිබුණේ එකම ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් තුළ. ඒ අපචාර සියල්ල සිද්ධ වෙන්නේ මේ දරුවන්ගේ ළඟම හිතවතුන්ගෙන්, ඥාතීන්ගෙන් සහ ආදරණීයයන්ගෙන්. එම නිසා මේ පනතින් ලබා දෙන ආරක්ෂාව ළමයෙකු පාසලේ ඉන්න පැය 6කට ලඝු කරන්නේ නැතිව -සීමා කරන්නේ නැතිව- සමස්ත සමාජයේ ළමයා ගැවසෙන හැම තැනකදීම ලබා දෙන ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතුයි. ඔක්තෝබර් මාසයේ පළමුවැනි දාට ලෝක ළමා දිනය යෙදෙනවා. අපි දැනට පුරුදු වෙලා තිබෙන්නේ ඒ දවසේ ළමයාට තෑග්ගක් අරන් දීලා, ඇඳුමක් අරන් දීලා හිත සතුටු කරන්නයි. හැබැයි, රජයක් විධියට අපි දරුවන්ට ඒ දේවල් ලබා දීම වෙනුවට කරන්නේ තෑග්ගක් විධියට මේ පනත සංශෝධනය කර ලබා දෙන එකයි. අපි කලින් කියපු විධියට "හොඳම දේ දරුවන්ට" කියන අපේ විශ්වාසයත් එක්කයි අපි ඒ දේ ලබා දෙන්නේ.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) Hemali Weerasekara. You have 12 minutes.

[අ.භා. 1.40]

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි විවාදයට ලක් කරන්නේ ළමුන් සම්බන්ධයෙන් ශාරීරික දඬුවම් තහනම් කරමින්, ඒ වාගේම දරුවන්ගේ ආරක්ෂාව තවදුරටත් තහවුරු කරමින් දණ්ඩ නීති සංග්‍රහයට ගෙන එන සංශෝධනය පිළිබඳවයි.

[ගරු හේමාලි වීරසේකර මහත්මිය මහතා]

මතුපිටින් බලද්දී මේක හුදෙක් නීතිමය වෙනස්කමක් විධියට පෙනෙන්න පුළුවන්. නමුත්, සැබැවින්ම අද අපි ගොඩනඟන්නේ නීතිමය කාරණයකට එහා ගිය ගැඹුරු සාමාජීය වෙනසක් පිළිබඳ සංවාදයක්. අපට අවශ්‍ය වන්නේ කුමන ආකාරයේ ජාතියක් ගොඩනැඟීමටද, අපේ ඊළඟ පරම්පරාවේ ළමා කාලය කෙබඳු එකක් විය යුතුද? මේ සංශෝධනය තුළින් සපයන්නේ ඊට අවශ්‍ය නීතිමය අත්තිවාරමයි.

මම අද මේ විවාදයට සහභාගි වෙන්නේ පාර්ලිමේන්තුවේ නීති සම්පාදකයෙකුගේ කෝණයෙන්ම පමණක් නොවෙයි. දරුවන් දෙදෙනෙකුගේ මවක් විධියටත්, ගුරුවරියක් ලෙසත් මගේ වෘත්තීයමය කාලය තුළදී අද විවාදයට ලක් වෙන සංශෝධනය පිළිබඳව මට වඩාත් සම්පත්වයක් දැනෙනවා. මගේ දරුවන් මේ වනවිට ඔවුන්ගේ ළමා කාලය පහු කරලා වැඩිහිටියන් බවට පත් වෙලා සිටිනවා. ඒ නිසා දරුවන්ගේ ළමා කාලය, නව යොවුන් විය හා වැඩිහිටියන් බවට පත්වීම දක්වා මහපෙන්වීමේ දිගු ගමන ඔස්සේ මම ගමන් කර තිබෙනවා. ඒ ගමන කෙතරම් දුෂ්කර විය හැකිද, කෙතරම් ඉවසීමක්, ආදරයක් ඒ සඳහා අවශ්‍යද යන්න පිළිබඳව මම හොඳින්ම අත්දැක තිබෙනවා. ඒ නිසා කිසිම දෙමව්පියෙකුට හෝ භාරකාරයෙකුට හෝ ආරක්ෂකයෙකුට දරුවන්ට ලබා දිය යුතු මහපෙන්වීම ප්‍රචණ්ඩත්වයෙන්, දණ්ඩනයෙන් ප්‍රතිෂ්ඨාපනය කරන්න කිසිම අයිතියක් නැති බව මම තදින්ම පිළිගන්නවා. දරුවන් වගකිව යුතු වැඩිහිටියන් බවට පත් කරන්න නම් අපි මුලින්ම ඔවුන්ට ආදරය හා ගෞරවය කුමක්ද කියා ඉගැන්විය යුතුයි. වැඩිහිටියන් ඇසුරෙන් ඔවුන්ට එය දැනෙන්න සලස්වන්න ඕනෑ.

ශාරීරික දඬුවම් තුළින් දරුවන් යහ මඟට ගත හැකියි කියන විශ්වාසය වසර ගණනාවක් තිස්සේ අපේ සමාජය තුළ ගිලී තිබුණා. දරුවන් නිවැරදි කළ හැක්කේ දඬුවම් කිරීම් තුළින් යන මිථ්‍යාව ක්‍රියාත්මක වුණා. නමුත් ප්‍රචණ්ඩත්වය තුළින් ගෞරවය බිහි කරන්නේ නැහැ; යහපත් ළමයි බිහි වෙන්නේ නැහැ. ඒ තුළින් බිහි කරන්නේ ජීවිත කාලය පුරාම පවතින බිය හා කැලල් විතරයි. එපමණක් නොවෙයි. අද හිංසකයන් බවට පත් වෙලා ඉන්න වැඩිහිටියාගේ ළමා කාලය දිහා බැලුවොත්, බොහෝ විට ඔවුන්ගේ ළමා කාලය හිංසාවෙන් හා පීඩාවෙන් වාගේම මානසික කඩා වැටීම්වලින් පිරුණු එකක්. ඒ ගැන දැනට සමාජ හිංසකයන් විධියට ඉන්න අයගේ ජීවිත පිළිබඳව හොයලා බැලුවොත් අපිට දැනගන්න පුළුවන්. යහ මඟට නැත්නම් නිවැරදි මඟට ගැනීම සඳහා දරුවන්ට පහර දීම කුඩා වරදක් යැයි සාධාරණීකරණය කරන සමාජයක් ඊට වඩා බරපතළ වැරදි සාධාරණීකරණය කරන තැනට ලොකු දුරක් යන්න නැහැ. ඒ බව පසුගිය කාලය තුළ අපි අත්වින්දා. පන්ති කාමරවල, නිවෙස්වල, රැඳවුම් නිවාසවල දරුවන් පහර දීමට ලක් වෙද්දී යම් යම් අවස්ථාවල බලයේ රැකවරණවලට යටත්ව වඩාත් දරුණු අපරාධ සිද්ධ වුණු අවස්ථා තිබුණා. නීති සම්පාදනය කරන අය වාගේම නීතිය ක්‍රියාත්මක කරමින් වගකීම් දරන අය පවා මේ හිංසනවලට සම්බන්ධ වුණු අවස්ථා තිබුණා. ඒ බව අපි පසුගිය කාලය තුළ ඇහුවා, දැක්කා. ළමයි සම්බන්ධයෙන් නීති දැඩි කළ යුත්තේ ඒ නිසායි. ඒ සඳහා ආරම්භක අවස්ථාවක් ලෙස මෙය මා දකිනවා.

ඊට එහා ගිය වඩා දරුණු අපරාධවල සුලමුල පවා දැන් එළි වෙමින් තිබෙනවා. මේ වෙනකොට රටේ දකුණු පළාතෙන් හමු වෙමින් තිබෙන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගත්තොත්, මේ මත්ද්‍රව්‍යවලට ගොදුරු වෙන්නේ කවුද? අනාගතයේ මේ මත්ද්‍රව්‍ය භාවිතයට පුරුදු වෙන්නේ කවුද? ඒවායේ ගොදුරු බවට පත් වන්නේ ඔබේ දරුවන්, මගේ දරුවන් -අපේ දරුවන්-. විශේෂයෙන්ම දෙමව්පිය රැකවරණය අහිමිව වීදියට වැටිලා ඉන්න දරුවන් විශාල වශයෙන් මේ සඳහා ගොදුරු වන එක වළක්වන්න බැරි තත්ත්වයක් තිබෙනවා. නමුත්, දැන් අපි ඒ යුගය අවසන් කරන්න ඕනෑ. මේ, අපේ දරුවෝ. අපි රජයක් විධියට ඒ දරුවන් ආදරයෙන් බලා ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාස කරනවා, වඩාත් අනාරක්ෂිත දරුවන් ඉන්නේ රැඳවුම් නිවාසවල, සහතික කළ පාසල් සහ ළමා නිවාසවල කියලා. ඔවුන්ට පවුලක රැකවරණය අහිමියි; දෙමව්පියන්ගේ උණුසුම අහිමියි. ඔවුන් සම්පූර්ණයෙන්ම යැපෙන්නේ ඔවුන්ගේ භාරකරුවන් මත. නමුත්, අවාසනාවකට අපට නිරන්තරයෙන්ම අහන්න වාගේම දකින්න ලැබෙනවා, රැකවරණය ලැබිය යුත්තන් අතින්ම මේ අහිංසක මල් කැකුළු හිංසනයට පත් වෙන බව. මේ දරුවන් ශාරීරික හිංසනයට හෝ නින්දාවට ලක් වීම ඔවුන් විසින් විශ්වාස කළ යුතු වැඩිහිටියන් අතින්ම සිදු වෙනවා නම් ඒක ඇත්තටම ඛේදජනක තත්ත්වයක්. ඒ නිසා මේ සංශෝධනය ගෙන එම වඩාත් තීරණාත්මක වෙනවා.

දඬුවම දැඩි කිරීමෙන්, නීතිය තුළ තිබුණු නිදහසට කරුණු ඉවත් කිරීමෙන් ශාරීරික හිංසනය සම්බන්ධයෙන් තිබෙන නීති ශක්තිමත් කරලා තිබෙනවා. ඒ තුළින් කියන්නේ ගෙදර, පාසල, දිවා සුරැකුම් මධ්‍යස්ථානය, නේවාසිකාගාරය, ළමා නිවාසය කියන මේ ඕනෑම තැනක ඉන්න අපේ රටේ සියලු දරුවන්ට තමන්ගේ අභිමානය වාගේම ආරක්ෂාව සඳහා අයිතිය තිබෙනවාය කියන එකයි. නමුත් අපි මතක තියා ගන්න ඕනෑ, නීතිවලින්ම මේ සියල්ල කරන්න බැහැ කියන එක. අපට මේ සඳහා සංස්කෘතික වෙනසක් ඕනෑ. ඒක දියුණු සංස්කෘතික වෙනසක්. ආදරය, ඉවසීම, කරුණාව, ගෞරවය තුළින් විනය නිර්මාණය වෙන බව අපි, අපේ දෙමව්පියන්ට, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට අවධාරණය කරන්න ඕනෑ, අවබෝධ කරන්න ඕනෑ. අපේ රැඳවුම් නිවාස, ළමා නිවාස ආරක්ෂිත ස්ථාන බවට පත් වෙන්න ඕනෑ. ළමයින්ට එරෙහිව සිදු වන ඕනෑම ආකාරයක හිංසනයක් පිටු දකින සංස්කෘතියක් වෙත අපි යන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය නීතිමය හස්තය දැන් සමාජයට දිගු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ ළමයින්ට අවශ්‍ය රැකවරණය දෙන්න බැරි නම් එවැනි රාජ්‍යයකට අනාගතයක් නැහැ. වැඩිහිටියන් විධියට හිංසනයට විරුද්ධ වෙන්න අපට තිබෙන අවස්ථාව බොහෝ විට දරුවන්ට ලැබෙන්නේ නැහැ. ඔවුන්ට ඒ වෙනුවෙන් හඬක් නඟන්න බැරි අවස්ථා එමටයි. අපේ සියලු දරුවන් බලා ගැනීම වැඩිහිටි පරම්පරාව වන අප සතු වගකීමක්. මොකද, අතීතය තුළ විවිධාකාරයේ දේවල් තිබුණා. දරුවෝ හදන්න නම් මේ වාගේ දඬුවම් දෙන්න ඕනෑ කියලා පාඨත් එක්කම තිබුණා. හැඳි නොගා හදන කිරි හොද්ද ගැන කිව්වා නේ. අපි විඳලා නැති වුණත්, ඒ කාලයේ අපි අහලා තිබුණා, ගස් බැඳලා දිමි ගොටු කඩලා දානවා කියලා. දඬුවම කියන එක ගෝත්‍රිකයි. ගෝත්‍රික සමාජයෙන් මෙහාට එන්න දැන් කාලය හරි. දියුණු සමාජයක් කරා පිය නඟනකොට අනිවාර්යයෙන්ම දරුවා දියුණු මානවයෙක් බවට පත් වෙන්න නම් වැඩිහිටියා ඊටත් එහා ගිය දියුණු සිතුම් පැතුම්, ගතිපැවතුම්වලින් හෙබි අය වෙන්න ඕනෑ.

මවක්, මන්ත්‍රීවරියක් වාගේම පුරවැසියෙක් විධියට මම අද ගරු සභාවට කියනවා, අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගත යුත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධනයක් කියන පදනමින්ම විතරක් නොවෙයි කියලා. අපේ රටේ සියලු ළමයින්ට රැකවරණය, අභිමානය, බලාපොරොත්තු සහිත දියුණු සමාජයක් ඕනෑ. ඒ සඳහා අපි අඩිතාලම දමන්න ඕනෑ. අපි බලාපොරොත්තු වෙනවා, මේ රට පොහොසත් රටක්, ලස්සන ජීවිත ගත කරන ජන පරපුරක් වෙසෙන රටක් බවට පත් කරන්න. අපි මේ වාගේ සංශෝධන ගෙන ඒමට අවශ්‍ය වන්නේ එවැනි දියුණු මානව සමාජයක් කරා

ඉහළට එසවෙන්නයි. මම බලාපොරොත්තු වෙනවා, සියලු මන්ත්‍රීවරුන් මේ සම්බන්ධව සාධනීය තීරණයක් ගන්නවා ඇති කියලා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa, Leader of the Opposition. You have been allotted 13 minutes.

[අ.භා. 1.50]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සාකච්ඡාවට භාජන වන මාතෘකාව ගැන කිව්වොත්, විශේෂයෙන්ම එහි අඩංගු වන්නේ අපේ දරුවන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂා කිරීම, කෲරත්වයෙන්, හිංසනයෙන් තොරව දූ දරුවන් රැක බලා ගැනීම සහ කායික, මානසික දණ්ඩනයට ලක් නොකිරීම කියන කාරණා. ශීලාචාර හා ශිෂ්ට සම්පන්න ජන සමාජයක, මනුෂ්‍යත්වය රජයන යුගයක එම ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු බවට කිසිදු විවාදයක් නැහැ. මම හිතනවා, ගරු මන්ත්‍රීවරු 225දෙනාටම එකඟ විය හැකි කාරණාවක් තමයි, දූ දරුවන්ට හිංසනයෙන් තොර ජීවිතයක් උදා කරලීමේ ක්‍රියාදාමය.

නීතිඥවරයෙක් වන අපේ ගරු ඇමතිතුමාත් මේ ස්ථානයේ සිටින මොහොතේ මා කැමැතියි, මේ කාරණය සඳහන් කරන්න. මම අහගෙන හිටියා අපේ ගරු ඇමතිතුමිය සඳහන් කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් ගැන කියන VI වන පරිච්ඡේදයෙන් කියන පරිදි, ළමයින් සහ යෞවනයින් කායික වශයෙන්, මානසික වශයෙන් හා සදාචාරාත්මක වශයෙන් ශක්තිමත් කිරීම රජයේ යුතුකමක්ය කියන කාරණය. හැබැයි, අපි හැමෝම දන්නවා VI වන පරිච්ඡේදයෙන් ඒ ලබා දෙන අයිතිවාසිකම් සියල්ලක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 වන ව්‍යවස්ථාවෙන් අහෝසි වන බව. එහි මෙසේ සඳහන් වනවා:

> "මේ පරිච්ඡේදයේ විධිවිධාන හේතුකොටගෙන නීතියෙන් කිසිම අයිතිවාසිකමක් නොපැවරෙන්නේ ය."

ඇත්ත වශයෙන්ම අපි කළ යුත්තේ මොකක්ද? මේ VI වන පරිච්ඡේදයේ අඩංගු අයිතිවාසිකම්, දූ දරුවන්ගේ අයිතිවාසිකම්, මූලික අයිතියක් කරන්නට ඕනෑ; ඒක මානව අයිතියක් කරන්නට ඕනෑ. දැන් බලන්න, මේ VI වන පරිච්ඡේදය. එහි ඔක්කෝම කාරණා ලියලා ලියලා ලියලා, අවසානයේ කියනවා, මෙය නීතිමය වශයෙන් අභියෝගයට ලක් කරන්න බැහැ කියලා. ඉතින්, මම මතක් කරන්න කැමතියි, මම උදේ කියපු මාතෘකාව ගැන; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන. මම විශ්වාස කරනවා, රජය එය සිදු කරයි කියලා. ඒක ඔබගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. එය එසේ කරනකොට මේ ළමා අයිතියත්, යෞවනයින්ගේ අයිතියත්, කාන්තාවන්ගේ අයිතියත්, මේ VI වන පරිච්ඡේදයේ ඔක්කෝම ලැයිස්තුව ලියලා, අවසානයට මෙය අභියෝගයට ලක් කරන්න බැහැයි කියන ඒකත් අයින් කරලා, VI වන පරිච්ඡේදය එකතු කරන්නට ඕනෑ, මූලික අයිතිවාසිකම් ගැන කියන III වන පරිච්ඡේදයට. ඇත්තටම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අඩුපාඩුව තමයි, මේ ව්‍යවස්ථාව හදලා තිබෙන්නේ බටහිර කේන්ද්‍රීය මානව අයිතිවාසිකම් දෘෂ්ටි කෝණයකින් වීම. මේ මානව අයිතිවාසිකම් කියන එකට බටහිර කේන්ද්‍රීය, නැඟෙනහිර කේන්ද්‍රීය, වාමාංශික සහ දක්ෂිණාංශික කියන එක නොවෙයි අපි බලන්නට ඕනෑ. සමූහයක් හැටියට මානව අයිතිවාසිකම් කියන මාතෘකාව දිහා බලලා, දේශපාලන, සිවිල් අයිතිවාසිකම් ඇතුළුව ඒකට අපි ඇතුළු කරන්නට ඕනෑ, ආර්ථික අයිතිවාසිකම්, සමාජීය අයිතිවාසිකම්, සංස්කෘතික අයිතිවාසිකම්, ආගමික අයිතිවාසිකම් සහ ජීවත්වීමේ අයිතිය. අධ්‍යාපනයත් මානව අයිතියක්. සෞඛ්‍යයත් මානව අයිතියක්. ඉතින්, මම කැමැතියි ඒ කාරණාත් සමඟ විශේෂයෙන්ම මේ ඉතා වැදගත්, සංවේදී මාතෘකාව පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.

අපි හිතුවා අද මේකට ඡන්දයක් තිබෙනවා කියලා. මම හිතනවා, අද ඡන්දයක් නැත්තේ, මත විමසුමක් නැත්තේ, මේ මාතෘකාව පිළිබඳව පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව විවිධ මත තිබෙන නිසාය කියලා. මොකක්ද හරි, මොකක්ද වැරදි කියන එක ගැන මතිමතාන්තර රාශියක් තිබෙනවා. නමුත් අපි පිළිගන්නවා, දූ දරුවන්ට කෲරත්වයෙන් තොරව, හිංසනයෙන් තොරව, කායික සහ මානසික දණ්ඩනයෙන් තොරව ජීවත්වීමේ අයිතිය තිබිය යුතු බව.

හැබැයි ශීලාචාර, ශිෂ්ට සම්පන්න ජන සමාජයක් නිර්මාණය කිරීමේදී වැඩිහිටියාගේ කාර්යභාරයකුත් තිබෙනවා, ඒ දූ දරුවන්ව නිවැරදි මාර්ගයට යොමු කරන්න; සුමගට යොමු කරන්න. ඇත්ත වශයෙන්ම "සද්භාවය" කියන වචනයේ මීට වැඩිය පොඩ්ඩක් විග්‍රහයක් තිබෙන්නට ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. මොකක්ද සද්භාවය කියන්නේ? අපි කියනවා ඒක general වැඩියි කියලා. මොකද, සද්භාවය කියන එක පාවිච්චි කරලා යම් කෙනෙකුට කෲරත්වය ක්‍රියාත්මක කරන්න පුළුවන්. එය එසේ සිදුවෙන්න බැහැ. හැබැයි, අපේ සමාජය තුළ හරි වැරැදි ඉගැන්වීමේ ක්‍රියාවලිය තුළ පෙර පාසලේ ඉඳලා ගත්තොත්, මොනවාද පෙර පාසල් ගුරුතුමිය කරන්නේ? මොනවාද සහායක ගුරුතුමිය කරන්නේ? දරුවකු ඉපදුණු දවසේ සිට අවුරුදු පහ දක්වා සියයට 70ක මොළයේ වර්ධනය සිද්ධ වෙනවා. ඔබතුමා වෛද්‍යවරයෙක් හැටියට මේ ගැන දන්නවා. එතකොට බැලුවාමත් අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ අවිධිමත් පෙර පාසල් ක්‍රමවේදයක්; පද්ධතියක්. පාසලට ගියාම ගුරුවරයාගේ වගකීම, ගුරුවරියගේ වගකීම මොකක්ද? ගෙදර ඉන්න අම්මා තාත්තාගේ වගකීම මොකක්ද? කෲරත්වය, හිංසනය යන සියල්ල අපි හෙළා දකිනවා. අපි ඒවා බැහැර කරනවා. හැබැයි, ගුරුවරයා, ගුරුවරිය, වැඩිහිටියන් ඒ දූවා දරුවන් ජන සමාජයේ ශීලාචාර, ශිෂ්ට සම්පන්න, යුක්තිගරුක, විනයගරුක දරුවෙක්, තරුණයෙක් හෝ තරුණියක්, පුරවැසියෙක් බවට පත් කිරීමේ ක්‍රියාදාමය තුළ හොඳ නරක කියා දීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි මීට වැඩිය ගැඹුරින් විශ්ලේෂණය කරන්න ඕනෑ. මම හිතන විධියට මේ විෂය පිළිබඳ ඒ තරමම සංකීර්ණ අදහස් පද්ධතියක් තිබෙන නිසා වෙන්න ඇති අද මෙය ඡන්දයට ඉදිරිපත් කිරීම වැළකුණේ. මම ඒක වරදක් හැටියට දකින්නේ නැහැ. තවදුරටත් වාද විවාද කරලා අපි මේ පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කළ යුතුයි කියන එක මම කියන්නට කැමැතියි.

අද අපි කථා කරන්නේ දරුවන්ගේ අයිතිවාසිකම් ගැන. දරුවාගේ අයිතිය ගැන. මම කැමැතියි, තවත් පැත්තක් ගැන බලන්න. ආහාර සුරක්ෂිතභාවය නැති දරුවාගේ අයිතිය අපි ආරක්ෂා කරන්නේ කොහොමද? මේ රටේ සියයට 50ක් දුප්පත්කමින්, දරිද්‍රතාවෙන් පෙළෙනවා කියලා විවිධ විශේෂඥයින් කියනකොට අපි දරුවාගේ අයිතිය ආරක්ෂා කරන්නේ කොහොමද? මන්දපෝෂණයෙන් තොර ජීවිතයක් දරුවාට ලබා දීම කරන්නේ කොහොමද? කෘශ වීම, මිටි වීම, ක්ෂය වීම, බර අඩු දරුවන්, උපත් බර අඩු දරුවන් සිටිනවා. නීරක්තිය -රක්ත හීනතාව- මවුවරුන්ගේ ශරීර ස්කන්ධ දර්ශකය සෘජුවම දරුවාට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

බලපානවා. මාතෘ පෝෂණයත් දරුවාට සෘජුවම බලපානවා. දරුවාගේ උප්පත්තියත් එක්ක අපි ඒ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ කොහොමද?

අවංකව හිතලා බලන්න ගරු ඇමතිතුමනි, අපි ඇති කර ගත්ත IMF ගිවිසුම තුළ, මේ තිබෙන විධිවිධාන තුළ දරුවාගේ ආර්ථික අයිතිය, බඩගින්නෙන් තොර ජීවිතයක් ගත කිරීමේ අයිතිය ශක්තිමත් වෙලාද? අපි හැම දාම කියනවා, IMF ගිවිසුම අවශ්‍යයි කියලා. අපි ඒ රාමුව තුළ වැඩ කරන්නට ඕනෑ. ඒක ගැන ආයේ විවාදයක් නැහැ. නමුත් ඔබතුමන්ලා ජනතාවට පොරොන්දු වුණේ IMF ගිවිසුම හරහා පවුල් මත පැටවෙන පීඩනය, අසහනය, ඒ දුක්ඛිතභාවය ඉවත් කරලා අලුත් වැඩ පිළිවෙළකට යනවා කියලායි. ඒ කියන්නේ වැඩි සහනදායී වැඩ පිළිවෙළකට යනවා කියලායි. අපිත් ඒක අවංකවම විශ්වාස කරනවා. දැන් නිකමට හෝ හිතනවාද, ලිබරල් ආර්ථික ක්‍රමවේදය තුළ උඩ ඉන්න පොහොසතුන් ශක්තිමත් කරනකොට පොහොසතා ශක්තිමත් වීම තුළින් ප්‍රතිලාභ පහළට ගලාගෙන එන trickle-down economics තුළ දරුවන්ගේ අයිතිය ආරක්ෂා වෙනවා කියලා? ආරක්ෂා වෙනවාද? හදවතට තට්ටු කරලා අහන්න. අන්ත සමාජවාදය තුළ හැම දෙයම කරන්නට ඕනෑ ආණ්ඩුවයි, හැම දෙයම කරන්න ඕනෑ රාජ්‍යත්වයයි කියලා ලෝකයේ අසාර්ථකම ආර්ථික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණු රටවල දරුවන්ගේ අයිතිවාසිකම් අමු අමුවේ උල්ලංඝනය වෙනවා.

ඒවාට උදාහරණ හැටියට ගත හැකි උතුරු කොරියාව ඇතුළු රටවල් ගණනාවක් තිබෙනවා. අපි බලන්න ඕනෑ, දරුවාගේ කායික ශක්තිය, මානසික ශක්තිය වර්ධනය කිරීම, හිංසනයෙන් තොර ජීවිතයක් ගත කිරීමට ඉඩ සැලසීම ආදිය ගැන. ඒ ඔක්කෝම වාගේම ප්‍රධාන වශයෙන් ඇතුළත් කරන්න ඕනෑ, අපේ දරුවන්ට බඩගින්නෙන් තොර ජීවිතයක් හිමි කර දිය යුතු බව. එය ක්‍රියාත්මක කරන්න පුළුවන් හොඳම ප්‍රතිපත්තිය තමයි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී, සමාජ වෙළෙඳ පොළ ක්‍රමය හෙවත් මැද මාවත. රජය අද නව ලිබරල්වාදී මූලධර්ම මත පදනම් වුණු IMF ගිවිසුම හරහා ඉදිරියට යෑම නිසා, අපි අද දවසේ වාද විවාද කරන දරුවාගේ අයිතිවාසකම් එළියේ, මහ දවල් උල්ලංඝනය වෙනවා කියන එක හොඳින් මතක තබා ගන්න. අපි අවංකවම එතැනින් බැහැර වෙන්නට ඕනෑ. එක පැත්තකින් මානුෂීය ධනවාදය, තවත් පැත්තකින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය මුසු කරගත් මානුෂීය මැද මාවතක, දේශපාලන සිවිල් අයිතිවාසිකම් විතරක් නොවෙයි, ආර්ථික අයිතිවාසිකම, ජීවත් වීමේ අයිතිවාසිකම, අධ්‍යාපන අයිතිවාසිකම, සෞඛ්‍ය අයිතිවාසිකම වාගේම සංස්කෘතික, ආර්ථික, සමාජයීය සහ ආගමික ආදි හැම අයිතියක්ම ආරක්ෂා කරන මැද මාවතේ වැඩ පිළිවෙළකට යන්නට ඕනෑ. අන්න එතකොට ආර්ථික සෞභාග්‍යය අපේ රටේ පවුල්වලට ලැබෙනවා. ඒ ආර්ථික සෞභාග්‍යය අපේ රටේ පවුල් පරපුරට ලැබෙන කොට පවුලේ සිටින ඒ අවදානම්ම කොට්ඨාසය වන අපේ දරු පරපුර ආරක්ෂා වෙනවා; රැකෙනවා. ඒ වාගේම ඒ අයගේ අයිතිවාසිකම් ශක්තිමත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලිවම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, අපි හිංසනය හෙළා දකින බව. කායික, මානසික දණ්ඩනය වාගේම දරුවාගේ ආත්මාභිමානය කෙලෙසන ක්‍රියා අපි අනුමත කරන්නේ නැහැ. ඒ වාගේම මේ රටේ අම්මලා තාත්තලාට වගකීමක් තිබෙනවා, දූවා දරුවන්ට නිසි මාර්ගෝපදේශකත්වය මානුෂීය ආකාරයකින් ලබා දීමට. ඒ පිළිබඳව අපි මීට වඩා පුළුල් සංවාදයක නිරත වීම අත්‍යවශ්‍යයි.

ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, කාලයක් පුරාවට අපේ රටේ පාසල් පද්ධතිය මත් රකුසා විසින් ගිලගෙන තිබෙන බව. EZ Cash ක්‍රමය තුළ අපේ පාසල් පද්ධතියට මත්ද්‍රව්‍ය ඇතුළු වෙලා තිබෙනවා. අපි හැම වෙලාවේම හිටපු ස්ථාවරය තමයි මත්ද්‍රව්‍ය ජාවාරම මර්දනය කරන්නට දැඩි පියවර ගන්න ඕනෑය කියන එක. එසේ පියවර ගැනීම අපේ රටේ දරුවන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමක්. ඒ කාරණාවත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

අද මේ පවත්වනු ලබන විවාදය ලේසි පහසු විවාදයක් නොවෙයි. මේක straight forward නැහැ. දරුවාගේ අයිතීන් ආරක්ෂා වෙන්නට ඕනෑ. ඒක ගැන කිසිම තර්කයක් නැහැ. ශිෂ්ට සම්පන්න, පරිපූර්ණ, සදාචාර සම්පන්න, සුචරිතවත් දරුවන් නිර්මාණය කරන්න, ඒ දරුවන් රටට, සමාජයට, ජන ප්‍රජාවට ඵලදායී යෞවන යෞවනියන්, පුරවැසියන් බවට පත් කිරීමේදී වැඩිහිටියන්ගේ කාර්යභාරය, ගුරුවරුන්ගේ කාර්යභාරය, උගතුන්ගේ කාර්යභාරය පිළිබඳවත්, එය ක්‍රියාත්මක විය යුතු මානුෂීය ආකාරය පිළිබඳවත් අපි තවදුරටත් වාදවිවාද කරලා සම්මුතියකට එළඹීම ඉතාම වැදගත් යැයි මා විශ්වාස කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani. You have 10 minutes.

Before she starts, will an Hon. Member propose the Hon. Thilanka U. Gamage to the Chair?

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තිලංක යූ. ගමගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு திலங்க யூ. கமகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. THILANKA U. GAMAGE took the Chair.*

[අ.භා. 2.05]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්නා මේ මොහොතේ විශේෂයෙන්ම ගුරුවරියක සහ මවක වශයෙන් මේ පිළිබඳ අදහස් දක්වන්න ලැබීම ම භාග්‍යයක් කොට සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්ව ළමා ප්‍රඥප්තියට අනුව, වයස අවුරුදු 18ට අඩු සෑම පුරවැසියෙකුම ළමයෙකු වශයෙන් පිළිගන්නා බව අපි දන්නවා. අපි ඒක පිළිගෙන විතරක් නිකම් ඉන්නේ නැහැ. විශේෂයෙන්ම විශ්ව ළමා සම්මුතියෙහි පළමුවැනි වගන්තියෙන්ම අවධාරණය කර සිටිනවා, එම ප්‍රඥප්තියේ සඳහන් සියලු අයිතිවාසිකම් වයස අවුරුදු 18ට අඩු දරුවන් සඳහා හිමි විය යුතුයි කියලා. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාවට අනුව, මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපාදන සලකා බැලීමේදී කිසිම පුද්ගලයෙකු කෲර, අමානුෂික හෝ අවමන්සහගත සැලකිල්ලට ලක් නොකළ යුතු බව පිළිගෙන තිබෙනවා.

විශ්ව ළමා අයිතිවාසිකම් සම්මුතිය හැදිලා තිබෙන්නේ වගන්ති 54ක් පදනම් කරගෙන. විශ්ව ළමා අයිතිවාසිකම් සම්මුතිය ගොඩ නැඟීමේදී මූලික වශයෙන් පදනම් කරගත් මූලධර්ම 4 ගැන කථා කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. දරුවන් සම්බන්ධයෙන් වෙනස් කොට නොසැලකීම, දරුවාගේ උපරිම යහපත, පැවැත්ම සහ සංවර්ධනයට ඇති අයිතිය, දරුවාගේ අදහස්වලට ගරු කිරීම කියන ප්‍රධාන මූලධර්ම හතර පදනම් කරගෙන තමයි විශ්ව ළමා අයිතිවාසිකම් සම්මුතිය ගොඩ නැඟිලා තිබෙන්නේ.

1992දී අපේ රටේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය එළිදැක්වීමෙන් පසුව එය ක්‍රියාත්මක කිරීමේ වගකීම කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයටත්, ඒ යටතේ තිබෙන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවටත් පැවරුණා. ඒ පැවරීමට, ඒ වගවීමට, ඒ වගකීමට සාධාරණයක් ඉටු කරන්න, ඒ වගකීමට සාධාරණ විධියට වග වෙන්න තමයි අපේ ගරු ඇමතිතුමිය දෙවන වර කියැවීමේ විවාදය සඳහා අද දවසේ කථා බහට ලක් වන මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සිටියේ.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුවට අනුව ශාරීරික දඬුවම නිර්වචනය කර තිබෙනවා. ශාරීරික බලය භාවිත කර කරන දඬුවමක් කොතරම් සැහැල්ලු වුවත්, යම් ප්‍රමාණයක වේදනාවක් හෝ අපහසුතාවක් ඇති කිරීමට අදහස් කරන ඕනෑම දඬුවමක් ශාරීරික දඬුවමක් ලෙස නිර්වචනය කර තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ ශාරීරික දඬුවම්වලට භාජන වන දරුවන්ගේ වයස් කාණ්ඩ ගත්තොත්, වයස අවුරුදු 2 සිට 4 දක්වා කිසිවක් නොතේරෙන, හය හතර නොතේරෙන ඉතාම පුංචි දරුවාත් ශාරීරික දණ්ඩනයට, හිංසනයට ලක් වෙනවා. ඒ විතරක් නොවෙයි, වයස අවුරුදු 5 සිට 14 දක්වා වයස් කාණ්ඩවල දරුවනුත් වැඩි වශයෙන් ශාරීරික දණ්ඩනයට, ශාරීරික හිංසනයට ලක් වෙනවා. රටවල් 29ක කරන ලද සමීක්ෂණවලින් පෙනී යන කාරණාවක් තමයි, වයස අවුරුදු 1 සහ 2 අතර දරුවන් 10දෙනෙකු ගත්තොත්, ඒ දරුවන් 10දෙනාගෙන් තුන්දෙනෙකුවත් අවම වශයෙන් පහරකෑම්වලට, එහෙම නැත්නම්, ශාරීරික දඬුවම්වලට ලක් වෙන බව.

ශාරීරික දඬුවම අවශ්‍ය මොහොතකද අප ඉන්නේ කියන එක ගැන අපි විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ. එහෙම සමාජ වටපිටාවකද අප ඉන්නේ කියන එක ගැන අපි කථා කරන්න ඕනෑ. හැම අතින්ම දියුණු රටක් නිර්මාණය කරා යන ගමනේදී අපට වුවමනා කරනවා, සංස්කෘතික වශයෙන් ග්‍රෝතිකවාදය අත්හැර දාලා අපේ දරුවන්ගේ අයිතිවාසිකම් සුරකෙන, හිංසනයෙන් තොර මානවවාදී සමාජයක්. එවන් සමාජයක් හෙට දවසේ බලාපොරොත්තු වෙන්න නම් දරුවන්ට කරන හිංසනය, දණ්ඩනය ගැන අපට දෙවරක් හිතන්න වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ශාරීරික දඬුවම් ලබා දීමේදී දරුවන්ගේ ජීවිත නතර වෙන්නේ අපි කිසිම දවසක නොහිතන තැන්වල. ගුරුවරු හැටියට අපට එවැනි අවස්ථා අත්දකින්න සිදු වෙලා තිබෙනවා. ශාරීරික දණ්ඩනවලදී දරුවන්ගේ ශරීරයට හානි වෙනවා විතරක් නොවෙයි, ඇතැම්විට ජීවිත පවා අහිමි වුණු අවස්ථා සමාජ අත්දැකීම් අතුළේ තිබෙන බව අපි දන්නවා. ඒ විතරක් නොවෙයි. මේ දණ්ඩනයට, මේ හිංසනයට ප්‍රතිචාර දක්වන දරුවා ප්‍රචණ්ඩත්වය කරා නිරායාසයෙන්ම ඇදී යන තත්ත්වයක් අපි දැකලා තිබෙනවා. ඒ වාගේම, දරුවාට පාසල අප්‍රසන්න තැනක් බවට පත් වෙලා, අධ්‍යාපන අයිතිය අහිමි කර ගනිමින් පාසල හැර යන තැනට ගමන් කරන අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ එක්කම දරුවන්ගේ ආත්ම අභිමානය බිඳවැටෙන තැනට පත් වෙලා තිබෙනවා. බලාපොරොත්තු කඩවීමෙන්, දරුවන් ඉච්ඡාභංගත්වයට පත් වුණු අවස්ථා අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාබහ අවැසිම මොහොතක තමයි, මේ හිංසනය, දණ්ඩනය දරුවන්ගෙන් ඉවත් කළ යුතුයි කියන කථාබහ සමාජය ඉල්ලා සිටින මොහොතක තමයි අපි මේ කථාබහ මේ පාර්ලිමේන්තුව ඇතුළට අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව ශ්‍රී ලංකාව පිළිබඳ නිර්දේශ දීලා තිබෙන්නේ අපට සතුටු විය හැකි සීමාවක් ඇතුළේ නොවෙයි. ඔවුන් වාර්තා කරනවා ශාරීරික දඬුවම් ඇතුළු අපයෝජනයට සහ ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු වන ළමුන්ගේ සංඛ්‍යාව අපේ රට ඇතුළේ ඉතාම ශීඝ්‍රයෙන් ඉහළ යෑමක් දකින්න තිබෙනවා කියලා. ඒ විතරක් නොවෙයි. නිවාසවල, තමන් හැදුණු වැඩුණු ගේ ඇතුළේ, තමන්ගේ අම්මා තාත්තාගේ රැකවරණය ඇතුළේ, එහෙම නැත්නම් භාරකරුවන්ගේ රැකවරණය ඇතුළේ සිටින දරුවන්ට, ළමා නිවාසවල සිටින දරුවන්ට, දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින දරුවන්ට, පාසල්වල සිටින දරුවන්ට, දණ්ඩනය ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල ඉන්න දරුවන්ට දඬුවම් කිරීම නීත්‍යානුකූල අයිතියක් ලෙස දකිමින් ගමන් කරන සමාජයක් අද වෙනකොට අපට ශේෂ වෙලා තිබෙනවා. ඒ නිසා මේ නිදර්ශක, මේ දර්ශක ලේසිපහසු ඒවා නොවෙයි. අපි දරුවා "දරුවා" හැටියට දකිමින්, දරුවාට හිංසනයකින් පීඩාවකින් තොරව සැලකිය යුතුයි, සමාජය හෙට දවසේ පෞරුෂයෙන් හෙබි දරු පරපුරක් අපේක්ෂා කරනවා නම්. ඒකට වුවමනා කරන වටපිටාව හදලා දෙන්න අපට සිද්ධ වෙනවා.

ඒ විතරක් නොවෙයි. සමාජයේ කථාබහට ලක් වෙමින් තිබෙනවා, දෙමාපියන්ගේ ප්‍රශ්න කිරීමක් තිබෙනවා අපි හදපු දරුවන්ට අපට දඬුවම් දෙන්න බැරිද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දරුවෝ හැදුවාට දරුවන්ගේ තනි පෞද්ගලික අයිතිකාරයා කිසිසේත්ම දෙමාපියන් විතරක් නොවෙයි.

පාසල් පද්ධතිය ගත්තොත්, 2017 වසරේ ජනවාරි ඉඳලා මාර්තු දක්වා මාස 3ක කාලය තුළ තෝරා ගත්ත දිස්ත්‍රික්ක 6ක පාසල් 32ක් මුල් කරගෙන කළ සමීක්ෂණය අනුව, සිසුන්ගෙන් සියයට 80.4ක් කවර හෝ කායික දඬුවමකට ලක්ව ඇති බව වාර්තා වෙනවා. ඒ විතරක් නොවෙයි. සියයට 53.2ක දරුවෝ ශාරීරික අපයෝජනයට ලක්ව ඇති බව වාර්තා වෙනවා. සියයට 72.5ක දරුවෝ මානසික හිංසනයට ලක්ව ඇති බව වාර්තා වෙනවා.

විශේෂයෙන්ම පාසල් පද්ධතිය තුළ මේ හිංසනය, දණ්ඩනය ගැන කථා කරන්නේ අද නොවෙයි. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා හුවා දක්වන්න උත්සාහ කළා, විශේෂයෙන් අපි අද මේ පනත් කෙටුම්පත ගේන්නේ එක කණ්ඩායමක් අරමුණු කරගෙන, එහෙම නැත්නම් නිශ්චිත පිරිසක් අරමුණු කරගෙන කියලා. ඇත්තටම ඒ ගැන කනගාටුයි. අපි මේකෙන් කිසිදු පාර්ශ්වයක් අගතියට ලක් කිරීමක් නොවෙයි බලාපොරොත්තු වෙන්නේ. මට හිතෙනවා එතුමන්ලා කළ කථාවලින් මේකට

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය ]

එරෙහි වෙන්න කියලා ගුරුවරුන්ට ආරාධනා කළා කියලා, හරියට ගුරුවරුන්ට දඬුවම් දෙන්න මේ පනත් කෙටුම්පත ගෙනාවා වාගේ. මේක පාසල් පද්ධතියට අලුත් දෙයක් නොවෙයි. 2005 මැයි 11වැනි දා 17/2005 දරන චක්‍රලේඛය මඟින්, " පාසල තුළ විනය ආරක්ෂා කිරීම, දරුවා තුළ චර්යාත්මක වෙනසක් සිදු කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් වුවද ශාරීරික දඬුවම් නොකළ යුතු බව" දැනුවත් කරලා තිබෙනවා. ඇත්තටම ගුරුවරු මේ චක්‍රලේඛය ගැන අවබෝධයෙන් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. 2017.04.29 දිනැති 12/2016 චක්‍රලේඛය අනුවද පාසල් විනය පවත්වාගෙන යැමේ අරමුණින් වුවද සිසුන්ට දඬුවම් දීම සිදු කළහොත් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි බව ගුරුවරු දන්නවා. විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මේක හුදෙක් එක් පිරිසක්, එහෙම නැත්නම් කවුරුන් හෝ අපහසුතාවට ලක් කිරීම වෙනුවෙන් ගෙනෙන පනතක් නොවෙයි කියන කාරණය. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අත්සන් තබා තිබෙන රටවල් අතරින් රටවල් 68ක් අද වෙනකොට ළමයින්ට දෙන ශාරීරික දඬුවම් සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා. එසේ ශාරීරික දඬුවම් තහනම් කර ඇති රටවල යෞවන ප්‍රචණ්ඩත්වය මේ වෙනකොට පහව ගිහින් තිබෙනවා.

2010 වර්ෂයේ සිට අපේ රටේ ළමා අපයෝජන ඉතා ශීඝ්‍රයෙන් වැඩි වී තිබෙනවා. එවැනි සිදුවීම් 2023 අවුරුද්දේ 1,789ක්, 2024 අවුරුද්දේ 2,378ක්, 2025 අවුරුද්දේ ජූලි මාසය වෙනකොට 1,403ක් වශයෙන් වාර්තා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම 2025.01.01 සිට 2025.08.31 දක්වා කාලය තුළ ළමා අපයෝජන හා ළමයින් සම්බන්ධ පැමිණිලි 6,456ක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වෙලා තිබෙනවා. මා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ එවැනි සිදුවීම් 169ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි මේ පනතට සංශෝධන ගෙනැල්ලා දරුවන් ආරක්ෂා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව පුංචි වෙලාවක් ඉල්ලනවා, විපක්ෂය පැත්තෙන් මතු වුණු කාරණයක් පිළිබඳ අදහසක් ඉදිරිපත් කරන්න. එතුමන්ලා අපට ආරාධනා කළා මැද මාවතක ගමන් කරන්න කියලා. එතුමන්ලා අවුරුදු ගණනාවක් තිස්සේ මැද මාවතක ගමන් කරලා දරුවන්ගේ බඩගින්න නිවවා කිව්වා, ආර්ථික සාධාරණත්වය ඇති කළා කිව්වා, අධ්‍යාපන සාධාරණත්වය ඇති කළා කිව්වා. නමුත් මැද මාවතේ ගමන් කරලා දරුවන්ගේ බඩගින්න, අධ්‍යාපනය, ආර්ථිකය ගැන හිතුවා කිව්වාට, ඒ කාලයේ කළ දේවල් මම කියන්න කැමැතියි. අපි දැක්කා, මේ රට මත්ද්‍රව්‍යවලින් පුරවනවා. අපි දෙමව්පියන් හැටියට, අම්මලා හැටියට මොහොතකටවත් බලාපොරොත්තු වුණේ නැහැ, මේ රට ඇතුළේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන කර්මාන්තශාලා ඇති කියලා; අපි මොහොතකටවත් ඒක විශ්වාස කළේ නැහැ. ඊයේ වෙනකොට අයිස් ඇතුළු මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,845ක් අල්ලා තිබුණා. හෙරොයින් කිලෝග්‍රෑම් 1,243ක් අල්ලා තිබුණා. මේවා කවුරු වෙනුවෙන්ද ගෙනාවේ? මේවා අපේ දරු පරපුර අරමුණු කරගෙනයි ගෙනැවිත් තිබෙන්නේ. ඒ නිසා අපි මේ නීති, අණ පනත් සංශෝධනය කරනවා විතරක් නොවෙයි, මේ රටේ දරුවන්ට හෙට දවසේ විශ්වාසයෙන් යුතුව ජීවත් විය හැකි පරිසරයක්, වටපිටාවක් නිර්මාණය කරනවා. විශේෂයෙන්ම ඒක මේ අණ පනත් ඇතුළේ සිද්ධ වෙන්න පුළුවන්. දරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම අපේ වගකීමක් හැටියට අරගෙන මේ හැම දෙයක් තුළින්ම හෙට දවසේ බලාපොරොත්තුසහගත දරු පරපුරක් නිර්මාණය කරන්නට අවශ්‍ය මැදිහත් වීම අපි කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.17]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! அமலமரி தியாகிகள் சபையைச் சார்ந்த அருட்பணி. லூக்கால் றெஜினி யூட் அவுலின் அமதி அடிகளார் மாந்தை அந்தோனியார்புரம் பங்கின் பங்குத்தந்தையாக அருட்பணி செய்து கொண்டிருந்த வேளையிலே அகால மரணமடைந்து இருக்கிறார். அவருக்கு இந்த உயர் சபையில் எனது அஞ்சலியைச் செலுத்துகின்றேன்.

மன்னாரில் மேற்கொள்ளப்படவுள்ள காற்றாலை மின் உற்பத்தித் திட்டம் தொடர்பாகப் பேசிவிட்டு, சிறுவர் துஷ்பிரயோகம் சம்பந்தமாகப் பேசலாமென நினைக் கின்றேன். மன்னாரில் மேற்கொள்ளப்படவுள்ள காற்றாலை மின் உற்பத்தித் திட்டத்துக்கு எதிர்ப்புத் தெரிவித்து எங்களுடைய மக்கள் 53 நாட்களாக மன்னாரிலும் அதன் பின்னர் கொழும்பிலும் தொடர்ச்சியாகப் போராட்டம் செய்து வருகின்றார்கள். ஆனால், நேற்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்கள், காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை அங்கு நடைமுறைப்படுத்துமாறு கடிதம்மூலம் ஆணை இட்டிருக்கிறார். உண்மையிலேயே எங்களுடைய மன்னார் மக்களின் போராட்டம் பொய்த்திருக்கிறதா? அவர்களுடைய வாழ்வுரிமை மறுக்கப்பட்டு இருக்கிறதா? அவர்களுடைய இறையாண்மை மறுக்கப்பட்டு இருக்கிறதா? என நான் இந்த உயரிய சபையில் கேட்க விரும்புகின்றேன்.

ஒரு போராட்ட இயக்கத்திலிருந்து வந்து இன்றைக்கு அரசாங்கத்தை வழிநடத்துகின்ற, அதன் தலைமைப் பொறுப்பை ஏற்றிருக்கின்ற மாண்புமிகு சனாதிபதி அவர்கள், எங்களுடைய மக்களுக்கு வாழ முடியாத சூழலை உருவாக்கக்கூடிய அந்தக் காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை மன்னாரில் நடைமுறைப்படுத்த வேண்டுமென ஆணையிட்டு இருக்கிறார். பொருளாதாரத்தை மேம்படுத்து வதற்காக எங்களுடைய மக்களின் உயிரைத் துச்சமாக மதிக்கின்ற ஒரு செயலாகவே நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களின் இந்தச் செயற்பாட்டைப் பார்க்கின்றோம். இதை ஒருக்காலும் ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால், நாங்கள் மன்னார் நகரம் தொடர்பான பல விடயங்களை மாண்புமிகு சனாதிபதி அவர்களிடம் எடுத்துச் சொல்லியும்கூட, அவர் அதைக் கருத்திற்கொள்ளாது, காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை அங்கு நடைமுறைப்படுத்த வேண்டுமென இலகுவாகச் சொல்லிவிட்டார்.

எனினும், எமது மக்களின் போராட்டம் தொடர்கின்றது; தொடரும். அது இன்னும் வலுவடையும்; மக்கள் வெள்ளமாக மாறும். உயிரைக் காவுகொள்ளக்கூடிய இந்தக் காற்றாலை மின் உற்பத்தித் திட்டத்துக்கு எதிராக அஹிம்சை வழியில் போராடுகின்ற எங்களுடைய மக்கள், தாங்கள் இறந்தாலும் பரவாயில்லை; அடுத்த சந்ததியினர் நல்ல முறையில் வாழ வேண்டும் என்பதற்காகவும் இந்தப் போராட்டம் பொய்த்து விடக்கூடாது என்பதற்காகவும் தியாகங்களைச் செய்வதற்குத் தயாராக இருக்கிறார்கள் என்பதை நான் இந்த உயரிய

சபையில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். மக்களை அழித்துத்தான் இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்த வேண்டும் என்றால், அதை ஒருக்காலும் எங்களால் ஏற்றுக்கொள்ள முடியாது என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, மாண்புமிகு சனாதிபதி அவர்கள் இது தொடர்பாகச் சிந்திக்க வேண்டும். இனரீதியாக மக்களுடைய விடுதலைக்காகப் போராடிய ஒரு தலைவர் என்ற ரீதியில், அவர் எங்களுடைய மக்களின் உயிரைக் காப்பாற்றுவதற்காக காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை உடனடியாக நிறுத்த வேண்டும் என்பது எமது மக்களின் கோரிக்கையாக இருக்கின்றது. எங்களுடைய மக்கள் இறுதியாக கொழும்பிலே போராட்டம் நடத்தினார்கள். அவர்களுடைய அஹிம்சை ரீதியான போராட்டம் புறக்கணிக்கப்பட்டு, காற்றாலை மின் உற்பத்தித் திட்டம் நடைமுறைப்படுத்தப்படுமாக இருந்தால், எங்களுடைய மக்கள் தியாகம் செய்வதற்குத் தயங்க மாட்டார்கள் என்பதை நான் இங்கு எச்சரிக்கையாகச் சொல்லிவைக்க விரும்புகின்றேன்.

இன்றையதினம் கொண்டுவரப்பட்டு இருக்கின்ற தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலத்தை நான் உண்மையிலேயே வரவேற்கக்கூடிய ஒரு விடயமாகவே பார்க்கின்றேன். சிறுவர் துஷ்பிரயோகத்துக்கு எதிராக அரசாங்கம் நல்லதொரு தீர்மானத்தைக் கொண்டுவந்து இருக்கின்றது. இன்று கிராமப் புறங்கள் உட்பட எல்லா இடங்களிலும் சிறுவர் துஷ்பிரயோகம் மிக மோசமாக இடம்பெறுகின்றது. இன்று போதைவஸ்துப் பாவனை எப்படி பெருகி வருகின்றதோ, அதேபோன்று சிறுவர் துஷ்பிரயோகச் செயற்பாடுகளும் பெருகி வருகின்றன. இன்று சிறுவர்கள் உட்பட எல்லோரும் கையடக்கத் தொலைபேசியைப் பயன்படுத்தி வருகின்றார்கள். இதுவும் அதற்கு ஒரு காரணமாக இருக்கலாம். தங்களுடைய பிள்ளைகள் என்ன செய்கிறார்கள் என்பதைப் பெற்றோர் கவனிப்பதில்லை. இன்று குடும்பங் களில் பெற்றோர், பிள்ளைகளுக்கு இடையிலான பேச்சு குறைவடைந்து இருக்கின்றது. ஒவ்வொருவரும் ஒவ்வொரு மூலையில் இருந்துகொண்டு கையடக்கத் தொலைபேசியைப் பயன்படுத்துவதனால் பிள்ளைகள் குடும்ப உறவிலிருந்து விடுபட்டு, குடும்பத்திலிருந்து அந்நியப்படுத்தப்படு கின்றார்கள். இதனால் அவர்களுடைய வாழ்க்கை கேள்விக்குறியாகின்றது. இதனை ஒருக்காலும் அனுமதிக்க முடியாது. எனவே, சிறுவர் தொடர்பான அடக்குமுறைகளை நிறுத்துவதற்காக இந்த அரசாங்கம் கொண்டுவந்துள்ள சட்டமூலத்தை நான் ஆதரிக்கின்றேன். இறுதியாக, எனக்கு வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.25]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද කරන (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත මඟින්, ලංකාවේ ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව වාගේම, අපේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරපු විධියට සමස්ත සමාජ පරිවර්තනයකට අදාළ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ වන අපේ සංකල්පය තව පියවරක් ඉදිරියට අරගෙන යනවා.

අපි ඉගෙනගෙන තිබෙන ආකාරයට ව්‍යවස්ථාදායකය කියන්නේ, මේ රටේ ප්‍රතිපත්ති සම්පාදනය කරන, නීති සම්පාදනය කරන ආයතනය. මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් වාගේම, මේ රටේ අනාගතයේ බොහෝ දේවල් තීරණය වෙන්නේ ව්‍යවස්ථාදායකය ක්‍රියා කරන ආකාරය සහ විධායකය, අධිකරණය යන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ආයතන ක්‍රියා කරනු ලබන ආකාරයටයි.

දණ්ඩ නීති සංග්‍රහය කියන්නේ, 1883 colonial period එකේදී අපට හඳුන්වා දුන් මූලික නීති පද්ධතියක්. මේ නීති පද්ධතිය වරින් වර සංශෝධනයට ලක් වෙමින් නූතන සමාජ තත්ත්වයට ගැළපෙන විධියට සංශෝධනය වෙන්නට ඕනෑ. මේ තත්ත්වය තුළ තමයි අපි ආණ්ඩුවක් හැටියට, නූතන ප්‍රඥප්ති අනුව ලෝකය පුරා දරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අද තත්ත්වයට ගැළපෙන විධියට නිර්මාණය වෙලා තිබෙන කරුණු පදනම් කරගෙන මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ.

මේ සංශෝධනය ඉදිරිපත් කරන අවස්ථාවේ, මේ විරුද්ධ පක්ෂයේ කථිකයන් මේ සාකච්ඡාවට දක්වපු දායකත්වය සහ එතුමන්ලා ඉදිරිපත් කරපු කරුණු ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට කොතරම් අදාළව කෙරුණාද කියන කාරණාව අපි දැක්කා. එය කනගාටුවට කාරණාවක්. එහිදී විෂය පිළිබඳව යම් අවබෝධයක් සහිතව කථා කරපු යම් නීතිඥ මහත්වරු පවා ඉතා sarcastically සහ ඉතාම කුහක විධියට තමන්ගේ අවස්ථාව පාවිච්චි කරමින් අපේ අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් යම් යම් අවස්ථාවල කරන ලද ප්‍රකාශ උපහාසයට, අපහාසයට ලක් කරන්න උත්සාහ කළා. ඒ හරහා එතුමන්ලා මෙම නීති පැනවීම සමාජය තුළ, නැත්නම් ගුරුවරුන් හෝ වෙනත් කණ්ඩායම් තුළ යම් කුතුහලයක්, නැත්නම් අවිශ්වාසයක් ගොඩනඟන්න උත්සාහ කළා. ඒ හැර, මේ නීති පැනවීම මඟින් මේ සමාජයට අත් පත් කර දිය හැකි වටිනාකම් පිළිබඳව අවධානය යොමු කළාද කියන එක ගැන අපි කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම යම් කිසි නීතියක් පනවනකොට, ඒ නීතිය පනවන අවස්ථාවේදී ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදකයන් විසින් පළ කරනු ලබන අදහස් ඉතාම වැදගත් වෙනවා. ඒ නීතිය අර්ථ නිරූපණය කිරීම, නීතිය බලාත්මක කිරීම පැවරෙන්නේ අධිකරණයට. බොහෝ වෙලාවට අධිකරණය තුළ කරුණු දක්වන පැමිණිල්ලේ සහ විත්තියේ නීතිඥවරු හැම පැත්තෙන්ම ඉදිරිපත් කරන කරුණු අනුව, විශේෂයෙන්ම ඒ ගැන හැන්සාඩ් වාර්තාවල තිබෙන්නේ මොනවාද, ඒ නීතිය පනවනු ලැබූ අදහස මොකක්ද, ඒ නීතිය පැනවීමේදී ව්‍යවස්ථාදායකයේ intention එක කුමක්ද කියන කාරණය අධිකරණයේ විශේෂ අවධානයට ලක් වෙනවා. එම නිසා මේ වාගේ නීතියක් පනවනකොට ව්‍යවස්ථාදායකය ඇතුළේ එම විෂයයට අදාළව ගැඹුරු සාකච්ඡාවක්, කරුණු දැක්වීමක් තමයි විරුද්ධ පක්ෂයෙන් සහ ආණ්ඩු පක්ෂයෙන් සිදු විය යුත්තේ.

නමුත් අපි දැක්කා, සමහර මන්ත්‍රීවරුන් ඉතිහාසය පුරාම මේ පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය - බොහෝ විට පාවිච්චි කළේ එවැනි සංවාදයකට නොව, තමන්ගේ පටු අරමුණු සහ පෞද්ගලික අරමුණු වෙනුවෙන් බව. විශේෂයෙන්ම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගත්තොත්, විසිඑක් වතාවක් **එය** සංශෝධනය කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කළ එම සංශෝධනවලින් දහතුන්වන සහ දහහත්වන සංශෝධන අවස්ථා හැරුණාම වැඩි ප්‍රමාණයක් කර තිබෙන්නේ එවකට බලයේ හිටපු කණ්ඩායම්වල පෞද්ගලික සහ පටු පරමාර්ථ ඉටු කර ගැනීම සඳහායි. අපි ඊට වඩා වෙනස්. විශේෂයෙන්ම අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව, මේ රටේ ජනතාවගේ

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

අවශ්‍යතා ගැන සහ නීතියේ ඇති කළ යුතු ප්‍රතිසංස්කරණ ගැන සලකා බලා තමයි මේ සෑම නීති සංශෝධනයක්ම ඉදිරිපත් කරලා තිබෙන්නේ.

දැන් විපක්ෂය කියනවා, ව්‍යවස්ථාදායක ඒකාධිපතිත්වයක් ගැන. ව්‍යවස්ථාදායක ඒකාධිපතිත්වයක් අපි දැක්කේ ඉතිහාසය පුරාම පැවති ඒගොල්ලන්ගේ පාලන කාලය තුළ. විශේෂයෙන්ම 1978න් පසු මේ රටේ අධිකරණයට කරපු බලපෑම් ගැන අපි දන්නවා. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු විනිශ්චයකාරවරුන්ගේ ගෙවල්වලට ගල් ගහපු ඉතිහාසයක් තමයි තිබෙන්නේ. ඒ වාගේම මොහාන් පීරිස් හිටපු අගවිනිසුරුවරයා පත් කිරීමේදී ක්‍රියා කළ ආකාරයක් අපි දැක්කා. ඒ වාගේම ශිරානි බණ්ඩාරනායක මැතිනිය අගවිනිසුරු තනතුරෙන් ඇද දැමූ හැටිත් අපි දැක්කා.

ඒ වාගේම අපි දැක්කා, සරත් නන්ද සිල්වා හිටපු අගවිනිසුරුතුමා පැහැදිලි කරනවා, එතුමා "Helping Hambantota" නඩුවට දෙන්න තිබුණු තීරණය දුන්නා නම් මේ බොහෝ ප්‍රශ්න විසඳෙනවා කියලා. ඒ වාගේ කාරණා සලකා බැලුවාම ඉතිහාසය පුරාම හිටපු පාලකයෝ අධිකරණය පාවිච්චි කරලා තිබෙන්නේ කොහොමද කියන එක අපට පැහැදිලි වෙනවා. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ අපි කිසිම අවස්ථාවක අධිකරණයට හෝ පොලීසියට හෝ රටේ ස්වාධීන ආයතනවලට, කොමිෂන් සභාවලට කිසිම බලපෑමක් කරලා නැහැ.

අපි දන්නවා, මේ සෑම ආයතනයක්ම හිටපු දේශපාලනඥයන් විසින් දූෂණයට ලක් කරලා, ආන්තිකරණයට ලක් කරලා, තමන්ගේ අතකොළු හැටියට පාවිච්චි කිරීම නිසා ඒ හැම ආයතනයක්ම විනාශ වෙලා තිබුණු බව. පොලිස්පතිවරු, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරු ඇතුළු ඉහළ නිලධාරීන් සිටි ආයතන දේශපාලනඥයන්ගේ බලපෑමෙන් විනාශයට ලක් වෙලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අගවිනිසුරුතුමා ඇතුළු අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අධිකරණ ක්ෂේත්‍රයේ කරනු ලබන මාරු කිරීම්, පත් කිරීම්, උසස් කිරීම් සම්බන්ධයෙන් සැක සංකා මතු කරන්න මේ මන්ත්‍රීවරයෙක් උත්සාහ කරනවා මම දැක්කා. ඒ අය මතක් කරන්නේ ඒගොල්ලන් කටයුතු කරපු ආකාරය. අපේ ආණ්ඩුව එවැනි කටයුතු කිසිසේත්ම අනුමත කරලාත් නැහැ, කරන්නේත් නැහැ. ඒ වාගේම එතුමන්ලා දිගින් දිගටම කථා කරනවා, මේ මොහොතේ පොලීසිය ක්‍රියාත්මක වන ආකාරය ගැන. රට පුරාම මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්නවා, අපරාධකරුවන් අත්අඩංගුවට ගන්නවා, ඒ විමර්ශන ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා. මේ තත්ත්වය තුළ භීතියට පත් වෙච්ච අය දේශපාලන මැදිහත්වීම් ගැන, දේශපාලන අතපෙවීම් ගැන කථා කරනවා.

හිටපු පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහත්තයා කිව්වා, පොලීසිවලට ස්ථානාධිපතිවරුන් 182ක් පත් කළා, ඉන් 180ක්ම පත් කළේ ආසන සංවිධායකවරු කියලා. මෙහෙම ඉතිහාසයක් තිබෙන මහත්වරු තමයි අපේ ආණ්ඩුවේ කටයුතු සම්බන්ධයෙන් විවේචන සහ අදහස් ඉදිරිපත් කරන්නේ.

මේ මොහොතේ අපි ඉදිරිපත් කරන මේ සංශෝධනය මේ සමාජයේ ප්‍රගමනයට, එහෙම නැත්නම් අපි බලාපොරොත්තු වන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කරා යන ගමනේ නීති ප්‍රතිසංස්කරණවල එක් අවස්ථාවක් හැටියට හඳුන්වා දෙන්න මම කැමැතියි. මේ හරහා කිසිම කණ්ඩායමකගේ -ගුරුවරුන් හෝ වැඩිහිටියන්ගේ- අයිතිවාසිකම්වලට අගතියක් කිරීම නොවෙයි අපි බලාපොරොත්තු වෙන්නේ. අපේ එකම බලාපොරොත්තුව, වඩා සුපිළිපන්, වඩා උසස් සමාජයක් අපේ රට තුළ නිර්මාණය කිරීමයි. එය තමයි මේ නීති ප්‍රතිසංස්කරණ හරහා අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා අපේ ආණ්ඩුවේ මේ නව පරිවර්තනීය ක්‍රියාදාම සමඟ විවෘත මනසකින් යුතුව එකතු වෙලා කටයුතු කරන්න කියලා හැම කෙනෙකුටම ආරාධනා කරමින්, මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.35]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමයින්ගේ අයිතිවාසිකම් ගැන, ළමයින්ගේ හැදියාව ගැන, ඒවාට බලපෑම් කිරීම ගැන අද අලුත් නීති රීති මාලාවක් ගෙනැල්ලා තිබෙනවා. මේ රටේ දරුවෝ සමාජයට යද්දි සමාජ සාධාරණත්වය ඇති වෙලා, සමාජයේ තිබෙන අකටයුතුකම් නැති වෙන්න ඕනෑ.

අද වෙනකොට අපේ අධිකරණ පද්ධතිය ගැන යම් කථා බහක් ඇති වෙලා තිබෙනවා. අපි දන්නවා, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය තමයි පාර්ලිමේන්තුවට -අපට- පවරා තිබෙන්නේ කියලා. පාර්ලිමේන්තුව අණ පනත් මඟින් අධිකරණයට ජනතාවගේ ඒ ව්‍යවස්ථාදායක බලය පවරා තිබෙනවා. එතකොට අපට බලන්න වෙනවා, ජනතාවගේ ඒ ව්‍යවස්ථාදායක බලය අනුව ඒ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී සාධාරණත්වය, ඒ වාගේම සමානාත්මතාව තිබෙනවාද කියලා.

මීට ඉස්සර වෙලා කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, පසුගිය කාලයේ මේ රටේ අධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගල් ගැහුවා, අග්‍ර විනිශ්චයකාරවරු එළියට දැම්මා, ජේවීපී-ජාතික ජන බලවේග ආණ්ඩුව ගෙනාවේ ඒවා පිරිසිදු කරන්න, ඒ වැරදි හදන්න කියලා. අපි අහනවා, අද මේ සමාජයේ වෙලා තිබෙන්නේ ඒ වැරදි වැඩි කරන එකද, හදන එකද කියලා. මෑත කාලයේ කළ අත්අඩංගුවට ගැනීම් සම්බන්ධව, අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම් සම්බන්ධව, ඒ තීන්දු සම්බන්ධව අද මහත් සේ කථා බහට ලක් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් ජාත්‍යන්තර නීති සම්මුතිවලට අනුව අධිකරණයට ඉදිරිපත් කරන උදවියට ඇප ලබා දීමේදී අද යම් ප්‍රමුඛත්වයක් ලබා දී තිබෙනවා. එක චෝදනාවක් යටතේ අධිකරණයට ඉදිරිපත් කරන පුද්ගලයෙක් රිමාන්ඩ් බන්ධනාගාරගත කරලා අවුරුදු ගණන්, මාස ගණන් තියාගෙන ඉන්නවා. ඒක එක දඬුවමක්. නඩුවේ තීන්දුවෙන් පස්සේ තවත් දඬුවමක් දෙනවා. එතකොට දඬුවම් දෙකක් දෙනවා. ඒ නිසා තමයි අධිකරණයට ඉදිරිපත් කරන උදවියට ඇප ලබා දීම සඳහා කටයුතු කරන්නේ. අපි දන්නවා, මෑත කාලයේ ලංකාවේ එවැනි කාරණා විනිශ්චයකාරවරුන්ගේත්, නීතිඥයන්ගේත්, සමාජයේත් කථා බහට ලක් වෙලා තිබෙන බව.

රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා අත්අඩංගුවට ගත්තා. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් නැතුව එතුමා අධිකරණයට ඉදිරිපත් කළා. සාමාන්‍යයෙන් සැකකරුවෙකුට අධිකරණය ඇප නොදෙන්නේ ඇයි? අධිකරණය මඟ හරිනවා නම්, කොහේ හරි හැංගිලා ඉන්නවා නම්, සාක්ෂිවලට බලපෑම් කරනවා නම් තමයි එහෙම කරන්නේ. නමුත් රනිල් වික්‍රමසිංහ මහත්මයාට එවැනි කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. එතුමා ප්‍රසිද්ධ පුද්ගලයෙක්. එතුමා අධිකරණය මඟ හැරලාත් නැහැ, එතුමා ආණ්ඩුවේත්

නොවෙයි, සාක්ෂිකාරයන්ට බලපෑම් කරන්නත් බැහැ. නමුත් එතුමා රිමාන්ඩ් බන්ධනාගාරගත කළා. ඒ වාගේම රජයේ ඇමතිවරයෙක් සම්බන්ධ නඩුවකට අදාළව තවත් අධිකරණයකින් පොලිසියට තීන්දුවක් දුන්නා, ඒ පුද්ගලයා අත්අඩංගුවට ගන්න කියලා. නමුත් ඒ පුද්ගලයා අත්අඩංගුවට ගත්තේ නැහැ.

මේ ආණ්ඩුව බලයට එනකල් අධිකරණ ක්ෂේත්‍රයේ උසස්වීම් දුන්නේ, ස්ථාන මාරු කළේ යම් සාධාරණ පිළිවෙළක් අනුව. උසස්වීම් දුන්නේ, ජ්‍යෙෂ්ඨත්වය අනුව. උසස්වීම් දෙන්න සම්මුඛ පරීක්ෂණ තිබ්බේ නැහැ. පසුගිය අවුරුදු 76දීම අධිකරණ ක්ෂේත්‍රයේ උසස්වීම් දුන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුවයි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ, විධායක ශ්‍රේණි සියල්ලේම උසස්වීම් දුන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුවයි. පසුගිය දා වෙනකොට අධිකරණ ක්ෂේත්‍රයේ පුරප්පාඩු 18ක් පමණ තිබුණා. පරණ ක්‍රමයට අනුව නම්, මෙතෙක් පැවති ක්‍රමයට අනුව නම් මොකක්ද කරන්නේ? චෝදනා නැතුව, වැරදි කරලා නැතුව ඉන්න අයගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව මේ උසස්වීම් ලබා දෙනවා. ඉතිහාසයේ ප්‍රථම වරට මේ JVP-NPP ආණ්ඩුව යටතේ මේ පුරප්පාඩු 18න්, 1ක් තිබෙනවා, Attorney-General's Department එකෙන් එන අයට. අනික් 17ම දෙන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුව. මේ සැරේ ඒ වෙනුවට 35දෙනෙක් ගෙනැල්ලා, ඒ 35ට, 34ට, 33ට උසස්වීම් දීලා තිබෙනවා. කාටද දීලා තිබෙන්නේ? රනිල් වික්‍රමසිංහ මහත්මයාව -මම නම් කියන්නේ නැහැ- රිමාන්ඩ් කරන්න තීන්දුව දුන් අයට උසස්වීම් දීලා තිබෙනවා. මේකේ නරකම වැඩේ තමයි, ඒ තීන්දුව දීලා සතියක් ඇතුළත උසස්වීම් දීලා තිබෙන එක. ඒ වාගේම අර ඇමතිවරයා අල්ලන්න කියන නියෝගය දුන් එක්කෙනාවත් මාරු කරලා තිබෙනවා. මේකද සාධාරණත්වය? මෙහි ඉන්න ජ්‍යෙෂ්ඨයන් විශාල ප්‍රමාණයක් අධිකරණ ක්ෂේත්‍රයේ අර 17දෙනාගේ ලැයිස්තුවට ඇතුළත් වෙලා නැහැ. අපි අහනවා, මේකද මේ ආණ්ඩුවේ සාධාරණත්වය කියලා. මේකද සමාජය හදන්න ගෙනාපු නීතිය? අපි දන්නවා, මේ රටේ විධායකයත්, ව්‍යවස්ථාදායකයත්, අධිකරණයත් වෙන වෙනම ස්වාධීන විය යුතුයි කියලා. නමුත් මේක තමයි අධිකරණයට ඇඟිලි ගැසීම.

ඒ වාගේම මාරුවීම් දීමේදී අපි දැක්කා, සාමාන්‍යයෙන් කොළඹ අවට තිබෙන කොළඹ අධිකරණය, ගල්කිස්ස වාගේ අධිකරණවලට තමයි අධිකරණ ක්ෂේත්‍රයේ ඒ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉන්න නිලධාරින් පත් කරන්නේ කියන එක. නමුත්, අද මොකක්ද කරලා තිබෙන්නේ? ඒ අය දාලා තිබෙනවා, පිට පළාත්වලට. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව, පාර්ලිමේන්තුවේ කටයුතු සම්බන්ධව වාගේම රජයේ කටයුතු සම්බන්ධව තීන්දු ගන්න ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ අය දාලා තිබෙනවා. මේක තමයි දේශපාලන ඇඟිලි ගැසීම. මේකද ජනතා විමුක්ති පෙරමුණෙන්, NPP එකෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ? අපි දන්නවා, මේගොල්ලන්ගේ කැලෑ අධිකරණත් 1988-89 කාලයේ තිබුණු බව. නියෝග දුන්නා, අහවලා මරන්න කියලා. නියෝගයක් දුන්නා, අහවල් ට්‍රාන්ස්ෆෝමරය ගිනි තියන්න කියලා; බස් ගිනි තියන්න කියලා. අපි අහනවා, මේ ක්‍රමයද මේ රටට නැවත ගේන්න හදන්නේ කියලා. පිරිසිදු පාලනයක් වෙනුවෙන්, තරුණයන් වෙනුවෙන්, රට වෙනුවෙන් කටයුතු කරනවා කියලා මේ රටට හඳුන්වා දෙන්නේ ඒකද කියලා අපි අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ආරංචියි, නමුත් අපි නම කියන්නේ නැහැ. රටේම ජනතාව දන්නවා, පසුගිය කාලයේ අර ගෙවල් ගිනි තිබ්බේ කවුද කියලා. ඒ ගෙවල් ගිනි තබපු අය අධිකරණයට ඉදිරිපත් කළාට පසුව ඇප දුන් අයට තමයි අද මම හිතන විධියට අධිකරණ සේවා කොමිසම භාර දීලා තිබෙන්නේ. අපි ඉල්ලා සිටිනවා, කරුණාකරලා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න කියා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රකින්න නම්, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන දේ ඉෂ්ට කරන්න නම්, අධිකරණයට ඇඟිලි ගහන්න එපා. මේ රටේ මනුෂ්‍යයෙකුට අසාධාරණයක් වුණොත් යන්න තිබෙන එකම තැන තමයි අධිකරණය. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එය හඳුන්වා දීලා තිබෙනවා, මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කරන්න. එම නිසා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න කියා අපි කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අධිකරණයේ නිලධාරින්ට, විනිශ්චයකාරවරුන්ට තමන්ගේ සමාජ තත්ත්වය ආරක්ෂා කර ගැනීමට හොඳ වැටුපක් ලබා දෙන්න. මේ වාගේ දේශපාලන පත්වීම් කරන්න, ආණ්ඩුවට ඕනෑ විධියට තීන්දු දෙන අයට උසස්වීම් දෙන්න, ආණ්ඩුවට ඕනෑ ඕනෑ විධියට තීන්දු දෙන්නේ නැති අය මාරු කරන්න කටයුතු කිරීම නොවෙයි කළ යුත්තේ. දැනට රුපියල් ලක්ෂ හතරහමාරක් විතර තමයි අධිකරණ ක්ෂේත්‍රයේ දිස්ත්‍රික් අධිකරණ මට්ටමේ විනිශ්චයකාරවරුන්ට වැටුප විධියට ලැබෙන්නේ. ඒවා වැඩි කරන්න. ඒ විතරක් නොවෙයි. ඒගොල්ලන්ගේ පහසුකම් ගත්තාම, සමහර අයට නිල නිවාස නැහැ. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. හැබැයි, මේ රටේ කවුරුවත් කළේ නැති විධියට අධිකරණයට ඇඟිලි ගහන්න මේ රජය කටයුතු කරනවා. එයට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.45]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන මේ වෙලාවේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයටත් මේ කාරණා අදාළ නිසා මට ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ලෙස දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය, සංවර්ධනය හා පෝෂණය වෙනුවෙන් විශේෂ මැදිහත්වීමක් කරමින් සිටින මොහොතක තමයි මේ පනත සංශෝධනය කරමින් ඒ දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය වාගේම ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්

[ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා]

විශේෂ මැදිහත් වීමක් කරන්නට මේ සුවිශේෂී අවස්ථාව උදා කරගන්නේ. පූර්ව ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට විශේෂ ප්‍රතිපත්තිමය, නීතිමය සහ ආයතනික ක්‍රියාමාර්ග ප්‍රමාණයක් ගනිමින් සිටිනවා. ළමා අපචාර වැළැක්වීම සඳහා බහුආංශික යන්ත්‍රණයක් කැබිනට් අනුමැතිය සහිතව ස්ථාපිත කරමින්, අණපනත් කිහිපයක් යාවත්කාලීන කිරීමට සහ ඒවා සංශෝධනය කිරීමට අදාළව ක්‍රියාමාර්ග ගනිමින් ආයතනගත දරුවන් වෙනුවෙන්, විශේෂයෙන්ම විකල්ප භාරකාරත්වයක් දරන දරුවන් වෙනුවෙන්, ඒත් එක්කම වීදි දරුවන් වෙනුවෙන් ජීවනාධාරයක් දෙන්න වැඩ පිළිවෙළක් "අර්ථ" නමින් ක්‍රියාත්මක කරමින් ඉදිරියට යනවා. ඒත් එක්කම වින්දිත දරුවන් අධිකරණ වෙත ප්‍රවාහනය කිරීම සඳහා අදාළ ප්‍රවාහන පහසුකම් සපයන්න වාහන ලබා ගැනීමට සියලුම පළාත්වලට ප්‍රතිපාදන වෙන් කරමින් ඒ ක්‍රියාවලිය සිදු කරමින් යනවා. ඒ වාගේම, පෙර පාසල් දරුවන්ගේ පෝෂණ ඌනතා මඟහරවා ගැනීම සඳහා ඔවුන් වෙනුවෙන් වෙන් කර තිබුණු මුදල් ප්‍රමාණය වැඩි කරමින්, කෑම වේලක් සඳහා වෙන් කර තිබූ රුපියල් 60ක මුදල රුපියල් 100ක් දක්වා වැඩි කළා. මෙවැනි ප්‍රතිපත්ති, තීන්දු තීරණ ගනිමින් ඉන්න මොහොතක තමයි අද දින මේ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පවත්වන්නේ.

මම මේ කාරණාව සම්බන්ධයෙන් තව ටිකක් කථා කරන්න කැමැතියි. මෙහි නෛතික රාමුව සම්බන්ධයෙන් පොඩි අවබෝධයක් ලබා දුන්නොත් හොඳයි කියලා මම හිතනවා. මේ සංශෝධන සඳහා එක් පැත්තකින් නෛතික රාමුවක් තිබෙන අතර, අනෙක් පැත්තෙන් මනෝ විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා සදාචාරාත්මක පැතිකඩක් තිබෙනවා. නෛතික රාමුව ගැන කථා කළොත්, අපි කවුරුත් දන්නවා 1989 නොවැම්බර් 20වන දා අනුමත කෙරුණු ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ගැන. අපි රටක් විධියට 1990 ජනවාරි 26වැනි දා මේ ප්‍රඥප්තියට අත්සන් තබනවා. ඊට පසු එය 1991 ජූලි 12වැනි දා අපරානුමත කරනවා. මේ ප්‍රඥප්තිය ව්‍යවස්ථා 54කින් සමන්විතයි. මේ ප්‍රඥප්තිය මූලධර්ම 4ක් පදනම්ව සකස් කර තිබෙනවා. ඒ මූලධර්ම 4 තමයි, දරුවන් සම්බන්ධයෙන් වෙනස්කොට නොසැලකීම, දරුවාගේ උපරිම යහපත, පැවැත්ම සහ සංවර්ධනය තහවුරු කිරීම, ළමයාගේ අදහස්වලට ගරු කිරීම. මේ කියන මූලධර්ම 4 තුළ තමයි මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වෙන්නේ. මේ ප්‍රඥප්තිය තුළ තිබෙන ව්‍යවස්ථා අතර 19වන ව්‍යවස්ථාවේ 1. අනුව්‍යවස්ථාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නට මම කැමැතියි. මම හිතන විධියට, මේ පනත සංශෝධනය කිරීම ගැන කථා කරනකොට ඒක අතිශයින්ම වැදගත්. එහි සඳහන් වෙනවා, "කිසියම් ළමයෙකු, දෙමව්පියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුගේ නැතහොත් භාරකරුවන්ගේ හෝ ළමයාගේ ආරක්ෂක රැකවරණය භාරව සිටින වෙනත් යම් තැනැත්තෙකුගේ ආරක්ෂක රැකවරණයෙහි සිටින අතරතුර, සියලු ආකාරයේ ශාරීරික හෝ මානසික හිංසා පීඩාවලින්, අනතුරුවලින්, පරිභවයට පාත්‍ර වීමෙන්, නොසලකා හැරීමෙන් හෝ නොසැලකිලිමත් ලෙස සලකනු ලැබීමෙන්, වෙනස්කම් කිරීමෙන් හෝ ලිංගික අපයෝජනය ඇතුළු අයථා ක්‍රියාවන්ට භාජන කිරීමෙන් හෝ අයුතු ප්‍රයෝජනයට යොදවා ගැනීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් සියලුම යෝග්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සමාජයීය හා අධ්‍යාපනික ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතුයි" කියලා. මේ වාක්‍ය අතිශයින්ම වැදගත්. "රාජ්‍යයන් විසින් සියලුම යෝග්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සමාජයීය සහ අධ්‍යාපනික ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතුයි" කියලා මේ 19 (1) අනුව්‍යවස්ථාව තුළ අන්තර්ගත වෙලා තිබෙනවා.

ඉතිහාසය ඇතුළේ මේකට විවිධ අවස්ථාවල රජයන් විධියට ගත් ක්‍රියාමාර්ග තිබෙනවා. ඒත් එක්කම අපි 2024 නොවැම්බර් මස බොගෝටාහි පැවැති දරුවන්ට එරෙහි ශාරීරික දඬුවම් අවසන් කිරීමේ ගෝලීය අමාත්‍ය මණ්ඩල සමුළුවට සම්බන්ධ වෙලා ලංකාව විධියට ඒ ගිවිසුමට අත්සන් කරලා තිබෙනවා. එතකොට අපට රටක් විධියට බැඳීමක් තිබෙනවා, දරුවන්ට සිදු වන සියලු ශාරීරික දඬුවම් අවසන් කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට. ඒත් එක්කම අපේ අමාත්‍යාංශයට සම්බන්ධ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පසුගිය කාලය තුළ කරපු අධ්‍යයන තුළ, විවිධ ක්ෂේත්‍ර ඇතුළේ දරුවන් අපයෝජනයට පත් වීම, අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධයෙන් කරපු විමර්ශන තුළින් හඳුනා ගෙන තිබෙනවා, අපේ රටේ බොහෝ ස්ථානවල දරුවන් විශාල ප්‍රමාණයක් මෙවැනි අපයෝජනවලට ලක් වන බව. ඒ අනුව ශාරීරික දඬුවම් අහෝසි කිරීම පිළිබඳව කමිටුවක් පත් කරලා තිබුණා. ඊටපසු ඔවුන් විසින් නිර්දේශ 18ක් සහිතව වාර්තාවක් ඉදිරිපත් කරලා තිබුණා, ක්‍රියාත්මක කරන්න කියලා විශේෂයෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විධියට. ඒත් එක්කම මීට අදාළව තිරසර සංවර්ධන ඉලක්ක -SDGs- යටතේ 16.2 කොටස ඇතුළේ අන්තර්ගත වෙනවා, "2030 වන විට ළමයින්ට එරෙහි හිංසා අවසන් කිරීම" කියලා. අපත් රටක් විධියට 2015දී ඉදිරිපත් කරපු මේ තිරසර සංවර්ධන ඉලක්කවලට එකඟ වෙලා තිබෙනවා. ඒ නිසා රටක් විධියට අපට විශේෂ වගකීමක් තිබෙනවා, 2030 වන විට ළමයින්ට එරෙහි හිංසන අවසන් කිරීමට. මෙවැනි නෛතික රාමුවක් තුළ තමයි මේ අදාළ පනත මේ මොහොතේ සංශෝධනයට ලක් වෙන්නේ.

ඊට අමතරව ගෙන ඇති තවත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කථා කළොත්, 1939 ළමා හා තරුණ පුද්ගලයන් සම්බන්ධයෙන් වන ආඥාපනතේ 71(6) වැනි වගන්තිය අවලංගු කිරීම, ඊට පස්සේ 2005 අංක 23 දරන ශාරීරික දණ්ඩන අහෝසි කිරීමේ පනත ඉදිරිපත් කිරීම ගන්න පුළුවන්. අපට මේ සියල්ල ගැන කථා කරන්න පුළුවන්, දරුවන්ට සිදු වන ශාරීරික දණ්ඩන අවසන් කිරීම වෙනුවෙන් ඉතිහාසය ඇතුළේ අප ගත් ක්‍රියාමාර්ග විධියට.

මෙතැනදී අපි කථා කරන්නේ පාසල් තුළ සිදුවන හිංසන, අපචාර ගැන විතරක් නොවෙයි. මේ සභාව තුළ වැඩිපුර කථාබහට ලක් වුණේ ඒ ක්ෂේත්‍රය පිළිබඳවයි. නමුත් අපි දන්නවා, ඊට වඩා නිවෙස් තුළදී දරුවන් දෙමව්පියන් අතින් හිංසනයට පත් වෙන අවස්ථා ඕනෑ තරම් තිබෙන බව.

විශේෂයෙන්ම ආයතනගත දරුවන්ට සිදු වන අපහසුතා ගත්තොත්, විවිධ ආයතන තුළ දරුවන්ට සිදුවන අපහසුතා ජන මාධ්‍ය හරහා අපට දකින්න ලැබෙනවා; අපේ අමාත්‍යාංශයට නිතරම පැමිණිලි ලැබෙනවා. මේ ආයතන; ළමා නිවාස, ඒත් එක්කම සමහර වෙලාවට ආගමික සංස්ථා කියන මේ සියලු ස්ථානවල මෙවැනි අකටයුතුකම් සිදු වෙනවා. මේ පනත ගෙනෙන්නට පෙර පවා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් චක්‍රලේඛ නිකුත් කර තිබුණා. පාසල් තුළ දරුවන්ට සිදු වන අපහසුතා ඉවත් කරන්නට, බලපෑම් ඉවත් කරන්නට 2005 මැයි 11වැනි දා ගෙනාපු චක්‍රලේඛය නැවතත් සංශෝධනය කරමින් 2016 අප්‍රේල් 29වැනි දින 12/2016 චක්‍රලේඛය ඉදිරිපත් කරලා තිබුණා. එම චක්‍රලේඛය තුළ ඇත්තටම සාකච්ඡා කරලා තිබෙනවා, ශාරීරික දණ්ඩන තුළින් දරුවන්ට සිදු විය හැකි, අනාගතයේදී ඇති විය හැකි අයහපත් තත්ත්වයන් පිළිබඳව. තත්ත්වයන් නවයක් පිළිබඳව විශේෂයෙන්ම එහි සාකච්ඡා කරලා තිබෙනවා. කාල වේලාව සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙන නිසා මම ඒ ගැන දීර්ඝව විස්තර කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එම චක්‍රලේඛය කියෙව්වොත්, ඒ ගැන හොඳින් පැහැදිලි වනවා. එහි තිබෙනවා, දරුවන්ට ශාරීරික දණ්ඩන ඇති කිරීම තුළින් අනාගතයේදී දරුවන් පත් විය හැකි තත්ත්ව පිළිබඳව.

මේ චක්‍රලේඛනයේ විශේෂයෙන්ම සඳහන් කරලා තිබෙනවා, පාසල් විනය මණ්ඩලයක් පිහිටුවිය යුතු බව. විනය මණ්ඩලයේ

සංයුතියත් එහි දක්වලා තිබෙනවා. එහි ඒත් එක්කම යෝජනා කරලා තිබෙනවා, "ශාරීරික දඬුවම් වෙනුවට පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ" කියලා. ඒ යටතේ අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ගත් සඳහන් කරලා තිබෙනවා. අපි හිතනවා, පාසල තුළ කිසිසේත්ම දරුවන් හිංසනයට ලක්විය යුතු නැහැ කියලා. දඬුවම් කිරීමට අවශ්‍ය නම් ඒ වෙනුවට විකල්ප ක්‍රියාමාර්ගත් මේ වක්‍රලේඛය තුළ සඳහන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ තව කාරණයක් සඳහන් කරන්න මම පොඩි වෙලාවක් ගන්නවා. එළඹෙන ඔක්තෝබර් 01වැනි දා ලෝක ළමා දිනය සැමරීමට නියමිතයි. එයට සමගාමීව අපි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට ඒ වෙනුවෙන් සතියක වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා. ළමා දින ජාතික සතිය අපි ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒකට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබිලා තිබෙනවා. හෙට -ඒ කියන්නේ, සැප්තැම්බර් 25වන දා- සිට ඔක්තෝබර් 01වැනි දා දක්වා, සතියක කාලයක් අපි ළමා දිනයට සමගාමීව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, සැප්තැම්බර් 25වැනි දාට අපි ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පිළිබඳව විදුහල්පතිවරුන්ගේ භූමිකාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා සංවිධානය කර තිබෙන බව. අද කථා කරන කාරණයටත් සම්බන්ධ නිසායි මම ඒ ගැනත් මතක් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම පාසල් දරුවන් ප්‍රවාහනය කරන වාහන සම්බන්ධව පරීක්ෂා කිරීමට අපි ශ්‍රී ලංකා පොලීසිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාවත් එක්ක එකතු වෙලා සැප්තැම්බර් 26වැනි දාට වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට, දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට, දරුවන්ගේ පෝෂණය වෙනුවෙන්, දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගොඩනැංවීම වෙනුවෙන් විශේෂ වැඩසටහන් අපි එම සතිය පුරාම ක්‍රියාත්මක කරමින්, ඔක්තෝබර් 01වැනි දා ලෝක ළමා දින ජාතික උත්සවය ගරු අග්‍රාමාත්‍යතුමියත් සම්බන්ධ කරගෙන, අරලියගහ මන්දිරයේදී පවත්වන්න බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධවත් දැනුවත් කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමයින්ට සිදු කරන ශාරීරික දඬුවම් වැළැක්වීමට දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන ගෙනෙමින් අද දින ඉදිරිපත් කළ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මුලින්ම අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වන්නට අවශ්‍යයි. මොකද, අපේ අරමුණත්, අපේ මතවාදයත් ඒ සමඟයි තිබෙන්නේ. දරුවන්ට ශාරීරික හිංසා අවශ්‍ය නැහැ. ඇත්තෙන්ම කියනවා නම්, දරුවන්ට පමණක් නොවෙයි, කාටත් එය අවශ්‍ය නැහැ කියන මතයේ තමයි අපි ඉන්නේ. මෙය අපි ශත වර්ෂ ගණනාවක් පරක්කු වුණු වැඩක්. ශත වර්ෂ ගණනාවකට කලින් ලෝකයේ වෙනත් රටවල් මේ පියවර අරගෙන තිබෙනවා. අපි ටිකක් පරක්කු වැඩියි, හැම කාරණයේදීම වාගේ. හැබැයි පරක්කු වෙලා හෝ මෙය ගෙන ඒම ගැන මම සන්තෝෂ වනවා.

ගරු සභානායකතුමා උදේ මතක් කළා, පෝලන්තය 1773දී මේක නතර කළා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්සම්බර්ග්වල 1845දීත්, රුසියාවේ 1917දීත්, නෙදර්ලන්තයේ 1920දීත්, ඉතාලියේ 1928දීත් නතර කළා. මෙහෙම ගිහින් ස්පාඤ්ඤය තමයි අන්තිමට අපි දන්න ටිකක් ලොකු රටක් හැටියට මේක නතර කළේ, 1985 වනතුරු ගත්තොත්. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හරියට ඉතිහාසය හොයා බැලුවොත්, අපේ චූලවංශයේ ඉතා පැහැදිලිව ලියා තිබෙනවා, දහතුන්වන ශත වර්ෂයේදී 3වන විජයබාහු රජතුමා ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් එතුමාගේ මතය ඉදිරිපත් කරලා තිබෙනවා සහ එය තහනම් කිරීමට ලක් කර තිබෙන බව. එහෙම බලපුවාම අපි පෝලන්තයටත් කලින් ඉතා ඈත ඉතිහාසයේ මේ සම්බන්ධව අදහසක් පළ කළ ජාතියක්. හැබැයි යටත් විජිතකරණයත් සමඟ, ඒ වාගේම බ්‍රිතාන්‍යයේ සහ අනෙකුත් රටවල බලපෑමත් සමඟ සහ ඊළඟට රජකමට පත් වුණු රජවරුන්ගේ බලපෑමත් සමඟ සමහර විට ඒ අදහස් වෙනස් වෙලා මේ තත්ත්වය ඉදිරියට ඇවිල්ලා තිබෙනවා.

එම නිසා අද මේ ගෙන තිබෙන පියවර බෙහෙවින් සන්තෝෂ වෙන්න පුළුවන් කාරණයක්.

ඊළඟට තවත් කාරණයක් සඳහන් කරන්න මම කැමැතියි. දුගීභාවය කියන එක දරුවන්ට දඬුවම් කිරීම සහ ශාරීරික දඬුවම් කිරීම කෙරෙහිද බලපාන ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. සමහර අයට තේරෙන්නේ නැතිව ඇති ඒක වෙන්නේ කොහොමද කියලා. ඇත්තටම මගේ ඇස් දෙකෙන් එවැනි සිද්ධි දැකලා තිබෙනවා. ඉතාම දුප්පත් දරුවන් ඉන්න පාසල්වල, දරුවන් 40ක්, 50ක් පමණ ඉන්න පාසල්වල දරුවන් මත් ද්‍රව්‍ය පාවිච්චියට යොමු වුණාම, අනෙක් සියලු අනවශ්‍ය වැඩවල යෙදුණාම පහර දීමෙන්ම තමයි ඔවුන් මට්ටු කරන්න ගුරුවරුන් පෙලඹිලා ඉන්නේ. ඒ වාගේ විදුහල් මම දැකලා තිබෙනවා. මා නියෝජනය කරන ආසනයේ දකුණු ආසියාවේ තිබෙන විශාලම ජනපදයක් වන "සිරිගම්පොළ ජනපදය" තිබෙනවා. පසුගිය සතියේත් මම ඒ ප්‍රදේශයේ එවැනි විදුහලකට ගිහින් බැලුවා. බලන්න දුක්බිතයි, දුගීභාවය නිසා ඒ දරුවන් විඳින දුක! ඒ දරුවන් පාසල් යන්නේත් නැහැ. පාසල් ගිය දරුවන් හැදෙන්නේත් නැහැ. ඒ දරුවන් දවල් වෙද්දී මත් වෙලා ඉන්නේ. දෙමවුපියන් මට ඒ කාරණය කෙළින්ම ප්‍රකාශ කළා. ඒවා නවත්වන්න ගුරුවරු දඬුවම් කරනවා. දඬුවම් කළාම ඒ දරුවන් ආයේ පාසල් යන්නේ නැහැ. මේක විෂම චක්‍රයක් වාගේ ඉවර වෙන්නේ නැති ප්‍රශ්නයක්. ඒ නිසා දුගීභාවය මේ තත්ත්වයට විශාල වශයෙන් වගකියන්න ඕනෑ කියන එකයි මගේ මතය.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ ශාරීරික දඬුවම් කෙසේ වෙතත්, ගුරුවරුන් ගැනත් මෙහිදී සිතන්නට අවශ්‍යයි. දරුවන්ට ශාරීරික දඬුවම් නොදිය යුතුයි කියන කාරණය ගැන සිතනවා වාගේම, ගුරුවරුන් ගැනත් සිතන්න අවශ්‍යයි. ශාරීරික දඬුවම් ගැන කථා කරද්දී වෙන්නප්පුව ආසනයේ -මගේ කොට්ඨාසයේ- මගේ නිවස පිටුපස තිබෙන එක්තරා පාසලක වූ සිදුවීමක් මට මතක් වෙනවා. ඒ සිද්ධියට අදාළ දැරියගේ පියා මගේ පාසලේ මගේම පන්තියේ ඉගෙන ගත්තේ. අච්චේ දණගස්සලා කළ පහර දීමකින් ඒ දැරිය මිය ගියා. මම ඒ දැරියගේ නම සඳහන් කරන්න කැමැතියි, ඇයට ගෞරවය පිණිස. ඇය, 10 ශ්‍රේණියේ ඉගෙන ගත්තු රමේෂා දිනිති දියණිය. එහෙම ප්‍රශ්නත් තිබෙනවා. ඒක නිසා තමයි අපි ප්‍රශංසාත්මකව කියන්නේ අද

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

කරන මේ වැඩේ කරන්න අවශ්‍යයි කියලා. ඒ එක්කම අනෙක් පැත්තෙන්, ගුරුවරුන් ගැනත් බලන්න අවශ්‍යයි කියන එක මම සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා අපි සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා, ගරු නීතිඥ සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමනි. අපි එය සද්භාවයෙන් ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගන්න.

ඊළඟට මම තවත් කාරණයක් කියන්න කැමැතියි. අපේ කාන්තා සහ ළමා කටයුතු ගරු අමාත්‍යතුමිය මේ පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුයි යෝජනා කරමින් ඉතාම දීර්ඝ කථාවක් කළා. මම ඒ වෙලාවේ මෙහි සිටියේ නැතත් ඒ කථාව අහගෙන සිටියා. එතුමිය විශේෂයෙන් කියන්නට යෙදුණා, විවිධ රටවල මේ සම්බන්ධයෙන් ගෙනැවිත් තිබෙන නීති සහ ඒ නිසා ඇති වෙලා තිබෙන ප්‍රවණතා මොනවාද කියලා. ගරු ඇමතිතුමියනි, ඔබතුමිය කිව්වා වාගේම රටවල් බොහෝ ගණනක් සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණයකට අදාළ පර්යේෂණ පත්‍රිකාවක් මා අතේ තිබෙනවා. මේ පර්යේෂණ පත්‍රිකාව තමයි, "School Corporal Punishment in Global Perspective: Prevalence, Outcomes, and Efforts at Intervention." මේක Elizabeth T. Gershoff කියන මැතිනියයි ලියා තිබෙන්නේ. මේක බොහොම ලස්සන පර්යේෂණ පත්‍රිකාවක්. මෙහි සඳහන්ව තිබෙනවා, ඒ රටවල කොයි කාලයේද corporal punishment එක ban කරලා තිබෙන්නේ සහ ඊට පස්සේ මොකද වුණේ කියන එක. ගරු ඇමතිතුමිය, මම ඔබතුමියට මෙහි සඳහන් රටවල් කීපයක් සඳහන් කරන්නම්. අප්‍රිකානු මහාද්වීපයේ බෙනින් කියන රටේ 2009දී පාසල්වල ශාරීරික දඬුවම් ban කරලා තිබෙනවා. හැබැයි, 2017 වනකොටත් සියයට 88කට ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. කැමරූන් රාජ්‍යයේ 2000 වනකොට මේ දඬුවම් ban කරලා තිබෙනවා. හැබැයි, 2017 වෙනකොට studentsලා සියයට 97ක් චෝදනා කර තිබෙනවා, තවමත් එවා සිද්ධ වෙනවා කියලා. ඒක තමයි ඇත්ත කථාව. ඉතියෝපියාවේත් එහෙමයි. ඒ රටේ 2009දී ඒ දඬුවම් ban කරලා තිබෙනවා. 2017 වනකොට සියයට 38ක් ඒ සම්බන්ධයෙන් චෝදනා කරනවා. මා සතුව ඒ රටවල list එකක් තිබෙනවා. මම ඒකත් මේ පර්යේෂණ පත්‍රිකාව සමඟ **සභාගත*** කරනවා.

මම මේ ලේඛනය සභාගත කළ නිසා මේ ගැන නැවත කියන්නේ නැහැ. හැබැයි, මම දකුණු අප්‍රිකාව ගැන කියන්න කැමැතියි, ගරු ඇමතුමිය. ඔබතුමිය විශේෂයෙන් මතක් කළා, දකුණු අප්‍රිකාව ගැන. දකුණු අප්‍රිකාව ගැන මතක් කරන ගමන් ඔබතුමිය කිව්වා, ඒ රට මේ අතින් සාධනීය ලක්ෂණ අත්පත් කරගෙන තිබෙනවා කියලාත්. හැබැයි, මා ළඟ තිබෙනවා පර්යේෂණ පත්‍රිකා. මේවා test කරලා බලපු ඒවා; සාම්පල් අරගෙන සමීක්ෂණ කරපු ඒවා. ශාරීරික දඬුවම දකුණු අප්‍රිකාවේ 2013දී තහනම් කළත්, 2017 වන කොටත් දරුවන්ගෙන් සියයට 50ක් ශාරීරික දඬුවම්වලට ලක් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා ඔප්පු කරපු දේවල්. ගරු ඇමතිතුමිය ඉදිරිපත් කරපු ඒ තොරතුරු කොහෙන් හොයාගත්තාද දන්නේ නැහැ. දකුණු අප්‍රිකාවේ එහෙම සාධනීය ලක්ෂණ පෙන්නුම් කිරීමක් නැහැ. මම මෙය අරගෙන ඇවිත් පෙන්නුවේ මේ නීතිය ගෙනාපු පළියට එහෙම සිද්ධ වෙන්නේ නැති බව කියන්නයි. ඒ නිසායි මම මේ ලේඛනය ඔබතුමන්ලාට විශේෂයෙන් ඉදිරිපත් කරන්නට යෙදුණේ. මේකේ ඉතා පැහැදිලිව මෙසේ සඳහන් වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි:

> "Corporal punishment continues to occur in schools throughout the world, both in countries where it is legal and countries where it is banned, leading to estimates that millions of children are subject to legalized assault at their schools…"

It further states, I quote:

> "South Africa banned school corporal punishment when it transitioned to a new government and a new Constitution that valued the rights of children in 1996. However, students have reported that corporal punishment continues to be a regular part of education in South Africa...."

ගරු ඇමතිතුමියනි, නිවැරදි කිරීමක් කරන්නටයි මා මෙය යොදා ගත්තේ. මම මේ ලේඛනය සභාගත කරන්නත් කටයුතු කළා.

මේ කාරණය සම්බන්ධයෙන් අපේ තවත් යෝජනාවක් තිබෙනවා. ගුරුවරුන්ට යම් ප්‍රශ්නයක් වෙයි කියලා හිතනවා නම් අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ කෙසේද? ඒ පිළිබඳව ගුරුවරුන්ට යම් අධ්‍යාපනයක්, යම් පුහුණුවක්, යම් දැනුමක් ලබා දීලා නොවෙයිද මේ පියවරට යන්න තිබුණේ කියන ප්‍රශ්නය මම ඉතාම ආදරයෙන් අහන්න කැමැතියි. එහෙම කරපු රටවල් තිබෙනවා. ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් සොයා බැලුවා නම්, කඩිමුඩියේ මේ පනත් කෙටුම්පත ගෙනෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියලායි මා හිතන්නේ. මොකද, ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් වන නීතිය මේ වන කොටත් ලංකාවේ ස්ථාපිතව, ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මා ඉහත කී සිද්ධියට අදාළ ගුරුවරියන් දෙදෙනාට අවශ්‍ය ක්‍රියාමාර්ග පවා ගත්තා. අධිකරණයෙන් ඒ අවශ්‍ය කටයුතු සිද්ධ වුණා. එසේ කටයුතු සිද්ධ වෙච්ච අවස්ථා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගුරුවරුන් සම්බන්ධයෙන් ද training programmes හදන්න ඕනෑ. ඒ කාරණය සම්බන්ධයෙනුත් නිදසුන් සපයන පර්යේෂණ පත්‍රිකාවක් මම ඉදිරිපත් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය, ඉතාලියේ මිලානෝ විශ්වවිද්‍යාලය විසින් කරන ලද පර්යේෂණයක පත්‍රිකාවක්. ඉතාලියේ ඉතාම ලස්සනට මේ කටයුත්ත කරනවා. ඉතාලියේ teacher training කරන්නේම දරුවන් ආරක්ෂා කරගන්න මිසක්, දරුවන් වෙනස් හැසිරීමක් පෙන්වපු ගමන් තරහ අරන් ගහන්න නොවෙයි. ඒ ගුරුවරුන්ට ලබා දී තිබෙන පුහුණුව මත දරුවන් දමනය කර ගන්න පුළුවන්. ඒ විධියේ training එකක් ඒ දෙන්නේ. එම පර්යේෂණ පත්‍රිකාවත් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා, අවශ්‍ය කවුරුන් හෝ කෙනෙකුට කියවා බලන්න.

ඒකේ විශේෂයෙන්ම කියනවා, I quote:

> "To be able to really recognize the child,…"

අපි දරුවා - child - recognize කරනවාද? අප කරන්නේ, දරුවා මොකක් හරි කරපු ගමන් ගහන්න පනින එක නේ. හැබැයි, අපි දරුවා recognize කරනවාද? ඒක තමයි ප්‍රශ්නය. It further states, I quote:

> "...a training course with teachers is necessary, to raise awareness and help them see the signals that children send."

දරුවන් signal එකක් දෙනවා කියන එක තමයි මේ කියන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලා සිටින්න කැමැතියි, මේ ලේඛනයත් කියවා බලන්න කියලා. මොකද, මෙයත් කියවා බලන්න තරම් වටිනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මෙහිදී අපි දඬුවමම පාදක කර ගත යුතු නැහැ. ගරු ඇමතිතුමියත් ඒක කිව්වා. මේ වෙනස දඬුවමෙන්ම කරන්න බැරි බව අපට තේරෙනවා. ඒ නිසා දඬුවම් පාදක කර ගන්නේ නැතුව මේ කටයුත්ත කරන්න අවශ්‍යයි කියන කාරණයත් මා මතක් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට හිමි කාලය අවසන්.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තවත් විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ පනත් කෙටුම්පතේ සඳහන් තවත් දෙයක් මම දැක්කා. එම නිසා එය නොකියා ඉන්නට බැහැ. ඒ, මෙම පනත් කෙටුම්පතෙහි 4වන වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන 308ආ අලුත් වගන්තියෙහි 4 (ඇ) යටතේ සඳහන් නිදර්ශනයයි. එහි මෙසේ සඳහන් වනවා:

> "ගුරුවරයකු හෝ විදුහල්පතිවරයකු වන "ඒ" විසින් "බී" නමැති ළමයකු තවත් ළමයකුගේ දෙයක් සොරකම් කර ඇති ලෙස විශ්වාස කර "බී" පාසල් රැස්වීම් වේදිකාවට කැඳවා පාසල් ශිෂ්‍ය සමූහය ඉදිරිපිට දී "බී" සොරකු ලෙස ප්‍රකාශ කරමින් "බී" ට අවමන් කරයි. "ඒ" විසින් ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදු කර ඇත."

This sounds more like how the NPP Government came into power; Hon. Watagala, this sounds more like that. මෙහෙම තමයි ඔබතුමන්ලා බලයට ආවේ. වෙන උදාරණ මොකවත් ඕනෑ නැහැ, අද සභානායකතුමා ඔක්කොටම අත දික්කරලා කිව්වා, "පල්හෝරු" කියලා. දැන් කොහොමද හත් ඉළව්වේ, එහෙම කියන්නේ? ඒ නිසා මෙහෙම නිදර්ශන දමන්න කලින් තමන් හැඳෙන්න ඕනෑ කියලා මම විශේෂයෙන් ඔබතුමන්ලාට කියනවා. මේක දැක්ක ගමන් මට මතක් වුණේ ඒ කාරණාවයි.

අවසාන වශයෙනුත් මම කියනවා, මේ කරන කටයුත්ත ඉතාම හොඳ බව. අපි මෙයට සංශෝධනයක් ගෙනෙව්ත් තිබෙන්නේ, ශාරීරික දඬුවම් සිදු කරන්න කියන පදනමෙන් නොවෙයි. ඒ සියලු දේවල් ඉවත් වෙන්න අවශ්‍යයි. හැබැයි, අනෙක් පැත්තෙන් ගුරුවරුන්ගේ රැකවරණය සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතුයි. මොකද, ගුරුවරුන් සියලු දෙනා දරුවන් මරාගෙන කන්න ඉන්න අය නොවෙයි. ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා කිව්වා, තිලමුට්ඨි ජාතකය ගැන. ඒ ජාතක කථාවෙන් කියනවා වාගේ දඬුවමක් කළත් දරුවන් වෙනුවෙන් නොනිත් ආදරයෙන් වැඩ කරන ගුරුවරු මේ රටේ ඉන්නවා. ඒ වාගේම එවැනි දෙමව්පියනුත් ඉන්නවා. ඒ ගුරුවරුනුත්, ඒ දෙමව්පියනුත් රැක ගනිමු, ඒ වාගේම දරුවන්ගේ රැකවරණයත් සලසමු; දරුවන්ගේ අයිතිවාසිකම් ද සුරක්ෂිත කරමු කියන කාරණය මතක් කරමින්, අපේ සංශෝධනය කරුණාකර භාරගන්න කියා ද ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු තිලංක යූ. ගමගේ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு திலங்க யூ. கமகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. THILANKA U. GAMAGE left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.09]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයට භාජන වන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අද උදෑසන සිටම විවිධ අදහස්, විවිධ යෝජනා සහ සංශෝධනය විය යුතු තැන් පිළිබඳව සාකච්ඡා වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව පටන් ගන්න කලින් පුංචි කාරණයක් මතක් කරන්න තිබෙනවා. මේ රට අපි භාර ගනිද්දී, අපට බලය පවරපු මිනිස්සු ප්‍රධාන කාරණා තුනක් බලාපොරොත්තු වුණා. ඉන් පළමුවැනි කාරණය තමයි, බංකොලොත් වෙලා තිබුණු ආර්ථිකයේ ස්ථායිකරණය ඇති කරයි කියන එක. දෙවැනි කාරණය තමයි, මූල්‍ය විනයක් සහිතව මේ රට පාලනය කරයි කියන එක. තුන්වැනි විශේෂ කාරණය තමයි නීතියේ විධානය, ආධිපත්‍යය අපි ආරක්ෂා කරයි කියන එක. ඒ නිසා නීතියේ විධානය, ආධිපත්‍යය ආරක්ෂා කරන්න අපට සිද්ධ වෙනවා. පැරණි නීති සියල්ලම නරක නැහැ. ඒකත් කියන්න ඕනෑ. මේ රටේ ඕනෑ තරම් නීති තිබෙනවා. අපි ඕනෑ තරම් නීති අනුගමනය කරලා තිබෙනවා. ඒ නීති සියල්ලම වැරදි නැහැ. නමුත් ඒ නීතිවල අඩු ලුහුඬුකම් තිබෙනවා නම්, ඒ නීතිවලින් මිනිස්සු බලාපොරොත්තු වෙන සාධාරණය, යුක්තිය සහිත සාධාරණ සමාජයක් නිර්මාණය වෙන්නේ නැත්නම්, ඊට අදාළ සංශෝධන කිරීමට අපට බලයක් පවරලා තිබෙනවා. මේ රටේ මිනිස්සු ඡන්දය ලබා දීලා අපට පරමාධිපත්‍ය බලයක් පවරලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, අපි කවදාවත් එක තැන පල් විය යුතු නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නීති සංශෝධනය කිරීමේදී විවාදසම්පන්න කාරණා මතු විය හැකියි. විශේෂයෙන්ම අද දවස පුරාම දැක්ක දෙයක් තිබුණා. විපක්ෂයේ මූලික තර්කය වුණේ, මේ නීති සංශෝධනය ඇතුළේ ගුරුවරු කියන කණ්ඩායම තනි කරලා, ගුරුවරුන්ට වැඩේ දෙන්න අපි නීති සංශෝධනයක් ගෙනාවා කියන කාරණයයි. එතුමන්ලා ඒක වැඩි වැඩියෙන් උලුප්පා දක්වන්න මහන්සි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධන පනත් කෙටුම්පතේ ප්‍රධාන කාරණා දෙකක් තමයි අන්තර්ගත වෙන්නේ. එකක්, ළමයින් සම්බන්ධයෙන් කෲර සහ අවමන්සහගත ශාරීරික හෝ ශාරීරික නොවන දඬුවම් පැනවීම තහනම් කිරීම සඳහා 308ආ යන වගන්තිය ඇතුළත් කිරීම. දෙවැනි

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

විශේෂිත කාරණය තමයි, ළමයෙකුට එරෙහිව ස්වේච්ඡාවෙන් බරපතළ තුවාල කිරීමේ වරද සිදු කරන අවස්ථාවකදී ඉහළ දණ්ඩනයක් හඳුන්වා දීම සඳහා 314අ සහ 316අ යන නව වගන්ති ඇතුළත් කිරීම. මේ කාරණා දෙක විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි යම්කිසි කාරණයක් විශ්ලේෂණය කිරීමේදී දත්ත උපයෝගී කර ගත යුතුයි. ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය විසින් ලබා ගත් වාර්තා අනුව 2023 අවුරුද්දේ ළමා සුළු අපරාධ 2,988කුත්, ළමා බල අපරාධ 3,126කුත් වාර්තා වෙලා තිබෙනවා. ඒ අනුව ළමයින් සම්බන්ධයෙන් සම්පූර්ණ අපරාධ 6,114ක් වාර්තා වෙලා තිබෙනවා. 2024 ඔක්තෝබර් මාසය වෙද්දී ළමා සුළු අපරාධ 2,622කුත්, ළමා බල අපරාධ 2,708කුත් වශයෙන් ළමයින් සම්බන්ධයෙන් සිදුවුණු සම්පූර්ණ අපරාධ 5,330ක් වාර්තා වෙලා තිබෙනවා. මේවා වාර්තා වෙච්ච අපරාධ. වාර්තා නොවුණු, හඬක් නැති දරුවන්ට සිද්ධ වෙච්ච අසාධාරණකම් අපි දන්නේ නැහැ. අපි මේ නීති සංශෝධන ගෙනෙන්නේ කවුරු හරි කණ්ඩායමක් අසරණභාවයට පත් කරලා, ඔවුන් එක තැනකට කොටු කරලා ඒ කවුරුහරි හිංසනයට ලක් කරන්න නොවෙයි. මෙතැනදී දරුවන් ප්‍රධානයි. ළමයි කියන්නේ වයස අවුරුදු 18ට අඩු, තමන් ගැන තනිව තීරණ ගන්න බැරි, තව කෙනෙකු මෙහෙයවන, තව කෙනෙකුගේ ආදරය, රැකවරණය, විශ්වාසය බලාපොරොත්තු වෙමින් ඒක ඇතුළේ හැදී වැඩෙන අය. ඒ දරුවන් සම්බන්ධයෙන් තමයි අපි මේ කථා කරන්නේ. මේ කිසිවක් අපේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යවරිය තනියෙන් කරන දේවල් නොවෙයි. මේ සියල්ල ජාතික ජන බලවේගයේ අපි සියලුදෙනා එකතුවෙලා කරන්නේ. දරුවාට හොඳම සුබසාධනය අත්පත් කර දීම වෙනුවෙන් අපි සියලුදෙනා ගන්නා උත්සාහයක ප්‍රකාශනයක් තමයි එතුමිය ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මෙය, එතුමිය මූලික කරගෙන ප්‍රහාර එල්ල කරන්න හරි, එතුමියට විරුද්ධව කථා කරන්න ගන්නා කාරණයක් විය යුතු නැහැ. දරුවාගේ හොඳම සුබසිද්ධිය වෙනුවෙන් තමයි අපි හැමදෙනාම මේ කථා කරන්නේ. ඒකයි මම මේ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළේ.

ඒ වාගේම ළමයින්ට සිදු වන කෲරත්වය පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නිකුත් කර තිබෙන වාර්තාවකට අනුව, 2025 ජනවාරි 01වැනි දා ඉඳලා 2025.07.31වැනි දා වනකල් පැමිණිලි 1,126ක් ලැබී තිබෙනවා. මේ ලැබුණු පැමිණිලි විතරයි. අපි මේකෙන් අදහස් කරන්නේ ගුරුවරයා සම්බන්ධයෙන් පමණක් නොවෙයි. දරුවන්ගේ භාරකාරත්වය දරන ආයතනයක් වෙන්න පුළුවන්, දරුවා ඒ වෙලාවේ රැක ගන්නා භාරය දරන කෙනෙකු වෙන්න පුළුවන්, පෙර පාසලේ වෙන්න පුළුවන්, ඉස්කෝලේ වෙන්න පුළුවන්, දෙමව්පියන් ළඟ වෙන්න පුළුවන්, වැඩිහිටියෙක් ළඟ වෙන්න පුළුවන් කිසිදු හේතුවක් මත දරුවා කෲර අමානුෂික වධ හිංසනයකට හෝ කෲරත්වයකට පත් නොවිය යුතුය කියන එක අපි විශ්වාස කරනවා.

ඒ වාගේම අද උදේ ඉඳලා අවවාදයයි, අපහාසයයි කියන වචන දෙක ඇතුළේ අපි පැටලුවා. අවවාදයි, අපහාසයි වෙන් කරලා හඳුනා ගන්න බැරි වෙන්න තරම් ව්‍යවස්ථාදායකය නියෝජනය කරන අපි කිසිවෙකු නොමේරූ මානසිකත්වයෙන් ඉන්නවා කියලා හිතන්න හොඳ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පුංචි කාලයේ අපේ අම්මලා බිල්ලෙක් එනවා කියලා භය කරලා දරුවන්ට බත් කැව්වා. ඒ වාගේම, "අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ" කියලා හඳ පෙන්වලා දරුවන්ට බත් කවන ආදරණීය දෙමව්පියනුත් ඉන්නවා. මම මේ පුංචි උදාහරණයක් විතරයි කියන්නේ. දරුවෙකුට මඟ පෙන්වන්න, දරුවෙකු යහ මඟට ගන්න දඬුවම අත්‍යවශ්‍ය කාරණාවක් නොවෙයි. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, දඬුවමකට භය නිසා රටක් කටයුතු කරනවා නම් ඒක අපට සාධාරණීකරණය කරන්න බැහැ කියලා. දඬුවමට භය නිසා මිනිස්සු වැරදි කරන්නේ නැතිව ඉන්නවා නම් ඒක අපට සම්පූර්ණයෙන් සාධාරණීකරණය කරන්න බැහැ. මේ සමාජය වෙනුවෙන් අපට තිබෙන්න ඕනෑ හොඳ හැදියාවක්. හොඳ, නිර්මාණශීලී හැදියාවක් සහ ඒ වෙනුවෙන් කටයුතු කරන හොඳ චින්තනයක් අපට තිබෙන්න ඕනෑ. ඒ නිසා දඬුවමට භයේ වැරදි කරන්නේ නැතිව ඉන්නවා නම්, ඒක අපට සාධාරණීකරණය කරන්න බැහැ. ගුරුවරුන් ගැන විශේෂයෙන් කථා කරපු නිසා මම මේ කියන්නේ. අපේ රටේ සුවහසක් ගුරුවරුන්ට, අපට අධ්‍යාපනය ලබා දුන් දහසකුත් ගුරුවරුන්ට අදටත් අපි ආචාර කරනවා. දහසකුත් ගුරුවරුන් අපට මඟ පෙන්නුවේ අමානුෂික දඬුවම් පමුණුවලා නොවෙයි. එහෙම නැති එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා වෙන්න පුළුවන්. එහෙම හඳන්න අපි සත්තු නොවෙයි. දරුවන් කියන්නේ සත්ව වර්ගයක් නොවෙයි.

මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා මේ පනතේ තිබෙන උදාහරණයක් අරගෙන කථා කළා.

එහි 4වන පිටුවේ, නිදර්ශන යටතේ (ඇ) කොටසෙහි මෙසේ සඳහන් වනවා:

> "ගුරුවරයකු හෝ විදුහල්පතිවරයකු වන "ඒ" විසින් "බී" නමැති ළමයකු තවත් ළමයකුගේ දෙයක් සොරකම් කර ඇති ලෙස විශ්වාස කර "බී" පාසල් රැස්වීම් වේදිකාවට කැඳවා පාසල් ශිෂ්‍ය සමූහය ඉදිරිපිට දී "බී" සොරකු ලෙස ප්‍රකාශ කරමින් "බී" ට අවමන් කරයි. "ඒ" විසින් ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදු කර ඇත."

මේ කියන්නේ දරුවන් ගැන. පාර්ලිමේන්තුවේ අපි ගැන නොවෙයි. මේ කථා කරන්නේ දරුවන් ගැන. දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතේ පැහැදිලිව ඒ බව සඳහන් කර තිබෙනවා. ඒ නිසා දරුවනුයි, මේ ගරු සභාව ඇතුළේ ඉන්න මන්ත්‍රී සහෝදර සහෝදරියන් පටලවා ගන්න එපා. ආපසු මතක් කරනවා, දරුවන් විෂයයෙහි සිදු වන ශාරීරික හෝ ශාරීරික නොවන කිසිදු හිංසනයක් අපි අනුමත කරන්නේ නැහැ. ලෝකය නිවැරදි වෙන්නේ නිවැරදි දේ වෙනුවෙන් පෙනී සිටියහොත් පමණයි. ඒක කරන්න යම් කාලයකදී අපට අපහසු වෙනවා වෙන්න පුළුවන්. යම් කිසි කාලයක් අපි අපහසුතාවට පත් වෙලා යම් යම් අකරතැබ්බවලට මුහුණ දෙනවා වෙන්න පුළුවන්. හැබැයි, මිනිස්සුන්ට කේන්ති ගියා කියලා මිනිස්සු මරන්නේ නැහැ. මරණයට මිනිස්සු භයයි. මරණ දඬුවමට මිනිස්සු භයයි.

ඒ වාගේම අපි මේ සමාජයෙන් ඉල්ලා සිටිනවා, නීතියේ විධානයේ ආධිපත්‍යය ගැන කථා කරන අපි, ආර්ථිකය ගැන කථා කරන අපි දරුවන්ට අහිමි වෙච්ච කාලය -දරුවන්ට නිදහසේ සෙල්ලම් කරන්න තිබුණු කාලය, දරුවන්ට නිදහසේ අධ්‍යාපනය ලබන්න තිබුණු කාලය- තව දුරටත් නැති කරන්නේ නැතිව අනාගතයේ මේ දරුවන්ට හොඳම දේ ලබා දීම වෙනුවෙන් අපි සියලුදෙනා එකතු වෙලා වැඩ කරමු කියලා. ඒ වෙනුවෙන් ඔබ ලබාදෙන අදහස්, යෝජනා ඉතාම ගෞරවනීය විධියට අපි පිළිගන්නවා. ඒ ගැන අපට කිසිම විවාදයක් නැහැ. දරුවෝ කියන කාරණයේදී, ඔබ විපක්ෂය නියෝජනය කළත්, කුමන පක්ෂයක් නියෝජනයක කළත් අපි ඔබේ අදහසට ගරු කරනවා. ඒ නිසා ඉතාම ගෞරවයෙන් අපි ඉල්ලා සිටිනවා, පොදු පටු මාතෘකාවලට මේක කොටු කරන්නේ නැතිව හොඳ සංශෝධන ගෙනැල්ලා, දරුවන්ට හොඳම දේ ලබා දීම වෙනුවෙන් වැඩ කරමු කියලා. එම ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.20]

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

දුවා දරුවන්ට ශාරීරික දඬුවම් ලබාදීම - corporal punishment - සම්බන්ධයෙන් දැනටමත් තිබෙන, 1833 දණ්ඩ නීති සංග්‍රහය යටතේ තිබෙන විධිවිධානවලට සංශෝධන ගෙන ඒම සඳහා තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත අද ඉදිරිපත් කර තිබෙන්නේ.

මම ප්‍රථමයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, අපි ශ්‍රී ලාංකිකයන් වශයෙනුත්, දෙමවුපියන් වශයෙනුත් පක්ෂ භේදයකින් තොරව අපේ ආදරණීය දුවා දරුවන්ට සිදු වන හිංසනයට විරුද්ධ බව. ඒ වාගේම පක්ෂයක් වශයෙන් සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂය අපේ රටේ දුවා දරුවන්ට සිදු වන හිංසනය හෙළා දකිනවා. මේ සම්බන්ධයෙන් පක්ෂයක් වශයෙන් ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගන්න අපි සූදානම් කියලා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අපි සඳහන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ගරු සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය ඇතුළු ආණ්ඩුව අපේ දරුවන් වෙනුවෙන් මේ පනත් කෙටුම්පත ගෙන ඒම ගැන අද ඒ වෙනුවෙන් කථා කරන මා ඇතුළු විපක්ෂයේ සියලුදෙනාම සන්තෝෂ වෙනවා. මේ පනත් කෙටුම්පත හොඳ චේතනාවෙන් කළ උත්සාහයක ප්‍රතිඵලයක් කියන එක ගැන අපට කිසිම සැකයක් නැහැ. ඇත්තටම ඒකට අපි ප්‍රශංසා කරනවා.

අපේ රටේ ළමා හිංසනය ගැන කථා කළොත්, සමස්තයක් වශයෙන් 2024 වර්ෂයේදී ළමා හිංසනය පිළිබඳ පැමිණිලි 15,000ක් විතර ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සටහන් වෙලා තිබෙනවා. එතකොට, 2025 අගෝස්තු 31වෙනි දා වෙනකොට ළමා හිංසන සම්බන්ධ පැමිණිලි 5,300කට ආසන්න සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙනවා. මේ ළමා හිංසන දත්තවලින් සියයට 20ක්ම ළමයින්ට කෲර ලෙස සිදු කළ දඬුවම් හා සම්බන්ධ පැමිණිලි. ඇත්තටම මම කලින් කිව්වා වාගේ අපි සන්තෝෂ වෙනවා මේ සඳහා රජය අවධානය යොමු කිරීම ගැන.

දරුවන්ට ශාරීරික දඬුවම් ලබාදීම පිළිබඳ තිබෙන නීති රීති ගැන මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි. 1833 දණ්ඩ නීති සංග්‍රහයට ළමයින් සම්බන්ධ සංශෝධනය ගෙනාවේ 1995දී. ඉන් පසුව 2006දී තවත් සංශෝධනයක් ගෙනාවා. අද පවතින නීතිය අනුව ළමයින්ට දඬුවම් කිරීම තහනම් කරලා තිබෙන නමුත්, ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින දරුවන්ට සද්භාවයෙන්, සාධාරණ හේතු මත ශාරීරික දඬුවම් කරන්න පුළුවන් කියලා දෙමවුපියන්ට, ගුරුවරුන්ට අවසරදීමක් තිබුණා. ආණ්ඩුව විසින් ගෙනැවිත් තිබෙන මේ පනත් කෙටුම්පත මඟින් අද අපේ ගරු ඇමතිතුමිය මුල් පනතට සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. දෙමවුපියන්, ගුරුවරුන්, භාරකරුවන්, ශිෂ්‍ය නායකයක් විසින් දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් ශාරීරික බලය භාවිත කරනු ලබන යම් ක්‍රියාවක් හෝ අවමානයක් ඇති විය හැකි ශාරීරික නොවන යම් ක්‍රියාවක් සිදු කරන්නේ නම් ඒක නීතියට අනුව වරදක් කියලා. ඒ, දෙමවුපියන් හෝ ගුරුවරුන්, එහෙම නැත්නම් භාරකරුවන්, ශිෂ්‍ය නායකයන් වෙන්න පුළුවන්. ඒ සියලුදෙනාට නඩු පැවරිය හැකි බව තමයි මේ සංශෝධනයේ සරල වශයෙන් සඳහන් කරන්නේ.

මමත් මහනුවර පාසලට ගිය කාලයේ අත දික් කරන්න කියලා ගුරුතුමන්ලා මටත් අඩි කෝදුවෙන් අතට ගහලා තිබෙනවා. මේ සභාවේ සිටින බහුතරයක් දෙනා ඒ වාගේ සුළු ශාරීරික දඬුවම්වලට ලක් වෙලා ඇති කියලා මම හිතනවා. නමුත් අද මේ සමාජය ගොඩක් වෙනස් වෙලා තිබෙන්නේ කියන එක අපට පිළිගන්න වෙනවා. විශේෂයෙන්ම දෙමවුපියන් මෙන්ම, පාසල්වලදීත් ළමයින්ට ඉතාම කෲර අන්දමින් ශාරීරික දඬුවම් ලබා දීපු සිද්ධි අපි දැකලා තිබෙනවා; වාර්තා වෙලා තිබෙනවා. ඉතින්, ඒ නිසා තමයි මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ කියලා අපි විශ්වාස කරනවා. නමුත්, මේ ගෙනැවිත් තිබෙන සංශෝධනයේ යම් යම් දුර්වලතා තිබෙනවා. විශේෂයෙන්ම දෙමවුපියන්, ඒ වාගේම ගුරුවරුන් සද්භාවයෙන් ලබා දෙන්නා වූ දඬුවම් පිළිබඳව යම් කිසි අපැහැදිලිකමක් තිබෙන බව තමයි විපක්ෂයේ අපි කරපු සාකච්ඡා අනුව අපට පැහැදිලි වෙන්නේ. ඒ වාගේම ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අද උදේ සඳහන් කළා, අද ගෙනැවිත් තිබෙන පනත් කෙටුම්පතට අනුව අවමානයක් ඇති විය හැකි ශාරීරික නොවන යම් ක්‍රියාවක් දෙමව්පියෙක් හෝ ගුරුවරයෙක් විසින් සිදු කර තිබෙනවා නම් ඒ සම්බන්ධයෙනුත් නීති ක්‍රියාමාර්ග ගන්න පුළුවන් කියලා. නමුත්, අවමානයක් ඇති විය හැකි ශාරීරික නොවන දඬුවම මොකක්ද කියලා ඇත්තටම මේ පනත් කෙටුම්පත තුළින් පැහැදිලි කරලා නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමියගේ අදහස්වලට ගරු කරමින්, ඔබතුමන්ලාගේ සංශෝධනයේ පිටපතක් ලබා දෙනවා නම් හොඳයි කියන එක මම කියන්න ඕනෑ.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ඒ වචනයේ තිබෙන අපැහැදිලි බව තමයි අපට තිබෙන ප්‍රශ්නය. ඉතින්, මේ සම්බන්ධයෙන් සලකා බලන්න කියන එක තමයි මම ගරු ඇමතිතුමියගෙනුත්, අධිකරණ ඇමතිතුමාගෙනුත් - මේ වෙලාවේ එතුමා මේ සභාවේ නැහැ- මේ අවස්ථාවේ ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නේ.

අපේ රටේ නීති පද්ධතිය ගැන කථා කළොත්, ප්‍රමාද වීම් රාශියක් තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ අද වෙනකොට පැමිණිලි 40,000ක් විතර හිරවෙලා තිබෙන බව අපි දන්නවා. ඒ පැමිණිලිවලින් සියයට 1ක්

[ගරු නිතිඥ චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය ]

විතර ප්‍රමාණයක් තමයි මේ වෙනකොට නිරාකරණය කරලා තිබෙන්නේ. සමහර අවස්ථාවලදී දරුවකුට අදාළ සිද්ධියක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කළාම, එම දරුවා වැඩිවියට පත්වෙලා, විවාහ වෙලා දරුවන් ලැබුණාටත් පසුව තමයි එම පැමිණිල්ල උසාවියට යන්නේ. අපේ රටේ නීති පද්ධතියේ ප්‍රමාදවීම් තිබෙනවා වාගේම, විශේෂයෙන්ම ගුරුවරයෙකුට මේ වාගේ පැමිණිල්ලක් කළාම ඒ ගුරුවරයාට තවත් ප්‍රශ්න ඇති විය හැකි අවස්ථා තිබෙනවා. ඒ කියන්නේ, ආයතන සංග්‍රහය යටතේ ඒ ගුරුවරයාගේ රැකියාව අහිමි වෙන්නත් ඉඩ තිබෙනවා. ඒ වාගේම සමාජය ඒ ගුරුවරයා දෙස බලන විධිය වෙනස් වෙන්නත් පුළුවන්. ඒ කෙසේ වෙතත්, මේ නීතිය ගෙන එනවා වාගේම, අනෙක් පැත්තෙන් අපේ නීති පද්ධතිය කාර්යක්ෂම කරන්නටත් ඕනෑ. ශාරීරික දඬුවම් ලබා දෙනවා වෙනුවට අපේ දරුවන් යහපත් පුරවැසියන් බවට පත් කිරීම සඳහා ගත හැක්කේ මොන වගේ ක්‍රියාමාර්ගද කියලා පාසල්වල ගුරුවරුන්ට යම් කිසි පුහුණුවක් ලබා දෙන්නට ඕනෑ.

විශේෂයෙන්ම ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. කලින් කිව්වා වාගේම අපේ දරු සම්පත වෙනුවෙන් මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. නමුත්, මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේදී මීට වඩා ගැඹුරින් හිතා බලා, කිසිම අවිනිශ්චිතභාවයක් ඇති නොවන අන්දමින් ඉදිරිපත් කළ යුතු බව තමයි අපේ මතය.

මේ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.28]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සමාජයක් ලෙස හිංසනය ප්‍රතික්ෂේප කරනවා, යුද්ධය ප්‍රතික්ෂේප කරනවා, ශාරීරික සහ මානසික පීඩනය ප්‍රතික්ෂේප කරනවා. හැබැයි, කනගාටුවට කාරණය තමයි දරුවන්ට වේවැල් කෝටුවලින්, නාරන්, සියඹලා අතුවලින් ගහන එක විතරක් පිළිගන්න එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක කොයි තරම් අභාග්‍යයක්ද?

අද ඉතා වැදගත් නීති සංශෝධනයක් තමයි මේ සභාවට ගෙනැවිත් තිබෙන්නේ. මේක ඓතිහාසිකයි. මේ මොහොතේ කථා කරන්නට ලැබීමත් මම ඉතා ගෞරවයක් ලෙස සලකනවා. අද උදේ ඉඳලාම මෙම විවාදයේදී මතු වුණු අදහසුත්, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමිය පළ කරපු අදහසුත්, උදේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අදහසුත් ඇතුළු ඒ සියලු අදහස්වලට එක පැත්තකින් මම ගරු කරනවා වාගේම, ඒවා අගය කරනවා. ඒ වාගේම මේ සමස්ත සංශෝධනයට එකඟ වනවා. මේ සංශෝධනය සම්බන්ධයෙන් විපක්ෂය පැත්තෙන් මත දෙකක් ගෙනාවා. මම කැමැතියි, ඒ මත දෙක පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

විපක්ෂය විසින් ගෙනා එක මතයක් තමයි, අවමානය කියන එක. එහෙම නැත්නම් මානසික කාරණය කියන එක. දෙවැන්න තමයි, සද්භාවය කියන එක. මේකත් මීට කලින් කථා කළ මන්ත්‍රීතුමිය ඇතුළු නීතිඥවරුන් විසින් කථා කළ දෙයක් නිසා මම ඒ ගැන කියන්නම්. ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 74වැනි වගන්තියේ සඳහන් වෙනවා, සද්භාවයෙන් කරන ක්‍රියා කියන එක සමස්ත අපරාධ නීතියට අදාළ වෙන හැටි. ඒ නිසා මම ඒ ගැන වැඩිපුර කථා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ මානසික කාරණය, අවමානය කියන එක ඉතාම වැදගත් වනවා. මෙතැනදී අප මතක තබා ගත යුතු කාරණයක් තිබෙනවා. අපේ ගරු නීතිඥ මන්ත්‍රීතුමාටත්, මන්ත්‍රීතුමියටත් මම කියන්න කැමැතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාවේ අවමානය කියන කාරණය ගැන සඳහන් කර තිබෙන බව. නමුත් මෙහි කිසිදු සීමාවක් දක්වා නැහැ. ශාරීරික හෝ මානසික, cruel, inhuman or degrading treatment යනුවෙන් තමයි එහි සඳහන් වෙන්නේ. ඇත්තටම අවමන් සහගත සැලකිල්ල කියන එක දැනටමත් නීතියේදී අපි පිළිගන්නවා, ඉතා වැදගත් අංශයක් විධියට. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය තුළත් ඒ ගැන කථා කරනවා, physical or mental violence යනුවෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ මානසික හිංසනය කියන කාරණය අපට මේකෙන් අයින් කරන්න කියන තර්කයට එකඟ වෙන්න බැහැ. මේකේ interpretation එකක් නැහැ කියන තර්කය එතුමා ගෙනාවා. නමුත් ලෝකය තුළින් මේකට ඕනෑ තරම් interpretations හොයාගන්න පුළුවන්. අපි ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ - CRC එකේ - පාර්ශ්වකරුවන් වනවා. එහි 42වැනි session එකේ General Comment No. 8 මම කියවන්නම්. මම ඒක සිංහල භාෂාවෙන් කිව්වොත්, දරුවන් හැල්ලු කරන, අවමානයට ලක් කරන, පළි ගන්න, තර්ජනය කරන, බිය ගන්වන හෝ සමච්චල් කරන දේවල් තමයි මානසික හිංසනය යනුවෙන් එහි සඳහන් කරන්නේ.

ලංකාවේ ප්‍රසිද්ධ නඩුවක් තිබෙනවා, "පොල්පිතිගම නඩුව" කියලා. ඒක ප්‍රියන්ත ඩයස් එරෙහි ඒකනායක නඩුව. පොලිස් නිලධාරින් විසින් කරන අවමන් සහගත වචන භාවිතය පවා මූලික අයිතිවාසිකම් යටතේ කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිල්ලට යටත් වෙනවා කියලා ගරු අධිකරණය ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා මේකට අර්ථ නිරූපණ නැහැ, වාඩිවෙන්න කියලා කිව්වත් ඒකටත් teachersලා හිරේ දමයි කියලා බොරු තර්ක මවන්න එපා, බොරු බිල්ලෝ මවන්න එපා. උදේ ගරු සභානායකතුමාත් මේ කාරණය අවධාරණය කළා. මට කලින් කථා කරපු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමියත් මේ ගැන කථා කළා. මේක තේරුම් ගන්න බැරි සමාජයක් නොවෙයි මේ තිබෙන්නේ.

දැන් බොහොම වෙනස්ම සංශෝධනයක් ඉල්ලා තිබෙනවා, ආදරයෙන් කරන දඬුවමක් ගැන. ඒ කියන්නේ සද්භාවයෙන් ක්‍රියා කරන, එහෙම නැත්නම් දඬුවමක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රමයක් වශයෙන් වේදනාවක් හෝ අපහසුතාවක් ඇති කරනවා නම්, නිවැරදි කරන අවස්ථාවකදී ආදරයෙන් කරන දේවල්වලට මේක ක්‍රියාත්මක කරන්න එපා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "වාඩිවෙන්න" කියලා ආදරයෙන් කියන්නත් පුළුවන්, අවවාද කරන්නත් පුළුවන්, ආදරයෙන් කනට ගහන්නත් පුළුවන්. එහෙම නම් අපට ආදරය කියන්නේ මොකක්ද කියලාත් අර්ථ නිරූපණය කරන්න වෙනවා.

මම කැමැතියි, මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්න පනතක් නිර්මාණය කරද්දී එම පනතේ අරමුණ මොකක්ද, ව්‍යවස්ථාදායකය විසින් අරමුණු කරන්නේ මොකක්ද කියන එක ගැන. මම හිතන විධියට එය ඉදිරියටත් අධිකරණවලදී නැවත නැවතත් සංවාදයට බඳුන් විය හැකි කාරණයක්. ඒ නිසා මේක

සහාගත කිරීම, හැන්සාඩ්ගත කිරීම වැදගත් කියලා මම විශ්වාස කරනවා. "හේවාමද්දුමගේ කරුණාපාල සහ තවත් අය එරෙහි ජයන්ත ප්‍රේමකුමාර සිරිවර්ධන" කියන නඩුවේදී පැහැදිලිව මෙසේ කියා තිබෙනවා:

> "…it must be recognized that rejection of Corporal Punishment is not a rejection of the concept of discipline."

විනය සඳහා කරන දඬුවමයි, ශාරීරික දඬුවමයි කියන්නේ එකක් නොවෙයි. යහපත් සංවර්ධනය සඳහා දෙමව්පියන්ගේ මඟ පෙන්වීමෙන් positive දඬුවම්, ඒ කියන්නේ ධනාත්මක දඬුවම් කිරීමේ ක්‍රමවේද ලෝකයේ ඕනෑ තරම් තිබෙනවා. එහි තවදුරටත් මෙසේ කියා තිබෙනවා:

> "An individual's understanding of discipline, respect for rules, a healthy attitude towards a non-violent society are integral attributes that must be instilled from a young age. However, in civilized society, these goals are to be accomplished using alternative forms of discipline which do not inflict physical or mental harm."

අපි දන්නවා, අධිකාරිමය ස්වභාවයකින් යුක්ත දඬුවම් - authoritative violence - වෙනුවට අද ලෝකය තුළ positive දඬුවම් ක්‍රම තිබෙන බව. දැන් දිගටම කථා වුණු දෙයක් තමයි දඬුවම් කරන්න එපා, ඒත් ළමයි හදාගන්න ඕනෑ කියන එක. නමුත් "ඒත්" කියන එකේ ඉතා භයානක කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම කැමැතියි, 2016 වසරේදී මම, විදුර මුණසිංහ, තිලිණි චන්ද්‍රසේකර සහ ඩැනියෙල් සෙලමායා කියන තවත් කණ්ඩායමක් සමඟ කළ පර්යේෂණයකට අදාළව ප්‍රකාශයට පත් කරපු පොතක සඳහන් කාරණයක් මෙතැනදී ඉදිරිපත් කරන්න. "පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ හිංසනය වටහා ගැනීම" කියන එක තමයි මේ පොතේ නම. මේ පොත තුළ අපි කථා කර තිබෙන්නේ පොලිස් වධ හිංසාව ගැන. පොලිස් වධ හිංසාව ගැන පර්යේෂණ කරද්දි අපට ගැඹුරින් තේරුණු දේ තමයි, ස්වභාවයෙන්ම සමාජය හිංසාකාරී වෙන්නේ කෙනෙකුට තමන්ගේ ළමා කාලයේදී හම්බ වෙන අත්දැකීම් මතයි කියන එක. ඒ සම්බන්ධව න්‍යායික පැහැදිලි කිරීමක් කරනවා, ගණනාථ ඔබේසේකර මහාචාර්යතුමා. එතුමා 1984දී ලියනවා, "ලජ්ජා, භය නැමති සංකල්පය ජීවිතයේ විවිධ වකවානුවලදී, විවිධ බල ක්ෂේත්‍රයන් තුළ, විවිධාකාරයෙන් මිනිස් විෂයයන් තුළ ස්ථාපනය කරනු ලබයි. පුද්ගලයෙකුගේ මුල් ළමා අවධියේදී පවුල තුළ සිදුවන පළමු සමාජයීයකරණ ක්‍රියාවලිය හරහා එය ස්ථාපනය වේ. 'ලජ්ජා නැද්ද, මිනිසුන් මොනවා කියයිද?' වැනි අවවාදාත්මක ප්‍රකාශන මඟින් දෙමව්පියන් විසින් යම් යම් හැසිරීම් පිටුදකින අතර, තවත් යම් හැසිරීම් පිළිගෙන සාමාන්‍යකරණය කරනු ලැබේ. විවිධ බල ක්ෂේත්‍ර තුළ සාමාන්‍යකරණ ක්‍රියාවලිය පාලනය කිරීමේ අධිකාරිය විවිධ පුද්ගල කණ්ඩායම් වරින වෙත පවරා ඇත. දෙමව්පියන්, ගුරුවරුන් සහ අවසානයේ පොලිස් නිලධාරින් ද තමාගේ ක්ෂේත්‍රය තුළ මෙබඳු බලයක් හිමි පිරිස වෙති. යටපත් කිරීම පිළිබඳ නියමය උල්ලංඝනය කරමින් ලජ්ජා, භය නැති ක්‍රියාකාරකම් සිදු කරන මිනිස් විෂයයන් අවමානයට ලක් කිරීම, තර්ජනය කිරීම හා ඔවුන්ට දඬුවම් පැමිණවීම මඟින් එකී අධිකාරිත්වය සහිත පිරිස විසින් සාමාන්‍යකරණය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබයි" කියලා.

තවදුරටත් මාලතී ද අල්විස් මහාචාර්යතුමියගේ අදහස් උපුටා දැක්වුවොත් එතුමිය කියනවා, කොහොමද මෙය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී වෙන්නේ, හිංසනය ඇතුළේ කොයි තරම් ක්‍රියාත්මක වන ස්ත්‍රී-පුරුෂ සමාජභාවයක් තිබෙනවාද කියලා. අපට නොපෙනෙන කුල ක්‍රමය, පන්ති වෙනස, ආබාධ සහිතභාවය වාගේ දේවල් හිංසනය ඇතුළේ කියනවා. අපි කියනවා නේ, ගහලා හදන්නේ නැති ළමයි හොඳ නැහැ, අම්මලා, තාත්තලාගෙන් ගුටි කාලා තමයි අපිත් හැදුණේ, ඒ නිසායි අපි මෙතැන ඉන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ඇතුළේ තිබෙනවා, සංකේතීය හිංසනය - symbolic violence - කියන එක. ඒ බව Pierre Bourdieu කියන දාර්ශනිකයා කියලා තිබෙනවා. අපිත් පිළිගන්නවා, අපිත් හිංසනයට ලක් විය යුතු කණ්ඩායමක් කියලා. ඒ විධියට අපිත් හිතනවා, කමක් නැහැ, ළමයි කියන්නේත් අපට ඕනෑ විධියට හදලා ගන්න පුළුවන් කණ්ඩායමක්, තළා පෙළා, පීඩනයට පත් කරලා හදලා ගන්න පුළුවන් කණ්ඩායමක් කියලා. මේක හරිම යටත් විජිතවාදී චින්තනයක්.

හිංසනය පිළිබඳව කථා කරපු නඩු තීන්දු බොහොමයක් තිබෙනවා. ඉන්දියාවේත් මීට අදාළ නඩු තීන්දු තිබෙනවා. නමුත් මම කියන්නේ, අපි මේ දේවල් කරන්න ඕනෑ, ඒ නඩු තීන්දුවල තිබෙන නිසාවත්, එහෙම නැත්නම් අපි ජාත්‍යන්තර සම්බන්ධතා - බැඳීම්- එක්ක ඉන්න නිසාවත් නොවෙයි කියලායි. අපි උදා කරන්න පොරොන්දු වුණේ ජනතාවට පුනරුදයක්. පුනරුදය තුළ තිබිය යුතුයි, හැම දාම තිබෙන සමාජ පරිවර්තනයක්; සදාකාලයටම රැඳෙන්න පුළුවන් සමාජ පරිවර්තනයක්. මට කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු කිව්වා, මේවා ගෙනාවාට විතරක් සමාජය වෙනස් වෙන්නේ නැහැ කියලා. ඔව්, අපි ඒක පිළිගන්නවා. අපි හැම තිස්සේම සමාජය වෙනස් වෙයි කියලා හිතනවා.

ආචාර්ය කිරාත් ශ්‍රේවල් ලියනවා, "සමාජයීය සාමය පවත්වා ගන්නා පිළිගත් මාර්ගයක් වශයෙන් ප්‍රචණ්ඩත්වය පිළිබඳව පවතින සමාජයීය ආකල්ප වෙනස් කිරීමකින් තොරව අපි වධ හිංසාව සහමුලින්ම නැති කිරීම සඳහා අරගළ කරමින් සිටින්නෙමු" කියලා. අපි වධ හිංසාව ගැන කථා කරනවා. නවක වධය ගැන කථා කරනවා. පොලිස් වධ හිංසාව ගැන කථා කරනවා. අපි සාමය සහ යුද්ධය ගැනත් කථා කරනවා. එහෙම නම්, අපි මේ රටේ අනාගතය වන දරුවන්ට ඔවුන් මත හිංසනය පටවමින්, ඒ දරුවන් අනාගතයේ හිංසාකාරී නොවේ යැයි අපේක්ෂා කිරීම තරම් අසාධාරණයක් තවත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසාන කරන්නම්, ධම්ම පදයේ එන ගාථාවකින්.

"අත්තානං චේ තථා කයිරා - යථඤ්ඤමනුසාසති
සුදන්තෝ වත දම්මේථ - අත්තා හි කිර දුද්දමෝ"

මේකත් මම උපුටා ගත්තේ නඩු තීන්දුවකින්. ගරු විනිසුරුතුමා නඩු තීන්දුවකටයි මේ ගාථාව ලියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනික් අයට අනුශාසනා කරනවා නම්, අනික් අයව දමනය කරන්න උත්සාහ කරනවා නම් ඊට කලින් අපි දමනය විය යුතුයි. අමාරු දෙය තමයි, අපි දමනය වීම. අපේ සමාජයේ ලොකු ප්‍රශ්න තිබෙනවා. අපේ සමාජයේ පීඩා තිබෙනවා. අපේ සමාජය විසින් අපට දීපු මානසික පීඩා තිබෙනවා. ඒ නිසා ඒවා දරුවන් මත පටවන්න එපා. දරුවන් කියන්නේ හොඳම දේ ලැබිය යුතු අපේ රටේ අනාගතයයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.39]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙම වැදගත් පනත් කෙටුම්පත ගෙන ඒම සම්බන්ධයෙන් ආණ්ඩුවට අපේ ස්තුතිය පුද කරනවා.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

විශේෂයෙන් අවුරුදු ගණනක් තිස්සේ මේ පනත් පිළිබඳව සාකච්ඡා කළා. නමුත් අදාළ ක්‍රියාමාර්ග ටික ගැනුණේ නැහැ. හැබැයි, මේ ආණ්ඩුවෙන් ඒක ක්‍රියාත්මක කිරීම ගැන මම එක පැත්තකින් සතුටු වෙනවා. දෙවනුව, මේකේ දෙපැත්තක් පිළිබඳව හැම වෙලාවේදීම කල්පනා කළ යුතුයි. මොකද, මේ ළඟදීත් අපි දැක්කා, ගුරුවරයාට කුණුහරුපයෙන් බණින ශිෂ්‍යයෙකුගේ වීඩියෝවක් යූ ටියුබ් එකේ තිබෙනවා. ගුරුවරයා බලාගෙන ඉන්නවා. ශිෂ්‍යයා කුණුහරුපයෙන් අහනවා, "උඹ මොකද කියන්නේ?" කියලා; ෂෝට් එකක් ඇඳලා හිටපු ළමයෙක්. මම හිතන විදියට, අපි ඒ දෙපැත්ත ගැනම කල්පනා කළ යුතුයි. මම කියන්නේ නැහැ, දරුවන්ට පහර දෙන්න කියලා. නමුත් අපි ගුරුවරුන්ගේ පැත්තෙනුත් ඒ ගැන සම්පූර්ණයෙන් කල්පනා කළ යුතුයි. ඒ නිසා ඒක හොඳින් වටහා ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙලා තිබෙනවා.

ඊළඟට මම කැමැතියි, තව කරුණු කිහිපයක් මතු කරන්න. විශේෂයෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය, නැත්නම් නීතියේ විධානයේ ආධිපත්‍යය පිළිබඳව මේ ආණ්ඩුව විතරක් නොවෙයි, අපි විපක්ෂයේ අවුරුදු ගණනක් ඉන්නකොට අපිත් ඒ ගැන සාකච්ඡා කළා; කථා කළා. සමහර වෙලාවට ඒ සිද්ධ වුණු අසාධාරණකම්වලට විරුද්ධව අපි පෙළපාළි ගිය අවස්ථාත් තිබුණා. අපට මතකයි, මහාචාර්ය ශිරානි බණ්ඩාරනායක මැතිනිය මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, නඩු අහලා, එතුමියව තනතුරෙන් එළියට දමපු වෙලාව. ඒක සම්පූර්ණයෙන් අසාධාරණයි. අදත් මම කියනවා, ඒක අසාධාරණයි කියලා. එතුමියට විශාල අසාධාරණයක් සිද්ධ වුණා. එතුමිය මේ රටේ අවුරුදු ගණනක් අග්‍ර විනිශ්චයකාරතුමිය විධියට වැඩ කරන්න හිටපු වැදගත් කාන්තාවක්. මේ කාන්තාව සම්පූර්ණයෙන් දේශපාලනිකව මහ නැඹුම පනතට සහයෝගය දුන්නේ නැහැ කියලා,- *[බාධා කිරීමක්]* ඔව්. ඒ විනාශය එතුමියට කළා.

ඉතින් ඒ වාගේ, අධිකරණයේ විනිශ්චයකාරවරුන්ට අත්වන මේ කෙනෙහිලිකම්, වැරදි, උසස්වීම් සම්බන්ධ ප්‍රශ්න පිළිබඳව ඔවුන්ට කියන්න තැනක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔවුන්ට කාටද ගිහිල්ලා appeal එකක් දමන්න පුළුවන් වෙන්නේ? මොකුත් කරන්න බැහැ. මාරුවීම් දීපු තැනට යන්න ඕනෑ. උසස්වීම් දුන්නා නම් සද්ද නැතුව ඉන්න ඕනෑ. අදත් මේ ආණ්ඩුව යටතේ ඊටත් වඩා බරපතළ ලෙස ඒක සිද්ධ වෙනවා නම් මොකක්ද තත්ත්වය? අපි අහලා තිබෙන විධියට, 1970-77 කාලයේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්මයා උදේට ඒගොල්ලන්ගේ තිබෙන නඩුවකට උසාවියට ගියාම, ඔළුව දමලා විනිශ්චයකාරතුමා දිහා බලලා එනවා. එහෙම බලපෑම් තිබුණා. හැබැයි, අපි කියන්නේ ඒක දැන් නවත්වන්න කියලා. හැබැයි, ඒක සිද්ධ වෙන්නේ නැහැ. තමන්ට කැමැති විනිශ්චයකාරවරු තමන්ගේ තැන්වලට හදා ගන්න ආණ්ඩු හැමදාම උත්සාහ කළා. ඒ වාගේම සමහර නීතිඥයන් හරහා ඒ අයට පණිවුඩ ඇරියා. ඒ අයගේ පණිවුඩ නීතිඥයන් හරහා ජනාධිපතිට අරගෙන ආවා. දැනුත් එහෙම කරන අය ඉන්නවා. නීතිඥවරු හරහා ගිහිල්ලා, නැත්නම් මන්ත්‍රීවරු හරහා ගිහිල්ලා ඒ අය හෙමිහිට පණිවුඩය කියනවා, "ජනාධිපතිතුමා අර වැඩේ හරි. මේක හරි" කියලා. ඒක bench fix කරලා නඩු අහන තත්ත්වයක්, ඉතිහාසයේ. වර්තමානයේත් දැන් ඒක සිද්ධ වෙමින් තිබෙන තත්ත්වයක් තමයි අපි දකින්නේ. දැන් අධිකරණ සේවා නිලධාරීන්ගේ සංගමය කියලා සංගමයක් තිබෙනවා. ඒක ඉතාම ස්වාධීන සංගමයක් විධියට, අපේ judgesලා ඔක්කෝම එකතු වෙලා හදා ගත්ත එකක්, ඉහළ උසාවිවල අය නොවෙයි. ඒ නිසා ඒක ස්වාධීනව කටයුතු කරගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 110 (2) අනුව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වී තිබෙනවා:

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නැතහොත් වෙනත් ලිඛිත නීතියකින් බලය දී ඇති පරිදි හෝ ජනාධිපතිවරයාගේ ලිඛිත කැමැත්ත ඇතිව හෝ මිස, (වැටුප් ගෙවනු ලබන හෝ නොලබන) වෙනත් යම් ධූරයක කටයුතු කිරීම නැතහොත් ලාභ හෝ වේතනයක් ලබන්නා වූ වෙනත් යම් තනතුරක් පිළිගැනීම ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ කිසිම විනිශ්චයකාරවරයකු විසින් නොකළ යුත්තේ ය."

ඇයි මෙහෙම දාන්නේ? මේක දාන්නේ වෙන එකකට නොවෙයි. මෙහෙම දාන්නේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා. ඇයි ඒ? ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු හෝ අග්‍ර විනිශ්චයකාරවරයෙකු, නැත්නම් Appeal Court එකේ කෙනෙක් එතැනින් ඉවත් වුණු විගසම ඔහුව ආණ්ඩුවේ තනතුරුවලට පත් කරනවා නම්, ඔහුගේ ස්වාධීනත්වය පිළිබඳව විශාල අර්බුදයක් තිබෙනවා. උදාහරණයක් හැටියට බලන්න, ඉන්දියාවේ තත්ත්වය මොකක්ද කියලා. ඉන්දියාවේ Chief Justice මොකක්ද කියන්නේ? 2025 ජූනි 05වන දින "The Hindu" පුවත් පතේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "Chief Justice of India BR Gavai has said that he and his colleagues in the Supreme Court have publicly pledged to not undermine the public's trust in judicial integrity by accepting post-retirement roles or positions from the government."

ඒ කියන්නේ, ඒගොල්ලන් සියලුදෙනාම ප්‍රතික්ෂේප කරනවා, ආණ්ඩුවේ තනතුරු ගන්න එක.

දැන් මොකද වුණේ? මේ ආණ්ඩුව ආපු ගමන් යවනවා, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා. එතුමා අපි හොඳින් දන්නා කෙනෙක්. නමුත් මොකක්ද වෙන්නේ? එතුමා තමයි රනිල් වික්‍රමසිංහ මහත්තයා ඡන්දය කල් දමනකොට ඒ කාලයේ නීතිපති විධියට ගිහිල්ලා පෙනී හිටියේ ඡන්දය කල් දාන්න. ඊට පසුව මේ ඡන්දය කල් දාන්න නියෝගය දුන්නාට පසුව ඒ නියෝගයටත් එතුමා සම්බන්ධ වුණා. දැන් එතුමාව යවනවා, එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිතයා විධියට. දැන් මේ වෙනකොට අපට හිතෙන්නේ නැද්ද, මේක ගැන යම් සැකමුසු තත්ත්වයක්? මොකක්වත් හිතෙන්නේ නැද්ද? එතුමා ඒ විධියට තීන්දු දුන්නා කියලා මම කියන්නේ නැහැ. නමුත් ඒක වැරදියි. දැන් මේක ගැන ඇහුවා, අනුර දිසානායක මැතිතුමා කවද්ද මේ ලිපිය දුන්නේ කියලා. මොකද, ජනාධිපති අත්සන් කරලා දෙන්න ඕනෑ මේ තනතුර භාර ගන්න කියලා. දැන් ඒ ලිපිය නැහැ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ අපි දිගටම ඒ ගැන ප්‍රශ්න කරනවා, ජනාධිපති ලේකම් කාර්යාලයෙන්. එහෙම තොරතුරක් නැහැ ලු. එහෙම නම් ජනාධිපතිතුමා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 110 ව්‍යවස්ථාව යටතේ මෙහෙම පත්වීමක් දෙන්න ඕනෑ කියලා තිබෙනකොට, ඒකට අත්සනක් ගහලා ජනාධිපතිතුමාගේ ලිපියක් ජනාධිපති ලේකම් කාර්යාලයේ නැත්නම් කොහෙන්ද අපි මේ ලිපි හොයා ගන්නේ? ඒකයි තිබෙන ප්‍රශ්නය. එතකොට ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට, මම මේ කාරණයත් කියන්න කැමැතියි. හිටපු අග්‍ර විනිශ්චයකාර කේ. ශ්‍රීපවන් මැතිතුමා, ඊවා වනසුන්දර මැතිනිය, දෙහිදෙණිය මැතිතුමා, මලල්ගොඩ මැතිතුමා වාගේ අය විශ්‍රාම ගියාමත් විවිධ තනතුරුවලට පත් කරලා තිබෙනවා. දැන් මෙතැන ඉන්නවා, අපේ වටගල මැතිතුමා. එතුමා කිව්වා, 114ක අත්සන් තිබෙනවා කියලා. බන්දුල කරුණාරත්න මහත්තයා ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කළා, රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කාලයේ. එතුමා පත් කළේ නැහැ. එතුමාව විශ්‍රාම යැව්වා; විශ්‍රාම නිවාඩු. එතුමා එහෙම යවලා මාස හය හතක් තියාගෙන ඉඳලා ගෙදර ඇරියා. මේ අය ආවේ ඒ අයට දඬුවම් කරන්න. බන්දුල කරුණාරත්න මහත්මයා වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒකට දඬුවම් කරන්න 114දෙනෙක් අත්සන් කරලා ගෙනාපු ඒ යෝජනාව දැන් කෝ? හැබැයි, මොකද වුණේ? බන්දුල

කරුණාරත්න මහත්තයා වරදකාරයෙක් වුණේත් නැහැ. එතුමාට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න දුන්නේත් නැහැ. මේ ආණ්ඩුව ඒකට මැදිහත් වුණා. ඒක හරිද? එතකොට ඒක නීතියේ ආධිපත්‍යයද? අධිකරණයේ ස්වාධිපත්‍යයද? නැහැ.

මම කලින් කිව්වා, අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමය ගැන. මම බොහොම පැහැදිලිව කිව්වා, ඒක ඉතාම ස්වාධීනව වැඩ කරපු ආයතනයක් බව. 2022 අරගළයත් එක්ක මේ අය දේශපාලනිකව සම්බන්ධ වෙනවා, මේ ආණ්ඩුවේ දේශපාලන පක්ෂත් එක්ක; ඒ අයගේ ක්‍රියාමාර්ගයත් එක්ක. එතකොට ඒක ඉවර වුණාට පසුව මොකද වෙන්නේ? මේගොල්ලන්ට කියන්නේ "I agree" කණ්ඩායම කියලා. මේ "I agree" කණ්ඩායම, මොනවා හරි එකක් ගහපු ගමන් ඒගොල්ලන් "I agree" කියලා 10ක් විතර ගහපුවාම වැඩේ ඉවරයි. නමුත් දැන් මොකද වෙලා තිබෙන්නේ? මේ "I agree" කණ්ඩායමේ පළමු එක්කෙනා තමයි, අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමයේ හිටපු සභාපතිතුමා. අද එතුමා උතුරුමැද පළාත් ආණ්ඩුකාරයා. මොකක්ද ඒකට හේතුව? මේ ආණ්ඩුවේ දේශපාලන ව්‍යාපාරයත් එක්ක වැඩ කිරීම. එතුමා හිටපු විනිශ්චයකාරවරයෙක්. අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමයේ හිටපු සභාපති කෙනෙක්. ඊළඟ එක්කෙනා කවුද? චම්පා ජානකී විජේරත්න මැතිනිය. එතුමිය දානවා, සබරගමුවේ ආණ්ඩුකාරවරයා කරලා. එතුමියත් මේ සංගමයේ හිටපු සභාපති කෙනෙක්. එතකොට ඊළඟට හිටපු සභාපතිතුමා කවුද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්තුමා. එතුමාත් අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමයේ සභාපතිවරයෙක් විධියට වැඩ කරපු කෙනෙක්. අධිකරණ සේවා කොමිෂන් සභාවේ අද ලේකම් කවුද? එතුමාත් මේ අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමයේ සභාපති විධියට වැඩ කරපු කෙනෙක්. මෙච්චර කාලයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, මට තව විනාඩි කිහිපයක් ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට විනාඩියක් ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් web එකේ පළ කරනවා මේ transfers ගැන. නමුත් මේ වතාවේ web එකේ මුකුත් පළ කළේ නැහැ. තැන් තැන්වලට දැම්මා; තමන් කැමැති තැන්වලට දමා ගත්තා. සම්පූර්ණ වැරදි කාරණා ගණනාවක් මම ඔබතුමාට පෙන්වන්නම්. මේ සමහර ඉහළ, ජ්‍යෙෂ්ඨ අය අන්තිම ඈතකට දානවා. චතුරිකා ද සිල්වා මැතිනිය ගල්කිස්ස උසාවියට ඇවිල්ලා අවුරුද්දක්වත් නැහැ. සාමාන්‍යයෙන් අවුරුදු තුනක් සේවය කරන්න අවස්ථාව තිබෙනවා. හැබැයි, මොකද කරන්නේ? අවුරුද්දක්වත් නැහැ, එතුමියව මාරු කරනවා කෙළින්ම කැස්බෑවට. එතුමිය ජ්‍යෙෂ්ඨ කෙනෙක්. ඇයි, එතුමියට ඉන්න දුන්නේ නැත්තේ? හේතුව, වසන්ත සමරසිංහ මහත්තයාගේ නඩුව ඇහුවේ එතුමිය. එතුමිය තමයි කිව්වේ, මේ අයව අත්අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරන්න කියලා. නමුත්, ඒක වුණේ නැහැ. ඒක කළේ නැහැ, පොලීසිය. හැබැයි, ඒ නියෝගය දීලා සති දෙකක් ගියේ නැහැ, එතුමියව ඉවත් කළා.

ඊළඟට, ගල්කිස්ස අධිකරණය A Grade එකේ තිබුණු තැනක්. එතැනට දාන්නේ ඉහළ නිලධාරින්. නමුත් මම මෙතැනදී ඒ නම් කියන්න යන්නේ නැහැ. මේ වාගේම කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 4, 2හි ඉන්න දෙදෙනාම මේ අයට වැඩිය ජ්‍යෙෂ්ඨයි. ඒ දෙදෙනාගෙන් එක්කෙනෙක් දැම්මා, ඇඹිලිපිටියට. අනික් කෙනා දැම්මා, වැල්ලවායට. සාමාන්‍යයෙන් judge කෙනෙකුට හම්බ වෙන පළමුවෙනි ස්ථානය තමයි, මේ ස්ථානය. ඊට අමතරව, මම කියන්න කැමැතියි,-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ගල්කිස්ස අධිකරණයෙන් වසන්ත සමරසිංහ ඇමතිතුමා සම්බන්ධයෙන් දීපු තීන්දුව මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අධිකරණ නියෝගයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මොකක්ද, අධිකරණ නියෝගය?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නියෝගයක් දීලා තිබෙනවා අත්අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්න කියලා. *[බාධා කිරීමක්]* හරි, දැන් ඔබතුමා එහෙනම් කියන්නකෝ. කොළේ තිබෙනවාද ඔබතුමා ළඟ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔබතුමා නේ කිව්වේ. අධිකරණ නියෝගයක් තිබෙනවාද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා ඇවිද ඇවිද කථා කරන්න එපා. මා ළඟ තිබෙනවා. මම ඉදිරිපත් කරන්නම්. ඇවිද ඇවිද පාර දිගේ කථා කරන්න එපා. මෙහෙම දීලා සති 2ක් ගියේ නැහැ එතුමියව මාරු කෙරුවා. මම ඉදිරිපත් කරන්නම් තව ටිකකින් කොළේ ගෙනැල්ලා. එතකොට, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඊළඟට බලන්න, රාජිත සේනාරත්න මහත්මයාගේ නඩුව. දැන් මේක ආපුවාම ප්‍රධාන මහෙස්ත්‍රාත්තුමිය විධියට ඉන්න මහෙස්ත්‍රාත්තුමියගෙන් අපේක්ෂිත ඇපයක් ඉල්ලුවාම එතුමිය ඒක ප්‍රතික්ෂේප කරනවා. අපේක්ෂිත ඇපය දෙන්නේ නැහැ. ඊළඟට මොකද කරන්නේ? Warrant එකක් ඉල්ලනවා, ඒක ප්‍රතික්ෂේප කරනවා. එතකොට නිවාඩු දිනයක් වෙච්ච අඟහරුවාදා දවසක මේ මහෙස්ත්‍රාත්තුමිය ඉන්නකොට අල්ලස් කොමිසම Court No. 3 එකේ අතිරේක මහෙස්ත්‍රාත්තුමා ළඟට ගිහිල්ලා ඉල්ලීමක් කරනවා, වරෙන්තුවක් ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවදාකවත් තමන්ගේ Court House එකට පිට සිටින කෙනෙක් ළඟට ගිහින් ඉල්ලන්නෙත් නැහැ, අනික් එක, ඒක දෙන්නෙත් නැහැ. හැබැයි, මොකද වෙන්නේ? Court vacation එකේදී රාජිත සේනාරත්නව අත්අඩංගුවට ගන්නවා. අනික් එක තමයි, කොළඹ අංක 5හි හිටපු විනිසුරුතුමා ජ්‍යෙෂ්ඨ කෙනෙක්. එතුමා Court No. 2 එක ඉල්ලනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමාට අයිතියක් තිබෙනවා Court No. 2 එක ඉල්ලන්න. මොකද වෙන්නේ? එතුමාව එතැනට දමන්නේ නැහැ, එතුමාව යවනවා තව ටිකක් ඈතට. මේ විධියට ගත්තාම තව සිද්ධි ගණනාවක් තිබෙනවා. වෙලාව නැති නිසා මම ඒ ගැන කියන්නේ නැහැ. මේ වාගේ කරුණු ගණනාවක් තිබෙනවා කියන්න. මොකක්ද මේ කරන්නේ? "I agree" සෙට් එක තමයි මේ කරන්නේ, මේක fix කරලා.

ඒ විතරක් නොවෙයි, මේ දුන්න ඔක්කොම උසස්වීම් අරගෙන බලන්න. මොකද වුණේ? උසස්වීම් තිබුණේ 20යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, 35දෙනෙක් කැඳවනවා. පළමු වතාවට interview එකක් තියනවා. තියලා, මොකද වෙන්නේ? ඉතාම වැදගත්, මේ ලැයිස්තුවේ පළමු ස්ථානයේ ඉන්නේ ෆර්ඩිනැන්ඩස් මැතිනිය, එතුමියව ඉවත් කරනවා. ඊළඟට ලියනගේ මැතිතුමාව ඉවත් කරනවා. තුන්වැනියට ඉන්නේ හේවාවසම් මැතිතුමා. මේ විධියට ගත්තායින් පස්සේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් - Supra Grade එකේ ඉන්න කට්ටියව - එළියට විසි වෙනවා. ඊළඟට, ගෙනෙන්නේ කවුද? ජ්‍යෙෂ්ඨ අය පැත්තකට දාලා අද කොළඹ මහාධිකරණවලට දාලා තිබෙනවා, තමන්ට control එකක් තිබෙන, කවුරුහරි අපිව අරගෙන ආවොත් හෙට උදේ හිර කරන්න පුළුවන් විනිශ්චයකාරවරු. මම කියන්නේ නැහැ ඒ අය වැරදියට වැඩ කළාය කියලා. හැබැයි, මම අහන්නේ මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම fix කරලා මේ රටේ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්ද? ඒ නිසා අපට සිද්ධ වෙනවා දැන් ලංකාවෙන් පිටතට මේක අරගෙන යන්න. International Court of Justice එකට යන්න අපට සිද්ධ වෙයි; International Bar Association එකට යන්න වෙයි; Transparency International එකට යන්න වෙයි; World Justice Project එකට යන්න වෙයි. Latimer House Principlesවල බොහොම පැහැදිලිව තිබෙනවා.

මේ ක්‍රියාවලිය තුළ අපි අග්‍ර විනිශ්චයකාරතුමාගෙනුත් ඉල්ලනවා කරුණාකර මේ සම්බන්ධයෙන් බලන්න කියලා. ඒ වාගේම, මම ඉල්ලනවා මේ ගැන සොයා බලන්න කාරක සභාවක් පත් කරන්න කියලා. මොකද, මේ සිද්ධ වුණු අසාධාරණකම් තවදුරටත් සිද්ධ වෙන්න බැරි නිසා. මේ සම්බන්ධව මැදිහත් වෙන්න කියා අපි අග්‍ර විනිශ්චයකාරතුමාගෙනුත් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ඉතා බරපතළ චෝදනාවක් කළා. ගරු අධිකරණ සේවා කොමිෂන් සභාවේ සියලු මාරුවීම් සහ පවතින නඩු සම්බන්ධයෙන් එතුමා කථා කළා. ගරු අග විනිසුරුතුමා bench fix කරනවා කියලා කිව්වා. ගරු අග විනිසුරුතුමා NPP එකේ මන්ත්‍රීවරුන් කියන විධියට වැඩ කරනවා කියලා බරපතළ චෝදනාවක් කළා. මෙතුමා වගකීමෙන්ද කරන්නේ අග විනිසුරුතුමාට කරන ඒ චෝදනාව? දේශපාලනික පාර්ශ්වකරුවෙක් කියලා අග විනිසුරුතුමාටයි මේ චෝදනා කරන්නේ. මේක බරපතළ චෝදනාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසි වෙලාවක මම,-*[බාධා කිරීමක්]* ඒක තමයි, අහගෙන ඉන්න මේ කථාව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථා කරන්න. හැබැයි, ඉතා කෙටි කාලයක් ගන්න. තත්පර 30ක් දෙන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අග්‍ර විනිශ්චයකාරතුමා bench fix කරනවාය කියලා මම කිසි වෙලාවක, කවදාවත් කිව්වේ නැහැ. ඒක එතුමිය තමයි කිව්වේ. එතුමිය කථාව අහගෙන හිටියා නම්,- *[බාධා කිරීමක්]* ඒක හරියට අහගෙන හිටියා නම්,- *[බාධා කිරීමක්]* නැහැ, ඔබතුමිය අහගෙන සිටියේ නැහැ නේ. මම කිසි වෙලාවක අග විනිසුරුතුමා bench fix කරනවාය කියලා කිව්වේ නැහැ. ඒක සම්පූර්ණ වැරදි කථාවක්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට දැනගන්න පුළුවන්ද,-*[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග 92 (2) යටතේ රීති ප්‍රශ්නයක් මම අහන්නේ. මගෙන් විතරක් අහනවා මොකක්ද, point of Order එක කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා පිට ඉඳලා නේ මේ කථා කරන්නේ. ඒකයි මම මේ කියන්නේ. ඔබතුමා මේ සාකච්ඡාවේ නොවෙයි නේ සිටියේ. ඒකයි කියන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. මම අහන්නේ මේකයි. ඔබතුමා මෙතුමියට point of Order එක දුන්නේ කොයි ආකාරයෙන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක කථාවකට දීපු උත්තරයක් නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එයාට එහෙම උත්තර දෙන්න බැහැ. එහෙම point එකක් නැහැ කොහේවත්. එයාට එහෙම උත්තර දෙන්න බැහැ. එයාගේ නම සටහන් කරලා නැහැ. එහෙම මොකක් හරි හේතුවක් තිබෙන්න ඕනෑ. මාව එක දවසක් එළියට දැම්මා, point of Order එකක් අහපු එකට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම නම් ඔබතුමා තත්පර 30ක කාලයක් ගන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කරුණාකරලා මට මේක කියන්න. Hon. Presiding Member, මම එක දවසක් just for raising a point of Order, one Presiding Member ordered me out of Parliament. මේ බලන්න, දැන් මුකුත්ම හේතුවක් නැතිව විනාඩි එකහමාරක් නිකම්ම කථා කරනවා. එතකොට ඒ point එක දුන්නේ කොයි ආකාරයෙන් ද? ආණ්ඩුවට එක නීතියක්, අපට එක නීතියක් ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. මට ඒක තීරණය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ සඳහා මට අවස්ථාව තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීමක්]*

මීළඟට, ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා. -*[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[பி.ப. 3.55]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தண்டனைச் சட்டக்கோவை (திருத்தம்)சட்டமூலம்மீது நாங்கள் உரையாற்றிக் கொண்டிருக்கின்றோம்.

> "எந்தக் குழந்தையும் நல்ல குழந்தைதான் மண்ணில் பிறக்கையிலே
> பின் நல்லவராவதும் தீயவராவதும் அன்னை வளர்ப்பதிலே"

என்று ஒரு பாடல் வரிகள் இருக்கின்றது. உண்மையிலே இன்றைய தினம் கொண்டுவரப்பட்டிருக்கின்ற தண்டனைச் சட்டக்கோவை திருத்தச் சட்டமூலமானது மிகவும் அத்தியா வசியமான ஒன்றாகக் காணப்படுகின்றது. குழந்தையைப் பற்றி அல்லது குழந்தைப் பருவம் பற்றி பல்வேறு அறிவிய லாளர்கள், உளவியலாளர்கள் பல்வேறுபட்ட கருத்துகளை முன்வைத்திருக்கிறார்கள். அந்த வகையிலே, மிகவும் பிரபல்யமான உளவியலாளரான சிக்மண்ட் பிராய்ட் அவர்களால் முன்வைக்கப்பட்ட சில கருத்துகளை இந்தச் சபையிலே கூற விழைகின்றேன்: "ஒரு பெரியவரின் உள்ளார்ந்த மனம் குழந்தைப் பருவத்தில் பெற்ற அனுபவங் களின் கண்ணாடிதான். குழந்தைப் பருவத்தில் அடக்கப்பட்ட உணர்ச்சிகள் பின்னர் வாழ்நாளில் பல நிலைகளிலும் வெளிப்படும். குழந்தைகளின் மனதைப் புரிந்துகொள்வது மனித மனவியல் முழுவதையும் புரிந்துகொள்ளும் முதல் படியாகும். கனவுகள் என்பது சிறு வயது ஆசைகளின் நிறைவேற்றமே!" என்று அவர் குறிப்பிட்டுள்ளார். இவ்வாறாகப் பல்வேறு உளவியலாளர்கள் இந்தக் குழந்தைப் பருவத்தைப் பற்றி கூறியிருக்கிறார்கள்.

ஆனால், எமது நாட்டிலே சிறுபராயம் என்று கூறப்படும் பிறப்பிலிருந்து 18 வயது வரையிலான குழந்தைப் பருவத்திலே சிறுவர்கள் பல்வேறு இடங்களில் பல்வேறு சந்தர்ப்பங்களிலே உடலியல் ரீதியான, உளவியல் ரீதியான பல்வேறுபட்ட துஷ்பிரயோகங்களுக்கும் தண்டனைகளுக்கும் உள்ளாக்கப் படுவதை அறிகிறோம். குறிப்பாக இவ்வாறு உடலியல் ரீதியான அல்லது உளவியல் ரீதியான தண்டனைக்கு உட்படுகின்ற பிள்ளைகள் யாரென்று பார்ப்போமானால், அவர்கள் பெற்றோரது அரவணைப்பு இல்லாத பிள்ளைகளாக இருப்பார்கள் அல்லது பெற்றோரை இழந்த பிள்ளைகளாக இருப்பார்கள் அல்லது தாய், தந்தை வெளியிடங்களில் சென்று வேலை செய்பவர்களின் பிள்ளைகளாக இருப்பார்கள். அதுமட்டுமல்லாமல், சமூகத்தால் அல்லது ஏனைய சாதி, மத வேறுபாடுகளினால் ஏற்படுத்தப்படுகின்ற செயற்பாடுகளின் மூலம் தண்டனைகள் வழங்கப்பட்ட பிள்ளைகளாக இருப்பார்கள். இவ்வாறு பல்வேறு சந்தர்ப்பங்களிலே சிறுவர்கள் உடலியல் ரீதியாகவும் உளவியல் ரீதியாகவும் தண்டனைக்கு உட்படுத்தப்படுகிறார்கள். எனவே, இவ் வாறான சந்தர்ப்பங்களை ஏற்படுத்திக்கொள்பவர்களுக்கு எதிரான நடவடிக்கைகளுக்கு மேற்படி தண்டனைச் சட்டக் கோவைத் திருத்தம் முறையான ஒரு செயற்பாடாக இருக்கும்.

உதாரணமாக, சிறுவர் இல்லங்கள், பாடசாலைகள், வீடுகள் மற்றும் அவர்கள் வசிக்கின்ற சமூகங்களில் சிறுவர்கள் பல்வேறு உடலியல் ரீதியான தண்டனைக்கு உள்ளாவதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. இந்தத் தண்டனைகள் நிச்சயமாக அவர்கள் தமது எதிர்காலத்திலே வேறுவிதமாகப் பிரதிபலிக்கக் காரணமாகின்றது. தற்பொழுது எங்களுடைய நாட்டிலே போதைப்பொருள் பாவனை, மது

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

பாவனை மற்றும் சட்டத்திற்கு முரணான ஏனைய ஏற்றுக்கொள்ள முடியாத விடயங்களைச் சிறுவர்களோ அல்லது அதற்கு மேற்பட்ட வயதினரோ மேற்கொள்கிறார்கள் என்றால், சிறு வயதில் உளவியல் ரீதியாகவும் உடலியல் ரீதியாகவும் வழங்கப்பட்ட தண்டனைகளின் பிரதிபலிப்பே அவர்களிடமிருந்து இவ்வாறு வெளிப்படுகின்றது.எனவே, அனைத்தும் அறிந்த பெரியவர்கள் என்ற வகையிலே சிறுவர்களைப் பாதுகாக்க வேண்டிய தலையாய கடமை எங்களுக்கு இருக்கின்றது. எனவே, இந்த உயரிய சபையிலே இருக்கின்ற அனைவரும் ஒருமித்த குரலாக இந்தத் திருத்தத்தை ஆமோதிப்பது வரவேற்கத்தக்க விடயமாகும்.

இன்று சிறுவர்களைத் தொழிலுக்கு அமர்த்துவதைப் பல இடங்களிலும் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அங்கும் இவர்கள் தண்டனைக்கு உட்படுத்தப்படுகிறார்கள். இதுகூட மிகவும் மோசமான ஒரு நிலைமையாகும். Infant age என்று சொல்லப்படுகின்ற பிறந்ததிலிருந்து இரண்டு வயதுவரையான குழந்தைப் பருவத்தினர் தங்களுடைய விருப்பங்களை அல்லது எதிர்பார்ப்புகளை அழுகையின்மூலம்தான் வெளிப்படுத்து கின்றார்கள். ஆனால், சில பெற்றோர்கள் அல்லது பாதுகாவலராக இருப்பவர்கள், தங்களுடைய வேலைப்பளு, மன அழுத்தங்கள் காரணமாக, குழந்தைகளின் உணர்வுகளைப் புரிந்துகொள்ளாமல் பல சந்தர்ப்பங்களில் அவர்களுக்கு உடல்ரீதியான தண்டனைகளை வழங்குகின்றார்கள். அந்தக் குழந்தைகளுக்கு எதுவுமே புரிந்துகொள்ள முடியாத வயது! இவ்வாறான வயதிலேயுள்ள பிள்ளைகள்மீது அவர்கள் தம் பளுக்கள், மனவெழுச்சிகள் போன்ற காரணங்களால் ஏற்படுகின்ற அழுத்தத்தைக் காண்பிக்கின்ற நிலைப்பாடு இப்போது பரவலாகக் காணப்படுகின்றது.

அதற்கடுத்த பருவமான இரண்டிலிருந்து ஆறு வயது வரையான பருவத்தை நாம் early childhood என்று சொல்லுவோம். இப்பருவத்திலுள்ள பிள்ளைகள் மிகுந்த உணர்ச்சி வசப்படுபவர்களாகவும் தங்களுடைய விருப் பங்களை, ஆசைகளை, எதிர்பார்ப்புகளைப் பெற்றோர்கள் மூலம் நிறைவேற்ற வேண்டுமென்ற அல்லது தங்களைப் பராமரிப்பவர்கள் தங்களுடைய விருப்பங்களை, ஆசைகளை நிறைவேற்ற வேண்டுமென்ற எதிர்பார்ப்புடன் இருப்பவர்கள். இவர்கள் ஒரு சிறிய எதிர்பார்ப்புடன் ஒரு விடயத்தைச் செய்தாலும் அந்த எதிர்பார்ப்பு நிறைவேற்றப்படாத சந்தர்ப்பத்தில் அவர்களுடைய பிரதிபலிப்பு எதிர்மறை யானதாக இருக்கும். இதன் காரணமாக, அவர்கள் தண்டனைக்கு உள்ளாக்கப்படுகின்றார்கள். எனவே, நிச்சயமாக இந்த வயதுக்குட்பட்ட பிள்ளைகளின் பராமரிப்பில் பெற்றோர்களின் கணிசமான பங்களிப்பு தேவையாக இருக்கின்றது. ஆனால், நாங்கள் என்ன செய்கின்றோம் என்றால், இரண்டு - இரண்டரை வயதிலேயே அந்தக் குழந்தைகளை daycare centreஇல் அல்லது nurseryஇல் கொண்டுபோய் விடுகின்றோம். உண்மையிலே, இந்த வயதுப் பிரிவிலுள்ள குழந்தைகள் தாய், தந்தையினரின் அரவணைப்பில் இருக்க வேண்டியவர்கள். இவ்வாறு daycare centres, nurseries போன்ற இடங்களில் அவர்களைக் கொண்டுசென்று விடுகின்றபோது, அவர்கள் தண்டனை களுக்குள்ளாகின்றார்கள். அதேபோல, பள்ளிப் பருவத்திலே பல்வேறு வகையான எதிர்பார்ப்புகளோடு பாடசாலைக்குள் நுழைகின்ற பிள்ளைகள் அங்கும் தண்டனைகளுக்கு ஆளாகின்றார்கள். அவர்களுடைய எதிர்பார்ப்புகள் மற்றும் வாய்ப்புகள் தட்டிப் பறிக்கப்படுகின்றன.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයක් තිස්සේ යූටියුබ් නාළිකා ගණනාවකිනුත් විවිධ මඩ ප්‍රචාර ගෙනිච්චා, ව්‍යාජ ප්‍රචාර ගෙනිච්චා, මමත්, වසන්ත සමරසිංහ ඇමතිතුමාත්, ඒ වාගේම රන්ජන් ජයලාල් නගරාධිපතිතුමාත් අත්අඩංගුවට ගන්න ගල්කිස්ස උසාවියෙන් නියෝගයක් දීලා තිබෙනවා කියලා.

"නීතිඥ දයාසිරි ජයසේකර" කියලා තමයි මෙතුමාගේ නම සඳහන් කරන්නේ. මම මීට කලිනුත් ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්නටත් අභියෝග කළා, තිබෙනවා නම් කොහේ හරි එවැනි උසාවි නියෝගයක්, ගෙනැල්ලා සභාගත කරන්න කියලා. එවැනි බොරු කියන්න එපා. කොහේද එහෙම එකක් තිබෙන්නේ? උසාවි නියෝගය සභාගත කරන්න ඕනෑ. මොකක්ද උසාවිය කිව්වේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගෙනුත්, වසන්ත සමරසිංහ සහෝදරයාගෙනුත්, ඒ වාගේම රන්ජන් ජයලාල් සහෝදරයාගෙනුත් ප්‍රකාශ සටහන් කර ගන්න කියලායි. ප්‍රකාශ සටහන් කර ගන්න කියලා කිව්වා, අගෝස්තු 22ට පෙර. අපි තිදෙනාම ගිහිල්ලා ප්‍රකාශ ලබා දීලා තිබෙනවා, ඒ සිද්ධිය සම්බන්ධයෙන්. ඒ සිද්ධිය එකින් එක, එකින් එක කියන්න මේක වෙලාවක් නොවෙයි. ඕනෑ නම් එහෙමත් කියන්න පුළුවන්.

කම්කරු දෙපාර්තමේන්තුවට වංචා කරලා, ජෝන් සෙනෙවිරත්න හිටපු ඇමතිවරයා තමන්ගේ දේශපාලන බලය පාවිච්චි කරලා වැරැදි විධියට වෘත්තීය සමිතියක එක පාර්ශ්වයක් ලියාපදිංචි කරවලා- *[බාධා කිරීමක්]* එහෙම කරපු වංචනික ක්‍රියාවක්. ඒක කම්කරු කොමසාරිස් ජනරාල්වරයා නිකුත් කරපු ලිපි දෙකක ඉතාම මැනවින් සඳහන් කරලා තිබෙනවා. ඒ නිසා කාරණය හරි පැහැදිලියි. මම challenge කරනවා - අභියෝග කරනවා - එතුමාට. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා, "නීතිඥ" බෝඩ් එක ගහගෙන ඇවිල්ලා හැමදාම මෙතැන බොරු කියන්න එපා. මේක දැන්වත් නිවැරැදි වෙන්න ඕනෑ. එවැනි කිසිදු තීන්දුවක් දීලා නැහැ. ඒ නිසා අපි ඉතාම කරුණාවෙන් ඉල්ලනවා, තවදුරටත් මෙවැනි වැරැදි ප්‍රචාර කරන්න එපා කියලා. ඒ වාගේම, මේ කරපු වැරැදි ප්‍රකාශය වහාම ඉල්ලා අස්කර ගන්න ඕනෑ. දයාසිරි ජයසේකර ගරු මන්ත්‍රීතුමා වහාම ඉල්ලා අස්කර ගන්න ඕනෑ, ඒ ප්‍රකාශය. තවදුරටත් පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා බොරු කියන්න එපා කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගිය දෙසැම්බර් 18වැනි දා නිලුපුලී ද සිල්වා මැතිනිය Fort Magistrate's Court එකේ දුන්නු තීන්දුවේ තමයි මේක තිබෙන්නේ. මම ලබන සිකුරාදා වෙනකොට ඒක සභාගත කරනවා. ඒ නිසා- *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
දැන් ඒක ළඟ නැද්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක දැන් මගේ අතේ තිබුණා නම් මම සභාගත කරනවා. මගේ ළඟ තිබුණා document එක. -*[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා. -*[බාධා කිරීමක්]* ඔබතුමා ගල්නෑවේ ගිහිල්ලා කලිසම, -*[බාධා කිරීමක්]* කලිසම, කලිසම?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මොකක්ද කලිසම?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
2006දී? 2006දී

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]* මම ඒක ගැන පස්සේ කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සිකුරාදාට- *[බාධා කිරීම්]* සිකුරාදාට මම ඒක අනිවාර්යයෙන්ම සභාගත කරනවා, උදේම. එතකොට ඒක ගැන කථා කරන්න පුළුවන්. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔහොම තමයි. මොකක් හරි කියලා උත්තර දීගන්න බැරි වුණාම - *[බාධා කිරීම්]* උත්තර දීගන්න බැරි වුණාම වෙන මොනවා හරි බයිලා ගහනවා. *[බාධා කිරීම්]* වෙන මොනවා හරි බයිලා ගහනවා. *[බාධා කිරීම්]* වෘත්තීය ආචාර ධර්ම කියලා දෙයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. වෘත්තීය ආචාර ධර්ම. නීතිඥ වෘත්තියේ ආචාර ධර්මත් කෙළෙසනවා. *[බාධා කිරීමක්]* නොදීපු නඩු තීන්දුවක් ගැන,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක නවත්වන්න දැන්. අපි කිව්වා, ඒක ගෙනැල්ලා දෙන්නම් කියලා, සිකුරාදාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි විවාදයේ කටයුතු කරගෙන යමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සිකුරාදාට කලින්,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි ඉතින්, සිකුරාදාට ගෙනැත් දෙන්නම්. කලබල වෙන්න එපා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිකම් නිකම් උදාහරණයකට කියපු එකක් විතරක් නොවෙයි. ඒ සිදුවීම මත පදනම් වෙලා තමයි ගල්කිස්ස මහෙස්ත්‍රාත්තුමිය මාරු කළේ කියන කථාවක් නේ කිව්වේ. දැන් කිව්වා නේ, ගල්කිස්ස මහාධිකරණයේ නියෝගය ඉදිරිපත් කරන්නම් කියලා. වසන්ත සමරසිංහ ඇතුළු මේ තිදෙනා අත්අඩංගුවට ගන්න කියලා ගල්කිස්ස මහාධිකරණය නියෝගයක් ලබා දීලා නැහැ. එතකොට දැන් කියන්නේ මොකක්ද? ඒ නියෝගය නිසා තමයි මහෙස්ත්‍රාත්තුමිය මාරු කළේ කියලා,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අධිකරණය-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අධිකරණය.ආ, මහෙස්ත්‍රාත් අධිකරණයෙන් මහෙස්ත්‍රාත්තුමිය මාරු කළේ කියලා කියනවා- *[බාධා කිරීමක්]* ඒක නේ මේ කථාවේ හරය වුණේ. අපි කියන්නේ, කරුණාකරලා අත්අඩංගුවට ගන්න කියලා කියපු ඒ නියෝගය ඉදිරිපත් කරන්න; එහෙම නැත්නම් ඒ කරුණු මත පදනම් වෙලා ගොතපු කථාව ඉවත් කර ගන්න කියලා. දැන් මෙතැන, අධිකරණයේ සම්පූර්ණ ක්‍රියාවලියට ආණ්ඩුව මැදිහත් වෙනවා කියලා නේ කථා කරන්න ගත්තේ. අධිකරණ සේවා කොමිෂන් සභාව තමයි මාරු කිරීම කරලා තිබෙන්නේ. ඒක අපේ එකක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම පැහැදිලිව කිව්වා,- *[බාධා කිරීමක්]* මම පැහැදිලිව කිව්වා, ලබන සිකුරාදා වෙනකොට ඒක ඉදිරිපත් කරනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. අනිද්දා; ලබන සිකුරාදා. *[බාධා කිරීමක්]* අනිද්දා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම තත්පර 30යි ගන්නේ. *[බාධා කිරීම්]* සිකුරාදාට මේ කියන නඩු තීන්දුව ඉදිරිපත් කරන්න බැරි වුණොත් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එදාට මොකක්ද කරන්නේ කියලාත් අපට, මේ සභාවට කියන්න. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හැමදාම බොරු කිව්වේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මෙහෙමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිකම් බොරු කියලා වැඩක් නැහැ නේ. *[බාධා කිරීම්]* Document එක තිබෙන හින්දා තමයි- *[බාධා කිරීම්]* තිබෙන හින්දා- *[බාධා කිරීම්]* ඉන්න, ඉන්න, කලබල වෙන්න එපා. ඔබතුමන්ලා ඔයිට වැඩිය බොරු කියලා නේ මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* මම බොහොම පැහැදිලිව කිව්වා, සිකුරාදා උදේට මම ඒක ඉදිරිපත් කරනවා කියලා. *[බාධා කිරීම්]* ඉදිරිපත් නොකළොත් කියලා එකක් නැහැ; කරනවා. එච්චරයි. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අනිද්දා ඒ කටයුත්ත ඉවර කරමු. *[බාධා කිරීම්]* දැන් අපි සභාවේ කටයුතු කරගෙන යමු. *[බාධා කිරීම්]* ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சிறுவர்களுக்கு உடல் ரீதியான தண்டனை வழங்குவதில் காத்திரமான பங்கினை ஆசிரியர்கள் மற்றும் பெற்றோர்களே வகிக்கின்றனர். எனவே, தண்டனை வழங்குவதற்குப் பதிலாக அன்பாகவும் அரவணைப்புடனும் நடந்துகொண்டு, அவர்களது விருப்பங்களுக்குச் செவிசாய்த்து, அவர்களது நியாயமான தேவைகளை நிவர்த்தி செய்வதன்மூலம் அவர்களிடமிருந்து எதிர்விளைவான விடயங்கள் ஏற்படுவதைத் தவிர்த்துக் கொள்ளலாம்.

இறுதியாக, நான் இங்கு ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். 'குழந்தைகளின் உளவியல்' என்பது வெறும் கோட்பாடல்ல! அது நாளைய சமுதாயத்தின் எதிர்காலத்தை வடிவமைக்கும் கருவி! ஒவ்வொரு வயதிலும் குழந்தைகளின் உணர்ச்சி, அறிவு, நடத்தை ஆகியவை தனித்துவமாக வளர்கின்றன. அந்த வளர்ச்சியைப் புரிந்துகொண்டு அன்பும் கவனமும் வழிகாட்டல்களும் வழங்கினால், அவர்கள் மன ஆரோக்கியமுள்ள, பொறுப்புள்ள குடிமக்களாக வளர்வார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு இன்னும் முப்பது செக்கன் தாருங்கள்!

காலையிலே இங்கு உரையாற்றிய எதிர்க்கட்சியைச் சார்ந்த வன்னி மாவட்ட பாராளுமன்ற உறுப்பினர் ஒரு விடயத்தைக் கூறியிருந்தார். அதாவது, செட்டிக்குளம் பிரதேச சபையின் கீழுள்ள வீதிகளின் அபிவிருத்திக்குத் தன்னிச்சையாகவும் பக்கச் சார்பாகவும் நிதி ஒதுக்கப்பட்டுள்ளதாக அவர் கூறியிருந்தார். அது தொடர்பான பட்டியல் இப்போது என்னிடம் இருக்கின்றது. நாங்கள் அனைத்து வட்டாரங் களுக்கும் சம அளவிலேதான் ஒதுக்கீடுகளைச் செய்திருக் கின்றோம். கிராமப்புற வீதிகளைப் புனரமைப்பதற்காக வழங்கப்பட்ட 200 மில்லியன் ரூபாய் நிதியிலிருந்து அனைத்து வட்டாரங்களுக்கும் ஒதுக்கப்பட்டிருக்கின்ற அதே வேளை, கூடுதலான தொகையைச் செட்டிக்குளம் பிரதேச சபைக்கு ஒதுக்கியிருக்கின்றோம். ஆனால், அரசியல் நோக்கத்துக்காக, ஒதுக்கப்பட்ட நிதியைப் பயன்படுத்த முடியாதென அந்தப் பிரதேச சபைத் தவிசாளர் கூறியிருக் கின்றார். நான் இங்கே ஒன்றைக் கூற விரும்புகின்றேன். இந்தப் பிரதேசத்தின் வீதிகளிலே நாங்கள் மட்டுமா பயணிக்கப் போகின்றோம்? அனைவரும்தான்! இந்த வருடத்துடன் வீதிப் புனரமைப்பு நிறைவேறப் போகின்றதா? அடுத்த வருடமும் நடைபெறும். நாங்கள் அனைத்து விடயங்களையும் அனைவருக்கும் சமமாகச் செய்வோம்! இதில் எந்தவித பாரபட்சமோ, அரசியலோ கிடையாதென்பதை அந்த உறுப்பினருக்குக் கூறி, எனது உரையை முடிக்கிறேன். நன்றி, வணக்கம்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද මාරුවීමක් සම්බන්ධයෙන් නේ මේ සාකච්ඡාව සිදු වුණේ. එතකොට මෙතුමා කියපු කථාව, මෙතුමාට ඔප්පු කර ගන්න වෙන්නේ සිකුරාදාට නම්, මාධ්‍ය මඟින් මේ කථාව පමණක් ප්‍රචාරය වුණාම, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාවකට චෝදනාවක් එල්ල වෙලා,

ඒ චෝදනාව පමණක් ජනතාවට ගිහිල්ලා තිබෙනවා. මෙතුමාට ඒක ඔප්පු කරන්න වෙන්නේ සිකුරාදාට; හෙටත් නොවෙයි සිකුරාදාට. ඒක සිකුරාදාට ඔප්පු කරගන්න බැරි වුණොත් එහෙම, අවසානයේ මෙතුමා කරපු චෝදනාව අධිකරණ සේවා කොමිෂන් සභාව මත පමණක් ඉතිරි වෙලා තිබෙනවා. මේ ගැන සැලකිලිමත් වෙන්න ඕනෑ කියලා මම හිතනවා. මම හිතනවා, ඒක බරපතළ ගණයේ චෝදනාවක් කියලා. ඒ සිදුවීම පදනම් කරගෙන තමයි මහෙස්ත්‍රාත්තුමිය මාරු කළේ කියලා මෙතුමාට කියන්න පුළුවන් නම්, දැන් ඒ තීන්දුවේ පිහිටලා ඉන්න. එහෙම බැරි නම්, "මම ඒක ඔප්පු කරන තුරු මම කියපු දේ ඉල්ලා අස් කර ගන්නවා" කියලා කියන්න. එතකොට මාධ්‍යවලින් ඒ කථාව ඉවත් කරාවි. නැත්නම්, මෙහෙම සමාජගත වෙච්ච මතයක් දවස් දෙකක් ගියාට පස්සේ - සිකුරාදා මෙතුමා කිව්වාට - reverse කරන්න බැහැ නේ. මේක අධිකරණය සම්බන්ධ ප්‍රශ්නයක් නිසා ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගෙන, සිකුරාදාට පුළුවන් නම් ඒක ඔප්පු කරලා පෙන්වන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ කරන අභියෝගය තමයි මහින්ද ජයසිංහ මැතිතුමා ඇතුළු පිරිස අත්අඩංගුවට ගන්න කියලා නියෝගයක් තිබෙනවා නම් ඒක පෙන්වන්න කියන එක. ඒක තමයි මට කිව්වේ. ඒක මම ඉදිරිපත් කරනවා. තව විනාඩි 5ක්, 10ක් යනකොට ඒක මගේ අතට ආවොත් මම ඒක අදම ඉදිරිපත් කරන්නම්. නැත්නම් සිකුරාදා තමයි ඒක මගේ අතට ගන්න පුළුවන්. මොකද, මම හෙට එන්නේ නැති නිසා.

අනෙක් කාරණය මේකයි. සාමාන්‍යයෙන් මහෙස්ත්‍රාත්තුමියක් අවුරුදු 3ක් එක අධිකරණයක වැඩ කරනවා. මේ මහෙස්ත්‍රාත්තුමිය ඉල්ලන්නේ නැතිව හෝ වෙනත් කාරණයක් නැතුව සාමාන්‍යයෙන් මාරුවීමක් දෙන්නේ නැහැ. මේ කරුණු දිගින් දිගටම සිද්ධ වෙනවා අපි දැක්කා. ඒ නිසා තමයි ඇය මාරු කරලා තිබෙන්නේ කියන කාරණය අපට හිතාගන්න සිද්ධ වෙනවා. ඒකයි මම කිව්වේ. මට වගකීම තිබෙන්නේ, ඒ අත්අඩංගුවට ගැනීම සම්බන්ධව තිබෙන ඒ Order එක පෙන්වන්න කියලා නේ. ඒක නේ මට කිව්වේ. ඒක මම ඉදිරිපත් කරනවා අනිවාර්යයෙන්. ඒක ගැන කිසි ගැටලුවක් නැහැ. නමුත් මේ සමස්ත කාරණය පිළිබඳව, මේ මාරු කිරීම් පිළිබඳව විශාල අසාධාරණකම් සිද්ධ වෙනවාය කියලා මම කිව්වා. ඒක ඒ විධියටම තිබෙනවා. ඒක ගැන කිසි ගැටලුවක් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසන්ත සමරසිංහ ඇමතිතුමා අත්අඩංගුවට ගැනීමට නියෝග කිරීම නිසා තමයි මහෙස්ත්‍රාත්තුමිය මාරු කළේ කියලා මෙතැනදී බොහොම පැහැදිලිව කිව්වා. මන්ත්‍රීතුමා, ඒක කිව්වේ නැද්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බලන්න. දැන් බලන්නකෝ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතාර**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හැන්සාඩ් එකේ තිබෙනවා; record වෙලා තිබෙනවා. ඔබතුමා කියපු කාරණය තමයි, මහෙස්ත්‍රාත්තුමිය මාරු කරන්න හේතු වුණේ වෙන කාරණා නොවෙයි, වසන්ත සමරසිංහ ඇමතිතුමා අත්අඩංගුවට ගන්න කියලා නියෝගයක් කළාය කියන එක. ඒක හරි පැහැදිලියි නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කියපු එක මේ. එහෙම නොවෙයි නම් mike එක අරන් දැන් කියන්න, එහෙම නොවෙයි කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට ඒක මෙතැන දැන් ආයේ කියන්න වුවමනාවක් නැහැ. දැන් එතුමාම කියනවා නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
නැහැ. ඔබතුමා කියපු එක කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමා ම කියනවා, ඒක නිසාම තමයි මාරු කළේ කියලා. මම කියන්න ඕනෑ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම කියන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* එතුමාමයි කියන්නේ. මම කියපු එකක් ආයේ ඉල්ලා අස්කරගන්න වුවමනාවක් නැහැ. මම කියපු එක ඒ විධියටම තිබෙනවා. එච්චරයි. *[බාධා කිරීමක්]* නැහැ. මම ඒ කියපු එක ඒ විධියටම තිබෙනවා. ඔබතුමා ඒක අරගෙන බලන්නකෝ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
දැන් කියන්න, ඒ කියපු දේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ. මට ආයේ කියන්න වුවමනාවක් නැහැ. *[බාධා කිරීමක්]* නැවත නැවත කියන්න වුවමනාවක් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
දැන් කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තමුන්නාන්සේලා මේ අධිකරණ ක්ෂේත්‍රයට කරන විනාශය අපි කිව්වා. *[බාධා කිරීම්]* Fix කරන්න කට්ටිය දාන හැටි. *[බාධා කිරීමක්]* නීතිඥයෝ ගිහිල්ලා කථා කරන ඒවා තිබෙනවා. ඒවාත් මම කිව්වා. ඒ නිසා මම ඒක ඉල්ලා අස්කරගන්න සූදානම් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි. ඔබතුමා සිකුරාදා ඒක ගෙනැල්ලා පෙන්වන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම බොහොම පැහැදිලිව ඒක කිව්වා, මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි. මහින්ද ජයසිංහ මැතිතුමා මට අභියෝගයක් කළා, ඒ document එක ඉදිරිපත් කරන්න කියලා. මම ඒක ඉදිරිපත් කරනවා. එච්චරයි. මම ඒ කරපු කථාව ආයේ ඉල්ලා අස්කරගන්න අවශ්‍යතාවක් නැහැ. ඔයිට වැඩිය කථා කිව්වා නේ. එතුමා කියලා තිබෙනවා නේ, ඉන්දියාව තමයි පාස්කු ප්‍රහාරය පිටිපස්සේ හිටියේ කියලා. දැන් කියන්න එහෙම නැහැයි කියලා. දැන් කියන්න ඉන්දියාව නොවෙයි පාස්කු ප්‍රහාරය පිටිපස්සේ හිටියේ කියලා. Mike එක දෙනවා, දැන් කියන්න. Mike එක දෙනවා දැන් කියන්න. ඉන්දියාව පාස්කු ප්‍රහාරය පිටිපස්සේ හිටියා කියලා තමුන්නාන්සේ කිව්වා. තමුන්නාන්සේ කිව්වේ. දැන් නැහැයි කියලා කියන්න, එහෙම නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපි වෙන මාතෘකාවලට යන්න වුවමනා නැහැ. අපි-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම කියන්න එපා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මේ, ඔබතුමා විනාඩි 10කට කලින් කියපු දේ. "ගල්කිස්ස මහෙස්ත්‍රාත්තුමිය මාරු කළේ වසන්ත සමරසිංහ ඇමතිතුමා අත් අඩංගුවට ගන්න නියෝගයක් දීපු නිසාය" කියන එක ආයේ කියන්න බැරිද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් මම-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඇයි, ඇයි? කෙකර ගාන්නේ මොකද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ. නැහැ. මම කියන්නේ-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට mike එක දීලා අහන්න බලන්න. එතුමාට mike එක දෙන්නකෝ. දෙන්නකෝ. Mike එක දෙන්නකෝ. දෙන්නකෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමාට mike එක දෙන්නකෝ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, දැන් මම ඔය කථාවම තමයි ඔබතුමාට කියන්නේ. ඔබතුමා කියන්න, ඉන්දියාව පාස්කු ප්‍රහාරය පිටිපස්සේ හිටියේ නැහැ කියලා. *[බාධා කිරීම්]* දැන් කියන්නකෝ. *[බාධා කිරීම්]* දැන් කියන්න. ඔබතුමා ඔය මගෙන් අහනවා වාගේම අනෙක් පැත්තටත් කියන්න. ඔබතුමා කියන්න, ඉන්දියාව නොවෙයි මේක පිටිපස්සේ හිටියේ කියලා. . ඔබතුමා කිව්වා, ඉන්දියාව තමයි පාස්කු ප්‍රහාරය පිටිපස්සේ හිටියේ කියලා, මීට කලින්. ඔබතුමා කිව්වා නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එහෙම නොවෙයි නේ. *[බාධා කිරීම්]* බැහැ නේ. වැඩක් නැහැ. ඔබතුමා කියපු එක ඔබතුමාට කියන්න බැහැ නේ. *[බාධා කිරීම්]* දැන් කියන්න බැරිද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි මේ සභාවේ කටයුතු නියමිත වෙලාවට අවසන් කරන්න ඕනෑ. ඒ නිසා සභාවේ කටයුතු පවත්වාගෙන යමු. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔබතුමා කියපු එක දැන් ඔබතුමාට කියන්න බැහැ නේ. දැන් කෙකර ගානවා නේ. බය නැත්නම් කියන්නකෝ. බය නැත්නම් කියන්නකෝ, මහෙස්ත්‍රාත්තුමිය මාරු කළේ ඒක නිසා කියලා. ඔබතුමාට කියන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාවේ කටයුතු කරගෙන යන්න ඕනෑ නිසා කරුණාකරලා ඔබතුමන්ලා වාඩි වෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අධිකරණයට අපහාසයක් කරලා, අධිකරණ සේවා කොමිසමට අපහාසයක් කරලා දැන් ඔප්පු කරගන්න බැරුව ඉන්නේ. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් බැරුව ඉන්නේ. *[බාධා කිරීම්]* දැන් බැරුව ඉන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක හම්බ වුණාම කියන්නම්. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් සභාව නිශ්ශබ්ද කරගන්නකෝ පුළුවන් නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. වෙන කවුරුවත් කථා කරන්නේ නැහැ.

[අ.භා. 4.18]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි, මම පටන් ගන්නම්. පටන් ගන්නකොටම ෂොට් එක දෙන්නම්. කරුණාකරලා අහන්න. දැන් ඉන්න ජනාධිපති ඇවිල්ලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ කියනවා, එතුමා ජීවිත කාලයේම කියපු එක සම්පූර්ණ බොරුවක් කියලා. එතුමා කියන්නේ "පාර්ලිමේන්තුව ඇතුළට ගිහිල්ලා මම හැම දාම කථා කරන්නේ බොරුවක්. පාර්ලිමේන්තුවෙන් එළියේ තමයි ඇත්ත කියන්නේ" කියලා.

මම මේක දැනගන්න කැමැතියි. මම එකක් අහන්නම් අපේ Health Ministerගෙන්. එක පාරටම මා interdict කරලා මාස තුනක් පඩි දැම්මා. රටට ඇත්ත කියන්න එපා යැ. මම ඇවිල්ලා දැන් පොඩි කාලයයි. මම ඇත්ත කියන්නම්. මා interdict කරලා මාස තුනක් දිගටම පඩි දැම්මා. ඒ කාලයේ මම මේගොල්ලන්ගේ supporter; එතකොට එතුමා මගේ හිතවතා. ඉස්සරහට එන්න ඉන්න ජනාධිපති. ඉස්සරහට එන්න ඉන්න ජනාධිපති නලින්ද ජයතිස්සගෙන් මම ඇහුවා, "අයියේ, මම මේ සල්ලි ටික දෙන්නද?" කියලා. එතුමා කිව්වා, "ගෙනැල්ලා ආපහු Ministry එකට දෙන්න" කියලා. හැබැයි දැන් නඩුවක් දාලා Attorney-General ගිහින් බොරුවක් කියනවා, මට pay කරලා තිබෙනවා කියලා.

තව කාරණයක් කියන්නම්. මම January මාසයේ Jaffnaවල දාපු නඩුවකට September මාසය වන කල් පොලීසිය statement එකක් අරගෙන නැහැ. හරි ද? ඒ OICට - *[බාධා කිරීම්]* අහගෙන ඉන්නකෝ බබාලා. ඒ OICට මම කථා කළාම OIC කියනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කථා කරලා කිව්වා ලු, ඒ නඩුව ගන්න එපා කියලා. මම mother promise කරලා කියන්නේ. එතකොට ඒ OIC කියනවා, ඔහුට ඒ නඩුව ගන්න එපා කිව්වා ලු. ඒ නිසා මාස නවයක් ගත වෙලාත් statement එකක් අරගෙන නැහැ.

ඉදිරියේදී ජනාධිපති වෙන්න ඉන්න අපේ ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාට මම කාරණයක් කියන්නම්. මම තමයි මේ කථාව පටන් ගත්තේ. මතක තියා ගන්න. ඔබතුමා කවදා හරි ජනාධිපති වුණොත්, ඒක කිව්වේ මම බව මතක තියා ගන්න. *[බාධා කිරීම්]* හරි, හරි. අහගන්නකෝ. ගරු ඇමතිතුමනි, මම ගිහින් ඒ සල්ලි pay කරලාත් ඉවරයි. එතකොට මහෙස්ත්‍රාත් පොලීසියෙන් අහනවා, "කෝ මෙයාගේ statement එක. කාට විරුද්ධවද නඩුව දාලා තිබෙන්නේ?" කියලා. පොලීසිය කියනවා මහෙස්ත්‍රාත්ට, "Sorry, මහෙස්ත්‍රාත්තුමනි" කියලා. මම දාපු නඩුව විභාගයට අරගෙනත් ඉවරයි. නමුත්, මම කාටද නඩුව දැම්මේ කියලා නම සඳහන් කරලා නැහැ. ඒකට හේතුව, සුනිල් වටගල මන්ත්‍රීතුමා එයාට කථා කරලා කිව්වා ලු, "මේ නඩුව අරන් යන්න එපා" කියලා.

මම තව කාරණයක් කියන්නම්. මමත් doctor කෙනෙක්. ඉදිරියේදී ජනාධිපතිවරයා වෙන්න ඉන්න ඔබතුමාත් doctor කෙනෙක්. මම දැන් අහන්න යන්නේ මේකයි. අපි කොච්චර BHT අයින් කරලා තිබෙනවාද? අපි doctorsලා විධියට ඉන්නකොට ලෙඩ්ඩු මැරිලා ඉවරයි. අපි canteen එකේ ඉඳන් දුවගෙන ඇවිල්ලා උදේ අටේ ඉඳලා ලෙඩා බැලුවා වාගේ අපි හැම දාම ලියනවා. ලෙඩ්ඩු මැරිලා ඉවරයි. එතකොට, මම නිකම් මේ අහන්නේ. සාමාන්‍යයෙන් මහෙස්ත්‍රාත් කිව්වොත්, "මෙයාගෙන් statement එකක් ගන්න" කියලා, අර්ච්චුනාගෙන් statement එකක් ගන්න කිව්වොත්, team එක ෆෝම් කරනවා. ඒ කියන්නේ, පොලීසියේ team එක ෆෝම් කරලා එවනවා. මගේ phone එක track කරනවා. සමහර වෙලාවට මම toilet එකේ ඉන්නකොට එනවා. හැබැයි, ලොකු team එකක් එනවා. කවුරු කියලාද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. මා Jaffnaවලට හොයාගෙන ඇවිල්ලා bathroom එකේ ඉන්නකොට ඇල්ලුවා. මට call කරලා එන්න කිව්වා නම්, මම එනවා නේ. වසන්ත සමරසිංහ මන්ත්‍රීතුමාගෙන් statement එකක් ගන්න කිව්වාම පොලීසිය යන්නේ නැහැ, bathroom එක හොයාගෙන. මතක තියා ගන්න. ඒ තත්ත්වයට ඔබතුමන්ලා පොලීසිය පත් කරලා තිබෙනවා. මගේ තාත්තාත් පොලීසියේ. මගේ තාත්තා 1960දී Police Football Team එකේ captain. පොලීසියේ uniform එක දාගෙන ඉන්නේ ඒ රාජකාරිය කරන්න. මේගොල්ලන්ගේ ගෙදර කුස්සිය හෝදන්න නොවෙයි. මතක තියා ගන්න. පොලීසිය පාවිච්චි කරන්නේ ඒ විධියට.

උතුරේ Jaffnaවල ඔක්කෝටම high posts දීලා ඉවරයි. හේතුව, මගේ case එකක් තිබෙනවා. දැන් මෙතුමන්ලාට විරුද්ධව මම කට ඇරියොත් වෙන්නේ - *[බාධා කිරීමක්]* මහෙස්ත්‍රාත් මාරු කරලා, එතකොට case එක-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි. Thank you.

මම තව කාරණයක් කියන්න කැමැතියි. දැන් අයිස්, අයිස් කියලා කියනවා නේ. Corporal punishment දෙන්න ඕනෑ නැහැ කියලා ඔබතුමන්ලා පනත් කෙටුම්පතක් ගෙනාවා. මම නම් කියනවා දෙන්න ඕනෑ කියලා. ඒ කාලයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

corporal punishment දීලා තිබුණා නම් එදා එයා පන්නන්නේ නැහැ, ඒ containers ටික. මතක තියා ගන්න. දැන් ඔබතුමන්ලා corporal punishment අයින් කළොත්, තව මාසයක් යනකොට හැම දාම containers පනිනවා, වරායෙන්. හේතුව, මේ බබාලා දැනුත් corporal punishment අරගෙන නැහැ. අඩුම ගණනේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න, ආණ්ඩුවේ ඉන්න MPsලාට

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

corporal punishment දෙන්න පුළුවන් විධියේ සංශෝධනයක්. එතකොට මෙතුමන්ලාට corporal punishment දීලා හරි මොකක් හෝ කර ගන්න පුළුවන්.

තව එකක් කියන්නම්. සුනිල් වටගල මන්ත්‍රීතුමා නාමල්ගේ පින්තූරයක් පෙන්වලා කියනවා, දකුණේ අයිස් අල්ල ගත්තා කියලා. ඊට පස්සේ, බිමල් රත්නායක ඇමතිතුමා කියනවා, island එකේ එතුමා ජනාධිපති වෙන්න ඉන්නවා කියලා. මම ඒ වාගේ ප්‍රකාශයක් කළා නම්, අද වනකොට toilet එකේදි නොවෙයි, එළියේ ඉන්නකොට මම arrest කරලා ඉවරයි. ඊට පස්සේ නඩු දානවා, "ඔයා කොහොමද ඒ ගැන කථා කළේ, ඔයාට තොරතුරු තිබෙනවාද?" කියලා. මට වැටිලා තිබෙන නඩු ඔක්කෝම ටික - 2024 hospital එකේ සිදු වුණු වංචා ගැන කථා කරලා තමයි මට නඩුව වැටුණේ. මට පෞද්ගලික නඩු එකක්වත් නැහැ. ඊයේ පෙරේදා මාධ්‍යයේ හොයනවා මම yellow line එකේ කාර් එක නවත්වපු එක ගැන. හැබැයි, ආණ්ඩුවේ ඉන්න containers පන්නපු අය කවුද කියලා හොයන්නේ නැහැ. දැන් ඒ containersවල එන්නේ මොනවාද? Containersවල එන්නේ අයිස්. ඒ කාලයේ ආවේ මිලි ග්‍රෑම් 1.2යි, 2.3යි. දැන් එන්නේ කිලෝ ගණන්වලින්. ඒ කිලෝ ගණන් කොහෙන්ද ආවේ? මම කියන්නේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගෙදර ඉඳන් තමයි ඒවා එන්නේ. CID එකෙන් ඇවිල්ලා මගෙන් අහනවා, ඒ containers 323 ගැන ඔයාට තොරතුරු තිබෙනවා නම් දෙන්න කියලා. බලන්න, මෙච්චර චෝදනා තිබුණත් අද වන කල්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගෙදර ගිහිල්ලා CID එකෙන් statements අරගෙන තිබෙනවාද? බැරි වෙලා හරි අපි -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
සර්, මට තත්පර 20ක් දෙන්න.

මට දැන් කියන්න තිබෙන්නේ, ආණ්ඩුවට එක නීතියක් සහ අපට එක නීතියක් කියලා. දැන් ඔබතුමා point of Order එක දෙනවා කිසිම රීතියක් නැතුව. අඩුම ගණනේ ඔය පුටුවේ වාඩි වෙන්න කලින් කරුණාකරලා, සර්, Standing Orders කියවලා බලන්න. අපේ කථානායකතුමා නියෝගයක් දීලා තිබෙනවා, point එක ගැන කථා කරන්න කලින් Standing Order එක කියන්න කියලා. එක දවසක් මාව එළියට දැම්මා, Standing Order එක කිව්වේ නැහැ කියලා. එහෙම නම් 159දෙනාව අරගෙන එළියට දමන්න. ඒ නිසා කරුණාකරලා ඔය පුටුවේ වාඩි වෙනකොට ඒ පුටුවේ ගරුත්වය තියාගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම දැන් ඉදිරිපත් කරනවා, බී 29984/24 දරන නඩුවේ වාර්තාව. මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා. 2024.09.06වැනි දින මහෙස්ත්‍රාත්තුමිය නියෝගයක් දීලා තිබෙනවා, "වහාම සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට නියෝග කරමි" කියලා. නැවත 2024.11.26වැනි දින "විමර්ශන අවසන් කර වහාම සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට නියෝග කරමි" කියලා නියෝගයක් දීලා තිබෙනවා.

නමුත් මොකද වුණේ? විමර්ශන අවසන් නැහැ කියලා මේ අය සාක්ෂි දෙන්න ගියේත් නැහැ. ඒ නිසා පොලීසිය දවස ගානේ ගිහින් මේගොල්ලන්ට කථා කළා. දිගටම සාක්ෂි දෙන්න ආවේ නැහැ. මහෙස්ත්‍රාත්තුමිය දෙවරක් මේ නියෝගය දීලා තිබෙනවා. 2024.09.06වැනි දිනත් කියනවා, "වහාම සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට නියෝග කරමි." කියලා. නැවත 2024.11.26වැනි දිනත් "විමර්ශන අවසන් කර වහාම සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට නියෝග කරමි." කියනවා. මේ, මහෙස්ත්‍රාත් අධිකරණය, ගල්කිස්ස. මම බොහොම පැහැදිලිව මේ ගැන කියන්න කැමතියි.

අපට බොරු කියලා මේ පාර්ලිමේන්තුව නොමඟ යවන්න වුවමනා නැහැ. මේ කරුණු ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා. "බී" වාර්තාවත් **සභාගත*** කරනවා. ගිහිල්ලා බලාගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි කාරණය තමයි, මේ සැකකරුවන් කවුද කියලා එතුමා කියන්න ඕනෑ. මොකද, 2024දී මෙවැනි,-

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු දයාසිරි මන්ත්‍රීතුමා, ඔබතුමා සභාගත කරපු ලේඛනය එවන්නකෝ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා සභාගත කරපු ලේඛනය අපට එවන්නකෝ. මෙවැනි නියෝගයක් 2024 ඔය කියන දින වකවානුවල අප වෙත ලැබී නැත. 2024දී තිබුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. 2024දී ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබියදී, අපි මැතිවරණ කළ කාලය. *[බාධා කිරීම්]* අපි මැතිවරණ කළ කාලය. ඒ කාලයේ මෙහෙම නියෝගයක් ලැබුණා නම් අපට නිදැල්ලේ ඉන්න දෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි ඇත්ත. නමුත් 2025දී ඉතාම පැහැදිලි නියෝගයක් තිබුණා, අපෙන් ප්‍රකාශ සටහන කරගන්න කියලා. අපි ඒ ප්‍රකාශ ලබා දීලා තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා සභාගත කළ ලේඛනය අපට එවන්න. අපි ප්‍රකාශ ලබා දෙන්න ගියේ 2025 අගෝස්තු මාසයේ 20වැනි දිනට ආසන්න දිනයක. මට දිනය හරියට මතක නැහැ. 20වැනි දිනට ආසන්න දිනයක. මමත්, රන්ජන් ජයලාල් සහෝදරයාත් එක දවසේ කැඳවලා තිබුණා. ඊට පසු දිනක වසන්ත සමරසිංහ ඇමතිතුමා කැඳවලා තිබුණා. ඉතින්, අපි තුන්දෙනාම ගිහින් ප්‍රකාශ ලබා දීලා තිබෙනවා. අපට පොලීසියෙන් නියෝගයක් ලැබුණේ එපමණයි. ඒ අනුව අපි පොලීසියට අවනත වෙලා, නීතියට ගරු කරලා ප්‍රකාශ සටහන් කරලා තිබෙනවා. ඒක තමයි සිද්ධ වුණේ. ඔබතුමා කියන්නේ 2024 නඩු තීන්දුවක් ගැන නේ. ඒ සභාගත කරපු ලේඛනය මා වෙත ලැබෙන්න සලස්වන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නැවත මේක සැකකරුවන්ට දෙන්න වුවමනාවක් නැහැ. මේ case එක ගැන එතුමා හොඳටම දන්නවා. අනෙක් කාරණය අපි ඒ ආණ්ඩුවල හිටියේ නැහැ. අපි ඒ කාලයේ ආණ්ඩුවල හිටියේ නැහැ. බොහොම පැහැදිලිව මම කියන්නේ. මේ කවුරුවත් අත්අඩංගුවට ගන්න අපට වුවමනාවක් නැහැ. අපි කියන්නේ මහෙස්ත්‍රාත්තුමිය විමර්ශනය අවසන් කරලා සැකකරුවන් අත්අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්න කියලා දිගටම කියලා තිබෙන එක ගැන. ඒකයි මම කිව්වේ. ඒ නියෝග දෙකම මේ ලේඛනයේ තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ඔය ලේඛනය සභාගත කරනවාද? *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔය ගැන ඔබතුමාගේ නීතිඥයාගෙන් අහගන්න. අපෙන් අහලා හරියන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම නීතිඥයෙක් නිසා තමයි කිව්වේ. මම නීතිඥයෙක් නිසා නේන්නම් කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ලේඛනය සභාගත කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ "B" report එකේ කාගේ නම් ද සඳහන් වෙන්නේ? මම කියන්නද "B" report එකේ ඉන්න කට්ටිය. කොළඹ වංචා විමර්ශන කාර්යාංශය. ඔබතුමන්ලාගේ නම් ටිකත් එක්කම කියන්නම්. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ලේඛනය සභාගත කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
සභාපති ලෙස අත්සන් කරලා තිබෙන අය, - *[බාධා කිරීමක්]* මම මීළඟට කියන්නම්, අනෙක් කට්ටියගේ නම් ටික. *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න. "B" report එක එහෙම පිටින්ම තිබෙනවා. මුළු වාර්තාවම කියන්න ඕනෑ නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ලේඛනය සභාගත කරන්න. සභාවේ කටයුතු කරගෙන යෑමට අවශ්‍යයි. සීමාසහිත කාලයක් තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම එවන්නම්. පොඩ්ඩක් ඉන්න, ඉතින්. "B" report එකේ පිටු 150ක් විතර තිබෙනවා. පොඩ්ඩක් ඉවසන්න. ඔක්කොම ටික එවන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි මේ සභාවේ කටයුතු කරගෙන යමු. අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා. ඔබතුමාගේ කථාව පටන් ගන්න.

[අ.භා. 4.28]

**ගරු අතුල වෙළඳගොඩ මහතා**
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ඉතාම සංවේදී මාතෘකාවක් පිළිබඳවයි කථා කරන්නේ. ඉතාම පරිස්සමින්, නීති රීතිවලට අනුකූලව කථා බහ කරන මේ වැදගත් සභාවේ මේ මාතෘකාවට හිමි නිසි වගකීම් සහගතභාවය, පිළිගැනීම, මානුෂීය ස්වරූපයන් සහ ස්වභාවයන් පිළිබඳව අධ්‍යයනය කළාම මට හිතෙනවා, මේ වෙලාවේත් මේ මාතෘකාවට අනුකූල ලෙස ඉතා පරිස්සම් සහගතව කරුණු ඉදිරිපත් කළ යුතුයි කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු අතුල වෙළඳගොඩ මහතා**
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි හිතනවා, නීති රීතිවලින් විතරක් රටක් පාලනය කරන්න බැහැ කියලා. එම නීති රීතිවලට අදාළව අපි අණ පනත් සම්මත කරගත යුතුයි. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය විසින් අද දින විවාදයට ඉදිරිපත් කරපු දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අද උදෑසන සිට යම් යම් අදහස් ඉදිරිපත් වුණා. අපි දකිනවා, මානව ගරුත්වය සහිත සමාජයක්. ඒ වාගේම "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන නව ආණ්ඩුවේ දැක්ම යටතේ මේ අණ පනත් වෙනස් කර ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කරපු කාරණා පෙළගැස්ම ඉතා වැදගත් මොහොතක තමයි මෙය ඉදිරිපත් කර තිබෙන්නේ කියලා මම හිතනවා. මේ කෙටි කාලයේදී අපට දැනෙන දේ තමයි එවැනි සමාජයකුත් අපට ඕනෑය කියන එක.

අද උදෑසන සිට කරපු කථා බහ අනුව අපට පෙනෙනවා, යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වෙන්න පුළුවන් සමාජයක් හදන්නේ නැතුව නීති රීතිවලින් විතරක්ම මේක කරන්න පුළුවන්කමක් නැති බව. එතකොට, එවැනි සමාජයක් කියන්නේ මොකක්ද කියලා ඇහුවාට පසුව මට හිතුණා, මේ මාතෘකාවෙන් පොඩ්ඩක් එළියට ගියොත් හොඳයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම නියෝජනය කරන්නේ, හම්බන්තොට දිස්ත්‍රික්කය. දැන් එය හැඳින්වෙන්නේ "අයිස්ලන්තය" යන අන්වර්ථ නාමයෙන්. මේ දේශපාලන සංස්කෘතියේ සුවිශාල වෙනසක් වෙන්න ඕනෑය කියන කාරණාව පසුගිය කාලය පුරාම සමාජගත වුණා. ඒ නිසා අලුත් සංස්කෘතික ජීවිතයක්, අලුත් සංස්කෘතික මිනිහෙක් කියන තැනට මේ සෑම සාකච්ඡාවක්ම අපි යොමු කළා. මේ ආණ්ඩුවේ දැක්ම යටතේත් අපි එය ඉදිරිපත් කළා. ඒකට බලපාන කරුණු කාරණා ගොඩක් තිබෙනවා. අතීතයට යන්නේ නැතිව වර්තමානය දිහා බැලුවත් ඒවා අපට පෙනෙනවා. මේ වෙනකොට ඒ යහපත් දේශපාලන වටපිටාවේ පරිවර්තනය රට පුරා සිදු වෙමින් පවතිනවා. ඊට සමගාමීව මේ අණ පනත්, නීති රීති හරහාත් අපට පිළිගත හැකි තැනකට -මානව සමාජයට, මානව සදාචාරයට, මානව බැඳියාවන්ට, පරිසමාප්ත සමාජයකට- යන්න අවශ්‍ය කරන ඉඩ කඩත් අපි විවෘත කර ගත යුතුව තිබෙනවා. අපේ රටේ සංස්කෘතිය පිළිබඳව කථා කරද්දි ඒ සංස්කෘතිය දැන් ක්‍රමානුකූලව යහපත් පරිවර්තනයකට, යහපත් දිශාවකට යොමු වෙමින් පවතිනවා.

ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. මීට අවුරුද්දකට විතර කලින් මිද්දෙනිය ප්‍රදේශයේ තිබුණු ප්‍රසිද්ධ රැස්වීමකට මම සහභාගි වුණා. ඒ අවස්ථාවේදී මැර තර්ජනයක් එල්ල වුණා. යම් පුද්ගලයෙකු වාහනයෙන් බැහැලා, ආයුධයක් පෙන්වලා ඒ රැස්වීම නතර කරන තත්ත්වයට පත් කළා. එදා ඒ රැස්වීමට ආපු "මිද්දෙනියේ කජ්ජා" කියන පුද්ගලයා හැසිරිච්ච ආකාරය අපි දැක්කා. එතැන දරුවන් හිටියා, කාන්තාවන් හිටියා. ඒ වෙලාවේ ඔහු හැසිරුණේ කොහොමද, ඔහුගේ හැසිරීම මොන වාගේ එකක්ද, ඒ රැස්වීම නතර කරන්න ඔහු කරපු තර්ජනය මොකක්ද කියන එක අපි දැක්කා. ඒ භීතියට ලක් කරපු වෙලාවේ මට හිතිච්ච දේ තමයි, ඔහුට දරුවෙක් ඉන්නවාද, ඔහු කවුද, කින්ද මන්ද කියන එක. ඔහු මත්ද්‍රව්‍ය ජාලයක, ඒ හා සම්බන්ධ වෙච්ච වටපිටාවකයි කටයුතු කළේ. ඊට පෙර අවස්ථාවක අපේ නලින්ද ජයතිස්ස සෞඛ්‍ය අමාත්‍යතුමා සහභාගි වෙච්ච රැස්වීමකදීත් තුන්දෙනෙකුගේ ජීවිත අහිමි වුණා. ඊට මාස 6කට පසුව "කජ්ජා" කියන අරුණ විදානගමගේ නම් වූ පුද්ගලයා තමන්ගේ දරුවන් දෙදෙනාගේත් ජීවිතය බිල්ලට දෙමින් ඝාතනය වුණා. ඒ අවාසනාවන්ත පරිසරය තමයි දැන් ක්‍රමානුකූලව සුද්ධ පවිත්‍ර වෙන්නේ. මත්කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය, පාතාලය ආදී මේ සියල්ල වෙනස් කරගෙන, එක පැත්තකින් මේවා සුද්ධ පවිත්‍ර කරගෙන යහපත් සමාජයකට පරිවර්තනය වෙමින් පවතින වෙලාවක්, මේ. පාර්ලිමේන්තුව තුළින් නීති, වැදගත් අණ පනත් සම්මත කර ගනිමින් මේ සමාජය මානවවාදී දිශාවකට, යහපත් දිශාවකට පරිවර්තනය කිරීම තමයි අපේ බලාපොරොත්තුව. ඒ වෙනුවෙන් අද දවසේ විවාද කරන මේ සංශෝධන පනත් කෙටුම්පත එක පැත්තකින් රටත්, සමාජයත් යහපත් මානව සමාජයක් දක්වා උසස් පරිවර්තනයකට ලක් කරන්න නව ආණ්ඩුවේ දැක්ම යටතේ ඉදිරිපත් කරපු එකක් බව සඳහන් කරමින්, කාලය ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் சிறுவர்களின் பாதுகாப்புத் தொடர்பில் கொண்டுவரப்பட்டுள்ள சட்டத் திருத்தம் சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்வடைகின்றேன். இந்தச் சட்டத் திருத்தமானது இந்த நாட்டின் சிறுவர்களைப் பாதுகாப்பதற்காக மாத்திரமா? அல்லது சிறுவர்களைப் பாதுகாப்பதாக இந்த நாட்டு மக்களுக்குக் காட்டி, எதிர்காலத்தில் அரசியல் சார்ந்து அவர்களுடைய வாக்குகளைப் பெறுவதற்காகவா? கொண்டு வரப்பட்டு இருக்கிறது என்ற கேள்வி எழுகின்றது. ஏனென்றால், இந்த நாடு சிறுவர்கள் விடயத்தில் மனிதாபிமானமற்ற ரீதியில் நடந்துகொள்வதை நாங்கள் பார்க்கின்றோம். குறிப்பாக, இந்த நாட்டில் இடம்பெற்ற உயிர்த்த ஞாயிறு தின தாக்குதல் எத்தனையோ அநாதைகளை உருவாக்கி இருக்கிறது. அந்த அநாதைகளின் பெற்றோர் தொடர்பில் இதுவரைக்கும் இந்த அரசாங்கம் எந்தவிதமான நடவடிக்கையையும் மேற்கொள்ளாமல், காலத்தைக் கடத்திச் செல்கின்றது. கடந்த கால அரசியல்வாதிகள் போன்று நீங்களும் செயற்படுவதை நாங்கள் பார்க்கின்றோம். அந்த அநாதைச் சிறுவர்களுடைய முகத்துக்காகவேனும், 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரிகள் யார் என்பதைக் காலங்கடத்தாமல் இந்த நாட்டு மக்களுக்குத் தெரியப் படுத்துமாறு கேட்டுக் கொள்கின்றேன். அந்தத் தாக்குதலால் ஏனைய சமூகத்தைச் சேர்ந்தவர்கள் பாதிக்கப்பட்டு இருந்தாலும், முஸ்லிம் சமூகமே கூடுதலாகப் பாதிக்கப்பட்டது. ஏனென்றால், 'சஹ்ரான்' என்ற முஸ்லிம் தீவிரவாதியின் தலைமையிலான குழுவினராலேயே அந்தத் தாக்குதல் நடத்தப்பட்டது. அதன் காரணமாக, முஸ்லிகளுடைய வீடுகளில் சமையல் அறைகளில் இருந்த கத்திகள்கூட இராணுவத்தினரால் பறிமுதல் செய்யப்பட்டன.

நாங்கள் உலகளாவிய ரீதியில் பார்க்கும்போது, இஸ்ரேலிய கொடூர அரசு பலஸ்தீன் மக்கள்மீது நடத்துகின்ற தாக்குதலால் கிட்டத்தட்ட 50,000 சிறுவர்கள் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். இரண்டு வருடங்களைத் தொடுகின்ற இந்த யுத்தத்தால் 18,000க்கும் மேற்பட்ட சிறுவர்கள் உயிரிழந்து

இருக்கின்றார்கள். இன்று உலகத்தில் இருக்கின்ற அத்தனை மக்களும் இந்த விடயத்தின்பால் ஈர்க்கப்படுகின்றார்கள். இவ்வாறான ஒரு சூழலில், அந்த நாட்டு மக்களுடைய வேதனைகளைக் கருத்திற்கொள்ளாமல், இஸ்ரேல் நாட்டுக்கு எதிராக இன்று ஒரு வார்த்தைகூட பேச முடியாத அளவுக்கு இந்த அரசாங்கம் இருந்துகொண்டு இருக்கின்றது. இவ்வாறான ஒரு சூழ்நிலையில்தான் சிறுவர்களைப் பாதுகாக்க வேண்டும், அவர்களுடைய பாதுகாப்புக்காகச் சட்டங்களைத் திருத்த வேண்டும் என்று கூறி, நீங்கள் முதலைக் கண்ணீர் வடிப்பதை நாங்கள் பார்த்துக்கொண்டு இருக்கின்றோம்.

அண்மைக் காலமாக 'ஐஸ்' போதைப்பொருள் பற்றி நாடு பூராவும் பேசப்பட்டுக்கொண்டு இருக்கின்றது. இருந்தாலும், இப்போதைப்பொருள் கடத்தலுக்குப் பின்னாலுள்ள சூத்திர தாரியை வெளிப்படுத்துவதற்கு இந்த அரசு தயங்குகின்றது. ஈஸ்டர் தாக்குதல் சூத்திரதாரியை நெருங்கிவிட்டதாகவும், அவரைக் கண்டுபிடித்து விட்டதாகவும் முன்னாள் சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் மிகத் தெளிவாக வாக்குமூலம் அளித்திருக்கின்றபோதிலும், இதுவரைக்கும் நீங்கள் அதை வெளிப்படுத்தாமல் இருக்கிறீர்கள். 'ஐஸ்' போதைப்பொருள் காரணமாக இன்று எத்தனையோ சிறுவர்கள் கல்வியை இழந்திருக்கிறார்கள். இவ்வாறு சிறுவர்கள் பாதிக்கப் பட்டிருக்கின்றபொழுது, வெறுமனே சட்டத்தில் மாற்றங் களைச் செய்துவிட்டு, "நாங்கள் இவற்றைச் செய்திருக்கிறோம்" என்று மார்தட்டுவதில் எந்தவிதமான அர்த்தமும் இல்லையென நினைக்கின்றேன். நாங்கள் மாணவர்களை, சிறுவர்களைச் சந்திக்கின்றபோது, "நீங்கள் எதிர்காலத் தலைவர்கள்" என்று பாராட்டிப் பேசுகின்றோம். பலஸ்தீனில் மிக அநியாயமாகப் படுகொலை செய்யப்பட்டுக்கொண்டு இருக்கின்ற சிறுவர் களுக்காகவும் இந்த அரசாங்கம் குரல்கொடுக்க வேண்டுமெனக் கேட்கின்றோம்.

எங்களுடைய நாட்டின் சனாதிபதி அவர்கள் தற்பொழுது அமெரிக்கா சென்றிருக்கிறார். அங்கு அவர், பலஸ்தீன் பற்றி, அங்கு நடக்கின்ற இஸ்ரேலுடைய அட்டூழியங்கள் பற்றி பேச வேண்டும். ஏனெனில், இந்த அரசாங்கத்துக்கு வாக்களித்த இலங்கை முஸ்லிம் சமூகம் அதை எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றது. உங்களுக்கு வாக்களித்த முஸ்லிம் சமூகத்துக்கு நீங்கள் என்ன விடயத்தை முன்வைக்கப் போகின்றீர்க ளென்பதை சிறுவர்களின் பாதுகாப்புத் தொடர்பில் விவாதிக்கப்படுகின்ற இந்தச் சந்தர்ப்பத்தில் நான் உங்களிடம் விநயமாகக் கேட்க விரும்புகின்றேன். இன்று இலங்கையில் இஸ்ரேலியர்களின் ஆக்கிரமிப்பு அதிகரித்து இருக்கின்றது. இந்நிலையில், நீங்கள் சுற்றுலாத்துறையின் மேம்பாடு கருதி open visasஐக் கொடுத்திருக்கிறீர்கள். அறுகம்பே பிரதேசத்தில் மிக வக்கிரமான வேலைகள் இடம்பெறுவதற்கு இது வாய்ப்பாக இருக்கின்றது. அறுகம்பேயில் அடுத்தடுத்து 'சபாத்' இல்லங்கள் நிறுவப்பட்டு வருவதாக அண்மையில் சில ஊடகங்கள் செய்தி வெளியிட்டிருந்தன. அங்கு 'சபாத்' இல்லங்கள் அமைக்கப்படுவது சம்பந்தமாக அங்குள்ள பிரதேச சபையோ அல்லது பொறுப்பானவர்களோ பதில் அளிக்காமல் அமைதி காக்கின்றார்கள். அறுகம்பையில் மாத்திரமல்ல, கொழும்பு, வெலிகம போன்ற பிரதேசங்களிலும் இந்த நிலைமை காணப்படுகின்றது. எனவே, எமது சமூகத்தையும் நாட்டையும் பாதுகாக்க வேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. அந்த வகையில், இன்று கொண்டுவரப்பட்டுள்ள சட்டமூலம் வரவேற்கத்தக்கது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
මට තව විනාඩියක් ලබා දෙන්න.

நான் இன்னுமொரு விடயத்தை இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். கடந்த வருடம் அதாவது, இந்தப் பாராளுமன்றத்தின் ஆரம்பக் காலப்பகுதில் காரைதீவு - மாவடிப்பள்ளி பிரதேசத்தில் ஏற்பட்ட வெள்ள அனர்த்தத்தில் சிக்குண்டு எட்டு சிறுவர்கள் பரிதாபமாக மரணமடைந்தார்கள். அவர்கள் மத்ரஸாவிலிருந்து வீடு நோக்கிச் செல்லும்போதே இந்தச் சம்பவம் இடம்பெற்றது. இதனைச் சுட்டிக்காட்டி, அந்த இடத்தில் பெரியதொரு பாலத்தை அமைக்க வேண்டுமென இச்சபையில் அந்தப் பிரதேசத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் வேண்டிக்கொண்டதற்கு இணங்க, இந்த அரசாங்கம் அதற்குச் செவிசாய்த்து அங்கு பாலமொன்றை அமைப்பதற்கான பூர்வாங்க நடவடிக்கைகளை மேற்கொண்டு இருக்கிறது. அதற்காக இச்சந்தர்ப்பத்தில் இந்த அரசாங்கத்துக்கு நன்றி கூறி விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.41]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකාව විසින් 1991 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ratify කළාට පස්සේ අපි වගකීමෙන් බැඳෙනවා, අපේ රටේ ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්. එහි ප්‍රතිඵලයක් හැටියට අපට අවශ්‍ය වෙනවා, අපේ නීති පද්ධතිය ශක්තිමත් කර ගන්න. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 19වන ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, සියලුම දරුවන් තමන්ගේ දෙමව්පියන්ගේ භාරයේ සිටියදී, එහෙම නැත්නම් තව කෙනෙකුගේ රැකවරණයේ සිටියදී, එහෙමත් නැත්නම් නීත්‍යනුකූලව තවත් භාරකාරයෙකු යටතේ සිටියදී කිසිදු ලෙසකින් අවමානයට, අපහිංසාවට, වධ හිංසනයට ලක් නොවිය යුතු බව. අන්න ඒ නිසා 1995දී මෙරට දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධනයක් ගෙනැල්ලා, 286, 308, 360, 364 ආදී වශයෙන් වගන්ති එක් කරමින් ළමා අයිතිවාසිකම් ආරක්ෂණය කර ගැනීම වෙනුවෙන් වාගේම ළමයි වෙනුවෙන් ඒ නීතිමය තත්ත්වය හඳුන්වා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද උදේ පටන්ම ගරු ඇමතිතුමිය ඇතුළු අපේ ආණ්ඩු පක්ෂයේ පිරිස ඉදිරිපත් කළ දත්ත අරගෙන බැලුවාම අපට බොහොම පැහැදිලියි, මෙතරම් නීති රීති තිබුණත් දිගින් දිගටම ළමා අයිතිවාසිකම් විශාල වශයෙන් උල්ලංඝනය වෙමින් පවතින බව. අන්න ඒ හින්දා මේ වෙනුවෙන් අපට කරන්න පුළුවන් හොඳම දෙය, අද දවසේදී මේ පනත සම්මත කර ගැනීමෙන් ඉෂ්ට සිද්ධ කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ රටේ දශක ගණනාවක් තිස්සේ තිබුණු යුද්ධමය තත්ත්වය නිසා දෙමව්පියන් නැති දරුවන් -අනාථයන්-, විවිධ වධ හිංසාවට ලක් වුණු දරුවන් බිහි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කය වාගේ ඇතැම් දිස්ත්‍රික්කවල ජනතාවට

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය ]

අපේ රටේ ඇති වුණු ආර්ථික අර්බුදය වැනි විවිධ පාරිසරික සහ සමාජයීය තත්ත්ව නිසා තමන්ගේ දරුවන්ව ආච්චි අම්මා ළඟ, නැන්දලා මාමලා ළඟ නතර කරලා විදේශගත වෙන්න සිදු වුණා. අන්න ඒ කාරණය නිසා දරුවන් විශාල වශයෙන් අපචාරයට, වධ හිංසනයට, දණ්ඩනයට ලක් වෙනවා. ඒ වාගේම දේශපාලනික කාරණා, සමාජයීය කාරණා සහ කලින් පැවති දේශපාලන සමාජය විසින් දරුවන් වෙනුවෙන් ගොඩනඟමින් තිබූ ඒ අපරාධ රාජ්‍යයන්, මත්ද්‍රව්‍යවලින් පෝෂණය කරමින් තිබූ වටපිටාව තුළ මේ බලය ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් නොගත්තේ නම් දරුවන්ගේ අනාගතය කෙසේ වෙන්නේද කියන එක ඇත්තටම ප්‍රශ්නසහගත වෙනවා. බියකරු අනාගතයක් තමයි මේ රටේ දූ දරුවන්ට තිබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැමෝම දඬුවමට භය බව අපි දන්නවා. ඒ වාගේම මරණයටත් භයයි. "සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ"; හැමෝම දඬුවමට භයයි, මරණයට භයයි. මෑත කාලීන උදාහරණයක් ගත්තොත්, වැඩිහිටි ප්‍රජාව අධිකරණයෙන් නොතීසියක් නිකුත් වුණාම, අධිකරණයට එන්න කිව්වාම හැංගෙනවා, විදේශගත වෙනවා. සති ගණන් හොයා ගන්න නැහැ. ඒ, දඬුවමට ඇති බිය නිසායි. වැඩිහිටියන් දඬුවමට ඇති බිය නිසා හැංගෙනවා නම්, සති ගණන් අධිකරණය මඟ හරිනවා නම්, දරුවන් දඬුවමට කොතරම් බිය ඇතිද? අන්න ඒ නිසා තමයි මේ දරුවන්ට සිදු වන සියලුම දණ්ඩන වළක්වන්න අද දවසේදී මේ පනත පිළිබඳව අපි විවාද කරන්නේ. විශේෂයෙන්ම ලංකාවේ සංස්කෘතිය තුළ කියමනක් තිබෙනවා, හැඳි නොගාපු කිරි හොද්ද වාගේ කියලා ගහලා හදපු නැති ළමයා. මේ ඉන්න 225දෙනාම -අපි හැමෝම- අනිවාර්යයෙන්ම පොඩි කාලයේ අම්මාගෙන්, තාත්තාගෙන්, ගුරුවරුන්ගෙන් එහෙම නැත්නම් කාගෙන් හෝ ගුටි කාලා තිබෙනවා. එහෙම නේද? මම හිතන හැටියට වයස අවුරුදු 18, 20 පැන්නාට පස්සේ තමයි ගුටි කෑම නතර වෙන්නේ. ඒ විධියට තිබුණු සමාජයක්, සංස්කෘතියක් තුළ දරුවන් වෙනුවෙන්, කාන්තාවන් වෙනුවෙන් ඒ දණ්ඩනයේ තිබුණු සීමා බිඳ දමමින් ඒ ළමා අයිතිවාසිකම් සහ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් තමයි මේ ආණ්ඩුව පැමිණිලා තිබෙන්නේ.

1995 අවුරුද්දට පස්සේ 2025දී -එනම්, වසර 30කට පසේස්- තමයි මේ සංශෝධන ගෙන එන්නේ. උදේ ඉඳන්ම ප්‍රශ්නගත වුණා, මේ පනතේ 308ආ. වගන්තිය සම්බන්ධයෙන්. 308ආ. වගන්තිය යටතේ ළමයි සම්බන්ධයෙන් ශාරීරිකව දඬුවම් කිරීම පිළිබඳව දක්වා තිබෙනවා. කාල වේලාව හරස් වන නිසා මම 308ආ. වගන්තිය පැහැදිලි කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

මෙහි 308ආ. වගන්තියේ දක්වා තිබෙනවා, "...අවමානයක් ඇති වීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික නොවන යම් වැරදි ක්‍රියා කිරීම..." කියලා. අපේ නීතියේ -අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය යටතේ සහ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු යටතේ- වාගේම කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මේ "අවමානය" කියන වචනය ඕනෑ තරම් අර්ථ නිරූපණය කරලා තිබෙනවා. ඕනෑම කෙනෙකුට "අවමානය" කියන වචනය අර්ථ නිරූපණය කර ගැනීමට හැකියාවක් තිබෙනවා. හැබැයි, විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ට මේ පිළිබඳව අවබෝධයක් නැහැ. ඒ වාගේම පනතේ "නිදර්ශන" යටතේ (ඇ)හි ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා, "අවමානය" කියන්නේ මොකක්ද කියලා. නොතේරෙන අයට මේ නිදර්ශන ආශ්‍රයෙන් ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තාම, මේ පනතේ "නිදර්ශන" යටතේ දක්වා තිබෙනවා, විදුහල්පතිවරයෙකු විසින් ළමයෙකු තවත් ළමයෙකුගේ දෙයක් සොරකම් කර ඇති බවට විශ්වාස කර එම ළමයා රැස්වීම් ශාලාවක් ඉදිරිපිටට කැඳවා "සොරකු" ලෙස ආමන්ත්‍රණය කිරීම අවමානයක් විධියට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තවත් උදාහරණයක් කියන්නම්. ඇතැම් සමාජ තත්ත්ව හේතුවෙන් සමහර ගම්මානවල ඉන්න ළමයින්ව පාසල්වලින් හොරෙකු ලෙස හංවඩු ගහනවා. නමුත්, මේ ළමයා හොරකමට සම්බන්ධ නැහැ. හැබැයි, ඒ ගමේ ඉන්නේ හොරකම්, මැරකම් ආශ්‍රයෙන් ජීවත් වන පවුල්. නමුත්, පාසලෙන් මේ ළමයා හොරෙකු විධියට හංවඩු ගහනවා. ඒ තත්ත්වයන් නිසා වන අවමානයෙන් දරුවා වළක්වා ගත යුතුයි. එම නිසා මේ වගන්තිය අත්‍යවශ්‍ය වගන්තියක් බවට මම සනාථ කරනවා.

මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 4.47]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தண்டனைச் சட்டக்கோவை திருத்தச் சட்டமூல விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பமளித்தமைக்கு நன்றியையும் வணக்கத்தையும் தெரிவித்துக்கொண்டு எனது உரையை ஆரம்பிக்கின்றேன். இந்த நாட்டின் எதிர்காலச் சந்ததியினரை, எதிர்காலத்தில் வளமான தலைவர்களாக உருவாகவேண்டிய குழந்தைகளைப் பாதுகாப்பதற்காகக் கொண்டுவரப்பட்டுள்ள இத்திருத்தச் சட்டமூல விவாதத்தில் உரையாற்றுவதையிட்டு உண்மையிலே மிக மகிழ்ச்சியடைகின்றேன்.

மிக முக்கியமாக, குழந்தைகள் தங்களுடைய இளமைக் காலத்தைச் சந்தோசமாகக் கழிக்க வேண்டிய நேரத்திலே அனுபவிக்க நேரிடுகின்ற பல்வேறு இன்னல்களும் துன்பங் களும் மற்றும் அவர்களுக்கு உடல் ரீதியாக, உள ரீதியாக ஏற்படுத்தப்படுகின்ற தாக்கங்களும் அவர்களுடைய எதிர்கால வாழ்க்கையைப் பாழாக்கிவிடுகின்ற, அவர்களுடைய எதிர்காலத்தைத் திசை திருப்பிவிடுகின்ற நிகழ்வுகளைத் தடுப்பதற்காக, மேலும் வலுப்படுத்தப்பட்ட சட்டத்தினைக் கொண்டுவரும் வகையில் இந்தச் சட்டமூலத்தைச் சமர்ப்பித் தமைக்காக அந்தத் துறைக்குரிய அமைச்சர்களுக்கு எனது வாழ்த்துக்களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

மிக முக்கியமாக, கடந்த காலங்களிலே பாடசாலைகளில் மட்டுமல்லாது, சிறுவர் காப்பகங்களிலும் பிரதேசங்களிலும் வீடுகளிலும்கூட குழந்தைகள் தண்டனைகளுக்கு ஆளாக்கப் பட்டிருக்கின்றார்கள். இவற்றுக்கெதிரான சட்டங்கள் இருந்தும் அவற்றுக்கு உரிய படிமுறைகள், உரிய வழிகாட்டுதல் வழங்கப்படாத நிலையில் இவ்வாறான நிகழ்வுகள் தடுக்கப் படாமல் தொடர்ந்திருக்கின்றன. எனவே, இந்த விடயங்கள் தொடர்பாகக் கருத்திலெடுத்துச் சட்டத்தைச் சரியாக அமுல்படுத்துவதன்மூலம் எதிர்காலத்திலே நாம் ஒரு வளமான சந்ததியை, வளமான எதிர்காலத்தை உருவாக்கிக்கொள்ள வேண்டும். அதேநேரம், இதற்குச் சமாந்தரமாக இந்தத் தண்டனைகள் ஏன் வழங்கப்படுகின்றன என்ற விடயத்தை ஆராய வேண்டிய ஒரு பொறுப்பும் நமக்கு இருக்கின்றது.

ஒரு குழந்தை நன்றாக வரவேண்டும் என்று பெற்றோ ராலும், பாடசாலைகளிலே மாணவர்கள் ஒழுக்கம் மிக்கவராகத் திகழ வேண்டும் என்று கல்விச் சமூகத்தினராலும் அல்லது பல்வேறு சந்தர்ப்பங்களிலே நல்ல விடயங்களில் அவர்கள் ஈடுபட வேண்டும் என்ற அடிப்படையில் சில இடங்களிலும் அவர்களுக்குத் தண்டனை வழங்கப்படுகின்றது. ஆனால், அவை அவர்களுக்குப் பயத்தையும் எதிர்காலம் பற்றிய ஒரு நிச்சயமற்ற தன்மையையும் உருவாக்குகின்றபொழுதுதான் அவர்கள் வன்முறையாளர்களாக, சமூகத்திலே உயர்ந்த நிலைக்கு வர முடியாதவர்களாக மாற்றப்படுகின்றார்கள். ஆகவே, இவ்வாறான விடயங்களைக் கருத்திற்கொண்டு, இதுபோன்ற சட்டங்களைக் கொண்டுவருவதற்குச் சமாந்தர மாக இப்படியான செயல்களை நாம் எவ்வாறு நிறுத்துவது எனவும் சிந்திக்க வேண்டும். தண்டனைக்கான சட்டங்களைக் கொண்டுவருவதன்மூலம் மாத்திரம் குற்றங்களைக் கட்டுப் படுத்திவிட முடியுமா? இல்லாவிட்டால், அந்தச் சமூகத்திலே வளமான மாற்றங்களை ஏற்படுத்துவதற்காக நாம் வேறு என்ன செய்ய வேண்டும் என்று சிந்தித்து, அதற்கான மாற்றுத் திட்டங்களை முன்வைக்க வேண்டிய பொறுப்பு இந்த அரசுக்கு இருக்கின்றது.

மிக முக்கியமாக, மாணவர்களுடைய இளம் பராயத்திலே பல்வேறு வகையான செயல்களைச் செய்வதற்கு அவர்கள் தூண்டப்படுகின்றார்கள் அல்லது அவர்களுடைய வயது காரணமாக அவ்வாறான ஆர்வங்கள் அவர்களுக்குள் மிளிர்கின்றன. இவ்வாறான விடயங்களைக் கருத்திற்கொண்டு, அவர்களை எவ்வாறு நல்ல வழியில் கொண்டுசெல்வது அல்லது நல்ல வழியில் ஒரு சமூகத்தை எவ்வாறு உருவாக்குவது என்பதற்கான மாற்றுத் திட்டம் ஏதும் உள்ளதா என்பதும் இங்கு கேள்விக்குறியாகவே இருக்கின்றது. ஏனெனில், பெற்றோர்கள் இந்த விடயங்களைக் கையாள முடியாத நிலையிலேயே அல்லது ஆசிரியர் சமூகம் இந்த விடயங்களைக் கையாள முடியாத நிலையிலேயே பாரிய பொறுப்பைக் கொண்டுள்ள அவர்கள் தண்டனை என்ற ஆயுதத்தைக் கையில் எடுக்க வேண்டிய நிலைக்கு உந்தப்படுகின்றார்கள். அதற்கப்பால் பல்வேறு மன உழைச்சலுக்கு ஆளாக்கப்பட்டவர்கள் அல்லது பல்வேறு வகையான துன்பங்களுக்கு ஆளானவர்கள் சிறுவர்களுக்குத் தண்டனையைக் கொடுப்பதும் உண்டு. அந்த வகையில், இந்தத் தண்டனைச் சட்டக்கோவைத் திருத்தச் சட்டமூலம் அவசியம் நிறைவேற்றப்பட வேண்டிய ஒன்றாக இருக்கின்ற அதேவேளை, நாட்டில் இவ்வாறான தண்டனைகள் இடம்பெறாமல் இருப்பதற்காக நாம் எவ்வாறான திட்டங்களை உருவாக்க வேண்டும்? என்பது பற்றியும் சிந்திக்க வேண்டும். மிக முக்கியமாக இதற்கான மாற்றுத் திட்டமாக, இது சம்பந்தமான விரிவான விளக்கங்கள் அல்லது விரிவுரைகள் அல்லது செயற்திட்டங்களைச் சமூகரீதியாகக் கொண்டுசெல்ல வேண்டிய பாரிய பொறுப்பு அரசுக்கு இருக்கின்றது. சட்டங்களை இயற்றுவதன்மூலம் மட்டும் இவ்வாறான விடயங்களை நாம் வென்றுவிட முடியாது; சிறுவர்களைப் பாதுகாத்துவிட முடியாது.

இதற்கப்பால், கடந்த காலங்களில் எமது வடக்கு, கிழக்கில் உள்ள சிறுவர் சமூகம் பல்வேறு துன்பங்களைச் சந்தித்திருந்தது. இன்று செம்மணியில் அகழப்படுகின்ற புதைகுழிகளில்கூட குழந்தைகளை அணைத்தபடி இறந்திருக் கின்ற மனித எலும்புக்கூடுகளைக் காணக்கூடியதாக இருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
තව එක විනාඩියක් දෙන්න, please.

ஆகவே, இந்த அரசு கொண்டுவந்திருக்கின்ற சட்ட மூலத்தை நாங்கள் வரவேற்கின்றோம்; எதிர்காலம் பற்றிய சிந்தனையோடு செய்கின்ற இந்த விடயத்தை வரவேற் கின்றோம். ஆனால், கடந்த காலங்களிலே தமிழ்ச் சமூகத்துக்கும் குழந்தைகளுக்கும் எதிராக அநீதி இழைத்தவர் களுக்கு என்ன தண்டனை கொடுக்கப் போகின்றீர்கள்? என்ற விடயத்தையும் நீங்கள் சொல்ல வேண்டும். உங்களுடைய ஆட்சி ஒரு வருட காலமாகத் தொடர்ந்திருக்கின்றது. பாதிக்கப் பட்ட தமிழ்ச் சமூகம் தொடர்பாக, அவர்களின் மீள்குடியேற்றம் சம்பந்தமாகவோ, அவர்கள் படுகொலை செய்யப்பட்டது சம்பந்தமாகவோ இக்காலகட்டத்தில் எந்தவிதமான உறுதிப் பாடுகளும் இல்லாத நிலையில், நீங்கள் இந்த விடயத்தைச் செய்வதன்மூலம் மட்டும் தமிழ்ச் சமூகத்தின் மனங்களை வென்றெடுக்க முடியாது. ஆகவே, சிறுவர்களைப் பாதுகாப் பதற்காகக் கொண்டுவரப்பட்டிருக்கின்ற இந்தத் தண்டனைச் சட்டக்கோவை திருத்தச் சட்டமூலத்துக்கு எமது ஆதரவைத் தெரிவித்துக்கொள்வதோடு, கடந்த காலங்களில் ஏற்பட்ட அநீதிகள் தொடர்பாகவும் உங்களுடைய செயற்பாடுகள் இருக்கவேண்டுமெனக் கேட்டு, உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[4.52 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Deputy Chairperson of Committees, before I comment on the Penal Code (Amendment) Bill, I think I have a small duty and that is to express my gratitude to the Hon. Bimal Rathnayake though he is not here. අම්පාර දිස්ත්‍රික්කයේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙනුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලුදෙනා වෙනුවෙනුත්, අප පක්ෂය වෙනුවෙනුත් ගරු බිමල් රත්නායක ඇමතිතුමාට අපගේ ස්තුතිය පළ කරන්න ඕනෑ. මොකද, එතුමා යටතේ තිබෙන විෂයය

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

සම්බන්ධයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩ පිළිවෙළට ගිය අවස්ථාවේදී සියලු මන්ත්‍රීවරුන්ගෙන් යෝජනා ඉල්ලලා තිබුණා. අපි සියලුදෙනාම යෝජනා 100කට වැඩි ප්‍රමාණයක් ලබා දුන්නා. කිසිම වෙනස් කිරීමක්, විෂමතාවක්, discrimination එකක් නැතිව එතුමා ඒ සියලු යෝජනා පිළිගෙන, ඊට පස්සේ අපේ පසුපෙළ මන්ත්‍රී ගරු රත්වත්තේ මන්ත්‍රීතුමියගේ සභාපතිත්වයෙන් ඒ සඳහා කමිටුවක් පත් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, අනාගතයේදී ඒ කමිටුවෙනුත් කිසිදු විෂමතාවකින් තොරව ඒ සංවර්ධන කටයුතු සිදු වෙයි කියලා.

கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களுக்கு இந்தச் சந்தர்ப்பத்தில் தமிழிலும் என்னுடைய நன்றியைத் தெரிவிக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் தன்னுடைய அமைச்சின்கீழ் வருகின்ற விடயங்கள் மூலம் அம்பாறை மாவட்டத்தை அபிவிருத்தி செய்வது சம்பந்தமாக அந்த மாவட்டத்தின் சகல பாராளுமன்ற உறுப்பினர்களுடைய யோசனைகளையும் எந்தவிதமான வேறுபாடும் இல்லாமல் பெற்றிருக்கின்றார். சந்தோஷம்! நன்றி! பின்வரிசைப் பாராளுமன்ற உறுப்பினரான திருமதி ரத்வத்தே அவர்களுடைய தலைமையில் அதற்கென ஒரு விசேட குழுவையும் அமைத்திருக்கிறார். அவரும் எந்தவிதமான பாகுபாடும் இன்றி, அரசியல் பேதங்களுக்கு அப்பால் சென்று, இவை எல்லாவற்றையும் நிறைவேற்றுவாரென நான் நினைக்கின்றேன்.

Having said that, now, let me move on to the Bill that is being debated. I once again thank the Hon. Bimal Rathnayake because he admitted in the morning that there are some issues in this Bill and that they are not going to pass it today, that they are not calling for a Division or taking up the Third Reading, I believe.

මේ පනත සම්බන්ධයෙන් සෑහෙන්න විවාද සිදු වුණා. සමහර විට ආණ්ඩු පක්ෂය බලනවා ඇති විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් සංශෝධනයක් ආව හින්දා ඒ ගැන වැරදි ආකල්පයක් ඇති කරන්න පුළුවන් කියලා. නමුත් ඒක එහෙම නොවෙයි.

මම පොඩ්ඩක් මේ පිළිබඳව දැනුවත් කරන්න කැමැතියි. මේ අදාළ වගන්තිය දණ්ඩ නීති සංග්‍රහයේ 308වන වගන්තියට (ආ) ලෙස තමයි එකතු කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැන පොඩි හයක් ඇති වුණා සාමාන්‍යයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ දඬුවම්, එහෙම නැත්නම් අපරාධයක් ඇති කිරීමේදී මානසික අංගය - *mens rea* - තිබුණත්, නොතිබුණත් වරදක් විය හැකිද කියලා. මම හිතන විධියට statutory rape කියන වරදටත් ඔය ප්‍රශ්නය මතු වුණා. ඒ ගැන අද ගුරුවරුන්, දෙමාපියන් අතර පොඩි සැකයක් තිබෙනවා. ඒ සැකය දුරු කරන්න වෙනවා ඔබතුමන්ලාට. මොකද, 308වන වගන්තිය ගැන ගොඩක් දේවල් කියැවුණා. I was listening and one Hon. Member was talking about judgments. 308ආ. ලෙස ඇතුළත් කරලා තිබෙන නව වගන්තියේ තිබෙන වචන මම කියන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රමයක් වශයෙන්, කෙතරම් අඩු වුවද යම් ප්‍රමාණයක වේදනාවක් හෝ අපහසුතාවක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව..."

කවුරුත් කථා නොකළ කෑල්ල තමයි, "දැනුම ඇතිව" - the knowledge - කියන එක. ඒක ශාරීරික කියන එකටත් අදාළයි, මානසික කියන එකටත් අදාළයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැන ඇත්තටම වෙලා තිබෙන්නේ "intention" කියන වචනය අත හැරලා තිබෙන එක.

නීතිඥවරු බොහෝදෙනෙක් මේ සභාවේ ඉන්නවා. එක්කෝ ඒ අභිලාෂය - intention එක- අරමුණු කරගෙන මනුෂ්‍යයෙකුගේ මරණය සිදු කිරීමේ චේතනාවෙන් යම්කිසි ක්‍රියාවක් සිදු කළහොත් හෝ අනිවාර්යයෙන්ම එය මරණය සිදු වීමට ඉඩ තිබෙන බවට හොඳාකාර දැනුමකින් කරලා තිබුණොත් ඒක දණ්ඩ නීති සංග්‍රහයේ 294-296 වගන්ති යටතට වැටෙනවා. නමුත් තව එකක් තිබෙනවා, "only the knowledge" කියලා; ඒ කියන්නේ දැන සිටිය යුතුයි. Section 297 of the Penal Code deals with culpable homicide not amounting to murder.

ඒ කියන්නේ එතැන මානසික අංගය සම්පූර්ණ නැති වුණත් දැනුම තිබුණොත් ඒ වරදට අහු වෙනවා. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ඒකේ දෙවැනි threshold එක තමයි දණ්ඩ නීති සංග්‍රහයේ 298. *Mens rea* කියන මානසික අංගය දෙවැනි threshold එකට තමයි දාලා තිබෙන්නේ. මම හිතන විධියට එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා, අනිවාර්යයෙන්ම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි මෙතැන Amendment එකේ සද්භාවය කියන එක පාවිච්චි කරලා ඉදිරිපත් කළත් එතැන සාධාරණ ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, "දැනුම" කියන වචනය threshold එකේ පහළම තිබෙන threshold එක. එතකොට ඒ කියන්නේ මෙතැන ඇති වෙලා තිබෙන ලොකුම බිය තමයි ශාරීරික හෝ මානසික පීඩාවක් සිදු කිරීම පිළිබඳ දැනුම, objective test. එතකොට objective test එක දානකොට දැනුම කියන වචනය ඒ threshold එකේ-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැනුම කියන ස්ථාවරය මත පිහිටලා මේක pass කළොත් අනිවාර්යයෙන් ප්‍රශ්නයක් මතු වෙනවාමයි. In the latest Judgment by Justice S. Thurairajah, he says, I quote:

> "...any punishment in which physical force is used and intended to cause some degree of pain or discomfort, however light. Most involves hitting ....... children, with the hand or with an implement - a whip, stick, belt, shoe...."

He is citing the corporal punishment defined by UNCRC. එතකොට එතැනම පාවිච්චි කර තිබෙනවා, "intention" කියලා. He goes on to say, I quote:

> "Based on the above it is clear that the UNCRC cannot be interpreted as supportive of Corporal Punishment of any form. However, it must be recognised that rejection of Corporal Punishment is not a rejection of the concept of discipline."

So, that is what Justice S. Thurairaja had stated in his Judgment. I believe it is my duty to mention that since I have made a note of that particular judgment. His famous

Judgment on the case Karunapala and others vs. Siriwardhana and others comes up in Sri Lanka Law Reports 2021 - Volume I. එතැන කියලා තිබෙන්නේ, එක්සත් ජාතීන්ගේ නියාමනය. The criteria is based on intention; පාවිච්චි කර තිබෙන වචනය අරමුණ, intention.

නමුත්, මෙතැන "දැනුම" කියන වචනය පමණක් දාලා තිබෙනවා. මම හිතන විධියට, the Hon. Deputy Minister Sunil Watagla would also appreciate the distinction I am trying to make. මෙතැන දාලා තිබෙන්නේ "දැනුම" කියන වචනය. ඒ නිසා මම හිතන විධියට, it is nothing but fair to refer this back to the same Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection so that there could be some expert input independent of any political interference in to the Bill . I am fully for this, but the only thing is, let us not make this an issue where knowledge would be used.

Madam Chairperson, there is one other thing that I must admit.

ඇත්ත වශයෙන්ම මේවා interpret කරන්න ගියාම අධිකරණයත් ඇස් වහගෙන ඔහේ කරන්නේත් නැහැ. අධිකරණයත් යම්කිසි ආකාරයකට සමාජය, සංස්කෘතිය ඇතුළු හැම එකක්ම හිතට අරගෙන තමයි තීන්දු දෙන්නේ. කෙසේ වෙතත්, නීති පොතට ඕක ඇතුළත් කරන කොට අපට වගකීමක් තිබෙනවා. මොකද, ජාත්‍යන්තර වශයෙන් බලාගෙන ඉන්න කොට මේ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් නොවුණේ ඇයි කියන ප්‍රශ්නය එනවා. මොකද, ඊයේ පෙරේදාත් යම්කිසි special Act එකක් සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ කියන කොට මා දිහා බලලා කිව්වා, "You all are in Parliament. You should have looked into this matter" කියලා. ඒක නිසා "knowledge" කියන word එකයි, "intention" කියන word එකයි, ඒවායේ තිබෙන නෛතික ඵල විපාක - legal consequences - ගැනයි අපි පොඩ්ඩක් පැහැදිලි කර ගත්තොත් හොඳයි, දේශපාලනයෙන් ඔබ්බට ගිහිල්ලා. මේ සම්බන්ධ විශේෂඥයන් ඉන්නවා. විශේෂයෙන්ම child protection, child discipline වාගේ දේවල් සම්බන්ධයෙන් කටයුතු කරන්න නීතිපති දෙපාර්තමේන්තුව, ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංගමයට අනුබද්ධ ආයතන තිබෙනවා. ඒ විශේෂඥයන්ගෙන් මේ පිළිබඳව පොඩ්ඩක් දැනුවත් වුණා නම් හොඳයි කියලා මම හිතනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Chairperson, I am about to wind up.

බැලූ බැල්මට මෙතැන අනිවාර්යයෙන් ප්‍රශ්නයක් තිබෙන නිසාත් - බිල්ලෙක් මවනවා නොවෙයි මේ. බිල්ලෙක් මවන්න අවශ්‍යතාවක් නැහැ - "විනය" කියන කාරණාවට පොඩි ප්‍රශ්නයක් මතු විය හැකි නිසාත් මම මේ ගරු සභාවෙන් අවසාන වශයෙන් ඉල්ලීමක් කරනවා. Let us have another look at that whole section and let the Bill be referred back to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.03]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මෙම විවාදයේදී ගොඩක් කරුණු දැක්වීමට අවශ්‍ය වුණත්, කාල වේලාව හරස් වෙනවා. මෙම පනත් කෙටුම්පත හඳුන්වා දීලා දණ්ඩ නීති සංග්‍රහයේ 308, 314 සහ 316 යන වගන්තිවලට හරයාත්මක සංශෝධනයක් එකතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ළමුන් ගැන හිතලා ළමුන් ආරක්ෂා කිරීමට අදාළව වයස් සීමාවත්, දණ්ඩනයත් වැඩි කරලා මෙම සංශෝධන තුන එකතු කරලා තිබෙනවා. මා හිතන විධියට, මේක ඉතාම සුබවාදී කටයුත්තක්; රටේ ළමුන් ගැන හිතලා ගත් තීන්දුවක්.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගෙන් සද්භාවය සම්බන්ධයෙන් යෝජනාවක් ආවා. මම දණ්ඩ නීති සංග්‍රහයේ 74වන වගන්තිය පෙන්නලා කිව්වා, සමස්ත දණ්ඩ නීති සංග්‍රහයටම බලපාන "සද්භාවය" නමැති වචනය එම සංග්‍රහය තුළ තිබෙනවා, එම නිසා එය අලුතින් ආරෝපණය කිරීමේ අවශ්‍යතාවක් නැහැ කියලා. ඒ පදනමින් ගත්තොත් විෂය භාර අමාත්‍යවරියට සංශෝධනයකින් තොරව මේ යෝජනාව සම්මත කර ගැනීමට කිසිදු බාධාවක් ඇති වන්නේ නැහැ.

මේ සංවාදයේදී වැඩි වශයෙන් මතු වුණු කාරණාවක් තමයි, අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධ කාරණාව. ඇත්ත වශයෙන්ම මම ඒ ගැන කථා කරන්නත් නොවෙයි සිටියේ. නමුත්, අධිකරණය සම්බන්ධයෙන් දිගින් දිගටම කථා වෙච්ච නිසා මම ඒ ගැන කියන්නම්. හැබැයි, මම අභ්‍යන්තර කරුණු ගැන කථා කරන්නේ නැහැ. අපි අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීන්දු සාකච්ඡා කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111වැනි වගන්තියට පටහැනියි. ඒ වාගේම අධිකරණයට මැදිහත් වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ [111ඇ] වගන්තියට සපුරා පටහැනියි. නමුත්, මෙතැන ඇති වුණු වාද විවාද පදනම් කර ගත්තාට පස්සේ පෙනෙනවා, ඒ වාද විවාදවලට කිසිදු පදනමක් ඇත්තේ නැහැ කියලා. මොකද, මේ සියලු විනිශ්චයකාරවරුන්ගේ මාරුවීම්, උසස්වීම් සියල්ල කරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්. ඒවාට කිසිදු දේශපාලන බලාධිකාරියක් සම්බන්ධ වන්නේ නැහැ. ඒක නිසා ඉතාම ද්වේශාත්මක ප්‍රහාරයක් තමයි ඇතැම් මන්ත්‍රීවරුන්ගෙන් අධිකරණ සේවා කොමිසමටත්, අධිකරණයේ ස්වාධීනත්වයටත් එල්ල වුණේ.

විශේෂයෙන්ම මෙතැනදී පැන නැඟුණු කාරණාවක් තමයි, වසන්ත සමරසිංහ ඇමතිතුමාත්, මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් සම්බන්ධයෙන් මතු කරපු කාරණාව. ඊට අදාළ ලේඛනය සභාගත කළා කිව්වත්, තවමත් එම ලේඛනය මගේ අතට ආවේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
සභාගත කරපු ලේඛනය තබන්නේ පුස්තකාලයේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මේක හරිම අසාධාරණ කථාවක්. අපට ඒක පරිහරණය කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* හොඳයි, කමක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණය දිගින් දිගටම ගිය නිසා,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකේ පිටු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. දැන් තමයි මේක ඡායා පිටපත් කරලා මෙතැනට ගෙනාවේ. මම මේක සභාගත කළා කියලා එතුමාගේ අතට දෙන්න මට බලයක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සභාගත ලේඛන තබන්නේ first floor එකේ තිබෙන Library එකේ ස්ථානයක. සාමාන්‍යයෙන් එතැන තමයි සභාගත කරන ලේඛන තබන්නේ. ඕනෑ නම් මට දැන් මේක දෙන්න පුළුවන්. හැබැයි ඔය විධියට නම් කථා කරන්නේ, ඒක වැරැදියි. මොකද, මෙය එතුමාට දෙන්න මට බලයක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔබතුමා ඔය ලේඛනයේ පිටපත් ගහන්න අවශ්‍ය නැහැ. සභාගත කරන ලද ලේඛනයක් ඕනෑම මන්ත්‍රීවරයෙකුට පරිහරණය කරන්න පුළුවන්. එහෙම නම් ඔබතුමා ළඟ තිබෙන ඔය ලේඛනය දැන් මගේ අතට එවන්නකෝ. හරි සරලයි. එතකොට ප්‍රශ්නය ඉවරයි නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද කාරණා 2024 නවවැනි මාසයට අදාළ කාරණායි. 2024 නවවැනි මාසයේ හිටියේ නිලුපුලී ලංකාපුර ,- *[බාධා කිරීමක්]* නම් කියපු නිසායි මම මේ කියන්නේ. නිලුපුලී ලංකාපුර මහත්මිය තමයි 2024 නවවැනි මාසයේ හිටියේ. එතුමිය ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ හිටියේ. අපි මේ කථා කරන්නේ 2025 වර්ෂය ගැන. 2025 වර්ෂයේ ආන්දෝලනාත්මක කථාවක් පැන නැගුණේ චතුරිකා ද සිල්වා මහත්මිය සම්බන්ධයෙන්. එතුමිය හිටියේ 2025 අටවැනි මාසයේ. 2025 අටවැනි මාසයේ තමයි එතුමිය යන්න කලින් යම් නියෝගයක් මහින්ද ජයසිංහ,- *[බාධා කිරීමක්]* මේ තිබෙන්නේ. 2024.12.20වන දින නියෝගයක් නිකුත් කර තිබෙනවා, නිලුපුලී ලංකාපුර මහත්මිය. ඊට කලින්, නවවැනි මාසයේත් නියෝගයක් නිකුත් කර තිබෙනවා. 2024.12.20 දින නියෝගයක් තිබෙනවා; නවවැනි මාසයේත් නියෝගයක් තිබෙනවා.

මට කියන්න ඕනෑ මෙන්න මෙච්චරයි. මේ සියල්ල සිදු වී ඇත්තේ අපි බලයට පත්වීමට කලින්. මේ, අපේ ආණ්ඩුවට කලින් ගරු අධිකරණය ඉස්සරහා ඇති වුණු තත්ත්වයක්. දැන් මේ කථා කරන්නේ, ඊයේ පෙරේදා ආන්දෝලනාත්මක කාරණාවක් වුණේ, අප බලයට පත් වුණාට පසුව ගල්කිස්ස මහේස්ත්‍රාත්වරිය නියෝගයක් කර තිබෙන බව, වසන්ත සමරසිංහ අමාත්‍යවරයාත්, මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යවරයාත් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන්න කියලා. මම කියන්නේ, එය අතිශය නොමඟ යැවීමක්. එහෙම නියෝගයක් දී නැත. එහෙම නියෝගයක් කරලාද නැත. මේ නොමඟ යැවීමට අදාළ අනෙක් කාරණාව තමයි, චතුරිකා ද සිල්වා මහත්මිය මේ තීන්දුව පදනම් කර ගනිමින් කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණය වෙත මාරු කර ඇත කියන කාරණාව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්ත කථාව මේකයි. චතුරිකා ද සිල්වා මහත්මියට promotion එකක් හම්බ වෙලා තිබෙන්නේ. එතුමිය මහේස්ත්‍රාත්වරියක් ලෙස ඉඳලා දිසා විනිසුරුවරිය ලෙසයි කැස්බෑවට යන්නේ. එතකොට අවුරුදු 3ක් ඉන්න පුළුවන් කෙනා අවුරුද්දකින් මාරු කළේ ඇයි කියලා ප්‍රශ්නයක් ඇහුවා. ඉතින් හොඳයි නේ. අවුරුද්දකින් මාරු කරලා, දෙනවා උසස්වීමක්. ඇයට දීලා තිබෙන්නේ උසස්වීමක්. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විෂයගත කාරණාව හරිම පැහැදිලියි. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොඩි කාරණාවක් -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කැස්බෑව අධිකරණය ධුරාවලියේ ගල්කිස්ස අධිකරණයට වඩා ඉහළින්ද, පහළින්ද තිබෙන්නේ?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මම උත්තරය දෙන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,- *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් උසාවි යනවා, මමත් උසාවි යනවා. දිසා විනිසුරු කියන්නේ, දිසා අධිකරණය කියන්නේ- *[බාධා කිරීමක්]* ධුරාලියේ ඉහළ පහළ නැහැ. ඒක තමයි දිසා අධිකරණය. එතකොට දිසා අධිකරණය- *[බාධා කිරීමක්]* හරි, මට කියන්නකෝ, සිවිල්- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
It is not a promotion.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක promotion එකක් නොවෙයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඇයි ඉතින්, මහේස්ත්‍රාත්වරිය ලෙස ඉන්න කෙනා- *[බාධා කිරීම්]* නැහැ, නැහැ, හිනා වෙන්න එපා, නිකම් සමච්චලයට.

ඇත්ත කථාවක් මේ කියන්නේ. මහෙස්ත්‍රාත්වරිය ලෙස හිටපු කෙනා කැස්බෑවට යන්නේ දිසා විනිසුරුවරියක ලෙස නම්, එතුමිය ඊට පසුව practise කරන්නේ සිවිල් නඩු විධාන සංග්‍රහය. තේරුණාද? එතකොට එතුමියට තිබෙන්නේ සිවිල් නඩු අහන්න. *[බාධා කිරීම්]* ඔබතුමා පිළිගන්නවාද,- *[බාධා කිරීම්]* ඔබතුමා පිළිගන්නවාද, මහෙස්ත්‍රාත් අධිකරණයයි, දිසා අධිකරණයයි කියන්නේ දෙකක් කියලා?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දෙකක් තමයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මහෙස්ත්‍රාත් අධිකරණය පල්ලෙහා උසාවි කියලා පිළිගන්නවාද? *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම නැහැ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඇයි? *[බාධා කිරීමක්]* මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒවා නැති කරලා ගොඩක් කල්. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මහෙස්ත්‍රාත්- [බාධා කිරීම්] නිකම් නොමඟ යවන්න එපා. මහෙස්ත්‍රාත් අධිකරණය- [බාධා කිරීම්] මෙහෙමයි. මහෙස්ත්‍රාත්- [බාධා කිරීම්] කෙසේ නමුත්, එතුමියට දීලා තිබෙන්නේ- [බාධා කිරීම්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
It is not a promotion.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අනේ, ඔබතුමාට ඒක promotion එකක් නොවුණාට, විනිශ්චයකාරවරියට promotion එකක්. තේරුණාද? *[බාධා කිරීම්]* මහෙස්ත්‍රාත්වරිය විධියට ඉඳලා දිසා අධිකරණ විනිසුරුවරිය වෙනවා කියන්නේ promotion එකක්.

ඒ සියල්ල අමතක කරන්නකෝ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පටලවා ගත්තු තැනක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමියට ස්ථාන මාරුවීම් ලැබෙන්නේ 2025.08.19වැනි දා. 25වැනි දා ගිහිල්ලා එතුමිය වැඩ භාර ගන්නවා. මේ කියන තීන්දුව දීලා තිබෙන්නේ කවදාද? මෙතුමා කියවපු තීන්දුව දීලා තිබෙන්නේ 2024 අවුරුද්දේ 09වන මාසයේ. එතකොට ඉඳලා තිබෙන්නේ වෙන විනිශ්චයකාරතුමියක්, නිලුපුලී ලංකාපුර මහත්මිය. කොහේද යන්නේ, මල්ලේ පොල් කථා නේ මේවා. මේවාට තමයි කියන්නේ හතර බීරි කථා කියලා. 2024 අවුරුද්දේ 09වන මාසයේ දීපු තීන්දුවක් 2025දී දීපු එකක් ලෙස මෙතැනට ගෙනැල්ලා සභාගත කරනවා. අමු පට්ටපල් බොරුවක් ඒ කළේ. ඒක නිසා මේක තනිකර මේ ගරු සභාව නොමඟ යවපු කථාවක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසන් වෙලා තිබෙන්නේ. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාරණය හරි පැහැදිලියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
කාලය අවසන් වෙන්නේ කොහොමද? සභාවේ කටයුතු අවසන් වෙනතුරු පවත්වාගෙන යන්න කාලය ගත්තා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ සම්බන්ධයෙන් කියන්න තිබෙන අවසාන උත්තරය මේකයි. මෙතුමා 2024යි, 2025යි පටලවා ගෙන 2024දී දීපු තීන්දුවක් කියෙව්වා. එතකොට අපි බලයට පත් වෙලාත් නැහැ. මෙතැන හුවා දැක්වූවා අපි බලයට පත් වුණාට පස්සේ අපේ බලය පාවිච්චි කරලා, අපේ මන්ත්‍රීවරයෙකුට දීපු තීන්දුවක් නිසා ගරු විනිශ්චයකාරතුමිය මාරු කළා කියලා. 2025දී එහෙම තීන්දුවක් දීලා නැහැ, අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන්න කියලා. නමුත් නියෝගයක් දීලා තිබෙනවා. ඒ නියෝගයට අනුව මෙතුමන්ලා ගිහිල්ලා ප්‍රකාශයක් දීලා තිබෙනවා. ඒකයි ඇත්ත. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා නැවත පාරක් හොඳටම පටලවා ගෙන.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ නම කිව්වා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අපට කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි, ගරු මන්ත්‍රීතුමා. විවාදයකට යන්නේ නැතිව නතර වෙමු.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අනෙක් කාරණය මේකයි. තීන්දුවක් දෙන්නේ කොහොමද, මේ නඩුවේ සැකකාරයන් ලෙස මේ දෙන්නා නම් කරලාවත් නැත්නම්? තවම මෙතුමන්ලා සැකකාරයන් ලෙස නම් කරලාවත් නැහැ. ඉතින් කොහොමද අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන්නේ? ඒක නිසා මේ ගරු සභාව නොමඟ යවනසුලු ප්‍රකාශ කරන්න එපා. එතුමන්ලාගේ කණ්ඩායමට අවශ්‍ය වෙලා තිබෙන දේ මොකක්ද කියලා අපට පෙනෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ලන්ඩන් සමුළුවේදී සුහාෂිනී යෝගනාදන් අපේ සහෝදරිය "ගැහැනු අපි එක මිටට" කියන කාරණයේදී හරි ලස්සනට කිව්වා, මේගොල්ලන්ට වෙලා තිබෙන වැඩේ. මොකක්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
1951දී රටේ දේශපාලනය බෙදුණා, සේනානායක සහ බණ්ඩාරනායක ලෙස. එතකොට මිනිස්සුත් ඒ කඳවුරු දෙකට ගියා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? එතුමිය කියනවා, අද ජනතාවගේ කඳවුර ලෙස තේරුම් අරගෙන තිබෙන්නේ, ජාතික ජනබලවේගයේ කඳවුර කියලා. නමුත් මෙතුමන්ලා තෝරා ගෙන තිබෙනවා, සිරිකොත කඳවුර. අපි දැක්කා ඊයේ පෙරේදා කට්ටිය ලස්සනට එකතු වෙලා තිබුණා. ඒගොල්ලන් විතරයි. මිනිස්සු නැහැ. කොළඹ මහ නගර සභා ඡන්දයටත් ඒගොල්ලන් එකතු වුණා; මිනිස්සු නැහැ, පරාදයි. ඒ පරාජයේ වියරුව තමයි මේ පෙන්වන්නේ. ඒක නිසා හරි පැහැදිලියි, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Madam, I rise to a point of Order.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Point of Order එකක් නැහැ. ඔබතුමා මේ සභාව නොමඟ යවපු එක පිළිගන්න. ඔබතුමා 2024යි, 2025යි පටලවා ගෙන කථා කළේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සභාව මේ විධියට නොමඟ යවන්න දෙන්න බැහැ. මේ, 2024දී ඇති වෙච්ච තත්ත්වයක්. 2025ට අදාළව එහෙම නියෝගයක් ඇත්තේත් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අපට කාලය කළමනාකරණය කරන්න තිබෙනවා. කරුණාකරලා විවාදයකට නොයා නතර කරමු.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, මේ සභාව නොමඟ යවපු එක පිළිගන්න. 2024 අවුරුද්දේ 9වැනි මාසයේ වෙච්ච සිද්ධියක් 2025 අවුරුද්දේ 9වැනි මාසයට හුවා දක්වලා සභාව නොමඟ යවනවා. එය ස්ථාවර නියෝගවලට පටහැනියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය සම්බන්ධයෙන් විවාදයකට නොයා නතර කරමු.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
තවම මහේස්ත්‍රාත් අධිකරණයයි, දිසා අධිකරණයයි වෙන් කර ගන්න බැහැ, ඔබතුමාට. මහේස්ත්‍රාත් අධිකරණයයි, දිසා අධිකරණයයි පටලවා ගෙන.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ නම කිව්වා. මට අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තවම mike එක දෙන්නේ නැහැ; ඒ පැත්තේ mike එකමයි on වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමන්ලා කිව්වා, එහෙම නියෝගයක් දීලා නැහැ කියලා. මම ඒක ඔප්පු කරලා පෙන්නුවා. ඒක පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය, මහේස්ත්‍රාත් අධිකරණයෙන් දිසා අධිකරණයට promotion එකක් දුන්නා කියලා තමයි දැන් එතුමා කිව්වේ, කැස්බෑවට. ඒක උසස්වීමක් නොවෙයි. දැන් අධිකරණ ධුරාවලියේ එහෙම වෙනසක් වෙලා තිබෙනවා. තුන්වැනි කාරණය, එක්සත් ජාතික පක්ෂයේ කට්ටියත් එක්ක එකතු වෙලා ආණ්ඩු හදනවා කියලා එතුමා කිව්වා. එතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ කට්ටිය එකතු කරගෙන හැම තැනම ඒගොල්ලන්ගේ ප්‍රාදේශීය සභා හැදුවා. ඒවා හොඳයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඊළඟට, තොන්ඩමන්ගේ එක්කෙනා අරගෙන ගිහිල්ලා හැදුවා. හැම එක්කෙනාටම සල්ලි දීදී ප්‍රාදේශීය සභා හැදුවා. *[බාධා කිරීම්]* "කුඩු ලාල්" එක්ක එකතු වෙලා හැදුවා. *[බාධා කිරීම්]* ඒවා ඔක්කෝම හොඳයි. "කුඩු ලාල්" එක්ක එකතු වෙලා කොළඹ හැදුවා. ඒවා ඔක්කෝම හොඳයි. *[බාධා කිරීම්]* දැන් තමයි ප්‍රශ්නය තිබෙන්නේ. *[බාධා කිරීම්]* අනේ වටගල, - *[බාධා කිරීම්]* පාන්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේකට මැදිහත් වෙන්නේ නැහැ. නමුත් මේක තනිකරම පාර්ලිමේන්තුව නොමඟ යවමින්, අධිකරණ සේවා කොමිසමට සහ අධිකරණයට කරන අපහාසයක් නිසායි මම මෙච්චර කථා කරන්නේ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැන් යම් ලේඛන සභාගත කරනවා කියලා, ඒ පැත්තේ ඉඳලා ඒ දේවල්, ඒ ලේඛනයේ තිබෙන දේවල් කියලා, එතුමා කියපු කරුණු හරියි කියන්න නේ යන්නේ. එතුමා සභාගත කළ ලේඛනයෙන් ම මම කියන්නම්. 2024.12.20 දින ගල්කිස්ස මහෙස්ත්‍රාත්තුමිය හැටියට ඉන්නේ, නිලූපුලී ලංකාපුර මහත්මිය. ඒ මහෙස්ත්‍රාත්තුමිය එතැනින් පසුව කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට මාරුවීමක් ලබලා යනවා. ඊට පස්සේ එතුමියට මහාධිකරණ විනිශ්චයකාරතුමියක් හැටියට promotion එකක් ලැබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පළමුවැනි තීන්දුවෙන් පස්සේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පොඩ්ඩක් ඉන්න.

මේ, එතුමා ඉදිරිපත් කරපු ලේඛනය. 2025.02.21 දින ගල්කිස්ස මහෙස්ත්‍රාත් හැටියට ඉන්නේ, ඒ.ඩී. චතුරිකා ද සිල්වා මහත්මිය. එතකොට දැන් එතුමා කියන්න උත්සාහ කළේ මොකක්ද? මේ චතුරිකා ද සිල්වා මහෙස්ත්‍රාත්තුමිය දෙන ලද නඩු තීන්දුවක් නිසා, එතුමියට කැස්බෑව අධිකරණයට මාරුවීමක් හම්බ වුණා කියලා නේ. ආණ්ඩුව දේශපාලන බලපෑමක් කරලා, අධිකරණයට ඇඟිලි ගහලා, අවුරුද්දකට වඩා අඩු කාලයකදී මහෙස්ත්‍රාත්තුමියක් ගල්කිස්සෙන් කැස්බෑවට මාරු කළා කියලා නේ. ඒක නේ තර්කයේ පදනම වුණේ. ඒ මත පදනම් වෙලා තමයි ආණ්ඩුව අධිකරණයට බලපෑම් කරනවා, විනිශ්චයකාරවරු මාරු කරනවා කියලා කිව්වේ. හැබැයි, මේ චතුරිකා ද සිල්වා මහෙස්ත්‍රාත්තුමිය එහෙම දීපු අධිකරණ තීන්දුවක් නැහැ. එහෙම අධිකරණ නියෝගයක් නැහැ. 2025.02.21 දින නියෝගය මම කියවන්නම්.

"මෙම අවස්ථාවේදී අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් සඳහන් කර සිටින්නේ, ඔවුන්ගේ ස්ථාවරය සම්බන්ධයෙන් ලිඛිත දේශන ගොනු කරන බවය. ඒ අනුව එකී ලිඛිත දේශන සහ පැමිණිල්ලේ සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව සලකා බලා පසුව සුදුසු නියෝගයක් ප්‍රකාශයට පත් කරමි."

ඒ හැර නියෝගයක් ලබා දීලා නැහැ. එහෙම අත්අඩංගුවට -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ දිනය කවදාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
2025.02.21, චතුරිකා ද සිල්වා මහෙස්ත්‍රාත්තුමිය ඉන්න වෙලාවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එතකොට, එතුමිය මේ අයව අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මේ ගැන විවාදයකට නොයා ඉඳිමු.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ නිසා මේ සම්පූර්ණ කරුණු විකෘති කරලා මේ වෙලාවේ අධිකරණ සේවා කොමිෂන් සභාවටත් ඇඟිල්ල දිගු කරනවා. ඊළඟට, ආණ්ඩුවේ වුවමනාවට අධිකරණයේ විනිශ්චයකාරවරු මාරු කරනවා කියලායි මේ කියන්න හදන්නේ. නමුත් මේ චතුරිකා ද සිල්වා මහෙස්ත්‍රාත්තුමිය කැස්බෑව අධිකරණයට යවන්නේ එක කාලයක. නිලූපුලී ලංකාපුර මහත්මිය වෙනත් අධිකරණයකට මාරුවීමක් ලබා ගෙන ඇය මහාධිකරණයට යන්නේ තවත් කාලයක. ඉතින් මේ දෙක පටලවාගෙන, වැරදි තොරතුරු මත පදනම් වෙලා, කථාවක් ගොතලා දැන් කියන්න හදනවා, ආණ්ඩුව අධිකරණයට බලපෑම් කරනවා කියලා. මේ සම්පූර්ණයෙන්ම පටලවාගෙනයි තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා දැන් පිළිගන්න. මේ ලේඛනය අපි අතට ගත්තේ නැත්නම් එහෙම එතුමා මේ ලේඛනය පෙන්වලා කියපු දේ හරි කියලා පිළිගන්න සිද්ධ වෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. අපි කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා ආපහු මගේ නම සඳහන් කළා. ඉතින් මට විනාඩියක් දෙන්න, ඒක පැහැදිලි කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තත්පර 30කින් කියලා ඉවර කරන්න. මේක ඉවරයක් වෙන්නේ නැහැ නැත්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම බොහොම පැහැදිලිව කිව්වේ, නියෝග දෙකක් දීලා තිබෙනවා,- මම කිව්වේ නැහැ, අර මහෙස්ත්‍රාත්ද, මේ මහෙස්ත්‍රාත්ද කියලා. *[බාධා කිරීම්]* මෙතුමන්ලා ඇහුවා ඉස්සර වෙලා, - *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* ඉන්න, ඉන්න. කලබල කරන්න එපා. *[බාධා කිරීම්]* මම බොහොම පැහැදිලිව - *[බාධා කිරීම්]* ඒගොල්ලන් කිව්වා ඔප්පු කරන්න කියලා, මහෙස්ත්‍රාත් උසාවියක අත්අඩංගුවට ගැනීමේ නියෝගයක් දීලා තිබෙනවාද කියලා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඒ දීලා තිබෙන නියෝග දෙකම ඉදිරිපත් කළා. *[බාධා කිරීම්]* මට ඉදිරිපත් කරන්න බැහැ කියලා නේ කිව්වේ. ඉතින් ඒක තමයි ඉදිරිපත් කළේ. *[බාධා කිරීම්]* ඉතින් තව මොකක්ද කථා කරන්නේ? *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, දැන් අවසන්. දැන් තවත් කථා කරන්න එපා, ඇති. අපට තවත් වැඩ තිබෙනවා. දැන් වෙලාව පස් වරු 5.20යි.

ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පාර්ලිමේන්තුවේ විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම සඳහා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට වචන කිහිපයක් එක වාක්‍යයකට ගළපා කියන්න පුළුවන්, "වසන්ත සමරසිංහ ඇමතිතුමා සම්බන්ධයෙන් අධිකරණ නියෝගය ලබා දුන් මෙන්න මේ මහෙස්ත්‍රාත්තුමිය ආණ්ඩුව විසින් මැදිහත් වෙලා අධිකරණ සේවා කොමිසම හරහා මාරු කළා" කියලා. දැන් ඒක කියන්න, පුළුවන් නම්. *[බාධා කිරීම්]* දැන් ඒක කියන්නකෝ, පුළුවන් නම්. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කිව්වා නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
කියන්නකෝ. *[බාධා කිරීම්]* දැන් කියන්නකෝ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම කියන්නම්. ඉස්සෙල්ලා එතුමියව කොටුව අධිකරණයට මාරු කළා. මේ වැඩේ යනකොට එතුමියව කොටුව අධිකරණයට මාරු කරලා. එතුමිය කොටුව අධිකරණයට මාරු කරලා ඊට පස්සේ තමයි කැස්බෑවට යවන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
කැස්බෑව අධිකරණයට යවන්නේ අනෙක් එක්කෙනාව.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, අනික් එක්කෙනා. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉන්දියාව පාස්කු ප්‍රහාරය එල්ල කළේ නැහැයි කියලා මෙතුමාට දැන් කියන්න කියලා කියන්න. *[බාධා කිරීම්]* ඉන්දියාව පාස්කු ප්‍රහාරය එල්ල කළේ නැහැයි කියලා කියන්න. විනාඩියක් දෙන්නම්. විනාඩියක් දෙන්නම්, කියන්න. ඇයි, ඇයි, ඔබතුමා කියන්නේ නැත්තේ? *[බාධා කිරීම්]* දැන් ඉන්දියාවට ගිහිල්ලා,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරමු. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා තමයි එතුමාට මේ ලණුව ගිල්ලෙව්වේ. [බාධා කිරීම්] අර, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා හිනා වෙවී ඉන්නවා. ලණුව ගිල්ලුවා, දයාසිරිට. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. ගල්කිස්ස මහෙස්ත්‍රාත්තුමිය, කොටුව අධිකරණයේ මහෙස්ත්‍රාත්තුමිය වෙලා, ඊළඟට මහාධිකරණයට ගියා. හරිද? [බාධා කිරීම්] ගල්කිස්සෙන් කැස්බෑවට මාරු කළේ නැහැ, එතුමියව. මේක තනිකරම කරුණු නොමඟ යැවීමක්. කරුණාකරලා පිළිගන්න, වැරදුණා කියලා. එතකොට ඉවරයි කථාව. පිළිගන්නකෝ, එතකොට ඉවරයි, ගරු දයාසිරි මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒවා වැඩක් නැහැ. ඔබතුමා අසත්‍ය තොරතුරු කියලා වැරැද්දක් කළේ කියන එක, - [බාධා කිරීම්] එතුමාට mike එක දෙන්න. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අද මේ කටයුතු ඉවර කරන්න අවස්ථාවක් දෙන්නේ නැද්ද? *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා තමයි මෙතුමාව අමාරුවේ දැම්මේ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.*[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. දැන් අපි දෙන්නාම පිළිගනිමු. ඉන්දියාව පාස්කු ප්‍රහාරය එල්ල කළේ නැහැ කියලා, -[බාධා කිරීම්] ඒක පිළිගන්න.[බාධා කිරීම්] ඒක පිළිගන්නවා නම්, මමත් අර කාරණය පිළිගන්නම්. හා, - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම සභාව එකඟද? *[බාධා කිරීම්]*

ගරු කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය.*[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මන්ත්‍රීවරු පටලන එකේ සීමාවක් තිබෙන්න ඕනෑ. එහෙම බැහැ නේ. මට විනාඩියක් ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
දණ්ඩ නීති සංග්‍රහය, - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කරුණාකර සභාව නිහඬ වෙන්න. *[බාධා කිරීම්]*

ගරු කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, - *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැවත විනාඩියක් දෙන්න බැහැ. කොහොමද එහෙම කරන්නේ? *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීවරුනි, තවදුරටත් විවාදයකට නොයා අවසන් කරමු. ගරු කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අර, ඇමතිතුමියට කථා කරන්න දෙන්න. මොකක්ද මේ කරන්නේ?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තත්පරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තවදුරටත් විවාදාත්මක, - *[බාධා කිරීම්]* මේක ඉවර වෙන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, චෝදනා කළා. *[බාධා කිරීම්]*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත,- *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොඩි වෙලාවක් දෙන්න. [බාධා කිරීම්] තත්පර 30ක් දෙන්න. කලින් කිව්වේත් බොරු. තත්පර 30ක් දෙන්න.[බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මේ කාරණය විවාදයක් දක්වා ගෙන යන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තත්පර 30ක් දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තත්පර 30ක් දුන්නාම, ඒ ගැන නැවත මේ පැත්තෙන් කථා කරනවා. *[බාධා කිරීම්]*

අපි මේ කටයුතු ඉවර කරන්නේ කීයටද?*[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අර ඇමතිතුමියට කථා කරන්න දෙන්න.*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විවාදයකට නොයා අපි මේක නතර කරමු, ගරු මන්ත්‍රීවරුනි. *[බාධා කිරීමක්]* ඔබතුමා ඉන්න. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තත්පර 30ක් දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමියට කථා කරන්න ඉඩ දෙන්න.*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තත්පර 30ක කාලයක් දෙනවා. ඒකට පිළිතුරක් දෙන්න ඕනෑ නම් මේ පැත්තටත් තත්පර 30ක කාලයක් දෙනවා එච්චරයි.*[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමිය පැය ගණනක් බලාගෙන ඉන්නවා, කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමියනි, ඔබතුමියගේ ප්‍රකාශය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) නමැති පනත් කෙටුම්පත සමඟ බද්ධ වී තිබෙන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) නමැති පනත් කෙටුම්පතත් ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත බැවින් ද, එකී යෝජිත පනත් කෙටුම්පත හා සමඟ මෙම (සංශෝධන) පනත් කෙටුම්පත තවදුරටත් විවාදයකට භාජන විය යුතු බැවින් ද, ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි සභාවේ අවසරය ඇතිව දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) නමැති පනත් කෙටුම්පතෙහි දෙවන වර කියවීමේ අද දින විවාදය ඉදිරි දිනකට කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2025 සැප්තැම්බර් 21 දිනැති අංක 2454/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2025.09.23 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය, වැඩබලන අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு பதில் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media, Acting Minister of Justice and National Integration and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ අවස්ථාවේ නියමිතව තිබෙන්නේ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න අහන්න. [බාධා කිරීම්] නැහැ, නැහැ, මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක් තිබෙනවා. [බාධා කිරීම්] මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න දෙන්නේ නැද්ද? [බාධා කිරීම්]

මොකක්ද ඉල්ලීම? [බාධා කිරීම්] සභාව කල් තබා අවසන්. මට දැන් ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] points of Order වෙනුවෙන් එහෙම කොහොමද ඉඩ දෙන්නේ? සභාව කල් තබා අවසන්. [බාධා කිරීම්] මට දැන් ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] ප්‍රශ්නයක් තිබෙනවා නම් හෙට අහන්න පුළුවන්. අද බැහැ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. සභාව කල් තබා අවසන්. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම කනගාටු වෙනවා. සභාව කල් තබා තිබෙන අවස්ථාවේ දැන් නියමිතව තිබෙන්නේ මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. සෑහෙන වෙලාවක් ගියා මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව ගන්න. හරි අසාධාරණයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සභාව කල්තබන අවස්ථාවේදී මම මේ ප්‍රශ්නය ගරු අග්‍රාමාත්‍යතුමිය වෙත ඉදිරිපත් කරනවා.

01. වත්මන් රජය බලයට පත් වීමෙන් පසු පිහිටුවන ලද ඒකපුද්ගල, ද්විපුද්ගල සමස්ත කොමිෂන් සභා ප්‍රමාණය කොපමණද?
02. එම කොමිෂන් සභාවල නම් මොනවාද?
03. එක් එක් කොමිෂන් සභාවල සාමාජිකයන්ගේ නම් සහ තනතුරු මොනවාද?
04. එම තනතුරුවලට පත් වීමට පෙර සේවය කළ ස්ථාන සහ දරන ලද තනතුරු මොනවාද?
05. ඔවුන් වෙත ලබාදෙන වේතන හා දීමනා මොනවාද?
06. එම සාමාජිකයන් වෙත ලබාදෙන වේතන හා දීමනාවල එකතුව රටේ සමස්ත ආදායමෙන් කොපමණ ප්‍රමාණයක්ද?
07. එම කොමිෂන් සභාවල කටයුතු පවත්වාගෙන යන ස්ථාන මොනවාද?
08. ඒ සඳහා රජයෙන් මාසිකව වැය කරන මුදල කොපමණද?
09. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආයෙත් මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීම්] ආයෙත් මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීම්] ආයෙත් ප්‍රශ්න ඇති කර ගන්න හදන්න එපා. [බාධා කිරීම්] ආයෙත් ප්‍රශ්න ඇති කරගන්න හදන්න එපා. [බාධා කිරීම්] මගේ ප්‍රශ්නයට දැන් උත්තර දෙන්න තිබෙන්නේ. ගරු අගමැතිතුමියනි, ඔබතුමිය උත්තරය ලබා දෙන්න. [බාධා කිරීම්] මේක සම්පූර්ණයෙන් වැරදියි. [බාධා කිරීම්] සම්පූර්ණ වැරදියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක්ද, point of Order එක? *[බාධා කිරීම්]* මොකක්ද, point of Order එක? *[බාධා කිරීම්]* What is the point of Order?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, point of Order එක කියන්න. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
Standing Order No. 91 යටතේ මම කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතුමා දිගින් දිගටම නඩු ගැන බොරු ගොඩක් කිව්වා. *[බාධා කිරීම්]* අපිව සැකකරුවෝ ලෙස නම් කරලා නැහැ. *[බාධා කිරීම්]* ඒ විතරක් නොවෙයි. *[බාධා කිරීම්]* මොනවාදෝ ඇඳුම් ගලවපු එකක් ගැනත් කිව්වා. *[බාධා කිරීම්]* ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා මම මේ මන්ත්‍රීතුමාට කියනවා. *[බාධා කිරීම්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මන්ත්‍රීතුමාට කියනවා. මාව සැකකරුවෙක් විධියට නම් කරපු එකයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ පිළිතුරු ලබා දීමේ අවස්ථාව. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Point of Order! - *[Interruption.]*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01. වත්මන් රජය බලයට පත් වීමෙන් පසු කොමිෂන් සභා පිහිටුවා නැත. *[බාධා කිරීම්]* එම නිසා ප්‍රශ්න අංක 02 සිට 09 දක්වා අදාළ නැත. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
I rise to a point of Order! ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට mike එක දෙන්න. *[බාධා කිරීම්]* මට mike එක දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. තත්පර 30යි. *[බාධා කිරීම්]* ආයෙත් විවාදයකට නොයා ඉඳිමු.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ, සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න අහන වෙලාව. ඔබතුමිය ඉතා නරක පළපුරුද්දක් මේ ලබා දුන්නේ. මම ප්‍රශ්නය ඇහුවාට පස්සේ ඊළඟට තිබෙන්නේ ගරු අගමැතිතුමිය උත්තර දෙන එක. නියෝජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න මෙච්චර කාලයක් තිබුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Point of Order එකකට අවස්ථාව, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මඩ ගහන්න සූදානම් නැහැ. හැබැයි, එක එක චෝදනා ආරෝපණය කරලා තිබුණු ඒ සියලු දේවල් අයින් කරන්න කියන්න. හැන්සාඩ් වාර්තාවේ බොහොම පැහැදිලිව තිබෙනවා. *[බාධා කිරීම්]* හැබැයි මම කියන්නම්, මම mike එක දාලා කවදාවත් ඔබතුමාට එහෙම මඩ ගහලා නැහැ. ගල්නෑවේ සිද්ධ වුණු සිද්ධියයි ඔක්කෝම මම ඕනෑ නම් කියන්නම්. මම ඒක කියන්න සූදානම් නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා මම ඔක්කෝම කියන්නම්. *[බාධා කිරීමක්]* ඒ නිසා කරුණාකරලා මේක කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල් තබන අවස්ථාවේ දෙවැනි ප්‍රශ්නය, ගරු දීප්ති වාසලගේ මහත්මිය. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අගමැතිතුමියට උත්තර ලබා දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එතුමිය උත්තර දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කොහේද උත්තර දුන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එතුමිය උත්තර දුන්නා. ඊට පස්සේ තමයි ඔබතුමාට අවස්ථාව දුන්නේ. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපට ඇහුණේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමියනි, ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] ගරු අගමැතිතුමිය උත්තර දුන්නා. [බාධා කිරීම්]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]* ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම මේ රීති ප්‍රශ්නයක් අහන්නේ. හරි ද? රීති ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පර 30යි. මම රීති ප්‍රශ්නයක් අහන්නේ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් කට වහගෙන ඉන්න. *[බාධා කිරීම්]* Point of Order එකක් ඉල්ලපු නිසා මාව මේ සභාවෙන් එළියට දාලා ලජ්ජා වැඩ කරන්න එපා. ඔය පුටුවට ගෞරවය තියන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ඇමතිතුමනි, කාන්තාව සහ දරුවා කියන්නේ, සමාජ සංවර්ධනයේ එක්තරා මිනුම් දණ්ඩක්. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අගමැතිතුමිය උත්තරය ලබා දුන්නා. *[බාධා කිරීම්]* හැන්සාඩ් එකෙන් තමයි ගන්න වෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක්ද මේ කරන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එතුමිය උත්තරය දුන්නා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බලන්න, *[බාධා කිරීම්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)
අපේ රටේ දරුවන් සහ කාන්තාවන් අන්තර්ජාලය ඔස්සේ ලිංගික අපයෝජනයට ලක් වීම වැඩි වෙලා තිබෙනවා කියලා පුවත් පත් නිවේදනයක් තිබෙනවා. *[බාධා කිරීම්]* රටක් සංවර්ධනය වෙන්න නම් සමාජ ආරක්ෂාව, ආර්ථික රැකවරණය, සමාජයේ ආදරය දරුවන්ට සහ කාන්තාවන්ට ලැබිය යුතුයි.

අපේ රටේ අන්තර්ජාලය ඔස්සේ කාන්තාවන් සහ දරුවන් අපයෝජනයට ලක්වීම මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය නිසා වැඩි වෙලා තිබෙනවා කියලා අපට දැනෙනවා. අපි රටක් වශයෙන් බොහොම අසීරු තත්ත්වයකයි හිටියේ. මේ රටේ අද සොයා ගන්නා කෝටි ගණනක් වටිනා, කිලෝ ගණනක් වූ මත්ද්‍රව්‍ය මේ සමාජය තුළ ව්‍යාප්ත වුණා නම්, අපේ රටේ කාන්තාවන් සහ දරුවන් නැත්තටම නැති වෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ මත්ද්‍රව්‍ය සොයා ගැනීම පිළිබඳව විවිධ කථා කියනවා. ඒ ගැනත් මම යමක් කියන්න ඕනෑ. එක්තරා පක්ෂයක මහ ලේකම් කෙනෙක් කියනවා, අපේ ආණ්ඩුව ආවාට පස්සේ කන්ටේනර් ගණනින් මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වෙලා තිබෙනවා කියලා. නමුත්, මම මේ කාරණයත් කියන්න ඕනෑ. පාතාලය සහ මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන්ට දේශපාලන රැකවරණය තිබෙනවා නම් තමයි ඔවුන් රැකෙන්නේ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පත් වූ දවසේ සිට පාතාලයට සහ මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන්ට දේශපාලන රැකවරණය නැති නිසා තමයි අද මත්ද්‍රව්‍ය මේ සා විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. පාතාලයේ මැර කල්ලි මේ තරම් අත්අඩංගුවට පත් වන්නේ අපේ ආණ්ඩුව බලයට පත් වූ නිසායි.

රටක් වශයෙන් අපි දැනගත යුතුයි, අන්තර්ජාලය ඔස්සේ අපේ කාන්තාවන්ට, දරුවන්ට සිදු වන ලිංගික අපයෝජනවලින් ඔවුන්ව වළක්වා ගන්නේ කොහොමද කියලා. අපේ කාන්තාවන් සහ දරුවන් මහ මඟදී, ප්‍රවාහනයේ යෙදෙන අවස්ථාවලදී, සේවා ස්ථාන ඇතුළු සියලුම ස්ථානවලදී අපයෝජනයට ලක් වෙනවා. අපි සමාජයක් වශයෙන් මේ දේවල් අඩු කර ගත යුතුයි. ඒ වෙනුවෙන් මේ පිළිබඳව ප්‍රශ්න කරන්න අපට අයිතියක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ අනුව මම ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් පහත ප්‍රශ්න අසනවා.

01. පසුගිය වසරේ සහ 2025 වසරේ අගෝස්තු මස දක්වා අන්තර්ජාලය ඔස්සේ කාන්තාවන්ට සහ දරුවන්ට සිදුව ඇති ලිංගික අපයෝජන සිදුවීම් කොපමණ ප්‍රමාණයක් වාර්තා වී තිබෙනවාද?

02. මෙවැනි සිදුවීම් සඳහා වැඩි අවදානම් කණ්ඩායම් හඳුනාගෙන තිබේද?

03. කාන්තාවන්ට සහ දරුවන්ට සිදුවන ලිංගික අපයෝජන සිද්ධීන් වාර්තාවීමේදී ඒ සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

04. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ගැනීමට බලාපොරොත්තු වන පියවර මොනවාද?

05. ඊට අමතරව මත්ද්‍රව්‍ය හා සම්බන්ධ කටයුතුවලදී දරුවන් සහ කාන්තාවන් යොදා ගනිමින් සිදු කරන ප්‍රවාහන හා අළෙවි කිරීම් හරහා ද දරුවන් සහ කාන්තාවන් දැඩි අවදානමකට ලක්වන අතර, එවැනි තත්ත්වයන්ගෙන් ඔවුන් මුදා ගැනීම වෙනුවෙන් ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග මොනවා ද?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01.

| වර්ෂය | ළමා | කාන්තා | එකතුව |
|---|---|---|---|
| 2024 | 15 | 375 | 390 |
| 2025 ජනවාරි සිට අගෝස්තු දක්වා | 28 | 118 | 146 |

02. ඔව්. අධි අවදානම්, ඉහළ අවදානම්, අවදානම්, අඩු අවදානම්, සාමාන්‍ය අවදානම් වශයෙන් වර්ගීකරණය කර හඳුනා ගැනීමකට ලක් කර ඇත.

03.

* ළමා හා කාන්තා කාර්යාංශය තුළ ස්ථාපිත 109 ක්ෂණික දුරකථන ඇමතුම් අංකය මඟින් පැය 24 පුරාම ළමුන්ට සහ කාන්තාවන්ට සිදුවන හිංසන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සඳහා කඩිනමින් ක්‍රියාත්මක වී විමර්ශනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

[ගරු ආනන්ද විජේපාල මහතා]

* එමෙන්ම, ළමුන්ට සහ කාන්තාවන්ට සිදුවන හිංසන සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා cwb.online@police.gov.lk විද්‍යුත් ලිපිනය හා 0718595823 WhatsApp අංකය හඳුන්වා දීම හා එම ලැබෙන පැමිණිලි සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක වී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

* අතුරුදහන් වූ දරුවන් සොයා ගැනීම, ලිංගික සූරාකෑම අවම කිරීමට සහ ළමා වින්දිතභාවය වැළැක්වීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ ස්ථාපිත කර ඇති අතුරුදහන් වූ හා සූරාකෑමට ලක් වූ ළමුන් සඳහා වන ජාතික මධ්‍යස්ථානය - National Centre for Missing and Exploited Children, NCMEC - මඟින් සයිබර් අවකාශය තුළ බාල වයස්කාර ළමුන් ලිංගික ක්‍රියාවන් සඳහා පොළඹවා ගැනීම්, ළමා ලිංගික අපයෝජනය, ළමා කාමුක දර්ශන, ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය, ළමා ලිංගික ජාවාරම්, ළමයින් වෙත යොමු කරන ලද අනවශ්‍ය අසභ්‍ය ද්‍රව්‍ය හා ඩිජිටල් අසභ්‍ය රූප සම්බන්ධයෙන් වන තොරතුරු www.missing.org/cybertipline සහ NCMECහි ඇමතුම් මධ්‍යස්ථානය 1-800-THE-LOST(1-800-843-5678) හරහා ළමා හා කාන්තා අපයෝජන නිවාරණ විමර්ශන කාර්යාංශය මඟින් ලබා ගැනීමට කටයුතු කර එම වැරදි ක්ෂණිකව විමර්ශනය කිරීමට මේ වනවිට කටයුතු යොදා ඇත.

04.

* ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ නිලධාරින් හා පොලිස් ස්ථානවලට අනුයුක්ත මහජන ආරක්ෂක කමිටු නිලධාරින් සමඟ වසමේ සිටින අනාරක්ෂිත ළමුන් හඳුනා ගැනීම, වැඩි වශයෙන් ළමුන් සම්බන්ධ අපරාධ වාර්තා වන ප්‍රදේශ සම්බන්ධයෙන් සොයා බලා ළමුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම හා අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන් සුදුසු භාරකාරත්වයට පත් කිරීම.

* වර්තමානයේ වැඩි වශයෙන් අන්තර්ජාලයෙන් ළමුන්ට හා කාන්තාවන්ට සිදු වන අපරාධ සම්බන්ධයෙන් ටික්ටොක් මාධ්‍ය හරහා අදාළ පාර්ශ්ව දැනුවත් කිරීමට මාධ්‍ය කොට්ඨාසය හා ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය සමඟ එක්ව මේ වනවිට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

* ළමුන් විසින් දුරකථන හා අන්තර්ජාලය භාවිත කිරීමේදී නිසි දැනුවත්වීමකින් තොරව අනිසි ලෙස භාවිතයට ගෙන ඇති බැවින් ඒ සම්බන්ධව වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වාගෙන යෑම.

* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ළමුන් හා කාන්තාවන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන උපදේශන නිලධාරින්, වනිතා සංවර්ධන නිලධාරින්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් හා දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරින් ඇතුළු අදාළ නිලධාරින් සම්බන්ධීකරණය කර ගනිමින් ඉහත පාර්ශ්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

* ශ්‍රී ලංකාවේ සියලු පොලිස් කොට්ඨාස ආවරණය වන පරිදි ළමුන්, කාන්තාවන්, වැඩිහිටියන් හා රාජ්‍ය සේවකයන් වෙන් වෙන් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම.

* එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - UNDP - හා එක්ව ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මඟින් අන්තර්ජාලය ඔස්සේ කාන්තාවන්ට සහ දරුවන්ට සිදු වන ලිංගික අපයෝජන සම්බන්ධයෙන් පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් පැවැත්වීමට මේ වනවිට කටයුතු කර ඇත.

05.

* මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථාන මට්ටමින් දැනුවත් කිරීමේ දේශන පවත්වා මහජන ආරක්ෂක කමිටු නිලධාරින් මඟින් තොරතුරු ලබාගෙන අදාළ පාර්ශ්වයන් එම කටයුතුවලින් මුදා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

* බුද්ධි අංශ නිලධාරින් මඟින් තොරතුරු ලබා ගනිමින් එම තොරතුරු මත ළමුන් හා කාන්තාවන් මෙම කටයුතුවලින් මුදා ගැනීමට කටයුතු කිරීම.

* පාසල් අවට හා පාසල් ළමුන් වැඩි වශයෙන් ගැවසෙන ස්ථාන තෝරාගෙන ආවේක්ෂණ රාජකාරි යොදවා තොරතුරු ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

* විශේෂයෙන් දෙමව්පියන්, පාසල් ගුරුවරු හා පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරු මේ සම්බන්ධව දැනුවත් කිරීම හා නෛතික තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

*එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.45ට, 2025 සැප්තැම්බර් 25වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.45க்கு, பாராளுமன்றம் 2025 செப்ரெம்பர் 25, வியாழக்கிழமை மு.ப 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.45 p.m. until 9.30 a.m on Thursday, 25th September, 2025.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශකයන්: විස්තර
பாதுகாப்பு அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
ADVISERS TO MINISTRY OF DEFENCE: DETAILS

328/2024

**1. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආරක්ෂක අමාත්‍යාංශයට මේ වනවිට පත් කර ඇති උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපදේශකයන්ගේ කාර්යභාරය කවරේද;

(iii) එම එක් එක් උපදේශකයාට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා, පෙර සේවා ස්ථානය/ස්ථාන, අවසන් වරට දරන ලද තනතුර, අධ්‍යාපන සුදුසුකම් සහ 2024 වර්ෂය වනවිට වයස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම උපදේශකයන්ට කාර්ය මණ්ඩලයක් ලබා දී තිබේද;

(v) එසේ නම්, එම එක් එක් උපදේශකයාගේ කාර්ය මණ්ඩල සේවකයන්ගේ නම්, ඔවුන්ගේ තනතුරු, ඔවුන්ගේ මාසික වැටුප් හා දීමනා සහ එම සේවකයන් අනුයුක්ත කර තිබේ නම්, ඔවුන්ගේ මුල් සේවා ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பாதுகாப்பு அமைச்சுக்கென இன்றளவில் நியமிக் கப்பட்டுள்ள ஆலோசகர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அந்த ஆலோசகர்களின் பணிப்பொறுப்புகள் யாவை என்பதையும்;

(iii) அத்தகைய ஒவ்வோர் ஆலோசகருக்கும் செலுத் தப்படுகின்ற மாதாந்தச் சம்பளம் மற்றும் கொடுப்பனவுகள், முந்தைய சேவை நிலையம்/ நிலையங்கள், இறுதியாக வகித்துள்ள பதவி, கல்வித் தகைமைகள் மற்றும் 2024ஆம் ஆண்டளவில் வயது வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) அத்தகைய ஆலோசகர்களுக்கென பணியாட் டொகுதி ஒன்று வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அத்தகைய ஆலோசகர் ஒவ்வொரு வரினதும் பணியாட்டொகுதியில் உள்ள பணியாளர்களின் பெயர்கள், அவர்களின் பதவிகள், அவர்களின் மாதாந்தச் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் அத்துடன் அப் பணியாளர்கள் இணைக்கப்பட்டிருப்பின், அவர்களின் முந்தைய சேவை நிலையங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House-

(i) the number of advisers appointed to the Ministry of Defence at present;

(ii) the role of those advisers;

(iii) the monthly salaries and allowances paid, previous workplace(s), position last held, education qualifications and ages as at 2024 in respect of each of those advisers, separately;

(iv) whether those advisers have been provided with a staff; and

(v) if so, the names of the staff members assigned to each adviser, their positions, their monthly salaries and allowances and if they are appointed on secondment basis, their previous places of work, separately?

(b) If not, why?

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**

(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)

(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) ආරක්ෂක අමාත්‍යාංශයට උපදේශකයන් පත් කර නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

(அ) (i) பாதுகாப்பு அமைச்சுக்கு ஆலோசகர்கள் யாரும் நியமிக்கப்படவில்லை.

(ii) பொருந்தாது.

(iii) பொருந்தாது.

(iv) பொருந்தாது.

(v) பொருந்தாது.

(ஆ) ஏற்புடையதன்று.

(a) (i) No advisers have been appointed to the Ministry of Defence.

(ii) Not applicable.

(iii) Not applicable.

(iv) Not applicable.

(v) Not applicable.

(b) Does not arise.

***ගරු නීතිඥ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 543/2025 - පිළිතුරු දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය සති දෙකක කාලයක් ඉල්ලා ඇත.***

*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 543/2025 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.*

*The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education has requested for two weeks' time to reply to Question No. 2 - 543/2025 - raised by the Hon. Dayasiri Jayasekara appearing in today's Order Paper.*

***ගරු නීතිඥ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 545/2025 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය සති දෙකක කාලයක් ඉල්ලා ඇත.***

*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 545/2025 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.*

*The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education has requested for two weeks' time to reply to Question No. 3 - 545/2025 - raised by the Hon. Dayasiri Jayasekara appearing in today's Order Paper.*

***ගරු නීතිඥ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 4වන ප්‍රශ්නයට - 546/2025 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය සති දෙකක කාලයක් ඉල්ලා ඇත.***

*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 4ஆம் இலக்க வினாவுக்கு - 546/2025 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.*

*The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education has requested for two weeks' time to reply to Question No. 4 - 546/2025 - raised by the Hon. Dayasiri Jayasekara appearing in today's Order Paper.*

## 2020 සිට විදේශගත වූ ශ්‍රමිකයන්: විස්තර
## 2020இலிருந்து புலம்பெயர்ந்த தொழிலாளர்கள்: விபரம்
## WORKERS MIGRATED FROM 2020: DETAILS

1298/2025

**5. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව, ඔවුන් විසින් ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය සහ එම විදේශ විනිමය ප්‍රමාණය ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් ඉහළ ඉල්ලුමක් පවතින රටවල් කවරේද;

(iii) එම ඉල්ලුම සපුරාලීම සඳහා රජය සතු වැඩ පිළිවෙළ කවරේද;

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා ඉහත(ii)හි සඳහන් රටවල රැකියා සඳහා යොමු කර ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට වැඩි ප්‍රතිලාභ අත්වන ශ්‍රම වෙළෙඳ පොළක් පවතින රටවල් කවරේද;

(vi) එම රටවලට ඉහළ නිපුණතාවකින් යුත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை இலங்கையிலிருந்து வெளிநாடுகளுக்கு தொழில் வாய்ப்புகளுக்காகச் சென்றுள்ள தொழிலாளர்களின் எண்ணிக்கை, அவர்களால் அனுப்பப்பட்ட அந்நியச் செலாவணியின் அளவு மற்றும் அவ்வாறு அனுப்பப்பட்ட அந்நியச் செலாவணியின் அளவானது இலங்கையின் மொத்தத் தேசிய உற்பத்தியின் வீதமாக ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்காக இலங்கை தொழிலாளர்களுக்கு அதிக கிராக்கி நிலவும் நாடுகள் யாவை என்பதையும்;

(iii) அத்தேவையைப் பூர்த்திசெய்வதற்கு அரசாங்கத் திடமுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

(iv) மேலே (ii)இல் குறிப்பிட்ட நாடுகளுக்கு 2020ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை தொழில் வாய்ப்புகளுக்காகச் சென்றுள்ள இலங்கைத் தொழிலாளர்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(v) இலங்கைத் தொழிலாளர்களுக்கு அதிக நன்மை பயக்கும் ஊழியச் சந்தை காணப்படுகின்ற நாடுகள் யாவை என்பதையும்;

(vi) மேற்படி நாடுகளுக்கு அதிக தேர்ச்சி மிக்க இலங்கைத் தொழிலாளர்களை அனுப்புவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House-

(i) number of Sri Lankan migrant workers who have migrated for employment since 2020 to date, the amount of foreign exchange remitted by them and the amount of that foreign exchange as a percentage of Sri Lanka's Gross National Product, separately for each year;

(ii) countries which have a high demand from Sri Lankan workers for foreign employment;

(iii) Government's programme to meet such demand;

(iv) number of Sri Lankan migrant workers who have been sent for employment in the

countries referred to in (ii) above since 2020 to date, separately for each year;

(v) countries that have a labour market which accrue greater benefits to Sri Lankan migrant workers; and

(vi) steps that will be taken to send highly skilled Sri Lankan workers to the countries concerned?

(b) If not, why?

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

(අ) (i)

| වසර | රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව | ප්‍රේෂණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන | දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| 2020 | 53,698 | 7,103.9 | 8.65% |
| 2021 | 122,905 | 5,491.0 | 6.34% |
| 2022 | 310,948 | 3,789.4 | 5.05% |
| 2023 | 297,585 | 5,969.6 | 7.35% |
| 2024 | 314,676 | 6,575.4 | 6.81% |
| 2025 අගෝස්තු 31 දක්වා | 204,733 | 5,116.0 | තොරතුරු නොමැත. |
| මුළු එකතුව | 1,304,545 | | |

(දළ ජාතික නිෂ්පාදිතයේ/ ආදායමේ ප්‍රතිශතය ගණනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා මඟින් ලබා ගත් තොරතුරු පදනම් කරගෙන සිදු කර ඇත. 2025 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා ඉදිරිපත් කර නොමැති බව සඳහන් කරමි.)

(ii) කාර්යාංශයේ ලියාපදිංචි රැකියා ඇණවුම් අනුව ඉහළ ඉල්ලුමක් ඇති රටවල් දහය ලෙස කුවේටය, සවුදි අරාබියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර් රාජ්‍යය, ජපානය, ඕමාන්, රුමේනියාව, සයිප්‍රස්, බහරේන්, මලයාසියාව යන රටවල් හැඳින්විය හැක. කෙසේ නමුත්, විදේශගත වීම සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් ඉහළ ඉල්ලුමක් ඇති රටවල් ලෙස ඊශ්‍රායලය, දකුණු කොරියාව, ජපානය සහ රුමේනියාව සඳහන් කළ හැකිය.

(iii) 1. දකුණු කොරියාව සහ ඊශ්‍රායලය සමඟ ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් අත්සන් කර ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්හට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථා උදා කර ඇත.

2. ජපානය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතා ගිවිසුම් දෙකක් අත්සන් කර ඇත. (තාක්ෂණික පුහුණුලාභීන් - TITP - හා විශේෂ කුසලතා සහිත ශ්‍රමිකයින් - SSWP) මෙම සහයෝගිතා ගිවිසුම යටතේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්, රජයේ මැදිහත් වීම මත හා පෞද්ගලික අංශය මඟින් ජපානය වෙත රැකියා සඳහා යොමු කරනු ලබයි. එමෙන්ම, ජපානයේ රැකියා සඳහා විදේශගත වීමට අපේක්ෂිත ශ්‍රමිකයින් උදෙසා ජපන් භාෂාව ඉගැන්වීමේ පාඨමාලා දියත් කර ඇති අතර, ජපන් භාෂා පාඨමාලා උගන්වනු ලබන පෞද්ගලික ආයතන දිරිමත් කිරීමටද කටයුතු කර ඇත. එසේම එම ආයතන කාර්යාංශයේ ලියාපදිංචි කිරීම.

3. ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් රුමේනියාවේ රැකියා සඳහා යොමු කිරීමට අදාළ සමාජ ආරක්ෂණ ගිවිසුමක් පිළිබඳව මේ වනවිට සාකච්ඡා කරමින් පවතී.

4. රාජ්‍ය හා පෞද්ගලික අංශය සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර විදේශ රැකියා අභිමුඛ පුහුණු පාඨමාලා ලබා දීම.

5. දේශීය රැකියා නියෝජිත ආයතන ද සමඟ සම්බන්ධ වී පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් රැකියා පොළවල් පැවැත්වීම.

6. සමාජ මාධ්‍ය ඔස්සේ විදේශ රැකියාවලට යොමු කිරීමට අදාළ තොරතුරු ප්‍රචාරණය කිරීම.

7. රැකියා බැංකුව - Job Bank - මඟින් මහජනතාවට ඇබෑර්තු පිළිබඳව විස්තර ලබා ගැනීමට අවස්ථාව සැලැස්වීම.

(iv) **ඇමුණුම*** මඟින් දක්වා ඇත. .

(v) දකුණු කොරියාව, ඊශ්‍රායලය සහ ජපානය වැනි රටවල ඉහළ වැටුපක් හිමි වන අතර සේවක ගැටලු අවම මට්ටමක පැවතීම.

(vi) ඊශ්‍රායලය

ඊශ්‍රායල රජය හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් කර ඇති ගිවිසුම් ප්‍රකාරව (G-to-G) ක්ෂේත්‍ර අටක් ආවරණය වන පරිදි ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කරන අතර, වඩාත් නිපුණතාවෙන් යුත් ශ්‍රමිකයින් ඊශ්‍රායලය වෙත යොමු කිරීම සඳහා,

1. ශ්‍රී ලංකාව පුරා සිටින සුදුසුකම් සපුරා ඇති ඕනෑම පුද්ගලයෙකුට වඩාත් විනිවිද භාවයකින් යුක්තව රැකියා අවස්ථා සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව සලසා දීම.

2. ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළව රාජ්‍ය හා පිළිගත් පෞද්ගලික ආයතන මඟින් කුසලතා පරීක්ෂණ, පූර්ව ප්‍රායෝගික පරීක්ෂණ හා අවසන් ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා වඩාත් සුදුසු ශ්‍රමිකයින් තෝරා ගැනීම.

3. තෝරා ගත් ශ්‍රමිකයින්හට ක්ෂේත්‍රයට අදාළව පුහුණුව ලබා දීම හා පෙර විගමනික පුහුණුව ලබා දීමට කටයුතු කිරීම.

උදාහරණයක් වශයෙන්: ඊශ්‍රායලයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා තෝරා ගැනීමේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මඟින් පූර්ව කුසලතා පරීක්ෂණ පවත්වා ඉන් සමත් වන අයදුම්කරුවන් ඊශ්‍රායල ජාතික නියෝජිතයින් විසින් අවසන් ප්‍රායෝගික පරීක්ෂණ මඟින් තෝරා ගැනීම.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

ජපානය

ජපානයේ IM Japan ආයතනය සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම ප්‍රකාරව පුහුණු අභ්‍යාසලාභීන් හා විශේෂ නිපුණතා සහිත ශ්‍රමිකයින් ජපානය වෙත යොමු කිරීමට කටයුතු කිරීම.

1. තෝරා ගන්නා ලද ශ්‍රමිකයින් සඳහා ජපන් භාෂාව ඇතුළුව නේවාසික පුහුණුවක් ලබා දීම. (පුහුණුලාභීන් සඳහා මාස 04ක පුහුණුව සහ විශේෂ නිපුණතා සහිත ශ්‍රමිකයින් සඳහා මාස 03ක පුහුණුව)
2. ජපන් රජය මඟින් පවත්වනු ලබන විශේෂ නිපුණතා සහිත ශ්‍රමික වැඩසටහනට අදාළ කුසලතා පරීක්ෂණ පවත්වනු ලබන දින පිළිබඳ රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම සඳහා පුවත් පත් දැන්වීම් මාසිකව පළ කිරීම.

මීට අමතරව බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන මඟින් ද ජපානය වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අනුමැතිය ලබා දී තිබේ.

තවද,

1. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දිස්ත්‍රික් කාර්යාලවල හා පුහුණු මධ්‍යස්ථානවල ජපන් භාෂා පුහුණු පාඨමාලා ආරම්භ කර පවත්වා ගෙන යෑම. (N4 හා N5 පාඨමාලා සඳහා)
2. ජපන් භාෂා පාඨමාලා සම්බන්ධයෙන් අත් පත්‍රිකා මහජනතාව අතර බෙදා හැරීම.
3. ජපන් භාෂා පාඨමාලා සමත් අයවලුන් වෙත ඔවුන් රැකියා සඳහා විදේශගත වන අවස්ථාවේදී පාඨමාලා ගාස්තුවෙන් 75%ක මුදලක් ප්‍රතිපූරණය කිරීම.
4. ජපන් විභාග පැවැත්වෙන මධ්‍යස්ථාන වෙත ගොස් දැනුවත් කිරීම සිදු කිරීම.

කොරියාව

2004 වසරේදී කොරියානු රජය හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් තබා ඇති අවබෝධතා ගිවිසුම ප්‍රකාරව නිෂ්පාදන, ධීවර, සේවා, කෘෂි කාර්මික, ඉදිකිරීම් හා නැව් තැනීම් යන ක්ෂේත්‍රයන්ට E9 වීසා කාණ්ඩය යටතේ කොරියානු රාජ්‍යයේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් යොමු කිරීම පහත පරිදි සිදු කරනු ලැබේ.

1. ශ්‍රී ලංකාව පුරා සිටින සුදුසුකම් සපුරා ඇති ඕනෑම පුද්ගලයෙකුට වඩාත් විනිවිදභාවයකින් යුක්තව රැකියා සඳහා අයදුම් කිරීමට හැකි වන පරිදි කොරියානු භාෂා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම.
2. ඉහත භාෂා පරීක්ෂණ කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ පූර්ණ අධීක්ෂණය යටතේ පැවැත්වීම.
3. භාෂා පරීක්ෂණය සමත් වන රැකියා අපේක්ෂකයන් සඳහා පළමුව නිපුණතා පරීක්ෂණයද, දෙවනුව කුසලතා පරීක්ෂණයද පවත්වන අතර, නිපුණතා පරීක්ෂණයේදී ඔවුන්ගේ සහතිකපත් පරීක්ෂා කරනු ලබන අතර, කුසලතා පරීක්ෂණයේදී රැකියා අපේක්ෂකයන්ගේ කායික, මානසික කුසලතාව පරීක්ෂා කරනු ලබයි.
4. ඉහත විභාග සමත් රැකියා අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයකට භාජන කිරීම, ඔවුන්ගේ පොලිස් නිෂ්කාසන වාර්තා ලබා ගැනීම සහ ශාරීරික යෝග්‍යතාව වෛද්‍ය පරීක්ෂණ මඟින් තහවුරු කර ගැනීම.
5. ඉහත කටයුතු අවසන් වීමෙන් පසු රැකියා අපේක්ෂකයන්ගේ තොරතුරු කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය මඟින් පරිපාලනය කරනු ලබන වෙබ් අඩවියට (Public Agency System) ඇතුළත් කිරීම.
6. ඉහත වෙබ් අඩවිය ඔස්සේ කොරියානු හාම්පුතුන් විසින් තෝරා ගනු ලබන රැකියා අපේක්ෂකයන් සඳහා රැකියා ගිවිසුම් නිකුත් වීමෙන් අනතුරුව රැකියා සඳහා පිටත්වීමට පෙර පහත සඳහන් පරිදි පුහුණුව ලබා දීම.

   I. නිෂ්පාදන, සේවා, ඉදිකිරීම්, කෘෂි කාර්මික හා නැව් තැනීම යන ක්ෂේත්‍ර සඳහා දින 10ක නේවාසික පුහුණුවක් එරට සංස්කෘතිය, රැකියා වටපිටාව, කම්කරු නීති වැනි කරුණු මූලික කරගෙන පැවැත්වීම.

   II. ධීවර ක්ෂේත්‍රය සඳහා ඉහත අංක Iහි සඳහන් කරුණු ඇතුළත් දින 5ක නේවාසික පුහුණුව සහ ධීවර කටයුතු සම්බන්ධව දින 5ක ප්‍රායෝගික පුහුණුව ලබා දීම.

(ආ) අදාළ නොවේ.

(அ) (i )

| ஆண்டு | தொழில் வாய்ப்பு களுக்காக வெளிநாடு சென்றுள்ள இலங்கைத் தொழிலாளர் களின் எண்ணிக்கை | பண அனுப்பீட்டின் அளவு அ.டொ.மி. (மூலம். இலங்கை மத்திய வங்கி) | மொத்த தேசிய உற்பத்தி யின் சதவீதம் ஒன்றாக |
|---|---|---|---|
| 2020 | 53,698 | 7,103.9 | 8.65% |
| 2021 | 122,905 | 5,491.0 | 6.34% |
| 2022 | 310,948 | 3,789.4 | 5.05% |
| 2023 | 297,585 | 5,969.6 | 7.35% |
| 2024 | 314,676 | 6,575.4 | 6.81% |
| 2025 ஓகஸ்ட் 31 வரை | 204,733 | 5,116.0 | தகவல்கள் காணப்பட வில்லை |
| முழு மொத்தம் | 1,304,545 | | |

(மொத்தத் தேசிய உற்பத்தியின்/வருமானத்தின் சதவீதத்தைக் கணிப்பிடுதல் இலங்கை மத்திய வங்கியின் அறிக்கைகளின் ஊடாகப் பெற்றுக்கொள்ளப்பட்ட தகவல்களை அடிப்படையாகக் கொண்டு மேற்கொள்ளப்பட்டுள்ளது. 2025ஆம் ஆண்டுக்காக இலங்கை மத்திய வங்கி அறிக்கைகளை முன்வைக்கவில்லை என்பதைத் தெரிவித்துக் கொள்கின்றேன்.)

(ii ) பணியகத்தில் பதிவு செய்யப்பட்டுள்ள தொழில் வாய்ப்புக் கட்டளைகளுக்கு அமைய ஆகக்கூடிய கேள்வி நிலவும் நாடுகள் பத்து என்ற வகையில், குவைட், சவூதி அரேபியா, ஐக்கிய அரபு அமீரகம், கத்தார், யப்பான், ஓமான், ருமேனியா, சைப்பிரஸ், பஹ்ரேன், மலேசியா ஆகிய நாடுகளைக் குறிப்பிட முடியும். எவ்வாறெனினும், வெளிநாடுகளுக்குச் செல்வதற்காக இலங்கைத் தொழிலாளர்களிடம் ஆகக்கூடிய கேள்வி நிலவும் நாடுகளாக இஸ்ரேல், தென் கொரியா, யப்பான் மற்றும் ருமேனியா என்பவற்றைக் குறிப்பிட முடியும்.

(iii ) 1. தென் கொரியா மற்றும் இஸ்ரேலுடன் ஒப்பந்தங்கள்/புரிந்துணர்வு ஒப்பந்தங்களைக் கைச்சாத்திட்டு இலங்கைத் தொழிலாளர்களுக்குத் தொழில்வாய்ப்புகளைப் பெற்றுக்கொள்வதற்கு உரிய சந்தர்ப்பங்கள் தோற்றுவிக்கப்பட்டுள்ளன.

2. யப்பான் மற்றும் இலங்கைக்கு இடையில் ஒத்துழைப்பு ஒப்பந்தங்கள் இரண்டு கைச்சாத்திடப்பட்டுள்ளன. (தொழிநுட்பப் பயிலுநர்கள் TITP மற்றும் விசேட திறன்களைக் கொண்ட தொழிலாளர்கள் SSWP ) இந்த ஒத்துழைப்பு ஒப்பந்தத்தின்கீழ் இலங்கைத் தொழிலாளர்கள் அரச தலையீட்டின்கீழ் மற்றும் தனியார் துறைமூலம் யப்பானுக்குத் தொழில்வாய்ப்புகளுக்காக அனுப்பி வைக்கப்படுகின்றனர். அவ்வாறே, யப்பானில் தொழில்வாய்ப்புகளுக்காக வெளிநாடு செல்வதற்கு எதிர்பார்க்கப்படும் தொழிலாளர்களுக்காக யப்பான் மொழியைக் கற்பிக்கும் பாடநெறிகள் நடாத்தப்பட்டுள்ளதுடன், யப்பானிய மொழிப் பாடநெறிகளைக் கற்பிக்கும் தனியார் நிறுவனங்களை ஊக்குவிப்பதற்கும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளன. அவ்வாறே மேற்படி நிறுவனங்களைப் பணியகத்தில் பதிவு செய்தல்.

3. இலங்கைத் தொழிலாளர்களை ருமேனியாவுக்குத் தொழில்வாய்ப்புகளுக் காக அனுப்பி வைப்பதற்கு உரிய சமூக பாதுகாப்பு ஒப்பந்தமொன்று தொடர்பில் தற்போது கலந்துரையாடப்பட்டு வருகின்றது.

4. அரச மற்றும் தனியார் துறையுடன் புரிந்துணர்வு ஒப்பந்தத்தைக் கைச்சாத்திட்டு, வெளிநாட்டு வேலைவாய்ப்பை இலக்காகக்கொண்ட பயிற்சிப் பாடநெறிகளை வழங்குதல்.

5. உள்நாட்டு வேலைவாய்ப்பு முகவர் நிறுவனங்களுடன் இணைந்து தொழில் வாய்ப்புச் சந்தைகளை நடாத்துதல்.

6. சமூக வலைத்தளங்களின் ஊடாக வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்காக அனுப்பி வைப்பதற்கு உரிய தகவல்களைப் பிரசாரம் செய்தல்.

7. தொழில்வாய்ப்பு வங்கிகள்மூலம் (Job Bank) பொது மக்களுக்கு வெற்றிடங்கள் தொடர்பான விபரங்களைப் பெற்றுக்கொள்வதற்கு உரிய சந்தர்ப்பத்தை வழங்குதல்.

(iv) ***இணைப்பில்** குறிப்பிடப்பட்டுள்ளது.

(v ) இஸ்ரேல், யப்பான், தென் கொரியா ஆகிய நாடுகளில் உயர் சம்பளம் கிடைக்கப் பெறுவதுடன் ஊழியர்களின் பிரச்சினை குறைந்த மட்டத்திலும் காணப்படுதல்.

(vi ) **இஸ்ரேல்**

இஸ்ரேல் அரசு மற்றும் இலங்கை அரசு என்பவற்றுக்கு இடையில் கைச்சாத்திடப்பட்டுள்ள உடன்படிக்கைகளின் பிரகாரம் (G to G ) எட்டுத் துறைகள் தழுவப்படும் வகையில் இலங்கைத் தொழிலாளர்கள் அனுப்பி வைக்கப்படுவதுடன், மிகவும் தேர்ச்சியுடைய தொழிலாளர்களை இஸ்ரேலுக்கு அனுப்பி வைப்பதற்காக,

1. இலங்கை பூராவுமுள்ள தகைமைகளைப் பூர்த்திசெய்துள்ள எந்தவொரு நபருக்கும் மிகவும் வெளிப்படைத் தன்மையுடன் தொழில்வாய்ப்புகளுக்காக கோரிக்கைகளை விடுப்பதற்குச் சந்தர்ப்பங்களை வழங்குதல்.

2. அந்தந்தத் துறைகளுக்கு உரிய வகையில் அரச மற்றும் அங்கீகரிக்கப்பட்ட தனியார் நிறுவனங்கள்மூலம் திறமைகளைப் பரீட்சித்தல், முன் செயன்முறைப் பரீட்சைகள் மற்றும் இறுதியான செயன்முறைப் பரீட்சைகள் என்பவற்றை நடாத்தி மிகவும் பொருத்தமான தொழிலாளர்களைத் தேர்ந்தெடுத்தல்.

3. தெரிவுசெய்யப்பட்ட தொழிலாளர்களுக்குத் துறைசார்ந்த வகையில் பயிற்சியை வழங்குதல் மற்றும் குடியகல்வுக்கு முன்னரான பயிற்சியை வழங்குவதற்கு உரிய நடவடிக்கைகளை மேற்கொள்ளல்.

உதாரணமாக: இஸ்ரேலில் கட்டிட நிர்மாணத் துறையில் தொழில்வாய்ப்புகளுக்காகத் தெரிவு செய்யும்போது, தேசிய பயிலுநர் மற்றும் தொழில்நுட்பப் பயிற்சி அதிகாரசபைமூலம் முன் திறமைப் பரீட்சையை நடாத்தி, அதில் சித்தியடையும் விண்ணப்பதாரிகள் இஸ்ரேலிய நாட்டின் பிரதிநிதிகளால் இறுதியான செயன்முறைப் பரீட்சைமூலம் தெரிவு செய்யப்படுதல்.

**யப்பான்**

யப்பானின் IM Japan நிறுவனத்துடன் கைச்சாத்திடப்பட்டுள்ள புரிந்துணர்வு ஒப்பந்தத்தின் பிரகாரம் பயிலுநர்கள் மற்றும் விசேட தேர்ச்சியுடன் கூடிய தொழிலாளர்களை யப்பான் நாட்டுக்கு அனுப்புவதற்கு உரிய நடவடிக்கைகளை மேற்கொள்ளல்.

1. தெரிவு செய்யப்பட்டுள்ள தொழிலாளர்களுக்கு யப்பான் மொழி உட்பட வதிவிடப் பயிற்சியை வழங்குதல் (பயிலுநர்களுக்காக

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

04 மாத காலப் பயிற்சி மற்றும் விசேட தேர்ச்சியுடன் கூடிய தொழிலாளர்களுக்கு 03 மாத காலப் பயிற்சி)

2. யப்பானிய அரசின்மூலம் நடாத்தப்படும் விசேட தேர்ச்சியுடன் கூடிய தொழிலாளர் நிகழ்ச்சித்திட்டத்துக்கு உரிய திறமைப் பரீட்சைகள் நடாத்தப்படும் தினங்கள் தொடர்பாக தொழில்வாய்ப்புகளை எதிர்பார்ப்பவர்களுக்கு அறியத் தருவதற்காக பத்திரிகை அறிவித்தல்களை மாதாந்தம் பிரசுரித்தல்.

இதற்கு மேலதிகமாக அனுமதிப்பத்திரதார வெளிநாட்டு வேலைவாய்ப்பு முகவர் நிறுவனங்கள் ஊடாகவும் யப்பான் நாட்டுக்கு இலங்கைத் தொழிலாளர்களை அனுப்பி வைப்பதற்கான அனுமதி வழங்கப்பட்டுள்ளது.

மேலும்,

1. இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் மாவட்ட அலுவலகங்களிலும் பயிற்சி நிலையங்களிலும் யப்பான் மொழிப் பயிற்சிப் பாடநெறிகள் ஆரம்பிக்கப்பட்டு பேணி வரப்படுதல்.

(N4 மற்றும் N5 பாடநெறிகளுக்காக)

2. யப்பான் மொழிப் பாடநெறிகள் தொடர்பான துண்டுப் பிரசுரங்களை பொது மக்களுக்கு இடையில் பகிர்ந்தளித்தல்.

3. யப்பான் மொழிப் பாடநெறிகளில் சித்தியடைந்தவர்களுக்கு அவர்கள் வேலைவாய்ப்புகளுக்காக வெளிநாட்டுக்குச் செல்லும் சந்தர்ப்பத்தில் பாடநெறிக் கட்டணத்தின் 75%ஐ மீளளிப்புச் செய்தல்.

4. யப்பான் மொழிப் பரீட்சைகள் நடைபெறும் நிலையங்களுக்குச் சென்று விழிப்புணர்வூட்டல்களை மேற்கொள்ளல்.

**தென் கொரியா**

2004ஆம் ஆண்டில் கொரிய அரசு மற்றும் இலங்கை அரசு என்பவற்றுக்கு இடையில் கைச்சாத்திடப்பட்டுள்ள புரிந்துணர்வு ஒப்பந்தத்தின் பிரகாரம் உற்பத்தி, மீன்பிடி, சேவைகள், விவசாயம், கட்டிட நிர்மாணம் மற்றும் கப்பல் கட்டுதல் ஆகிய துறைகளுக்கு E9 வீசா வகையின்கீழ் கொரியா நாட்டின் வேலைவாய்ப்புகளுக்காக இலங்கையர்களை அனுப்பி வைத்தல் கீழ்வரும் வகையில் மேற்கொள்ளப்படுகின்றது.

1. இலங்கை பூராவுமுள்ள தகைமைகளைப் பூர்த்திசெய்துள்ள எந்தவொரு நபருக்கும் மிகவும் வெளிப்படைத் தன்மையுடன் தொழில்வாய்ப்புகளுக்காக விண்ணப்பிப்பதற்கு இயலுமான வகையில் கொரிய மொழிப் பரீட்சைக்காக விண்ணப்பம் கோரல்.

2. மேற்படி மொழிப் பரீட்சைகளை கொரியாவின் மனித வள அபிவிருத்தி நிறுவனத்தின் முழுமையான கண்காணிப்பின்கீழ் நடாத்துதல்.

3. மொழிப் பரீட்சையில் சித்தியடையும் வேலைவாய்ப்புகளை எதிர்பார்த்திருக்கும் நபர்களுக்காக முதலில் தேர்ச்சி தொடர்பான பரீட்சையும் இரண்டாவதாக திறமை தொடர்பான பரீட்சையும் நடாத்தப்படுவதுடன், தேர்ச்சி தொடர்பான பரீட்சையின் போது அவர்களின் சான்றிதழ்கள் பரீட்சிக்கப்படுவதுடன், திறமை தொடர்பான பரீட்சையின்போது வேலைவாய்ப்புகளை எதிர்பார்ப்பவர்களுக்கான உடல், உளவியல் தகைமைகள் பரீட்சிக்கப்படும்.

4. மேற்படி பரீட்சைகளில் சித்தியடையும் வேலைவாய்ப்புகளை எதிர்பார்ப்பவர்களை நேர்முகப் பரீட்சைக்கு உட்படுத்துதல், அவர்களது பொலிஸ் அங்கீகார அறிக்கைகளைப் பெற்றுக்கொள்ளல் மற்றும் உடற் தகைமையை மருத்துவப் பரிசோதனை மூலம் உறுதிப்படுத்தல்.

5. மேற்படி நடவடிக்கைகள் பூர்த்தியடைந்ததன் பின்னர் வேலைவாய்ப்புகளை எதிர்பார்ப்பவர்களின் தகவல்கள் கொரிய நாட்டின் மனித வள அபிவிருத்தி நிறுவனம் மூலம் நிருவகிக்கப்படும் வலைத் தளத்துக்குள் (Sending Public Agency System) உள்ளடக்குதல்.

6. மேலே குறிப்பிடப்பட்டுள்ள வலைத் தளத்தின் ஊடாக கொரிய நாட்டின் சேவை வழங்குநர்களால் தெரிவு செய்யப்படும் தொழில்வாய்ப்புகளை எதிர்பார்த்திருப்பவர்களுக்கான தொழில் ஒப்பந்தங்கள் வெளியிடப்பட்டதன் பின்னர் வேலைவாய்ப்புகளுக்காக வெளியேறிச் செல்வதற்கு முன்னர் கீழே குறிப்பிடப்பட்டுள்ள வகையில் பயிற்சியை வழங்குதல்.

   I. உற்பத்தி, சேவைகள், கட்டிட நிர்மாணம், விவசாயம் மற்றும் கப்பல் கட்டுதல் ஆகிய துறைகளுக்காக 10 நாள் வதிவிடப் பயிற்சியை அந்நாட்டு கலாசாரம், வேலைவாய்ப்புச் சூழல், தொழிலாளர் சட்டங்கள் போன்ற விடயங்களை அடிப்படையாகக் கொண்டு நடாத்துதல்.

   II. மீன்பிடித் துறைக்காக மேற்படி இலக்க 1இல் குறிப்பிடப்பட்டுள்ள விடயங்கள் உள்ளடக்கப்பட்ட 05 நாள் வதிவிடப் பயிற்சி மற்றும் மீன்பிடி நடவடிக்கைகள் தொடர்பான 05 நாள் செயன்முறைப்பயிற்சி என்பவற்றை வழங்குதல்.

(ஆ) ஏற்புடையதல்ல.

(a) (i)

| Year | Number of Sri Lankan workers who migrated for employment | Amount of foreign exchange remitted (USD million) (Source - Central Bank of Sri Lanka) | Percentage of Gross National Product |
|---|---|---|---|
| 2020 | 53,698 | 7,103.9 | 8.65% |
| 2021 | 122,905 | 5,491.0 | 6.34% |
| 2022 | 310,948 | 3,789.4 | 5.05% |
| 2023 | 297,585 | 5,969.6 | 7.35% |
| 2024 | 314,676 | 6,575.4 | 6.81% |
| Up to 31st August | 204,733 | 5,116.0 | No information |
| Total | 1,304,545 | | |

( The calculation of the percentage of Gross National Product/Income has been based on information obtained from the reports of the Central Bank of Sri Lanka. It should be noted that the Central Bank reports for the year 2025 have not yet been submitted.)

(ii) According to the registered job orders of the Bureau, the ten countries with the highest demand are Kuwait, Saudi Arabia, the United Arab Emirates, Qatar, Japan, Oman, Romania, Cyprus, Bahrain and Malaysia. However, the countries most preferred by Sri Lankan workers for employment abroad are Israel, South Korea, Japan and Romania.

(iii) To meet this demand, the Government's programme is as follows:

1. Agreements/MoUs have been signed with South Korea and Israel to provide employment opportunities for Sri Lankan workers.
2. Two cooperation agreements have been signed between Japan and Sri Lanka (Technical Interns - TITP - and Specified Skilled Workers - SSWP). Under these agreements, Sri Lankan workers are sent to Japan for employment through both government intervention and the private sector. In addition, Japanese language courses have been introduced for workers intending to go abroad for employment in Japan and efforts are being made to encourage private institutions that conduct Japanese language courses. Such institutions are also registered with the Bureau.
3. A social security agreement is currently under discussion to facilitate the employment of Sri Lankan workers in Romania.
4. Signing MoUs with the public and private sectors to provide training courses for foreign employment.
5. Conducting job fairs at provincial and divisional levels in collaboration with local employment agencies.
6. Sharing information to direct people to foreign employment opportunities through social media.
7. Providing the public with access to information on available vacancies through the Job Bank.

(iv) Since 2020, the number of Sri Lankan workers sent for employment to countries with high demand each year is given in Annex*.

(v) Countries such as South Korea, Israel and Japan can be identified as labour markets offering greater benefits to Sri Lankan workers. In these countries, Sri Lankan workers receive higher wages and labour-related issues are kept to a minimum.

(vi) The steps taken to deploy highly skilled Sri Lankan workers to those countries are as follows:

Israel

According to the agreements signed between the Government of Israel and Sri Lanka - G2G, Sri Lankan workers are being sent to Israel covering eight sectors and the most skilled workers are sent to Israel:

1. An opportunity is provided for any person from Sri Lanka who meets the qualifications to apply for employment in a transparent manner.
2. Skill tests, pre-practical tests and final practical tests are conducted by the Government and recognized private institutions in each sector to select the most suitable workers.
3. Sector-specific training and pre-departure training are provided to the selected workers.

For example, in the selection for jobs in the construction sector in Israel, the National Apprentice and Industrial Training Authority conducts pre-skill tests and the Israel national representatives select the applicants who pass final practical tests.

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

Japan

Deploying Technical Interns and Specified Skilled Workers to Japan in accordance with the Memorandum of Understanding signed with IM Japan.

1. Providing residential training, including Japanese language instruction to selected workers (four months for Interns and three months for Specified Skilled Workers).
2. Publishing monthly newspaper notices to inform job seekers about the dates of skill tests related to the Specified Skilled Worker Programme conducted by the Japanese Government.

   In addition, approval has been granted to send Sri Lankan workers to Japan through licenced foreign employment agencies.

   Furthermore:

1. Initiating and conducting Japanese language training courses at district offices and training centres of the Sri Lanka Bureau of Foreign Employment.

   (N4 and N5 levels)
2. Distributing brochures on Japanese language courses to the public.
3. Reimbursing 75 per cent of the course fee to those who have successfully completed Japanese language courses when they go abroad for employment.
4. Visiting examination centres where Japanese tests are conducted and providing relevant information.

Korea

In accordance with the Memorandum of Understanding signed between the Governments of Korea and Sri Lanka in 2004, the following procedures are followed for sending Sri Lankan workers to Korea under the E9 visa category in the fields of manufacturing, fisheries, services, agriculture, construction and shipbuilding:

1. Calling for applications for the Korean language test, allowing any qualified person from across Sri Lanka to apply for jobs in a transparent manner.
2. Conducting the language tests under the full supervision of the Human Resources Development Institute of Korea.
3. For job candidates who pass the language test, a proficiency test is conducted first followed by a skill test. During the proficiency test, their certificates are verified and during the skill test, the physical and mental abilities of the candidates are assessed.
4. Interviewing candidates who have passed the above tests obtaining their police clearance reports and verifying physical fitness through medical examinations.
5. After completing the above steps, the information of job candidates is entered into the Public Agency System administered by the Human Resources Development Institute of Korea.
6. Providing the following training to candidates selected by Korean employers through the said website after the issuance of employment contracts and before departure:

   I. Conducting a 10-day residential training for the manufacturing, services, construction, agriculture and shipbuilding sectors, covering basic aspects such as the country’s culture, work environment and labour laws.

   II. For the fisheries sector, providing five days of residential training covering the aspects mentioned in I above followed by five days of practical training related to fishing activities.

(b) Does not arise.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.